# ක්‍රම විමර්ශ

12 වැනි වෙළුම 02 වැනි කලාපය / 2015 අගෝස්තු
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි



## 2015 මහ මැතිවරණය
# තීරණාත්මක කඩඉමක්

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු / ආචාර්ය දීපිකා උඩගම / මහාචාර්ය කුමාර් ඩේවිඩ් / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චරිත හේරත් / මංජුල ගජනායක
මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න / ආචාර්ය ජයම්පති වික්‍රමරත්න / නීතිඥ කේ.ඩබ්ලිව්. ජනරංජන / නීතිඥ එස්. ජී. පුංචිහේවා / පූජ්‍ය මාදොළුවාවේ සෝභිත හිමි
මහාචාර්ය ජයදේව උයන්ගොඩ / අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ / හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ / අනුර දිසානායක / ඉලෙයිජා හූල්
නීතිඥ නිසාම් කාරියප්පර් / මහාචාර්ය එම්.ඒ.ඕ. ද සොයිසා / සුරේෂ් කුමාර් / ලයනල් ගුරුගේ

# පුරවැසියා වෙබ් අඩවිය

## පුරවැසි ජනජීවිතයට අදාළ,

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු සියලුම නීති, අණපනත් සහ රෙගුලාසි
- පුරවැසියාට අදාළ ඉහළ අධිකරණයෙන් විනිශ්චිත නඩු තීන්දු සහ අනෙකුත් වැදගත් නඩු තීන්දු
- රාජ්‍ය හා පොදු ආයතනයන්හි ආකෘති පත්‍ර
- පුරවැසි ක්‍රියාකාරීත්වයේ නවීන තොරතුරු
- මූලික අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්
- පුරවැසි ක්‍රියාකාරීත්වයෙන් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර
- පුරවැසි සභා - පිළිබඳ තොරතුරු

---

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව ත්‍රෛභාෂාවෙන්
පුරවැසියා වෙනුවෙන්ම
සැප්තැම්බර් මාසයේ ඇරඹුමත් සමඟ

---

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙතින්
**බලාපොරොත්තුවන්න.**



සාම විමර්ශී

සංස්කරණය **ලයනල් ගුරුගේ**

ISSN 955-1800-0061

12 වැනි වෙළුම 02 වැනි කලාපය 2015 අගෝස්තු

දුරකථනය 94-1-2370801/4
ෆැක්ස් 94-1-2370802
ඊ-මේල් cpa@cpalanka.org
වෙබ් www.cpalanka.org


# 2015 මහ මැතිවරණය තීරණාත්මක කඩඉමක්

ලාංකේය දේශපාලන ඉතිහාසයේ සංධිස්ථානයක් හැටියට 2015 මහ මැතිවරණය හැඳින්වීම යුක්ති යුක්ත ය. එයට හේතු කාරණා බොහෝමයකි. රටෙහි මුල් පුරවැසියා වන ජනාධිපතිතුමන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ  මුල් පුටුවේ සිටිමින් මෙවර මැතිවරණයේ දී නිර්පාක්ෂිකව කටයුතු කිරීම සුවිශේෂී කාරණයකි.

අප සමඟ නිදහස ලැබූ ඉන්දියාව ඇතුළු වෙනත් තදාසන්න රාජ්‍යයන් ශීඝ්‍රයෙන් දියුණු වෙමින් ඉදිරියට යන මොහොතක, අප රට ඇතැම් කාරණාවලින් දියුණුවක් ලබා තිබුණ ද එක් ජාතියක් ලෙස එකට එකතු වී කටයුතු කරන්නේ කෙසේ දැයි නිශ්චිත කතිකාවකට පැමිණ නැත. මේ උදාවී ඇත්තේ එකී කතිකාවේ ඇරඹුම ය. අප සියලු නායකයන්ට ඇරයුම් කරන්නේ ඔවුන් ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රතිපත්ති සඳහා මහජන ඇනුමැතිය ලබාගනිමින් වඩා යහපත් රටක් ගොඩ නැගීම සඳහා එකී කතිකාව හා එකතුවන ලෙස ය. ජනාධිපතිතුමන් ඒ සඳහා මූලික පියවර ගත යුතු අතර කුමන පාර්ශ්වය බලය ලබාගත්ත ද දෑ අවුරුද්දක් ඉක්ම යන්නට කලියෙන් රටේ මූලික ගැටලු විසඳීම සඳහා පියවර ගනිමින් ඒ වෙනුවෙන් ජාතික වැඩපිළිවෙළක් ගොඩ නැගීම ආරම්භ කළ යුතු යැයි විශ්වාස කරමු.

එසේ ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම අද ජාතික අවශ්‍යතාවක් වී තිබේ. කවරෙකු ආණ්ඩු බලය ලබා ගත්ත ද එකී කාරණයේ දී සියලු පාර්ශ්වයන් සද්භාවයෙන් කටයුතු කළ මනා ය. පුරවැසියන් දැනුවත් කරමින්, පුරවැසියන් සහභාගී කරගනිමින්, දේශපාලඥයන් සහ විද්වතුන්ගේ දායකත්වය ලබා ගනිමින් ගොඩනගන නැවුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සමාජය අපේක්ෂා කරයි.  එම අපේක්ෂාවන්ට ඉඩදෙමින් සියලු ම ආයතන ප්‍රජාතන්ත්‍රීයකරණය කිරීම, නීතියේ ආධිපත්‍යය සුරැකීම, ස්වාධීන කොමිෂන් සභා ශක්තිමත් කිරීම හා යථා තත්වයට පත් කිරීම පදනම් කරගනිමින් සංහිඳියාව ගොඩනැගීමට යත්න දැරිය යුතු ය. ඒ සඳහා සියලු පුරවැසියන්, දේශපාලන නායකයන්, සිවිල් ක්‍රියාකාරීන් හා විද්වතුන් සහභාගී කරගනිමින් මෙවර මැතිවරණය ලාංකේය සමාජයේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත් කර ගනිමු. ●


විවිධ සහාය **මහින්ද රත්නායක, ළහිරු කිතලගම**

පරිගණක අක්ෂර / පිට කවරය / පිටු සැලසුම **වාක්‍යා රූ දු.ඇ. 011-2708377** මුද්‍රණය **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 0777-315971**

"සාම විමර්ශී" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම හා ගැටුම් විශ්ලේෂණ ඒකකයේ සහ ප්‍රජා සහභාගිත්ව ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"සාම විමර්ශී" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.

වැඩිදුරට විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

සංස්කාරක, "සාම විමර්ශී"
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2565304/06 ෆැක්ස් 94-11-4714460 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

# පටුන


**තීරණාත්මක මැතිවරණයක් සඳහා වේදිකාවක්** 3
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

**නීතියේ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ පොරොන්දු** 7
ආචාර්ය දීපිකා උඩගම

**ආර්ථිකයේ වෙනසක් ඇති වුවත් ජාතික ප්‍රශ්නය විසඳේද?** 13
මහාචාර්ය කුමාර් ඩේවිඩ්

**ආණ්ඩු බලය ලබාගැනීම සඳහා හුදු විවේචන පමණක් ප්‍රමාණවත් නැහැ** 17
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චරිත හේරත්

**ඡන්ද අයිතිය, මැතිවරණ නීති හා ප්‍රචණ්ඩ ක්‍රියා** 22
මංජුල ගජනායක

**බෙදුණු අතීතයකින් හවුල්කාර අනාගතයක් කරා පියමං කරමු** 28
මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න

**ප්‍රජාතන්ත්‍රීකරණයේ සංවර්ධන ගතිකය හා සමාජ සාධාරණත්වය** 32
ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

**පුරවැසියාගේ පුනරාගමනය හා ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණය** 37
නීතිඥ කේ. ඩබ්ලිව්. ජනරංජන

**රටට හෙටක් - අලුත් පුරවැසියෙක්** 42
නීතිඥ එස්. ජී. පුංචිහේවා

**තරඟයට බොරු පොරොන්දු නොදී නිෂ්පාදන ආර්ථිකයකට රට යොමු කරමු** 46
පූජ්‍ය මාදොළුවාවේ සෝභිත හිමි

**රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය නැවත පාර්ලිමේන්තුවට ගත යුතුය.** 51
මහාචාර්ය ජයදේව උයන්ගොඩ

**පංචවිධ ක්‍රියාවලිය** 56
අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ

**අනාගතයට සහතිකයක්** 59
හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ

**හෘද සාක්ෂියේ සම්මුතිය** 64
අනුර දිසානායක

**එක්සත් සහ නොබෙදුණු ශ්‍රී ලංකාවක් තුළ උපරිම බලය බෙදීමේ ආකෘතියක් අවශ්‍යයි** 70

**දෙමළ ජාතික සන්ධානයට දෙමළ ජාතික ජනතා පෙරමුණ අභියෝගයක්ද?** 72
ඉලෙයිජා හුල්

**මුස්ලිම් ජනයාට ලැබුණු වාසි මත ජනාධිපති රාජපක්ෂට කැමති වුවත් ඔහුගේ මුස්ලිම් විරෝධය ඔහුටම පාරාවළල්ලක් විය** 76
නීතිඥ නිසාම් කාරියප්පර්

**ජාතික සංහිඳියාවකට සමාන අවස්ථාවන් හා සමාන පුරවැසියන්** 82
මහාචාර්ය එම්. ඒ. ඕ. ද සොයිසා

**ප්‍රතිපත්තියක් නැති වතුකරයේ දේශපාලනය** 84
සුරේෂ් කුමාර්

**පුරවැසි සහභාගිත්වයෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්** 88
ලයනල් ගුරුගේ

**මත විමසුම - මහා මැතිවරණය 2015** 95
Social Indicator ආයතනය


2015 මහ මැතිවරණය
තීරණාත්මක කඩඉමක්



www.dailymirror.lk



**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සමග

# තීරණාත්මක මැතිවරණයක් සඳහා වේදිකාවක්

නාම යෝජනා ඉදිරිපත් කර තිබෙන අතර මැතිවරණ ප්‍රකාශන බොහොමයක් නිකුත්ව තිබේ. අවාසනාවකට මෙන් කලින් පැවති මැතිවරණ සමග සැසඳීමේ දී සාපේක්ෂ වශයෙන් හිංසනයෙන් තොර මැතිවරණයක් පිළිබඳ තත්ත්වය උතුරු කොළඹ වෙඩි තැබීමක් මගින් සිදු කෙරුණු මරණයකින් දැන් අවලස්සන කර තිබේ.

පෙර බොහෝ අවස්ථාවල දී මතු කර තිබුණු කරුණක් වුවද 2015 අගෝස්තු මහ මැතිවරණය රටේ ඉතාම වැදගත් මහ මැතිවරණය බවට තර්ක කළ හැකිය. මෙවර මැතිවරණයේ වැදගත්කම 2015 ජනවාරි ජනාධිපතිවරණයේ නොනිමි කාර්යය මගින් අවධාරණය කරනු ලබයි. මහින්ද රාජපක්ෂ



**රාජපක්ෂ කඳවුරේ දේශපාලන බලාපොරොත්තු තවමත් දැල්වී තිබේ. ජනාධිපතිවරණයෙන් පසු හා දැන් ඔවුන්ගේ තර්කය වන්නේ කෙසේ අර්ථ දැක්වුව ද ජනාධිපති සිරිසේන ජය ගත්තේ සුළුතර ජනයාගේ ඡන්දවලින් බවත් ආණ්ඩුවේ මාස 6 ක පාලනයේ බර රාජපක්ෂ විරෝධී බලවේගවලවලට එරෙහිව ඇති තත්වයක් තුළ තමන්හට පුනර්ජීවනයක් ලැබීමේ අවස්ථා වැඩි බවත් ය.**

දකුණේ ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ ප්‍රදේශවල ඡන්ද 58 ලක්ෂයක් පමණ දිනාගත් අතර සිරිසේනගේ ජයග්‍රහණයේ වැඩි ඡන්ද සංඛ්‍යාව අපේක්ෂා කළ තරම් විශාල නොවීය. එමගින් රාජපක්ෂ කඳවුරේ දේශපාලන බලාපොරොත්තු තවමත් දැල්වී තිබේ. ජනාධිපතිවරණයෙන් පසු හා දැන් ඔවුන්ගේ තර්කය වන්නේ කෙසේ අර්ථ දැක්වුව ද ජනාධිපති සිරිසේන ජය ගත්තේ සුළුතර ජනයාගේ ඡන්දවලින් බවත් ආණ්ඩුවේ මාස 6 ක පාලනයේ බර රාජපක්ෂ විරෝධී බලවේගවලවලට එරෙහිව ඇති තත්වයක් තුළ තමන්හට පුනර්ජීවනයක් ලැබීමේ අවස්ථා වැඩි බවත් ය.

මේ සම්බන්ධයෙන් ගත් කල ප්‍රධාන වශයෙන් දමිළ ප්‍රදේශවලින් පිටත මැතිවරණය ජනාධිපතිවරණය නැවත පැවැත්වීමකි. සිරිසේන විසින්ම ඔහුට හිමි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඡන්ද ව්‍යාපාරය සක්‍රීයව අත්හැර දැමීම මගින් හා එසේ කරමින් එලෙසම එක්සත් ජනතා නිදහස් සන්ධානය හා එහි ප්‍රධාන කොටස්කරුවා වන ශ්‍රීලනිපය තුළ ඔහුගේ දුර්වලතාව විදහා පාමින් රාජපක්ෂට කාරණය සියතට ගැනීමට ඉඩ දෙනු ලැබ තිබේ. ඔහුගේ පූර්වගාමියාට නාම යෝජනා දීම පිළිබඳ ප්‍රශ්නය ගැන කරන ලද ඔහුගේ ප්‍රසිද්ධ ප්‍රකාශයේ දී ජනාධිපති සිරිසේන මූලිකව පැවසුවේ එය ඔහුට කිරීමට අවශ්‍ය නොවූ නමුත් එය කරන්නට සිදු වූ බවත් එහෙයින් ඔහු එජනිසයේ මැතිවරණ ව්‍යාපාරයේ කිසිදු කාර්යයක් ඉටු නොකරන බවත් ය. එලෙසම එක්තරා දුරකට පැවසුවේ ඡන්දය අනෙක් පැත්තට එනම් එජාපයට දිය යුතු බවත් ය. එහෙත් ප්‍රකාශයේ පසු කොටස ඉතාමත්ම විවාද සම්පන්න ය. රාජපක්ෂට නාමයෝජනා ලබා දීම ජනවාරියේ දී රාජපක්ෂලාට එරෙහි ව්‍යාපාරයේ නිරතවූවන් විසින් පාවා දීමක් යයි හඬ නැගීමට මග පෑදුවේ නම් එලෙසම ඔවුන්ට ඡන්දය නොදෙන්නැයි යෝජනා කිරීම රාජපක්ෂ හා ඔහුගේ ආධාරකරුවන් වෙතින් පාවා දීමකැයි යන චෝදනාව ඉදිරිපත් කිරීමට මග පාදා තිබේ. ජනාධිපති සිරිසේනගේ ක්‍රමෝපාය රාජපක්ෂලාටම සිය ගෙල වැලලා ගැනීමට ඇති තරම් ඉඩ දිය යුතුය හෝ ඡන්දදායකයාට ඔවුන්ව සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කිරීමට තවත් අවස්ථාවක් දිය යුතුය යන්න විය හැකි අතර එය සාර්ථක වන්නට ද පුළුවන. එසේ වුව ද එලෙසම එය ශ්‍රීලනිපයේ හදවතේ හා ආත්මයේ පාලනය අත්කර ගැනීම ද වෙනුවෙන් කරන අරගලයක් මගින් රටේ අනාගතය කප්පමකට දෙනු ලැබීමේ සුදුවකින් අවසන් වන්නට ද පුළුවන.

රාජපක්ෂ නම් කිරීම සඳහා වන තාර්කිකය විය හැක්කේ බහුතර සිංහල ජනතාව ඔවුන් ඉල්ලා සිටින්නේය යන්න හා එහෙයින් ඔවුන්ට ආපසු බලයට ඒම සඳහා ප්‍රධාන ජන මත රැල්ලක් තිබේය යන්න පමණි. මෙය තවමත් ප්‍රකාශයට පත් වී නොමැති අතර සිරිසේනගේ ප්‍රකාශය මගින් කිසියම් දුරකට ඔවුන්ගේ ශක්තිය දුබල කිරීමක් පෙන්නුම් කර තිබේ. ලබා ගත හැකි සාක්ෂි එජාපය තනි විශාලතම පක්ෂය ලෙස නැගෙමින් පවතින බව හා එමනිසා එජාප සහ සිරිසේන පාක්ෂික එජනිස ඇමතිවරුන්ගෙන් යුත් ආණ්ඩුවක් ඇති විය හැකි බව පෙන්නුම් කරයි. බහුතරය වඩාත් කුඩා වන අවස්ථාවක ආණ්ඩුවෙන් පිටතවන අනෙක් පක්ෂවල සහය ලැබීමේ ඉඩකඩ තිබේ. එමෙන්ම අනෙක් අතට රාජපක්ෂ එජනිසය විපක්ෂයේ විශාලතම පක්ෂය වශයෙන් මතුවීමේ ඉඩකඩ සහිතවන විකල්ප සිදුවීම් පෙළක දී රාජපක්ෂ එජනිසය එජාපයේ හෝ එජාපය නායකත්වය දෙන ආණ්ඩුවක් පෙරළා දැමීමට අනෙකුත් පක්ෂවලින් මන්ත්‍රීවරුන් දිනා ගැනීමට උත්සාහ කිරීමේ ඉඩකඩ ද ඇත්තේ ය.

ප්‍රතිඵල වශයෙන් ඡන්දදායකයා විසින් මතක තබා ගත යුතු වන වැදගත් සාධකයන් වන්නේ ජනවාරිවල සිට නිම නොකරන



**ජනාධිපති සිරිසේනගේ ක්‍රමෝපාය රාජපක්ෂලාටම සිය ගෙල වැලලා ගැනීමට ඇති තරම් ඉඩ දිය යුතුය හෝ ඡන්දදායකයාට ඔවුන්ව සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කිරීමට තවත් අවස්ථාවක් දිය යුතුය යන්න විය හැකි අතර එය සාර්ථක වන්නට ද පුළුවන.**

ලද කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ස්ථාවර, ප්‍රතිසංස්කරණ සඳහා යොමු වූ ආණ්ඩුවක් ස්ථාපිත කිරීම පිණිස ප්‍රමාණවත් විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා දීමට පෙරට පැමිණිය යුතු ය යන්න ය.

සත්තකින්ම ඊළඟ ආණ්ඩුව ඉටුකළයුතු වැඩකොටස දැනටම නිශ්චය වී තිබේ. දූෂණ විරෝධී මෙහෙයුම සාර්ථක ලෙස නිම කිරීමට අමතරව - රාජපක්ෂ අපේක්ෂකත්වය දියත් කරන ලද්දේ එය නතර කිරීමේ අපේක්ෂාවෙන් විය හැකි ය- නව පාර්ලිමේන්තුව ක්‍රියාත්මක කළ යුතු, ජනවාරිවල දී රාජපක්ෂ විරෝධී පක්ෂ ඉදිරියට ගෙන ඒමෙන් වැලකී සිටි කාරණාම එනම් වගවීම පිළිබඳව වූ ගැටලු සැප්තැම්බරයේ දී එළි දැක්වීමට නියමිතව තිබෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ වාර්තාව මගින් අවධාරණය කිරීමට ඉඩ තිබෙන සත්‍යය සෙවීම් හා සාධාරණය හා ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් යන කාරණා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුව තිබේ.  ඊට අමතරව විසඳිය යුතු ආර්ථික ප්‍රශ්න, මැතිවරණ හා වෙනත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රශ්න සමූහයක් ද තිබේ.

උතුර හා නැගෙනහිර ඡන්දදායකයා හා දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් සත්‍යය සෙවීම් සාධාරණය, හානි පූරණ හා ප්‍රකෘතිමත් කිරීම් (Reparations) හා ගැටුම යළි ඇති නොවන බවට වන සහතික වීම පිළිබඳ ප්‍රශ්න ප්‍රමුඛ ඒවා වේ. මේ සම්බන්ධයෙන් නව ආණ්ඩුවක් මත ඔවුන්ට ලැබෙන්නා වූ කේවල් කිරීමේ හා ගාමක බලය කුමක් ද?

වර්තමානයෙහි  වගවීම සම්බන්ධ විශ්වසනීය දේශීය යාන්ත්‍රණයක් හා සත්‍ය පැවසීම සම්බන්ධ යම් යාන්ත්‍රණයක් වන අතුරුදහන් වූවන් පිළිබඳ ස්ථිර කාර්යාලයක් පිහිටු වීම සඳහා ආණ්ඩුව විසින් ගෙන ඇති මුලපිරුම් තිබේ. ජිනීවා වාර්තාව යනු පාලනය වෙනස් කිරීම හා හේග්වල දී යුද අපරාධ නඩු පැවරීම හා සම්බන්ධ එකක් ය යනුවෙන් තර්ක කරන වර්ගවාදී රාජපක්ෂ මැතිවරණ ව්‍යාපාරය, ඒවා සිය වාසිය සඳහා කූට ලෙස උපයෝගී කර ගැනීමේ අනතුර ඇති හෙයින්  මෙම මුලපිරීම් ප්‍රකාශයට පත් කර නැත. එසේම මැතිවරණය අවසන් වූ වහාම ආණ්ඩුවට පෙන්වීමට හා සැප්තැම්බර් අවසාන සතියේ දී නිල වශයෙන් කවුන්සිලය වෙත නිකුත් කිරීමට අපේක්ෂා කරන නියම වාර්තාව නිකුත් කිරීමට පෙර රාජපක්ෂ කඳවුර විසින් ව්‍යාජ ජිනීවා වාර්තාවක් නිකුත් කිරීමට යන බවට ද චෝදනා තිබේ. හානි පූරණයන් පිළිබඳ යම් පියවර ගැනීමක් ඉඩම් මුදා හැරීම මගින් කර තිබුණ ද තව බොහෝ දේ සිදු කිරීමට  ඉතිරිව තිබේ.

සමගි සන්ධානය හා සංක්‍රමණීය යුක්තිය පිළිබඳ අර්ථවත් පියවර ද ව්‍යවස්ථාමය පියවර හා සම්බන්ධ වේ. නිදසුන් ලෙස ශ්‍රී ලංකා නීතියෙහි අතුරුදහන් වීම් මෙන්ම මනුෂ්‍ය වර්ගයාට එරෙහි අනෙක් අපරාධ හා යුද අපරාධ අපරාධයන් ලෙස නොසැලකේ. යමක් ගැන නැවත මෙනෙහි කරන්නේ නම් නඩු විභාග සම්බන්ධයෙන් ද ප්‍රශ්න පැන නගින්නේ ය. නඩු පවරනුයේ කවරෙක් ද, ස්වාධීන නඩු පැවරීමේ කාර්යාලයක් තිබෙනවා ද හා විනිශ්චයකරුවන් සියලුදෙනාම ශ්‍රී ලාංකීයවන්නේ ද? ජන වාර්ගික ගැටුම පිළිබඳ දේශපාලන විසඳුමක් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත් කල එය පක්ෂ මැතිවරණ ප්‍රකාශනවලට අනුව  ඒකීය රාජ්‍යයේ සීමාවන් ඇතුළතම වුවකි. අනුෂංගිකව මෙය සියල්ලන් විසින් පිළිගනු ලැබ තිබෙන විටෙක ප්‍රශ්නය වනුයේ බලය බෙදීමේ වපසරිය මෙම රාමුව ඇතුළත ඉඩම් හා පොලිස් බලතල ලබා දීම පිළිබඳ එකක් වීම ය. ප්‍රධාන කොටස්කරුවා වන ෆෙඩරල් පක්ෂයේ මුද්‍රාව දරණ දෙමළ ජාතික සන්ධානය නව මැතිවරණ ප්‍රකාශණයේ ෆෙඩරල්වාදය ඉදිරිපත් කර තිබෙන අතර එසේ කිරීමෙන් දකුණේ ඒකීය රාජ්‍යයේ දැඩි හණමිටිකාර වීරයින්ගේ බෙදුම්වාදය පිළිබඳ බිහිසුණු අනතුරු



**විශේෂයෙන් උතුරේ දී මැතිවරණ ව්‍යාපාරය තුළ මේ සියල්ල උපයෝගී කර ගන්නවා ඇත. ඡන්දදායකයින් කෙරෙහි වන දෙමළ ජාතික සන්ධානයේ ප්‍රබල ප්‍රමුඛතාව දෙමළ ජාතිකවාදය කෙරෙහි වඩාත් දැඩි ආකර්ෂණයකින් යුත් ඡන්දදායකයින්ගේ තරුණ පරම්පරාව හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් විසින් සීමාසහිත දුරකට අභියෝගයට ලක් කරනු ලබන බව පෙනෙන්ට තිබේ.**



## ඉගෙනීම

පුතා මගෙන් මෙසේ අසයි :
"මා ගණිතය ඉගෙන ගන්නද ?"
මට සිතිණි මෙසේ පිළිතුරු දෙන්නට

"කුමටද? පාන් කෑලි දෙකක්, කෑලි
එකකට වඩා වැඩි බව ඕනෑම
කෙනෙකුට වැටහෙනු ඇති. ඉතින්
ගණිතය කුමකට ද?"

පුතා යළිදු මෙසේ විමසයි:
"මා ප්‍රංස බස දැන ගන්න ද?"
මට මෙවන් පිළිතුරක් නැගේ

"ඒ කුමටද ප්‍රංස බස? ඔබ කළ යුතුව
ඇත්තේ ඔබේ කුස පිරී මදිමින්
කෙඳිරිගෑම පමණයි. එ විට මිනිසුන්
ඔබට බඩගිනි බව තේරුම් ගනීවි."

හේ යළිත් මෙසේ අසයි;
"මා ඉතිහාසය හදාරන්න ද?"
මෙසේ සිතෙයි, මට.

"ඉතිහාසය කුමට ද? පළමුව ඔබේ ඔලුව
බේරා ගන්නට ඉගෙන ගන්න.
ඉන් පසුව සමහර විට ජීවිතය
ඉතිරිව තිබුණොත් ගණිතය, ප්‍රංස බස
පමණක් නොව ඉතිහාසයත් හදාරන්න යි"
මම කියමි.


**බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්**

පරිවර්තනය
**එස්.ජී. පුංචිහේවා**

හැඟවීම් සහිත විරෝධය හා හෙළා දැකීම අවුලුවා තිබේ. මෙය එක් අර්ථයකින් පැරණි කතාවම පුනරුච්චාරණය කිරීමකි. ෆෙඩරල් පක්ෂය ෆෙඩරල්වාදය නොමැතිව වෙන ඉල්ලා සිටිය යුත්තේ කුමක් ද? එය බිහි වූ තැන් සිටම සෑම මැතිවරණයක දී ම එය එසේ ඉදිරිපත් කර තිබේ. තව ද රටේ සෙසු කොටසෙහි විවේචකයෝ ෆෙඩරල්වාදය ක්‍රියාත්මක විය හැක්කේ එක්සත් රටක බව දනිති. ප්‍රශ්නය වනුයේ ඒකීය රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය හා ''ඒකීය'' හා ''එක්සත්'' (''unitary'' හා ''united'') යන වචන අතර හිතාමතාම ව්‍යාකූලත්වය ඇති කිරීම හා ඒවා විකෘති කිරීම ය.

විශේෂයෙන් උතුරේ දී මැතිවරණ ව්‍යාපාරය තුළ මේ සියල්ල උපයෝගී කර ගන්නවා ඇත. ඡන්දදායකයින් කෙරෙහි වන දෙමළ ජාතික සන්ධානයේ ප්‍රබල ප්‍රමුඛතාව දෙමළ ජාතිකවාදය කෙරෙහි වඩාත් දැඩි ආකර්ෂණයකින් යුත් ඡන්දදායකයින්ගේ තරුණ පරම්පරාව හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් විසින් සීමාසහිත දුරකට අභියෝගයට ලක් කරනු ලබන බව පෙනෙන්ට තිබේ. එමෙන්ම කැපී පෙනෙන ආකාරයකින් උච්ච වෙමින් පවතින දෛනික ජීවිතය හා ජීවිකා වෘත්තීන් හා සම්බන්ධ සමාජ-ආර්ථික ප්‍රශ්න ද තිබේ. දුක්ගැනවිලි දේශපාලනය සැලකිය යුතු තරම් කාලයක් තිස්සේ හා සාධාරණ හේතු සහිතව අන් සියල්ලට වඩා තුරුම්පුවක් කර ගනු ලැබ තිබේ. එයට තවමත් සැලකිය යුතු තරම් වන අදාලත්වයක් පවතින්නේ වී නමුදු යුද්ධය නිමාවී වසර හයක් ගතවී ඇති මේ අවස්ථාවේ දී දේශපාලන ක්‍රියාකාරීත්වයෙහි එකම තාර්කිකය ලෙස එයට හිමිවූ ප්‍රමුඛතාවය අහිමිවීමට ඉඩ ඇත.

මැතිවරණයේ ප්‍රතිඵලය කුමක් වුව ද ඊළඟ පාර්ලිමේන්තුවට මෙන්ම රටේ පුරවැසියන්ට ද ඔවුන් විසින් ඉටුකිරීමට නියමිතව ඇති කාර්යයන් දැනටමත් පෙලගැස්වී ඇත..





ආචාර්ය
**දීපිකා උඩගම**

# නීතියේ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ පොරොන්දු

ලංකාවේ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශනයන් පිළිබඳ මතකය දශක කීපයක් ඈතට දිව යයි. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්වල ඉතාම වැදගත් ප්‍රතිපත්තීන් ඉදිරිපත් විය. උදාහරණ විදියට 1970 වාමාංශික එක්සත් පෙරමුණු ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සඳහන් වූයේ ජනරජ ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන බවයි. එසේම 1977 මැතිවරණයට ඉදිරිපත් වුණු එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වූයේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන බවයි. ඉන් රටේ දේශපාලන ව්‍යුහය විශාල වෙනසකට පත් වන බවයි. එවැනි දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත්

www.mahinda2015.com




**වර්තමාන වර්තමාන තත්ත්වය දෙස බලනවිට පෙනෙන්නේ මහින්ද චින්තනය ඉදිරිපත් වුණාට පසු වඩාත් සවිස්තරාත්මක ලෙස පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් පිළිබඳ සංවාද ගොඩ නැගුණු බවයි. එය දේශපාලන ක්ෂේත්‍රයේ ව්‍යවහාර වුයේ එක් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හැටියට නොව රජයේ ප්‍රතිපත්තිය හැටියටයි.**

විය. නමුත් දේශපාලන සම්ප්‍රදායන් සහ සංස්කෘතීන් එක්ක බලනකොට කෙතරම් දුරට ඡන්දදායකයන් මේ ගැන අවධානය යොමු කළාද යන්න අපි විපරම්කාරීව විමසා බලමු. මගේ මතය හැටියට නම් දැන් රටේ යම්කිසි රජයකට තියෙන අප්‍රසාදය ඇත්තේ එක්කෝ බඩුමිල පිළිබඳව, එක්කෝ ප්‍රජාතන්ත්‍ර විරෝධීව හැසිරෙන එක පිළිබඳවයි. ජනතාවට ඇති සිතුම් පැතුම් අනුව ඒ ඒ රජයන් පත් කර ගැනීම හෝ ඉවත්කර ගැනීම සිදුවෙයි. ජන්ද දායකයින් ප්‍රතිපත්ති ප්‍රකාශ එතරම් වැදගත් ලියවිල්ලක් ලෙසට සැලකීමක් නොකරති.

**මහින්ද චින්තනය**

වර්තමාන තත්ත්වය දෙස බලනවිට පෙනෙන්නේ මහින්ද චින්තනය ඉදිරිපත් වුණාට පසු වඩාත් සවිස්තරාත්මක ලෙස පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් පිළිබඳ සංවාද ගොඩ නැගුණු බවයි. එය දේශපාලන ක්ෂේත්‍රයේ ව්‍යවහාර වුයේ එක් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හැටියට නොව රජයේ ප්‍රතිපත්තිය හැටියටයි. මහින්ද රාජපක්ෂ තේරී පත්වීමෙන් එය රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය චින්තය බවට පත් විය. මේ නිසාම ජනතාව මේ ප්‍රතිපත්ති ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කිරීම ආරම්භ විය. මහින්ද රාජපක්ෂ කෙරෙහි පසුගිය ධූරකාල දෙකෙහිදී ම විශාල වශයෙන් අවධානයක් යොමු වුයේ පෙර නොවූ ලෙසටය. ඉන් ගම්‍ය වන්නේ මීට පෙර වූ ප්‍රතිපත්ති ප්‍රකාශනවලට අවධානයක් යොමු නොවූ බවයි. එහි දී පෙනෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම නිර්මාණය වෙන්නේ මහින්ද චින්තනය යටතේ බවයි. එහිදී ප්‍රතිපත්ති පිළිබඳව සුපරික්ෂාකාරීව වග විභාග කිරීමක් විය. නමුත් එහි දී වැදගත් වන්නේ එය ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළ පුද්ගලයෙක්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් වීමයි. එය ඉදිරිපත් වූයේ පක්ෂයකින් ඉදිරිපත්වන ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ලෙස නොව පුද්ගලයෙක්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හැටියටයි. එහි දී පක්ෂය දුරස් වී මහින්ද රාජපක්ෂ කියන පුද්ගල චරිතය ඉස්මතුවීමක් දැකිය හැකිය. පුද්ගල බද්ධ න්‍යාය පත්‍රය සහ දේශපාලන යෝජනා මුළු රාජ්‍ය තන්ත්‍රයේම ප්‍රතිපත්ති බවට පත්වීම හේතුවෙන් අපි මේ පිළිබඳව වඩාත් අවධානය යොමු කරන්නෙමු. අප හිතන්නේ මේ පිළිබඳ සාමාන්‍ය ඡන්ද දායකයා පමණක් නොව රටේ පොදු ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරන විද්වතුන් පවා විශාල වශයෙන් අවධානය යොමු කිරීමට පටන් ගත් බවයි. එහි වැදගත්කමක් තිබේ. රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දෑ කොතරම් දුරට සිදු වේද යන්න සංසන්දනය කිරීම වැදගත්ය. එහි ගුණාත්මක කාරණා සැලකිල්ලට ගෙන බලමු. නිදසුනක් ලෙස ගත් විට පළමුවන මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමට පොරොන්දු විය. ඒ නිසා ම ඉතාමත්ම පැහැදිලි, භාරදූර ප්‍රතිපත්ති එහි සඳහන් විය. නමුත් ඒවා සිදුනොවුණු බව ජනතාවට ප්‍රත්‍යක්ෂ විය. දැන් මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව නොයෙක් විශ්ව විද්‍යාලවල සිදු කරන්නට යෙදුණු ප්‍රතිපත්ති ඔස්සේ පැහැදිලිව පෙනුණු කරුණක් වන්නේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හැටියටත් ඒ දේවල් ඒ ආකාරයෙන් ම සිදු නොවුණු බවයි. මේ අනුව එවැනි ප්‍රතිපත්ති ප්‍රකාශවල තිබෙන දේශපාලන යථාර්ථය හා ප්‍රතිපත්ති අතර ඇති පරස්පරය අපිට හඳුනාගත හැකි ය.

පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශන හැම අවස්ථාවකම ප්‍රජාතන්ත්‍රවාදීව ඉදිරිපත් වන්නේ ඒ හේතුවෙනි. අපිට මීන් පෙර එවැනි පරිචයක්




**බලය බෙදීම සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳ ජනතාව බොහෝදුරට විපරම්කාරීව විමසති. ඒ හේතුවෙන් සංවේදී යැයි හැඟෙන කරුණු සවිස්තරව සඳහන් නොකිරීම දුර්වලතාවයකි. ප්‍රශ්නය වන්නේ ඒ සංවේදී යැයි කියන ප්‍රශ්න ජනතාවට වැදගත් විමයි. ඒ නිසාම ඒවා සවිස්තරාත්මකව දැක්විය යුතුය.**

නොතිබුණේය. ප්‍රායෝගික තලයේ අපි ඒවා සමග ක්‍රියා කළේද නැත. මැතිවරණයෙන් පසු එම ප්‍රතිපත්ති ප්‍රකාශන අමතක කර දැමුවා සේම නැවත ඒ පිළිබඳව සලකා බැලීමට ගියේද නැත.

### දින සීයේ යහපාලන ප්‍රතිපත්තිය

ජනවාරි 8 වෙනිදා ඡන්දයට ඉදිරිපත් වුණ ප්‍රතිපත්ති ප්‍රකාශනය, විශේෂයෙන්ම අපි නොදැන හිටපු ජනාධිපති අපේක්ෂකයා වූ මෛත්‍රීපාල සිරිසේනගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙරෙහි විශාල අවධානයක් යොමු විය. වර්තමානයේ හැම පක්ෂයකම ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන විශාල අවධානයක් යොමු වෙයි. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය දෙස බලන විට රටේ ජනතාවගේ අපේක්ෂාව වුයේ නොයෙකුත් කරුණු පිළිබඳව සවිස්තරාත්මක ප්‍රතිපත්ති ප්‍රකාශනයක් බවට පත්වේය යන්නයි. ඊට හේතුව වුයේ ජනාධිපති සිරිසේන මැතිතුමාගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේදී සඳහන් වු දින සියයේ වැඩ පිළිවෙලෙහි ඉදිරි ඉලක්කය එතනදී පෙන්නුම් කිරීමයි. නමුත් අවුරුදු පහකට බලය ලබාගෙන පාර්ලිමේන්තුවේ කාර්යය තුළ ඉටු කෙරෙන ඒ කර්තව්‍යන් පිළිබඳව ජනතාවට වැඩි අපේක්ෂාවක් සහිතව ප්‍රතිපත්ති ඉදිරිපත් වෙතැයි ජනතාව බලාපොරොත්තු විය. උදාහරණයක් ලෙස එජාපය සංහිඳියාව හා වාර්ගික ප්‍රශ්නය පිළිබඳව විශාල අවධානයක් තිබුණු කණ්ඩායමක් හේතුවෙන් සුළුජන කොටස් විශේෂයෙන්ම ඒ පිළිබඳව බලාපොරොත්තු විය. පසුගිය ජනාධිපතිවරණ ප්‍රතිඵලයෙන් පසුව සුළුජන කොටස්වල ඡන්ද ආකර්ෂණය කර ගැනීම එක්සත් ජාතික පක්ෂය නොසලකා ඇත. එම හේතුව නිසාම විශාල බලාපොරොත්තුවක් වුයේ ඒ පිළිබඳව සවිස්තරාත්මක විදියට කරුණු දැක්වේ යැයි කියා ය. නමුත් ආර්ථික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සෑහෙන්න සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් වී ඇත. ප්‍රතිපත්ති ප්‍රකාශනයක ඉලක්ක පෙන්නුම් කිරීමට කිසිම බාධාවක් නැත. උදාහරණයක් විදියට පළවෙනි මාස හයේ මේ මේ ඉලක්ක කරා යන බවත් පළවෙනි වසරේදී මේ මේ ඉලක්කය කරා යන බවත් ආදී වශයෙන් සඳහන් වීමේ ගැටළුවක් නැත. එනමුත් ප්‍රතිපත්තිය ප්‍රකාශනයට පත් කිරීම අවශ්‍යවේ. එහි හරය, වන්නේ එය පාදක වෙන කරුණු පසුබිම ගැන ජනතාවට අවබෝධය ලබා දීමටය.

### සංවේදී කරුණු සඟවා තිබීම

බලය බෙදීම සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳ ජනතාව බොහෝ දුරට විපරම්කාරීව විමසති. ඒ හේතුවෙන් සංවේදී යැයි හැඟෙන කරුණු සවිස්තරව සඳහන් නොකිරීම දුර්වලතාවයකි. ප්‍රශ්නය වන්නේ ඒ සංවේදී යැයි කියන ප්‍රශ්න ජනතාවට වැදගත් විමයි. ඒ නිසාම ඒවා සවිස්තරාත්මකව දැක්විය යුතුය. උදාහරණයක් හැටියට, කෙනෙක් හිතන්න පුළුවන් යම් පක්ෂයක එකීය රටක් නැතුව කතා කිරීම තුළ යම් කිසි ඡන්ද ප්‍රමාණයක් ගන්න පුළුවන් බව. මෙලෙස පැහැදිලි ලෙසට ප්‍රකාශ නොකිරීම තුළ එහිදී විචිකිච්ඡාවක් ඇති විය හැකිය. එය ප්‍රජාතන්ත්‍රීය පරිචයට නුසුදුසු ය. මන්ද පක්ෂයකට යම්කිසි පැහැදිලි දැක්මක් තිබිය යුතු ය. විශේෂයෙන්ම මේ එය රටේ පැවැත්මට ඉතාම වැදගත්වන කෙන්ද්‍රීය ගැටලුවක් වන බැවිනි.

එඩාත් වැදගත් දේ වන්නේ, දේශපාලන පක්ෂ බොහෝ දුරට ක්‍රියා කරන්නේ තමන් වෙත ඡන්ද ආකර්ෂණය කර ගැනීමට වීමයි. එහිදී යම් ආකාරයක අපැහැදිලි ස්ථාවරයක් පක්ෂ



**මෙවර ප්‍රතිපත්ති ප්‍රකාශනවල විවිධත්වයක් පවතින අතර එසේ විවිධත්වයක් පැවතීම වැදගත් ය. මේ විවිධත්වය ඔස්සේ මිනිස්සු තෝරා බේරා ගනිමින් තම ඡන්දය භාවිත කර තමන්ගේ ස්ථාවරය දරන පක්ෂය තෝරගනී. මෙහි දී යම් කිසි පක්ෂයකට රජයක් පිහිටුවා ගැනීමට නොහැකිව වෙනත් පක්ෂ සමග සන්ධාන ගත වීමක් අවශ්‍ය වුවහොත් ගැටළු මතු වේ.**

දරන්නේ යම්කිසි ස්ථාවරයක් ජනතාව අතර ජනප්‍රිය වෙන්නේ නැතැයි සිතීම නිසා ය. එය දේශපාලන යථාර්ථය විය හැකිය. සංවේදී කරුණු පිළිබඳ ජනතාව බලාපොරොත්තු වන්නේ ඉහළ මට්ටමකින් එම කරුණු දැක්විය යුතු බවයි. නමුත් යම්කිසි ප්‍රතිපත්ති ප්‍රකාශනයක බදු සම්බන්ධව ජනප්‍රිය වීම අවශ්‍ය නම් බදු බරින් බෝහෝ දුරට ජනතාව නිදහස් කිරීම හා ඉතාමත්ම සීමිත ආකාරයේ බදු පමණක් පනවන බව පැවසිය හැකිය. නමුත් එහිදී ජනතාවට ඒ කෙරෙහි විශ්වසනීයත්වය පිළිබඳව ප්‍රශ්නයක් ඇති වේ. ඊට හේතුව වන්නේ ඡන්ද දායකයන් නිරන්තරයෙන්ම අපි ඉස්සර වගේ මෝඩ නැතැයි පැවසීම ය. පෙර පරිදි අමනෝඥ විදියට ඡන්දය නොදෙන බව පැවසීම ය. තම පවුලේ ඡන්ද භාවිතය කෙසේද එහෙම නැත්නම් යම් කිසි අවස්ථාවක තමන්ට ලැබෙන බත් පැකට්ටුවක් වැනි දෙයක් නිසා ඡන්දය භාවිත නොකරන බව ය. නමුත් ඒවාට යටවෙන අයත් සිටිය හැකිය. එලෙස යටනොවන ජනතාව ඡන්ද ප්‍රකාශන කියවීමට පෙළඹෙන ජනතාව වන බැවින් එම අභිලාශයන්ට සරිලන ආකාරයෙන් ප්‍රතිපත්ති ප්‍රකාශන තුළ මේ ප්‍රශ්න සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය වේ. ඡන්දදායකයා දැනුවත් කිරීමත් ඔවුන්ට කරුණු අවබෝධ කර දීමත් සම්බන්ධයෙන් මෙය හොඳ අවස්ථාවක්ය.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි විවිධත්වය

මෙවර ප්‍රතිපත්ති ප්‍රකාශනවල විවිධත්වයක් පවතින අතර එසේ විවිධත්වයක් පැවතීම වැදගත් ය. මේ විවිධත්වය ඔස්සේ මිනිස්සු තෝරා බේරා ගනිමින් තම ඡන්දය භාවිත කර තමන්ගේ ස්ථාවරය දරන පක්ෂය තෝරගනී. මෙහි දී යම් කිසි පක්ෂයකට රජයක් පිහිටුවා ගැනීමට නොහැකිව වෙනත් පක්ෂ සමග සන්ධාන ගත වීමක් අවශ්‍ය වුවහොත් ගැටළු මතු වේ. මන්ද යම් යම් වැදගත් කරුණු සම්බන්ධව පරස්පර විරෝධීතාවන් තිබීම හේතුවෙන් වෙනත් මාර්ගවල ඒ ඒ ප්‍රතිපත්ති දිවෙනවා නම් එතනදී ඒ ප්‍රශ්නය ඇති විය හැකිය. මෙහි දී දේශපාලන ඉතිහාසය දිහා බලන කොට ඉංග්‍රීසි කියමනක් අපට සිහි වේ. එනම් Politic makes bet fellows බවයි. ඕනෑම දෙයක් ප්‍රායෝගික තලයේ විය හැකි බව එහි අදහසයි.

දෙමළ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ඔවුන් නොබෙදුණු රටක් පිළිබඳ සඳහන් කිරීම හේතුවෙන් වෙනම දේශයක් නොඉල්ලන බව පෙනේ. එය හොඳ පියවරකි. එක පැත්තකින් ඔවුන් අදහස් කරන්නේ ෆෙඩරල් ක්‍රමයක් ඇති කරනවා කියන අදහස ය. එය 13 වන සංශෝධනයට බොහෝ ඈතට ගොස් ඇත. නමුත් ෆෙඩරල් ක්‍රමයකට නොයා උපරිම බලය බෙදීමේ පියවරකට යන්නේ නම් එය විශාල පරස්පරයක් නොවෙයි. එකම දේ වන්නේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සීමා වීමේ ප්‍රශ්නයකි. නමුත් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලංකාවේ කිසිලෙසකින්වත් පූර්ණව ක්‍රියාත්මක වුයේ නැත. එය පොලිස් හා ඉඩම් බලතල සහිතව නිසි ආකාරයට ක්‍රියාත්මක වෙනවා නම් එතනදී විශාල පරතරයක් දැකිය නොහැකි ය. නමුත් ඔවුන් එතැන නිශ්චිතවම පැහැදිලි ප්‍රකාශයක් දක්වා නැත.

එක්සත් ජාතික පක්ෂය සහ ද්‍රවිඩ සන්ධානය පවසන දෙය අතර විශාල පරස්පරයක් දැකිය නොහැක. නමුත් 13 වන ව්‍යවස්ථා සංශෝධනයට ඔබ්බෙන් නොගියද එය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනවා නම් සෑහෙන බලය බෙදීමක් සිදු විය හැකිය.

www.omlanka.com



**රාජපක්ෂ පාලන තන්ත්‍රය මූලික ලක්ෂණයක් වූ උතුරු නැගෙ නහිර මිලිටරීකරණය කර හමුදාව මගින් මධ්‍යම ආණ්ඩුව සමග සබදතා තබා ගැනීමටයි උත්සහ ගත්තේය. එම නිසා සියලුම අපේක්ෂාවන් ඒ කියන්නේ යම්කිසි ආකාරයක බලය බෙදීමෙන් ඒ පළාත්බදව කරන්න තියෙන දේවල් නිසියාකාරයට කළ හැකිය යන්න පිළිබඳව එම විවේචනය ම ප්‍රමාණවත්ය.**

නමුත් එය මධ්‍යම ආණ්ඩුවේ යම් යම් සීමාවන්ට යටත්වය. මෙහිදී ආකෘතිමය වශයෙන් ප්‍රශ්නයක් ඇත. ආණ්ඩුකාරයා මාර්ගයෙන් ජනාධිපතිවරයාට විශාල වශයෙන් පාලනය කර ගැනීමේ හැකියාවක් ඇත. එතැනදි 13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ දුර්වලතා තිබුණත් ප්‍රාදේශීය මට්ටමෙන්, පළාත් මට්ටමෙන් ජනතාවට තමන්ගේ ජීවිතය හා අනාගතය පිළිබඳව තීරණ ගැනීමට අවශ්‍ය නිදහස ලබා දීම කියන අරමුණින් මෙය ක්‍රියාත්මක කළේ නම් ඔය කියන ප්‍රතිපාදනත් සෑහෙන්න දුරට ප්‍රමාණවත්ය. එසේම එම බලතල නිර්මාණශීලිව භාවිත කර තිබෙනවා පැවසීම අපහසුයි.

### උතුරු පළාත් සභාවේ බල එදිරිවාදිත්වය

ජනවාරි මාසය වෙනතෙක් පැහැදිලි එදිරිවාදීකමක් උතුරු පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුවත් අතර තිබුණි. එතැන විශාල වශයෙන් නැගුණු විවේචනයක් වුයේ මිලිටරීකරණයයි. ආණ්ඩුකාරවරයා හෝ එවැනි පුද්ගලයෙකු හරහා මිලිටරීකරණය බොහෝම තදින් සිදු විය. ඒ නිසා ජන ජීවිතයට නොයෙකුත් ප්‍රශ්න ගොඩනැගී තිබුණි. ඒ වගේම නොයෙකුත් ආකාරයෙන් මධ්‍යම රජය බලපෑම් කිරීම සිදු විය. ඒ නිසා තමන්ගේ බලතල නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට සීමාවක් තිබෙන බව අපිට පහුගිය කාලේ අසන්නට ලැබුණ දෙයකි. එහි එක් සත්‍යතාවක් තියෙන බව අපි පිළිගත යුතුය. ඒ වාතාවරණය සහයෝගීතාවයක් තියෙන වාතාවරණයක් නොවන අතර විශාල වශයෙන් සැකකටයුතු සම්බන්ධතාවක් තිබේ. ජනවාරි මාසයේ මෙම තත්වය වෙනස් වී සිවිල් ආණ්ඩුකාරවරයෙක් පත් කොට ජනාධිපතිවරයාත් කීප වතාවක්ම උතුරට දේශපාලකයන් හා ජනතාව මුණ ගැහෙන්න යාම හොද ප්‍රවණතාවයකි. එසේම මේ වන විට යම්කිසි විදියකට සංහිඳියාව පිළිබඳව බොහොම ධනාත්මකව ආරම්භයක් ඇති කිරීමට ප්‍රයත්න දැරීමක්ද දැකිය හැකිය.

ජනවාරි මාසයේ සිට ඒ කාලවකවානුව දිහා බලන විට එම කාලය හරිම කෙටි ය. කෙනෙකුට කියන්න පුළුවන් මෙම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තියෙන පලාත් සභාවල ධනාත්මක ලක්ෂණ පවා නිසි ආකාරයට ප්‍රයෝජන ගෙන නොගෙන කියන විවේචනයක් ඉදිරිපත් කරන්න ඒ කාලය අපට මදිය. විශේෂයෙන්ම මතක තියා ගත යුතු කරුණ වන්නේ අවුරුදු 26ක කාලයක් යුද්ධයකට වෙළිලා තිබුණ ප්‍රදේශයක, එහි සමාජ ක්‍රමය, මුළු ආර්ථික ක්‍රමය, දේශපාලන ක්‍රමය, මිනිසුන්ගේ සිත් සතන් මේ සියල්ලම යථාතත්වයට පත් කරන්න අවුරුදු 2ක කාලයක් බොහෝම කෙටි බවයි.

ප්‍රඥප්තීන්වලට වඩා වැඩිය ආණ්ඩුකාරවරයා සංකේතාත්මකවත් මිලිටරි පාලනයෙන් මුක්ත කිරීමට තිබුණු අකමැතිබව, හේතුවෙන් උතුරු පළාත් සභාව "අපට අපේ බලතල ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැයි" කියන එක කිව හැකිය. එසේම රාජපක්ෂ පාලන තන්ත්‍රය මූලික ලක්ෂණයක් වූ උතුරු නැගෙනහිර මිලිටරීකරණය කර හමුදාව මගින් මධ්‍යම ආණ්ඩුව සමග සබදතා තබා ගැනීමටයි උත්සහ ගත්තේය. එම නිසා සියලුම අපේක්ෂාවන් ඒ කියන්නේ යම්කිසි ආකාරයක බලය බෙදීමෙන් ඒ පළාත්බදව කරන්න තියෙන දේවල් නිසියාකාරයට කළ හැකිය යන්න පිළිබඳව එම විවේචනය ම ප්‍රමාණවත්ය.

www.onlanka.com



**මෙහිදී බලයට පත්වන ආණ්ඩුවේ මුඛ්‍ය වගකීම වන්නේ ප්‍රජාතන්ත්‍රීකරණයට මුල් තැන දීම ය. අපට සංහිඳියාව ළං කරගැනීම හෝ ජනතාව අතර ඇති සුහදතාව හා බැඳීම වර්ධනය කිරීම ප්‍රජාතන්ත්‍රීය පරිසරයක් නැතිව කළ නොහැකිය. ඒ නිසා මුඛ්‍ය පරමාර්ථය විය යුත්තේ රට ප්‍රජාතන්ත්‍රීයකරණය කිරීමයි.**

අනික් අතට මේ වගේ ක්‍රමයක් ක්‍රියාත්මක වෙනකොට යම් කිසි ආකාරයක දේශපාලන කැපවීමක් තිබීම ඉතාමත්ම වැදගත්ය. දකුණු පළාත් ආදී අනෙකුත් පළාත්වල ඉතාම අවම වශයෙනි ප්‍රඥප්තීන් නිර්මාණය වී ඇත්තේ. එයට විශේෂ දක්ෂතාවයක් අවශ්‍ය නැති අතර හැකියාව පිළිබඳ ප්‍රශ්නය ඇත. ඒවාට සම්ප්‍රදායක් ගොඩ නැගිම අවශ්‍ය වේ. පාර්ලිමේන්තුවේ නම් දශක ගණනාවක් ඒ සම්ප්‍රදාය බිහි වි ඇත. ඒ පළාත්වල දැනුම තියෙන, කුසලතා තියෙන සන්දර්භය ඉතා අවම ය. මෙතන වන්නේ එදිරිවාදී පරිසරයක් තුළ තමයි මේ අය අපිට වැඩ කරන්න සැලසුවේ කියන කාරණයයි. ඒ නිසා යුද්ධයෙන් මිදුණු අවස්ථාවකදී වසර ගණනාවට පසු වඩාත් අපහසුවෙන් ඡන්දයක් පැවැත්විණ. මේ මුළු සන්දර්භය දිහාම බලන විට ඔවුන්ට තිබුණ විශාලම හා එල්ල කරන්න පුළුවන් ප්‍රධානම විවේචනය වන්නේ ඔබලාගේ තියෙන මිලිටරීකරණ ග්‍රහණයෙන් මුදන්න කිසිවක් කරන්න නැති බවයි. අපිත් සමග තියෙන සබඳතා බොහෝම එදිරිවාදීව පවත්වාගෙන යනාදී වශයෙන්ය. අප මේ සඳහා කාලය දිය යුතු ය. මන්ද ළාබාල වියේ පසුවන මේ ආයතනවලට සිය ක්‍රියාදාමයන් පවත්වා ගැනීමට ය. එනම් පළාත්බදව පවතින දේශපාලනය හා පරිපාලනය නිසිලෙස සකස් කරගෙන නිසියාකාරව කටයුතු කරන්න අප කාලයක් දිය යුතුයි.

### ප්‍රජාතන්ත්‍රවාදි පරිසරය තුළ සංහිඳියාව

මෙහිදී බලයට පත්වන ආණ්ඩුවේ මුඛ්‍ය වගකීම වන්නේ ප්‍රජාතන්ත්‍රීකරණයට මුල් තැන දීම ය. අපට සංහිඳියාව ළං කරගැනීම හෝ ජනතාව අතර ඇති සුහදතාව හා බැඳීම වර්ධනය කිරීම ප්‍රජාතන්ත්‍රීය පරිසරයක් නැතිව කළ නොහැකිය. ඒ නිසා මුඛ්‍ය පරමාර්ථය විය යුත්තේ රට ප්‍රජාතන්ත්‍රීයකරණය කිරීමයි. නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීමයි. ජනතාවගේ අයිතිවාසිකම්වලට ගරු කරන ආකාරයේ රාජ්‍ය තන්ත්‍රයක් නිර්මාණය කිරීමයි . ඒ ප්‍රයත්නය ඉතාමත් හෘදයාංගමයෙන්ම බොහොම ඉහළ සද්භාවයෙන්ම සිදු වෙනවා නම් ඒක ජනතාව පිළිගනු ඇත. එවිට සංහිඳියාව පිළිබඳව නොයෙකුත් විදියේ ඉදිරිපත් කිරීම, ක්‍රියාත්මක කිරීම ඉතාම පහසු ක්‍රියාවක් වේ . එහිදී විශ්වසනීයත්වය ජනතාවත් සමග ගොඩනගාගෙන ඇති බැවිනි. මෙහිදී දේශපාලන පක්ෂය කටයුතු කරන ආකාරය රජය තුළ සිදුවන ක්‍රියාදාමය, ප්‍රතිපත්ති නිර්මාණය කරන ක්‍රමය, ක්‍රියාත්මක කරන ආකාරය, පත්කරන පුද්ගලයෝ ක්‍රියාත්මක වෙන ආකාරය හා මොන පදනම මතද ඔවුන් පත් කරන්නේ යන කරුනු මත ජනතාවට ඉඟි ලබා ගත හැකිය. ඒ විශ්වසනීයත්වය මතින් පත්වන රජයකට හැකියාව ලැබෙන්නේ දැවෙන ජාතික සංහිඳියාව කියන ප්‍රශ්නය සමග රටේ ආර්ථිකය ගොඩනගා එහි ප්‍රතිලාභ ජනතාවගේ ජීවිතවලට සමීප කිරීම ය. මේවා හොඳින් කළ හැක්කේ අදාල විශ්වාසනීයත්වය ගොඩ නැගුණොත් පමණි. ඇතැම් අය ප්‍රකාශ කරන්නේ ජාතික සංහිඳියාව මුලින්ම ඇති කළ යුතු බවයි. නමුත් නීතියේ ආධිපත්‍යත් නැති තැන, නීතියේ ආධිපත්‍ය දුර්වල තැන, ප්‍රජාතන්ත්‍රීය ආයතන නිසි පරිදි කටයුතු නොවන තැනක සැබෑ සංහිඳියාවක් ගොඩ නොනැගේ. ●





මහාචාර්ය
**කුමාර් ඩේවිඩ්**

# ආර්ථිකයේ වෙනසක් ඇති වුවත් ජාතික ප්‍රශ්නය විසඳේද?

මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජයග්‍රහණය මා දකින්නේ ඔහුගේ ජයග්‍රහණයකට වඩා මහින්ද රාජපක්ෂව ප්‍රතික්ෂේප කිරීමක් ලෙසට ය. රාජපක්ෂ පිළිබඳ විශාල චෝදනා, සහ කළකිරීම් තිබුණි. දූෂණය, නීතියේ ආධිපත්‍ය බිඳවැටීම, අනවශ්‍ය ලෙස සුළු ජාතීන් මත බලය පාවිච්චි කිරීම, මැරවරකම්, කුඩු ජාවාරම්, රජයේ දේපොළ මංකොල්ල කෑම වැනි බොහෝ දේ ඒ චෝදනාවලට ඇතුලත් ය. රාජපක්ෂගේ රජය යන්නෙන් අදහස් වන්නේ රාජපක්ෂ පමණක් හෝ ඔහුගේ සමස්ථ පවුල පමණක් ම නොවේ. ඒ සාධක යුගල ඉතාම වැදගත් වන අතර ම ඒවාට අමතරව රජයේ යාන්ත්‍රණය, මැති ඇමතිවරු, පළාත් සභාවල හා ප්‍රාදේශිය සභාවල පිරිස ද මෙයට අයත් ය. මේ සමස්ථ යාන්ත්‍රණය පිළිබඳවම විශාල අප්‍රසාදයක් රටේ තිබුණි. මගේ පෞද්ගලික මතයට අනුව ලංකාවේ කිසිම රජයක් ගැන මෙවැනි අප්‍රසාදයක් තිබී නැත. ලැබෙන තොරතුරු වලට

www.Sri Lanka.com



**පොදුවේ පවසන්නේ නම් මෛත්‍රීපාල ජනාධිපතිගේ ජයග්‍රහණය වාමාංශික නැත්නම් සමාජවාදී ඇසකින් මා බලන්නේ නැත. සම්පූර්ණයෙන් මෙය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ලැබූ ජයග්‍රහණය ක් ලෙසයි මා මෙය දකින්නේ. මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණයේ වැදගත්කම වන්නේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වී යන අවස්ථාවකදී ඒ ටිකවත් ආරක්ෂා කර ගැනීමට හැකිවීම ය.**

අනුව මේ රටේ තිබී ඇත්තේ ආර්ථික මාෆියාවකි. රාජපක්ෂව පරාජය කරන්නට හැකිවුයේ ද මේ කරුණු නිසාම ය.

දෙවනුව මම දකින්නේ ජනවාරි 8 ජයග්‍රහණයේ උපක්‍රමය ඉතා ශුක්ෂම, සංවේදී සහ බුද්ධිමත් උපක්‍රමයකි. චන්ද්‍රිකා සහ රනිල්ගේ එම උපාය දැනගෙන සිටියේ 4-5 දෙනෙක්ගේ පිරිසක් බවයි මට පෙනෙන්නේ. තුන්වැනි ව ඒ ජයග්‍රහණය තුළින් ව්‍යවස්ථාව වෙනස් කරගැනීමේ බලාපොරොත්තුවක් තිබුණි. හොරුන්ට එරෙහි ව නීතිමය පියවරක් ගැනීම, නීතියේ ආධිපත්‍ය පිහිටුවීම වැනි ධනාත්මක පැත්ත ගැන බොහෝ දෙනෙක් සිතූ හ. ව්‍යවස්ථාව වෙනස් කරගැනීම සම්බන්ධයෙන් නම් අනිවාර්ය විශ්වාසයක් තිබුණි ඒ බලාපොරොත්තු 50%ක් පමණ ඉටුවුවා යැයි කිව හැක. 19 වැනි සංශෝධනයේ තිබෙන්නේ ඇත්තටම පළවෙනි මට්ටමෙන් බලාපොරොත්තු වූ ඒවා නොවේ. ඒ අනුව මෙය දෙවන පංතියේ ජනතා ජයග්‍රහණයකි. බලතල අඩු කළා මිස විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළේ නැත. පාර්ලිමේන්තු ක්‍රමයට යන්නට කිසියම් යාන්ත්‍රණයක් ගෙනෙන්න උත්සාහයක් දැරී ය. එය කිසියම් දුරකට සාර්ථක විය. ව්‍යවස්ථාදායක සභාව අසාර්ථක වුණි. ප්‍රධාන වශයෙන් මා දකින ජයග්‍රහණ සහ පරාජයන් එසේ ය.

පොදුවේ පවසන්නේ නම් මෛත්‍රීපාල ජනාධිපතිගේ ජයග්‍රහණය වාමාංශික නැත්නම් සමාජවාදී ඇසකින් මා බලන්නේ නැත. සම්පූර්ණයෙන් මෙය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ලැබූ ජයග්‍රහණය ක් ලෙසයි මා මෙය දකින්නේ. මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණයේ වැදගත්කම වන්නේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වී යන අවස්ථාවකදී ඒ ටිකවත් ආරක්ෂා කර ගැනීමට හැකිවීම ය.

ජනවාරි 8 ජයග්‍රහණයේ මේ මැතිවරණයට බලපාන්නේ විශාල වශයෙන් එක්සත් ජාතික පක්ෂයට වාසියක් ලෙසට ය. මෛත්‍රීපාල සිරිසේන ගත්ත ඡන්ද ඇත්තට ම එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම බවට මිනිසුන්ට අවබෝධයක් ඇත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර ඡන්ද ද ලැබුණි. සුළු ජාතික ඡන්ද විශාල ඡන්ද ප්‍රතිශතයක් මෙයට දායක විය. නමුත් මෛත්‍රීපාලට ලැබුණු ඡන්දයේ පදනම එක්සත් ජාතික පක්ෂයේ ය.

කෙසේ නමුත් අලියා සළකුණ අතහැර එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද හංසයා ට ලබා ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නයක් තිබුණි. නමුත් පළමුවැනි පියවර ලෙස අලියා සළකුණ අතහැරීමට රනිල් තම පක්ෂය එකගකර ගත්තේ ය. ඒ ආකාරයට එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම එතැනට ගෙනෙන්නට රනිල් සමත් විය. එතනින් පසු තව පක්ෂ හා සංවිධාන රාශියක් එක්කර ගැනින. මේ සියල්ල එක්වූ පසු එජාපය යනු විශාල බලයකි. එය මේ මැතිවරණයට බලපාන ආකාරය පැහැදිළි කරගැනීමට ප්‍රථම විරුද්ධ පක්ෂයේ පෙළ ගැසීම ද නිරීක්ෂණය කළ යුතු ය.

මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණය විපක්ෂයට බලපෑවේ තවත් විධියකට ය. වාසුදේව, ගම්මන්පිල, විමල් වීරවංශ සහ සහ දිනේෂ් ගුණවර්ධන මෙහි දි විශාල මෝඩකමක් කළ හ. ඒ මෝඩකම වන්නේ අගමැති කරවන බව පවසා මහින්ද රාජපක්ෂ වටා රටේ විශාල රැල්ලක් ඇති කිරීම ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විශාල කොටසක් එයින් උණුසුම් විය. එහි ප්‍රතිඵලය ලෙස මහින්ද රාජපක්ෂ ප්‍රතික්ෂේප කරන සියල්ලෝ ම එකට එක්කෙරින. අවසානයේ රනිල්ට එය දැන් විශාල වාසියක් වී තිබේ. මහින්ද රාජපක්ෂ නොපැමිණියේ නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙවැනි අර්බුදයකට යන්නේ නැත. විය හැකිව තිබුනේ කොටසක් කැඩීගොස් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ විශාල කෝලහලයක් ඇති වීම ය. කළ නොහැකි දෙයක් වුවත් තමා අගමැතිකම මහින්දට නොදෙන බව කීමෙන් පැහැදිළි වන්නේ ජනාධිපතිවරයා මහින්දට ඉඩදීමට සූදානම් නැති බව ය. ඔහු එවැනි දේ කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ව කළකිරවන අදහසිනි. මෙයින් පෙනෙන්නේ මහින්ද රාජපක්ෂගේ ආගමනය වාසියකට වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අවාසියක් ඇතිකර තිබේ.

රනිල් - මෛත්‍රී ආණ්ඩුවේ දින 100 යේ පොරොන්දු බොහෝ දුරට ඉටු වූ බවක් මා සිතන්නේ නැත. ජනතාව හිතනවාට වඩා හුගක් අඩුවෙන් සාර්ථක වු බවයි මගේ අදහස. ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් එය 30% නැත්නම් 40% සාර්ථක වන්නට ඇත. සාමාන්‍ය මිනිස්සුන් හිතන්නේ එය 50%-60% පමණ සාර්ථක වු බව ය. ඇත්තට සමහරක් මිනිස්සු සිරිසේන-රනිල් ආණ්ඩුව ගැන කළකිරීමෙන් සිටිති. කුඩුකාරයින්ට, දූෂිකයින්ට එරෙහිව

www.thesundayleader.lk




**දෙමළ ජාතික සන්ධානය ද ජාතික ප්‍රශ්ණය ගැන කිසිවක් ම ප්‍රකාශ කළේ නැත. ජාතික ප්‍රශ්ණය ලෙස ඔවුන් කීවේ සුළු ජාතීන්ට මහින්ද රාජපක්ෂ කළ අඩන්තෙට්ටම් පිළිබඳව පමණි. අපි ද ෆෙඩරල්වාදය, බලය බෙදීම වැනි දේ ගැන කථා කරන්නට ගියේ නැත. යුද්ධයට අදාල පීනීවා ගැන ද මෛත්‍රීපාල සිරිසේනගෙන් කිසිම දෙයක් ඇසුවේ නැත. එසේ ඇසුවේ නම් මෛත්‍රිපාල-රනිල් දෙමළු සමග එක් වී රට බෙදන්නට යනවා යන ඝෝෂාව මතුවෙනවා නියත ය.**

ගත් පියවරයන් ප්‍රමාණවත් නැති බවයි ඔවුන් පවසන්නේ. මේ සියලු සාධක කිරා මැන බලන්නේ නම් පොරොන්දු ඉටු කිරීමට යම් උත්සාහයක් ගත් බවට පිළිගැනීමක් ඇත. රනිල්ට අවස්ථාවක් ලබාදුනහොත් ඔහු ආරම්භ කළ ගමන සම්පූර්ණ කරනු ඇතැයි විශ්වාසයක් ඇත. මා හිතන්නේ එය එක්සත් ජාතික පක්ෂයට වාසියක් වන බව ය.

පසුගිය ජනාධිපතිවරණයේ දී මා ඇතුලුව වමෙන් සිතන කිසිවෙක් කිසිම විදියකට ජාතික ප්‍රශ්ණය පිළිබඳ ප්‍රශ්ණය මතු කළේ නැත. පළමු වැනි පියවර ලෙස අප කල්පනා කළේ මහින්ද රාජපක්ෂව පරාජය කිරීම ය. ඔහුව පරාජය නොකර මොන ප්‍රශ්නයවත් විසඳන්නට හැකියාවක් තිබුණේ නැත. ජාතික ප්‍රශ්නය අපි මතු කළේ නම් රට බෙදන්නට යන බව පවසමින් ජාතිවාදීන් එය ප්‍රයෝජන ගැනීමට ඉඩ තිබුණි. එවැනි වාසියක් ඔවුනට ලබාදෙන්නට අපිට අවශ්‍ය නොවී ය.

මා දන්නා ආකාරයට දෙමළ ජාතික සන්ධානය ද ජාතික ප්‍රශ්ණය ගැන කිසිවක් ම ප්‍රකාශ කළේ නැත. ජාතික ප්‍රශ්ණය ලෙස ඔවුන් කීවේ සුළු ජාතීන්ට මහින්ද රාජපක්ෂ කළ අඩන්තෙට්ටම් පිළිබඳව පමණි. අපි ද ෆෙඩරල්වාදය, බලය බෙදීම වැනි දේ ගැන කථා කරන්නට ගියේ නැත. යුද්ධයට අදාල පීනීවා ගැන ද මෛත්‍රීපාල සිරිසේනගෙන් කිසිම දෙයක් ඇසුවේ නැත. එසේ ඇසුවේ නම් මෛත්‍රිපාල-රනිල් දෙමළු සමග එක් වී රට බෙදන්නට යනවා යන ඝෝෂාව මතුවෙනවා නියත ය. ඊකට අප ඉඩ දුන්නෙ නැත. එසේ සිතුවේ නම් සිතිය හැකිව තිබුණේ මහින්ද රාජපක්ෂ නැවත බලයට පැමිණියත් ප්‍රශ්නයක් නැත යැයි සිතන අයෙකුට පමණි. මෙයින් මා උත්සාහ දරන්නේ මෛත්‍රිපාල- රනිල් ආණ්ඩුව බලයට පැමිණියේ ජාතික ප්‍රශ්ණය ගැන කිසිදු පොරොන්දුවක් නොදී බව පෙන්නා දීමට ය.

මාගේ කල්පනාවේ හැටියට දෙමළ ජාතික සන්ධානයට ද ඔවුන් එවන් පොරොන්දුවක් නොදෙන්නට ඇත. පොරොන්දුවක් දුන්නා නම් පොරොන්දු වී ඇත්තේ උතුරේ මිලිටරිය අඩු කරනවා වැනි දේවලට පමණි. බලය බෙදන ව්‍යවස්ථාමය කරුණු ගැන කිසිම පොරොන්දු දුන්නේ නැත. ඒ නිසා ම බලයට පැමිණි පසු එසේ කරන්නට අවශ්‍යතාවක් පැනනගින්නේ ද නැත. ජාතික ප්‍රශ්ණය සම්බන්ධයෙන් රටේ දැන් සෑම පැත්තෙන්ම ඇත්තේ අඩු උනන්දුවකි. එන මැතිවරණයටත් ජාතික ප්‍රශ්නය වෙනුවෙන් කුමක් හෝ කරනවා යනුවෙන් පැවසීමට රනිල්ගේ පැත්තෙන් ද විශාල අවශ්‍යතාවක් මතුවේ යැයි කිව නොහැක.

නමුත් මහින්ද රාජපක්ෂලා ට කියන්නට තිබෙන්නේ ජාතික ප්‍රශ්නයට අදාළ නිශේධනාත්මක චෝදනා පමණි. රාජපක්ෂලාට අනුව මෙතන කුමක් හෝ හොර වැඩක් තිබේ. මේ රට බෙදන්න මෛත්‍රි-රනිල් එක් වී දෙමළ සන්ධානය සමග විශාල කුමන්ත්‍රණයක් කරන බව ඒත්තු ගැන්වීමට රාජපක්ෂ කඳවුර දැඩි වෙහෙසක් දරති. සිංහල ජීවිත දහස් ගණන් පූජා කර ලබාගත්ත ජයග්‍රහණය පාවා දෙන්නට සූදානම් වන්නේ යැයි කියන පණිවිඩය ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරයේ තේමාව වී තිබේ.

මේ අනුව මහින්ද රාජපක්ෂලා ගේ එම මැතිවරණ ව්‍යාපාරයට ජාතිවාදයට අමතරව මහ බැංකුවේ අධිපති මහේන්ද්‍රන්ගේ ප්‍රශ්නය මතු කිරීම හැර වෙනත් ප්‍රශ්නයක් නැත. මා නම් හිතන්නේ මිනිස්සු ඒ ගැන එතරම් විශ්වාස කරන්නේ නැත. කොටි සංවිධානය අතන සිටිනවා මෙතන සිටිනවා කීවාට ඒ ගැන බියක් ද නැත. මහේන්ද්‍රන්ගේ ප්‍රශ්නය ගැන තරමක් කළකිරීමක් තිබේ. ජාතික ප්‍රශ්නය පැත්තෙන් ආණ්ඩුවේ සැලකිල්ල අඩු වී ඇති බවයි පෙනෙන්නට තිබේ.

කෙසේ නමුත් මෛත්‍රීපාල සිරිසේන හා රනිල් බලයට පැමිණියාට, අපේ ප්‍රශ්නය ගැන කිසිදෙයක් කළේ නැත යන ප්‍රශ්නය දැන් උතුරේ මතු වී ඇත. කවුරු බලයට ආවත් අපිට වැඩක් නැත යැයි ඔවුහු පවසති. . ඒ නිසා ම දැන් දෙමළ ජාතික සන්ධානය තුළ බෙදීමක් ඇති වී තිබේ. විග්නේෂ්වරන් ජාතිවාදී මාවතේ ගමන්කරනු පෙනේ. වර්ගවාදී සමූල ඝාතනයක්, එසේ නැති නම් දෙමළ ජනඝාතනයක් කර තිබෙන බවට උතුරු පලාත් සභාවේ යෝජනාවක් ද සම්මතකරගෙන තිබේ. 25%ක පමණ තද පිරිසක් ඩයස්පෝරාවේ සිටිති. විග්නේෂ්වරන් ඒ අය සමග තදින් සම්බන්ධ

www.telegraph.co.uk



**මේ මැතිවරණයෙන් පසු රනිල් බලයට පැමිණියත්, ජාතික ප්‍රශ්ණය ගැන වැඩි ප්‍රගතියක් වේ යැයි අප විශ්වාස කරන්නේ නැත. රනිල් ජාතිවාදියෙක් යැයි මා කියන්නේ නැති අතර දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් හා දෙමළ ජනතාවට ස්වයංපාලන තත්ත්වයක් ඇති කර දෙන අරගලයට ඔහු යන්නේ නැත. එසේ බැලූ කළ ජාතික ප්‍රශ්ණය පැත්තෙන් අවාසිදායක තත්ත්වයක් තිබේ.**

වී ඇති බවයි පෙනෙන්නට තිබෙන්නේ. දෙමළ සන්ධානයේ බෙදීම හේතුකොටගෙන ජාතික ප්‍රශ්ණයට අදාල ප්‍රශ්නය ඉතා සංකීර්ණ බවක් පෙනෙන්නට තිබේ. මෙයට ප්‍රතික්‍රියාවක් ලෙස දෙමළ ජාතික සන්ධානයට තමන්ව ආරක්ෂා කරගන්නට උවමනාවක් තිබේ. කුමක් ද අපිට කළේ යනුවෙන් දෙමළ ජනයා නගන ප්‍රශ්නයට ඔවුන්ට ද පිළිතුරක් තිබිය යුතු ය. තමන්ගේ මැතිවරණ ප්‍රකාශනයට ප්‍රමාණයට වඩා ෆෙඩරල්වාදය ඔවුන්ගේ අවම ඉල්ලීම ලෙස ඉදිරිපත් කරන්නේ ඒ නිසා ය. උතුරේ සමාජ ප්‍රශ්න ඉතා බරපතල ය. එහි සංස්කෘතිය කඩා වැටී ඇත. තරුණ අය පවසන්නේ එල්ටීටී එක බලයට පැමිණියා නම් අපේ සංස්කෘතිය හා අපේ සමාජය ආරක්ෂා වෙන බව ය.

මේ මැතිවරණයෙන් පසු රනිල් බලයට පැමිණියත්, ජාතික ප්‍රශ්ණය ගැන වැඩි ප්‍රගතියක් වේ යැයි අප විශ්වාස කරන්නේ නැත. රනිල් ජාතිවාදියෙක් යැයි මා කියන්නේ නැති අතර දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් හා දෙමළ ජනතාවට ස්වයංපාලන තත්ත්වයක් ඇති කර දෙන අරගලයට ඔහු යන්නේ නැත. එසේ බැලූ කළ ජාතික ප්‍රශ්ණය පැත්තෙන් අවාසිදායක තත්ත්වයක් තිබේ. මෙවැනි සන්දර්භයක් තුළ උතුරේ ජනතාව අලුත් ආණ්ඩුවට විරුද්ධව තල්ලුවීම වැළැක්විය නොහැක. ඉතිං උවමනාවක් ඇත්නම් අපට මේ ප්‍රශ්ණය ගැන මතු කරන්නට සහ ඒ වෙනුවෙන් වැඩ කරන්නට පුළුවන.

කෙසේ නමුත් මෙය පහසු කටයුත්තක් නම් නොවේ. අවශ්‍ය ප්‍රමාණයට වඩා මේ ගැන කෑකෝ ගසන්නට ගියහොත් මහින්ද රාජපක්ෂලා ගෙනයන රට පාවා දෙනවා කියන අදහස ජය ගන්නට ඉඩකඩ විවරවේ. මම හිතන්නේ ලංකාවේ ජාතික ප්‍රශ්ණය විසඳන්න ඉතාමත් අමාරු ය. මක්නිසා ද යත් සිංහල බෞද්ධ රටක් යන ජනතාවගේ ආකල්පය එයට හේතු වී තිබේ. එහෙත් කළ යුතු දේ අප කළ යුතු ය. ජාතික ප්‍රශ්ණය ගැන මහින්ද රාජපක්ෂට ප්‍රයෝජනය ගන්නට අවස්ථාවක් නොදීම විශේෂයකි. මෙහි දී රනිල් ප්‍රමුඛ එජාපයට ප්‍රශ්ණය ඉදිරිපත් කළ යුතු ය. රටට හොඳක් වන්නේ නම් ෆෙඩරල් නොදිය හැක්කේ ඇයි ද යන්න අසා ඔහුව ප්‍රශ්න කළ යුතු ය.

**සමාජ ආර්ථිකය**

විශේෂයෙන්ම ලංකාවේ සමාජ ආර්ථික ප්‍රතිපත්තිය ගතහොත් ප්‍රතිපත්ති තුනක් ලෙස සාකච්ඡා කළ හැක. එයින් එකක් වන්නේ මහින්ද රාජපක්ෂගේ පාලන කාලයේ එනම් පසුගිය වසර 9 යේ අප දුටු ආර්ථික ප්‍රතිපත්තිය ය. එම ආර්ථික ප්‍රතිපත්තිය මා දකින්නේ බලය තිබෙන කාලයට කුලියක් ගන්නවා වගේ වැඩකි. රටේ පාරවල් හැදීමෙන් පගා සහ කොමිස් ගැනීම එහි ප්‍රධාන අංගයකි. සම්පූර්ණයෙන්ම ඒ ආර්ථිකය දුවන්නේ ආර්ථිකය අල්ලාගෙන සිටි කණ්ඩායමේ ප්‍රයෝජනය උදෙසා ය. කසකස්තාන් රටේ ද තිබෙන්නේ එවන් ආර්ථිකයකි. අනික් විකල්පය අපි දකින්නේ ජනතා විමුක්ති පෙරමුණෙනි. ඒක ගැන මා වැඩියෙන් සඳහන් කිරීමට යන්නේ නැත. නමුත් ඒක වමට බර වැඩි රජය මැදිහත්වීම ප්‍රභල ආර්ථික ප්‍රතිපත්තියකි.

තුන්වන විකල්පය වන්නේ ලෝකයේ හැම තැනම පැතිර තිබෙන ක්‍රමය වේ. චීනය වුවත්, වියට්නාමය වුවත්, දකුණු කොරියාව, තායිවානය, මේ පැත්තෙන් කියුබාව ද එතැනට අයත් වේ. ඉන්දියාවත් එතැනට පැමිණ තිබේ. මා දකින්නේ දැන් අනාගත රනිල්ගේ සැලැස්ම ද එය වේ. එහෙත් එය කෙරෙන්නේ මිශ්‍ර ආර්ථික ක්‍රමයක් තුළ ය. ධනේශ්වර ආයතන ඕන තරම් එයට ආයෝජනය කරනු ඇත. චීනයේ ආණ්ඩුව පවසන්නේ ආයෝජන විදුලියට නැත්නම් නිවාස අංශයට දිසානති කළ යුතු බව ය. දකුණු කොරියාවේ ද සිදුවූයේ මෙයයි. මේ වැඩේ කරන්නට පෞද්ගලික අංශයට ඕනතරම් ඉඩ කඩ ලබාදෙනු ඇත. කොරියාව තායිවානය වැනි රටවල ආණ්ඩුව එම අංශයට මැදිහත් වූයේ නැත.

රනිල් උත්සාහ දරනු ඇත්තේ ද ඒ මාවතේ යෑමට ය. රාජපක්ෂලාගේ යුගයේ ආර්ථිකයට කිසිම දිශානතියක් තිබුණේ නැත. එකම ආර්ථික දිශානතිය කොමිස් ගන්න එක පමණි. ●









ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**චරිත හේරත්**

# ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා හුදු විවේචන පමණක් ප්‍රමාණවත් නැහැ

**ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති සමඟ සන්සන්දනයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානය සිටින තැන පිළිබඳ ඔබේ අදහස?**

ප්‍රධාන කාරණා කීපයක් නිසා අපි අනෙක් පක්ෂවලට වඩා වෙනස් වෙනවා. එක පැත්තකින් ලංකාවේ දේශපාලනයේ ප්‍රධාන බෙදුම් රේඛා දෙකක් හමුවෙනවා. ඒ ඒ දේශපාලන පක්ෂ වෙළඳ පොළ සමඟ ගනුදෙනු කරන්නේ කොහොමද කියන කාරණයත්, රාජ්‍යයේ පැවැත්ම වෙළඳ පොළට යටත් කිරීමට ඉඩ දෙනවාද නැද්ද


www.youtube.com

කොළඹ නව වෙළඳ පොලක්

**එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පදනම් දර්ශනය වන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කියල අප කියනවා. ඒ කියන්නේ වෙළඳ පොළ යාන්ත්‍රණය පිළිගනිමින් වෙළඳ පොළ නියාමනය කිරීමට රාජ්‍ය යොදා ගැනීම අත්‍යාවශ්‍ය ධාකයක් ලෙස සැළකීම තමයි මා එක් පැත්තකින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ලෙස සළකන්නේ.**

කියන කාරණයත් යන ප්‍රධාන කරුණු දෙක මගිනුයි ලංකාවේ දේශපාලන පක්ෂ එකිනෙකට වෙනස් වෙනවා කියල මම හිතන්නේ. ඒ අනුව අපේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි ඇති මහා පොදු සාධකයක් තමයි, එක්සත් ජනතා නිදහස් සන්ධානයට රජ්‍ය පාලනය කරද්දි වෙළඳ පොළ සමඟ ගනුදෙනු කරන්නේ කොහොම ද කියන එක සහ රාජ්‍යයේ බලය වෙළඳ පොළට හකුලනවාද නැද්ද කියන එක. එම නිසා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පදනම් දර්ශනය වන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කියල අප කියනවා. ඒ කියන්නේ වෙළඳ පොළ යාන්ත්‍රණය පිළිගනිමින් වෙළඳ පොළ නියාමනය කිරීමට රාජ්‍ය යොදා ගැනීම අත්‍යාවශ්‍ය ධාකයක් ලෙස සැළකීම තමයි මා එක් පැත්තකින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ලෙස සළකන්නේ. අනෙක් අතට වෙළඳ පොළ යාන්ත්‍රණයට රටේ ප්‍රජාතන්ත්‍රීය ඉඩ ඇහිරෙන්න ඉඩ නොදීම හා කළමනාකරණය කිරීම. වෙළඳ පොළයි ප්‍රජාතන්ත්‍රවාදයයි එකට ගමන් කරනවා වාගේ පෙනුණට දාර්ශනිකව ගත්තාම ඒ දෙකේ බරපතල වෙනසක් තියෙනවා. වෙළඳ පොළ තුළ ශක්තිවතුන් කීප දෙනෙක් සමස්ථ ක්‍රියාවලියම හසුරවනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ කීප දෙනෙකුට හසුරවන්නට ඉඩ නොදී හැමදෙනාගෙම කැමැත්ත මත හැසිර වීම. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදය හා වෙළඳ පොළ එකට යනව වගේ පෙණුනට මේ දෙකෙහි සෛද්ධාන්තිකව වෙනස්කම් හඳුනා ගන්න පුළුවන්. අපි පෙනී සිටින්නේ වෙළඳ පෙළ යාන්ත්‍රණය පිළි ගනිමින් එය ප්‍රජාතන්ත්‍රවාදයට කරන බල පෑම අවම කරමින් රාජ්‍ය විසින් වෙළඳ පොළ නියාමනය කරමින් ඉදිරියට යෑම පිළිගන්නා පක්ෂයක් හැටියටයි. ඒ නිසා අපි සමාජ ප්‍රජාතාන්ත්‍රීය පදනමක සිටිනවා.

නමුත් මා හිතන හැටියට අපගේ ප්‍රධාන ප්‍රති විරුද්ධවාදීන් වන එක්සත් ජාතික පක්ෂයේ පදනම වන්නේ රාජ්‍යයේ බලය හැකි තරම් හකුලා පුරවැසියන්ට දීම නොව වෙළඳ පොළට දීමයි. මෙය ඔවුන් හඳුන් වන්නේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය නමින්. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඇත්තේ මීට වඩා වෙනස් අදහසක්. රාජ්‍යයේ බලය හකුලා එය සිවිල් සමාජයට නැත්නම් පුරවැසියාට ලබා දීමයි ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ දී සිදු වන්නේ. නමුත් එජාපය කියන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තමයි රාජ්‍යයේ බලය හකුලා වෙළෙන්ඳන් කීප දෙනෙක් අතට බල ලබා දීම. අපේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෛද්ධාන්තික පදනම වන්නේ වෙළඳ පොළ පිළිගනිමින්, එය නියාමනය කිරීමේ රාජ්‍යමය මැදැහත්වීම පිළිග නිමින්, වෙළඳ පොළ විසින් ප්‍රජාතාන්ත්‍රීය ඉඩට බපෑම්කිරීමේ ඇති හැකියාව අවම කරමින් ඉදිරියට යන ක්‍රමයක් ඇති කිරීමයි.

**ඔබ විස්වාස කරන ආකාරයට මෙවර මැතිවරණයෙන් පසු ලංකාවේ අනාගතය කුමන පක්ෂයකට හිමි වේද? ඊට හේතුව කුමක් ද?**

අපි බොහොම නිශ්චිතව ම විස්වාස කරනවා මෙවර මහ මැතිවරණයෙන් පසු එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් පිහිටුවන බව. එයට හේතු ගණනාවක් තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානය පසු ගිය වසර විස්ස තුළ මේ රටට ලබා දුන් ජයග්‍රහණයන් වැසී යන පරිදි ඉදිරිපත් කළ මිථ්‍යාවන් සහ අවලාද තමයි පසු ගිය ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන මෙවලම වුණේ. නමුත් ඒවා තාවකාලිකයි. බොරු අවලාද දවස් කීපයක් පෙන්නන්න පුළුවන්. නමුත් එය පුළුල් ලෙස හුවා දැක්වීමේ දී අවලාදයක් ම බවට පත් වෙනවා. පසුගිය ජනාධිපතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානයට ප්‍රතිචාර ලෙස ලැබුණේ කරුණුමය දේශපාලන චෝදනා නොවෙයි, අවලාදමය දේශපාලන චෝදනා පමණයි. එම අවලාදමය දේශපාලනයට වැඩි දුර යා නොහැකියි. සරළ උදාහරණයකින් කියනව නම් ගුවන් යානයක් එකම විදියට අවස්ථා දෙකකදි

www.timeout.com



**ආර්ථිකමය තලයේ බරපතල වෙනස් කිරීමක් අප සිදු කරනු ලැබුවා. අපගේ ජීවිත, අපගේ නගර, පාසල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන ආදිය බරපතලමය ලෙස භෞතිකමය වෙනසකට ලක් කරන්නට ආර්ථිකය පැත්තෙන් අපට හැකි වුණා. ජනතාවගේ ජීවිතයට මෙතෙක් අත්නොවින්ඳ නැවුම් බවක් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා.**

කොළඹ නගරය ආසන්නයේ පරිසර හිතකාමී - ශරීර සුවතා නිර්මාණ

පැහැර ගන්න බැහැ. පසුව ඒ උපක්‍රමය මොකක් ද කියල වැටහෙනවා. ජනතාවටත් දැන් ඒ විදියට වැටහිලා තිබෙන්නේ. එකසත් ජාතික පක්ෂයට තිබෙන ප්‍රධාන ම ප්‍රශ්නය සහ අපට තිබෙන ප්‍රධානම වාසිය එයයි. මොකද එක්සත් ජාතික පක්ෂයට කරුණුමය දේශපාලනයක් (factual Politics) නැහැ. ඔවුන්ට කරුණුමය මැදිහත්වීමක් (factual Interventoin), කරුණුමය ප්‍රතිචාරයක් (factual Response) නැහැ. ඔවුන්ට ඇත්තේ අවලාදමය දේශපාලනයක් පමණයි. ඒ නිසා අප මෙවර පැහැදිලිව සන්ධාන රාජයේ ජයග්‍රහණය පෙන්නල තියෙනවා.

එසේම සන්ධාන රජය 1994 සිට මේ දක්වා ගොඩ නඟන ලද නිදහස වඩාත් වැදගත්. ත්‍රස්ත ක්‍රියාවලියටකින් මෙ රටෙහි නිදහස විනාශකොට තිබූ යුගයක තමයි අපගේ පක්ෂය බලය අතට ගත්තේ. එය පෙරළා නිදහස් රටක් හැටියට පත් කොට ජනතාවට භාර දෙන්න අපට හැකි වුණා.

ආර්ථිකමය තලයේ බරපතල වෙනස් කිරීමක් අප සිදු කරනු ලැබුවා. අපගේ ජීවිත, අපගේ නගර, පාසල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන ආදිය බරපතලමය ලෙස භෞතිකමය වෙනසකට ලක් කරන්නට ආර්ථිකය පැත්තෙන් අපට හැකි වුණා. ජනතාවගේ ජීවිතයට මෙතෙක් අත්නොවින්ඳ නැවුම් බවක් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. ශක්තිමත් ආර්ථිකයක්, වඩාත් ශක්තිමක් යටිතල පහසුකම්, සියයට අනූ නවයකට ම විදුලි බල පහසුකම්, සියයට එකසිය විස්සකට වඩා වැඩි විදුලි සංදේශමය පහසුකම්, අධිවේගී මාර්ග පහසුකම්, ආදී වශයෙන් පුළුල් ආර්ථිකමය දියුණුවක් අප ලබා දී තිබෙනවා.

එසේ ම අපි විශ්වාස කරනවා මේ රටේ සංවර්ධනය, නිදහස ආරක්ෂා කරගැනීමේ හැකියාව, දැනුම සහ අවශ්‍යතාවය යන තුනම කතියෙන්නේ අපට කියලා. රාජ්‍ය පාලනයට ශක්තිමත් පක්ෂයක් ශක්තිමත් නායකත්වයක් අවශ්‍යයි. එසේ ම දැනුම සහිත දෙවැනි ස්ථරයක් අවශ්‍යයි. රටේ ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා හුදු විවේචනයක් පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ සඳහා පැහැදිලි වැඩසටහනක් අවශ්‍යයි. එක්සත් ජාතික පක්ෂයට තිබෙන බරපතලම ගැටලුව තමයි ඔවුන් අවලාදමය දේශපාලනයක් කළාට, රට ඉදිරියට ගෙන යෑමේ ප්‍රතිපත්තිය කුමක්දැයි පැහැදිලි නැති කම. අප මෙයට දාර්ශනිකව කියනවා නම් විසි කිරීම (Name Dropping) කියලා. ඇතැමුන් ශාස්ත්‍රීය අධ්‍යයනයක් නොමැතිව, ගැඹුරට පොතක් පතක් නොකියවා නම් විසි කරමින් අතැම් දේ දන්න බව පවසනවා. ඒ අයට රාජ්‍ය පාලනය සම්බන්ධ අත්දැකීමක් සහ සූදානමක් නැති බව පැහැදිලියි. ඒ නිසා මෙවර තාර්කිකව ගත්තත් මා හිතනවා සන්ධානයට ලංකාවේ අනාගතය භාරවෙනව කියලා.

**ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් බලය බෙදීමේ මතය සම්බන්ධ ඔබේ අදහස කුමක් ද? එය දෙමළ ජනතාවගේ විසඳුමක් ලෙස ඔවුන් පිළිගනීවි ද?**

ඇත්තෙන් ම 13 වන ව්‍යවස්ථා සංශෝධනය ලාංකේය දේශපාලනයේ ජනවාර්ගික ගැටලුව ඉලක්ක කරගෙන ඉදිරිපත් කෙරුණු ප්‍රායෝගික විසඳුමක් ලෙස බොහෝ අය පිළි ගන්නවා. නමුත් දෙමළ සමාජයේ මේ සම්බන්ධයෙන් තිබෙන මතය යම්තාක් දුරකට වෙනස්. එසේ ම මේ වන විට දෙමළ සමාජයේ වාර්ගික සණාත්වය වෙනස් වෙලා තියෙන්නේ කියන එක තේරුම්ගත යුතු යි. 13 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ පූර්ව කල්පනයක (Assumption) සිටයි. එම පූර්ව කල්පනය තමයි උතුරු නැගෙ නහිර ප්‍රදේශවල දෙමළ ජනතාවගේ බහුතරය ජීවත්ව සිටිනවා



www.asiantribune.com

**අපට පිළිගන්න සිදුවෙනවා ප්‍රමාණාත්මකව ගත්තාම සිංහල සමාජය දෙමළ සමාජයට වඩා විශාල බව. ඒ නිසා සිංහල සමාජය එකතු කරන්නාට පමණයි දෙමළ සමාජය සිංහල සමාජය සමඟ එකතු කළ හැක්කේ. ඒ අර්ථයෙන් ගත් විට එක්සත් ජනතා නිදහස් සන්ධානයට පමණයි දෙමළ ගැටලුවට ශක්තිමත් විසඳුමක් ලබා දිය හැක්කේ,**

හිටපු ජනාධිපති - විග්නේෂ්වරන් හමු වූ අවස්ථාවක්

ය කියන එක. එහෙම හිතල තමයි ඒ ප්‍රදේශ ඒකාබද්ධ කරල එම ජනතාවගේ පළාතක් හදන්න ඕන කියලා හිතුවේ. එම පූර්ව කල්පනය දැන් වැරදියි. දැන් දෙමළ බහුතර ජනයාගේ පැවැත්ම උතුරු නැගෙනහිරින් පිට කියල පැහැදිලියි. එවැනි තත්ත්වයක් තුළ සෑම තැනකම ජීවත්වන දෙමළ සමාජයට උතුරු නැගෙනහිර පළාත් සභාවක් තිබීමෙන් ඒ අයගේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ කියල තමයි හිතන්නේ. ඒ නිසා මෙම ජනවර්ග සම්බන්ධ ගැටලුව ලංකාවේ ප්‍රාදේශීය පාලනයන් එක්ක ගැටගැහිල නෑ කියල තමයි දැන් පෙනෙන්නේ. මෙම ජනවාර්ගික ගැටලුව මධ්‍යම ව (සැබවර්ක වදිසවසදබ) විසඳගන්න ඕන එකක් කියල තමයි මා හිතන්නේ. එහි ධනාත්මක පැත්තක් තිබෙනවා. රට බෙදෙන්නේ නැතිව ජන වර්ග අතර සුහදතාවක් ගොඩනගා ගැනීමේ අවස්ථාවක් ඉන් හිමි වෙනවා. ප්‍රාදේශීයකරණයට ජනවාර්ගික ප්‍රශ්නය යොමු වුණ ගමන් යළිත් පූර්ව කල්පනයකට එනවා, ඒ ප්‍රදේශයේ දෙමළ අය ඉන්නවා. මේ ප්‍රදේශයේ සිංහල අය ඉන්නවා කියලා. එම පූර්ව කල්පනය වැරදිලා තිබෙන නිසා හොඳක් වෙලාතියෙනවා මධ්‍යම රජය හරහා බලය බෙදා දීමක් ඔස්සේ, නව ප්‍රවේශයක් හඳුන්වා දෙන්න පුළුවන් වීම. එසේත් නැත්නම් ආර්ථික මැදිහත් වීම විසින් ජනවාර්ගික අභිලාෂයන් යම්තාක් දුරකට වෙනස් කරන්නට ඉඩ තිබෙනවා. රට දියුණු වුණහොත් එහි දී ආර්ථික අභිලාෂය මිසක ජනවාර්ගික අභිලාෂය ඉදිරියට නොඑන්න ඉඩතිබෙනවා. එයත් එක් පැත්තකින් ධනාත්මක තත්ත්වයක්. මා හිතනවා ජනවාර්ගික ගැටලුව සම්බන්ධයෙන් 13 වැනි සංශෝධනය එකතැන සිර වී තියෙන්නේ කියලා. ඒකෙන් එළියට එන්නේ කොහොමද කියන එකේ දී ප්‍රශ්නයේ ස්වභාවයෙන් ම වෙනස් කරමින් එළියට ආ යුතු බවයි මගේ අදහස. මධ්‍යයම රජයට මේ ගැටලුව ගෙනවිත් මධ්‍යම රජයේ බලය බෙදා හැරීමක් ඔස්සේ තමයි වාර්ගික අනන්‍යතාවයේ යටත් කිරීමක් තියනවයි කියල හිතන අය නැවත උඩට ගත හැකි වන්නේ.

**ජාතික ප්‍රජාව සමඟ වඩා ශක්තිමත් සබඳතාවයක් පවත්වාගත හැක්කේ කවර පාර්ශ්වයකට ද?**

සිංහල සමාජය හා දෙමළ සමාජය කියන්නේ ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකවත් වෙනස් සමාජ දෙකක්. මා හිතනවා අප මේ ප්‍රමාණාත්මක වෙනසට සංවේදී වෙමින් ගුණාත්මක වෙනස ආරක්ෂා කරන්න උත්සාහ කරන්න ඕන කියලා. එනම් දෙමළ සමාජයේ අභිලාෂයන් සිංහල සමාජයේ අභිලාෂයන් තරම් ම වැදගත් කියන එක අප පිළිගන්න ඕන. අපට පිළිගන්න සිදුවෙනවා ප්‍රමාණාත්මකව ගත්තාම සිංහල සමාජය දෙමළ සමාජයට වඩා විශාල බව. ඒ නිසා සිංහල සමාජය එකතු කරන්නාට පමණයි දෙමළ සමාජය සිංහල සමාජය සමඟ එකතු කළ හැක්කේ. ඒ අර්ථයෙන් ගත් විට එක්සත් ජනතා නිදහස් සන්ධානයට පමණයි දෙමළ ගැටලුවට ශක්තිමත් විසඳුමක් ලබා දිය හැක්කේ, මොක ද සිංහල සමාජ පිළිගන්නේ, බහුතරයක් අනුගමනය කරනනේ එක්සත් ජනතා නිදහස් සන්ධානය නිසා. සිංහල සමාජයට පිටින් ගොස් දෙමළ සමාජයේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලයි එක්සත් ජාතික පක්ෂය හැමදාම සිතුවේ. එය වැරද්දක් බව 89 සිංහල සමාජයේ පුපුරා ගිය දැවැන්ත අරගලයෙන් පේනවා. ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමේ ඉඳලා පළාත් සභා පිහිටුවීම දක්වා සම්පූර්ණ ක්‍රියාවලිය සිංහල සමාජයේ සහභාගීත්වයකින් තොරව කළ හැකියි කියල හිතපු මිථ්‍යා දෘෂ්ටිය විසින් සිංහල සමාජයේ ජනතාව අසූදාහක් බිළිගත්තා. ඒ නිසා නැවත වතාවක් දෙමළ සමාජය එක්ක ඒකාබද්ධව ඉදිරියට යෑමේ දේශපාලනයක් කළ හැක්කේ සිංහල සමාජය විස්වාස කරන නායකත්වයකට පමණයි කියල තමා මා හිතන්නේ.

**පක්ෂ නායකත්වය මත පදනම් ව පමණක් ආණ්ඩුවකට ගමන් කළ හැකිද? ඉන් ඔබ්බට ගිය ප්‍රතිපත්තිමය කාරණාවලට නොවේ ද, ආණ්ඩුවක් හෝ පක්ෂයක් ගමන් කළ යුතු වන්නේ?**

www.slelections.gov.lk



**මේ මැතිවරණය අප ජයග්‍රහණය කිරීමෙන් පසුව මේ වන විට ජයග්‍රහණය කර ඇති ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්තිත්, අලුතෙන් ජයග්‍රහණය කරන සන්ධානෙ ප්‍රතිපත්තිත් ඒකාබද්ධ වන අයුරින් තමයි මෙය නිර්මාණය කරල තියෙන්නේ. මේ නිසා පහුගිය ජනාධිපතිවරණයේ 'මෛත්‍රී සමාජයක්' කියන ලියවිල්ලත්, 'මහින්ද චින්තන' කියන ලියැවිලත් යන දෙකෙහිම මහා පොදු සාධකය හැටියට 'අනාගතයට සහතිකයක්' හඳුන්වන්න පුළුවන්.**

හිටපු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ - වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සමග

එය ඉතා වැදගත් කාරණයක්. එක්සත් ජනතා නිදහස් සන්ධනය මෙවර මැතිවරණයට ඒමේ දී සමහරු විස්වාස කරනවා අපි මහින්ද රාජපක්‍ෂ කියන නම සමඟ පමණයි යන්න හදන්නේ කියලා. එතුමා පමණයි පක්‍ෂයේ ජනප්‍රියම නායකයා. එතුමා පසුපස, එතුමන් සමඟ, එතුමන් වටකරග නිමින් එන පුළුල් වැඩසටහනක් අපි ඉදිරිපත් කළා. අනාගතයට සහතිකයක් කියන්නේ ඒ වැඩසටහන. අප දිනවන්නේ එයයි. ඒ වැඩසටහනට මහින්ද රාජපක්‍ෂ හිටපු ජනාධිපතිතුමත් මෛත්‍රීපාල සිරිසේන වත්මන් ජනාධිපතිතුමත් එකසේ හවුල් කරන්න ඕන කියලා තමයි අප විස්වාස කරන්නේ. ඒ නිසා මේ මැතිවරණය අප ජයග්‍රහණය කිරීමෙන් පසුව මේ වන විට ජයග්‍රහණය කර ඇති ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්තිත්, අලුතෙන් ජයග්‍රහණය කරන සන්ධානෙ ප්‍රතිපත්තිත් ඒකාබද්ධ වන අයුරින් තමයි මෙය නිර්මාණය කරල තියෙන්නේ. මේ නිසා පහුගිය ජනාධිපතිවරණයේ 'මෛත්‍රී සමාජයක්' කියන ලියවිල්ලත්, 'මහින්ද චින්තන' කියන ලියැවිලත් යන දෙකෙහිම මහා පොදු සාධකය හැටියට 'අනාගතයට සහතිකයක්' හඳුන්වන්න පුළුවන්.

**රටේ පවතින ආර්ථිකදේශපාලන ගැටලුවලට විසඳුම් ලබා දිය හැකි වඩා ශක්තිමත් පාර්ශ්වය කවු ද? ඊට හේතුව කවරේ ද?**

අප විස්වාස කරන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානය තමයි. ලංකාවේ ආර්ථිකය කියන එක යම්තාක් දුරකට මැදිහත්වීමෙන් යුතුව කරන්න ඕනකියලයි අප හිතන්නේ. මේ රටේ ඉන්නවා, එක පැත්තකින් නුපුහුණු ශ්‍රමිකයන් ගණනාවක්. අනෙක් පැත්තෙන් අඩු පහසුකම් සහිත සමාජ කණ්ඩායම් ගණනාවක්. ඒ නිසා මේ සමාජ කණ්ඩායම් බල ගැන්වීම සහ තරඟකාරීත්වයට ඉඩදීම කියන දෙකම එක විටයි සිදු කිරීමට සිදුව ඇත්තේ. මෙය උදාහරණයකින් පැහැදිලි කළහොත්, අප හිතමු, කොළඹ බගතලේ පාරේ ජීවත් වන කෙනෙකුයි, හිරාඳුරුකෝට්ටේ ජීත් වන කෙනෙකුයි, දෙන්නම එක සමාන තීරුවක ජීවත් වන්නේ කියල හිතලා කවුරු හරි කියනවා මේ දෙන්නටම දුවන්න කියලා කොළඹ කොටුවට. එතකොට බගතලේ පාරේ මිනිසා ඉක්මනින් දුවනවා, හිරාඳුරුකොට්ටේ මිනිහා මැරෙනවා. එක්සත් ජාතික පක්‍ෂයේ කල්පනාවත් එහෙමයි. ඔවුන් පූර්ව කල්පනය කරනවා මේ දෙදෙනාම ඉන්නේ එක ඉරක කියලා. එසේ සිතා මේ දෙදෙනාටම එක වගේ තරඟයට ප්‍රවිෂ්ට වන්න කියල කියනවා. එවිට දුබලයා විනාස වෙමින් ප්‍රබලයා ඉදිරියට යනවා. මේ දෙදෙනා සිටින්නේ ස්ථාන දෙකකය, ඒ නිසා දෙවැන්නාගේ තත්ත්වය පළවැන්නා දක්වා බලගැන්වීමෙන් පසුව තමයි තරඟය ඉදිරියට යා යුත්තේ කියා අප විශ්වාස කරනවා. ඒ බල ගැන්වීමට රජයේ සුබසාධන ක්‍රියාවලිය අවශ්‍යයි. ඒ නිසා හිරාඳුරුකොට්ටේ ඉන්න මිනිසා බගතලේ පාරේ සිටින මිනිසා ළඟට ගෙන ඒමේ ක්‍රියාවලියකට මැදිහත් වෙලා පසුව තරඟයට ඉදිරිපත් කරනවා.

**දෙමළ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳ ඔබගේ අදහස කුමක් ද?**

ඇත්තටම දෙමළ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශන දෙකක් වැදගත් වෙනවා. එකක් තමයි පසුගිය පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් කළ එක. දෙවැනි එක තමයි මෙවර මහ මැතිවරණයට ඉදිරිපත් කළ එක. මේ දෙක තුළම අපට පෙනෙන්නේ අඩු වැඩි වශයෙන් ඩයස්පෝරා දේශපාලනයට මේ අය හසු වෙලා තියන ආකාරය යි. දෙමළ ජාතික සන්ධානය ඩයස්පෝරා එල්.ටී.ටී.ඊ දේශපාලනයට හසුවෙලා තියෙනවා කියල අපට පැහැදිලි වෙනවා. අපි ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රතික්ෂේප කරනවා ඔවුන් යෝජනා කරන ෆෙඩරල් ශ්‍රී ලංකාව පිළිබඳ අදහස නිසා. ●





**මංජුල ගජනායක**
ජාතික සම්බන්ධීකාරක
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතා ප්‍රවෘත්ති සාකච්ඡාවක

newsfirst.lk

# ඡන්ද අයිතිය, මැතිවරණ නීති හා ප්‍රචණ්ඩ ක්‍රියා

ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙත, සර්වජන ඡන්ද අයිතිය ලැබී, මේ ගෙවී යන්නේ 84 වැනි වසරයි. සීමාසහිත කොන්දේසි යටතේ වුවද මෙරටේ වැසියන් හට සර්වජන ඡන්ද අයිතිය ලැබී මේ වන විට දශක අටකට වඩා වැඩි කාලයක් ගත වී ඇත. එදා මෙදා තුර මෙරටේ ජනයා හට තමන් අභිමත නියෝජිතයන් ව්‍යවස්ථාදායක සභාව වෙත තෝරා පත් කර ගැනීමේ අවස්ථාව මැතිවරණ හරහා වරින් වර ලැබුණු අතර එය බොහෝ විට සිදු වූයේ සමස්ථ රටම ආවරණය වන පරිදි පවත්වන මහ මැතිවරණයක් හරහාය. ඒ අනුව නව මැතිවරණ ක්‍රමයක් යටතේ පුළුල් ජන සහභාගීත්වයකින් යුක්තව මෙරටේ පවත්වනු ලැබූ ප්‍රථම මහ මැතිවරණය වසර 1947 දී පවත්වා ඇත. එතැන් පටන් මේ දක්වා මහ මැතිවරණ 15ක් පමණ මෙරටේ පවත්වා ඇති අතර 1982 පැවති ජනමත විචාරණය ද ඊට ඇතුළත්ය. මෙකී මැතිවරණ 15 තුළ දක්නට ලැබුණු අනෙකුත් සුවිශේෂත්වය වන්නේ එකම වර්ෂයක් තුළ මහ මැතිවරණ දෙකක් පැවැත්වීමට සිදු වීමයි. ඒ වසර 1960 මාර්තු හා 1960 ජූලි වශයෙනි. පසුගිය දා පැවති ජනාධිපතිවරණයේ

www.nation.lk



**1978න් පසු මෙරටේ පැවැත්වෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයකදී විධායක ජනාධිපතිවරයා මැදහත් ස්වභාවයකින් කටයුතු කරමින් තමන් නියෝජනය කරන පක්ෂය දිනවීම සඳහා මැතිවරණ සටනට නායකත්වය නොදී සිටීම.**

ජනපති මෛත්‍රී ජාතිය අමතමින්

එක් සුවිශේෂත්වයක් වූයේ මෙරටේ ප්‍රථම වරට මිලියන 15 කට අධික ඡන්දදායකයන් සංඛ්‍යාවක් ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලබා තිබීමයි. මෙවර මහ මැතිවරණය සඳහා ද උපයෝගී කර ගනු ලබන්නේ වසර 2014 අවසන් වරට යාවත්කාලීන කරන ලද ඡන්දදායක ලැයිස්තුව බැවින් මෙවර ද ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලත් ඡන්දදායකයන් සංඛ්‍යාව, මෙම වසර මුල පැවති ජනාධිපතිවරණයේදී ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලත් ඡන්දදායක සංඛ්‍යාව හා සමානය . එමෙන්ම මැතිවරණයක් පැවැත්වෙන කාලසීමාව තුළ අවධානයට ලක් වන තවත් විශේෂිත කරුණක් වන්නේ අදාළ වර්ෂය තුළ කවර තරම් සංඛ්‍යාවක නව ඡන්ද හෙවත් පාවෙන ඡන්ද ප්‍රමාණයක් පවතී ද යන්නයි. වසර 2008 සිට වසර 2014 දක්වා සුදුසුකම් ලත් ඡන්දදායකයන් සංඛ්‍යාව පහතින් දක්වා ඇති අතර ඒ අනුව පැහැදිලි වන්නේ සෑම වර්ෂයක ම ලක්ෂ දෙකකට ආසන්නව නව ඡන්දදායකයන් ප්‍රමාණයක් වාර්ෂිකව ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලබන බවයි. එය සමස්ථ ලියාපදිංචි සංඛ්‍යාවෙන් 2%ක් ලෙස සැලකිය හැකිය.

| වර්ෂය | සුදුසුකම්ලත් ඡන්දදායකයන් සංඛ්‍යාව |
|---|---|
| 2008 | 14,088,500 |
| 2010 | 14,222,290 |
| 2009 | 14,315,417 |
| 2011 | 14,268,064 |
| 2012 | 14,456,253 |
| 2013 | 14,752,168 |
| 2014 | 15,044,490 |

1977 දී පමණ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීමෙන් අනතුරුව මේ වන විට මෙරටේ පාර්ලිමේන්තු සැසිවාර 7ක් පමණ පවත්වා ඇත. 8වැනි පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයන් තෝරා ගැනීමට නියමිත මෙවර මැතිවරණයේ මේ ගෙවී යන්නේ පූර්ව මැතිවරණ ප්‍රචාරක සමයයි. මෙකී සමය තුළ දක්නට ලැබුණු සුවිශේෂතා කිහිපයක් මෙහිලා කෙටියෙන් දැක්වීම වටී.

- 1978න් පසු මෙරටේ පැවැත්වෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයකදී විධායක ජනාධිපතිවරයා මැදහත් ස්වභාවයකින් කටයුතු කරමින් තමන් නියෝජනය කරන පක්ෂය දිනවීම සඳහා මැතිවරණ සටනට නායකත්වය නොදී සිටීම.
- ස්වාමීන් වහන්සේලා වැඩි ප්‍රමාණයක් (36) නාම යෝජනා ලබා දී ඇති (ජාතික ලැයිස්තුව ද ඇතුළත්ව) මැතිවරණය මෙය වීම.
- මෑත කාලීනව පැවති මහ මැතිවරණයකදී පූර්ව මැතිවරණ ප්‍රචාරක සමයක් තුළ මෙතෙක් වාර්තා වූ අවම සිද්ධි සංඛ්‍යාවක් වාර්තා වීම.
- ඊට අමතරව වන්නි මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා පමණක් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් 28ක් මැතිවරණය සඳහා නාම යෝජනා ලබා දී තිබීම ද මෙහිලා යම් සුවිශේෂීත්වයක් දරණ සංසිද්ධියක් බව පැහැදිලි වන කරුණකි.

ඒ අතර ඕනෑම මැතිවරණයකදී වඩාත් සැලකිල්ලක් දැක්විය යුතු සුවිශේෂී කාරණා සමුදායක් ඇති අතර පහත අවධානය යොමු කර ඇත්තේ ඉන් කාරණා කිහිපයක් පමණකි. පූර්ව මැතිවරණ ප්‍රචාරක සමය තුළ තම ප්‍රචාරක කටයුතු කිරීමේදී අපේක්ෂකයන් හට සම අවස්ථා ලැබී තිබේද? ප්‍රතික්ෂේපිත (නරක් වූ ඡන්ද) ඡන්ද ප්‍රමාණය අවම කර ගැනීම සඳහා යම් ක්‍රමවත් වැඩ පිළිවෙලක් මැතිවරණ දෙපාර්තමේන්තුව සතුව තිබේද? සෑම මැතිවරණයක් පාසා ම තම ඡන්දය භාවිතා කිරීමේදී විවිධ අපහසුතා වලට ලක්වන පිරිස් සඳහා මෙවර ප්‍රමාණවත් පහසුකම් සලසා තිබේද?

**පූර්ව මැතිවරණ ප්‍රචාරක සමය හා මැතිවරණ නීති උල්ලංඝණය කිරීම**

මීට සති දෙකකට පමණ පෙර පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් හරහා අපේක්ෂකයන් පමණක්




**මෙරටේ මැතිවරණ ක්‍රියාදාමය නිරීක්ෂණය කිරීමේදී ප්‍රත්‍යක්ෂ කරුණක් වන්නේ මූල්‍ය හා පරිවාර සම්පතින් අගතැන්පත් අපේක්ෂකයන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ලබා ගන්නා ප්‍රචාරය අනෙකුත් අපේක්ෂකයන් හට නොලැබී යන බවයි. ශ්‍රී ලංකාව තුළ අපේක්ෂකයන්ගේ ප්‍රචාරක කටයුතු සඳහා නිශ්චිත මුදල් සීමාවක් නොමැත.**

නොව අනෙකුත් අදාළ පාර්ශව ද යම් තිගැස්මකට ලක් විය. එනම් දේශපාලන පක්ෂ ආධාරකරුවන් ගෙන්ගෙට ගොස් ඡන්ද ආයාචනා කිරීම ප්‍රශ්නකාරී බවත් එවැනි අවස්ථාවක යමෙක් අපහසුවට පත්වන්නේනම් පොලිස් හදිසි ඇමතුම් අංශයට අමතන ලෙසත් ය. මෙය තරමක් විමතිය දනවන කරුණක් වූයේ එවැනි ප්‍රකාශයක් මෙතෙක් පොලිස් දෙපාර්තමේන්තුව හරහා නිකුත්ව නොතිබීමයි. එහිදී මෙවැනි තීරණාත්මක ප්‍රකාශයක් කිරීමට පෙර මැතිවරණ කොමසාරිස්තුමා විමසීමේ අතීත සම්ප්‍රදාය ආරක්ෂා කිරීමට ඔහු අසමත්ව තිබුණි. ඊට සමගාමීව අපේක්ෂකයන් හා ඥාතීන් නොවන 25 දෙනෙකුට පමණ ගෙන්ගෙට ගොස් තම ප්‍රචාරක කටයුතු කිරීමේ නිසි අවස්ථාව මැතිවරණ කොමසාරිස්තුමා දේශපාලන පක්ෂ වලට ලබා දෙන ලදී. එමෙන්ම නීති විරෝධි ප්‍රචාරක කටයුතු අඩපණ කිරීමෙහිලා පොලිසිය මෙතෙක් ගෙන ඇති උත්සාහය ද ප්‍රශංසාවට ලක් කළ යුතුය. මැතිවරණ ප්‍රචාරක සමය තුළ මෙතෙක් ක්‍රියාත්මක තත්ත්වය මැතිවරණයක පැවැතිය යුතු සාමාන්‍ය තත්ත්වය බව විශේෂයෙන් සටහන් කළ යුතු නැත. මෙහිදී සැලකිය යුතු මූලික කාරණයක් වන්නේ සියලු අපේක්ෂකයන් සඳහා 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනත මඟින් උදාකර ඇති සම අවස්ථා තම මැතිවරණ ප්‍රචාරණය සඳහා සියලු අපේක්ෂකයන් හට ලැබෙන්නේ ද යන්නයි. මෙතෙක් මෙරටේ මැතිවරණ ක්‍රියාදාමය නිරීක්ෂණය කිරීමේදී ප්‍රත්‍යක්ෂ කරුණක් වන්නේ මූල්‍ය හා පරිවාර සම්පතින් අගතැන්පත් අපේක්ෂකයන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ලබා ගන්නා ප්‍රචාරය අනෙකුත් අපේක්ෂකයන් හට නොලැබී යන බවයි. ශ්‍රී ලංකාව තුළ අපේක්ෂකයන්ගේ ප්‍රචාරක කටයුතු සඳහා නිශ්චිත මුදල් සීමාවක් නොමැත. එවැනි පසුබිමක මෙවැන්නක් පාලනය කිරීම අපහසු වුවද අනෙකුත් අපේක්ෂකයන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමට විධිමත් මැතිවරණ ක්‍රියාවලියක් පැවතිය යුතුය යන්න අවිවාදිත කරුණකි. වරෙක ඡන්දදායකයන් දසදහසකගෙන් සමන්විත ඡන්දදායක ප්‍රදේශයක් ආවරණය වන පරිදි අදාළ අපේක්ෂකයන්ගේ නම් හා අංක සඳහන් පුවරු සෑම මැතිවරණ කොට්ඨාශයක් හරහා ප්‍රදර්ශනය කිරීමට සලකා බැලිය හැකියැයි මැතිවරණ කොමසාරිස්තුමා යොජනා කළේද අපේක්ෂකයන් හට සම අවස්ථා ලබාදීම සඳහා ගතයුතු පියවරක් ලෙසිනි. නමුත් මැතිවරණ කාල සීමාවේදී පමණක් තම පක්ෂයේ ජයග්‍රහණය උදෙසා දිවි හිමියෙන් කැප වන දේශපාලන පක්ෂ, මැතිවරණ ක්‍රියාවලියේ ප්‍රතිසංස්කරණ සඳහා තම දායකත්වය ලබා දීමට මැලි වීම දශක ගණනාවක් තිස්සේ මෙරටේ දක්නට ලැබෙන සාමාන්‍ය තත්ත්වයයි. නිදහස් තැපැල් සේවාව හා ඡන්ද කාඩ් පත සමඟ අපේක්ෂක නාමාවලියක් නිවෙස් වෙත තැපෑලෙන් යැවීම ආදී අවම පියවර මැතිවරණ කාල සීමාව තුළ පැවතුන ද තම නම හා අංකය ප්‍රචලිත කිරීම සඳහා සාමාන්‍ය අපේක්ෂකයෙක් දැරිය යුතු වෙහෙස ඉතා ප්‍රභලය. මැතිවරණ බල ප්‍රදේශය දිස්ත්‍රික්කයක් වී ඇති බැවින් යම් පමණකට වත්මනේ පවතිනවාට වඩා විකල්ප අවස්ථා සාමාන්‍ය අපේක්ෂකයන්ට ලැබිය යුතුයැයි පැවසීම අසාධාරණ නැත. එසේ නොමැති වුවහොත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ජනතාවට අමතන අපේක්ෂකයන් හට වැඩි අවස්ථා හිමි වන්නේයැයි නැගෙන චෝදනාව බැහැර කළ නොහැකිය.

### නරක් වූ ඡන්ද

සෑම මැතිවරණයක් පාසා ප්‍රතික්ෂේප වන ඡන්ද ප්‍රමාණය පිළිබඳව මෙතෙක් අදාළ පාර්ශව දක්වා ඇති සැලකිල්ල ප්‍රමාණවත් ද යන්න ගැන ඇත්තේ බලවත් ප්‍රශ්නාර්ථයකි. පසුගිය මහ මැතිවරණයේ ප්‍රතික්ෂේපිත ඡන්ද ප්‍රමාණය සලකා බලන විට පැහැදිලි වන්නේ එය මෙතෙක් මෙරටේ පැවති මහ මැතිවරණයක ඉහළම නරක් වූ ඡන්ද ප්‍රමාණය බවයි. එය පහත සටහනින් මනාව පැහැදිලි වේ. මෙසේ නරක් වන ඡන්ද ප්‍රමාණය බොහෝ විට තම විරුද්ධත්වය පළ කිරීමට භාවිතා කරන ලද ඡන්ද ලෙස යමෙකුට නිර්වචනය කළ හැකිය. එහෙත් සෑබෑ තත්ත්වය වන්නේ ග්‍රාමීය හා වතු ආශ්‍රිත ජනතාව ඡන්දය භාවිතා කිරීම පිළිබඳව යම් අවබෝධයක් ලබා දීම කාලීන අවශ්‍යතාවයක් බවයි. සෑම මැතිවරණයක් පාසාම මැතිවරණ කොමසාරිස්තුමා ඊට අදාළව ජනතාව දැනුවත් කිරීම සඳහා විශාල ප්‍රයත්නයක්

www.sundaytimes.lk



**සෑම මැතිවරණයක් පාසාම තම වටිනා ඡන්දය භාවිතා කිරීමට නොහැකිව අපහසුවට පත්වන තවත් එක් පිරිසක් වන්නේ යම්යම් ආබාධ සහිත පුද්ගලයන්ය. එහිලා වඩාත් බලපෑමට ලක් වන්නේ දෘශ්‍යාබාධ හා වෙනත් දැඩි ආබාධ නිසා අදාළ ඡන්ද මධ්‍යස්ථාන කරා ප්‍රවේශ වීමට අපහසු ඡන්දදායකයන්ය.**

ආබාධිත අයෙකු ඡන්දය භාවිතා කරමින්

දැරුවත් එය සෑම ඡන්ද කොට්ඨාශයක්ම ආවරණය කිරීමට තරම් ප්‍රමාණාත්මක නැත. ඒ නිසාම මැතිවරණ කොමසාරිස්තුමා ඒ පිළිබඳ ඡන්දදායකයන් දැනුම්වත් කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇති අතර ඒ අනුව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) ඊට අදාළ වැඩ පිළිවෙලක් මේ වන විටත් ආරම්භ කර ඇත. ඉදිරි මැතිවරණ වලදී මෙවැනි කාරණා පිළිබඳව තම පූර්ණ අවධානය අදාළ බලධාරීන් යොමු කළ යුතු අතර ඒ සඳහා දිවයිනම ආවරණය වන පරිදි යම් විශේෂ වැඩපිළිවෙලක් නිර්මාණය විය යුතුව ඇත. පහත වගුව තුළ එදාමෙදා තුර පැවති මහ මැතිවරණයන්හි ඡන්ද නරක් වී ඇති ආකාරය පිළිබඳව දළ සටහනක් දැක්වේ.

| මැතිවරණය පැවති වර්ෂය | ප්‍රතික්ෂේපිත ඡන්ද ගණන | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| 1947 | 44,569 | 2.307% |
| 1952 | 37,386 | 1.581% |
| 1956 | 30,514 | 1.140% |
| 1960 මාර්තු | 31,246 | 1.000% |
| 1960 ජුලි | 22,235 | 0.725% |
| 1965 | 34,101 | 0.836% |
| 1970 | 26,606 | 0.530% |
| 1977 | 33,035 | 0.526% |
| 1982 ජනමත විචාරණය | 2,456 | 0.372% |
| 1989 | 365,563 | 6.132% |
| 1994 | 400,389 | 4.798% |
| 2000 | 481,155 | 5.271% |
| 2001 | 493,944 | 5.227% |
| 2004 | 534,948 | 5.460% |
| 2010 | 596,972 | 6.917% |

ඉහත වගුවෙන් මනාව පැහැදිලි වන පරිදි සෑම මැතිවරණයක් පාසා නරක්වන ඡන්ද ප්‍රමාණය වැඩි වී ඇති අතර එය පසුගිය මහ මැතිවරණයේදී ඉහළ ම ප්‍රතිශතයක් වාර්තා කර ඇත. එසේ ප්‍රතික්ෂේපිත ඡන්ද වලින් යම් ප්‍රමාණයක් තම විරෝධය පළ කිරීම සඳහා කටුගා දමන ලද ඡන්ද විය හැකිය. එහෙත් අපගේ අත්දැකීම වන්නේ ග්‍රාමීය හා වතු ආශ්‍රිත ප්‍රදේශ වල දිවි ගෙවන ජනතාව ඡන්දය ප්‍රකාශ කරන්නේ කෙසේද යන්න පිළිබඳව පුළුල් අවබෝධයකින් නොසිටින බවයි. මැතිවරණ දෙපාර්තමේන්තුව සෑම මැතිවරණයක් පාසා ජනතාව දැනුවත් කිරීමට වෙහෙසක් දැරුවද එය ප්‍රමාණාත්මකව සමස්ථ දිවයිනම ආවරණය නොකරන්නක් බැවින් සිවිල් සංවිධාන වල සහාය ඊට අවශ්‍යය. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ඒ සඳහා මෙවර මැතිවරණයේදී ද මැතිවරණ දෙපාර්තමේන්තුවට ද සහාය ලබා දීමට නියමිතය.

### ආබාධිත ඡන්ද දායකයන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම

සෑම මැතිවරණයක් පාසාම තම වටිනා ඡන්දය භාවිතා කිරීමට නොහැකිව අපහසුවට පත්වන තවත් එක් පිරිසක් වන්නේ යම්යම් ආබාධ සහිත පුද්ගලයන්ය. එහිලා වඩාත් බලපෑමට ලක් වන්නේ දෘශ්‍යාබාධ හා වෙනත් දැඩි ආබාධ නිසා අදාළ ඡන්ද මධ්‍යස්ථාන කරා ප්‍රවේශ වීමට අපහසු ඡන්දදායකයන්ය. එහෙත් මෙවර යම් සුභවාදී වෙනසක් ඇති වී ඇත. මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතා 2015 මැයි මස 7 වන දින නිකුත් කළ අංක DE/LI/PR/03 දරණ චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකාවේ ආබාධවලින් පෙළෙන සියලු පුද්ගලයින්ට ඡන්දය දීමේ අයිතිය සහතික කිරීමට ප්‍රශංසාත්මක පියවරක් ගෙන ඇත. ඊට අදාළව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV), ඒ සඳහා උනන්දුවක් දැක්වූ අනෙකුත් ආයතන හා එක්ව (සබල ලංකා පදනම (ELF), ආචාර්ය ෂ්‍යාමනි හෙට්ටිආරච්චි (ආබාධිත අධ්‍යයන දෙපාර්තමේන්තුව-කැලණිය විශ්ව විද්‍යාලය), CBM ශ්‍රී ලංකා, GIZ-FLICT සංවිධානය,

www.theindependent.lk



බිලුමැන්ඩල් වෙඩි තැබීමෙන් පසුව

**මෑත කාලීනව ශ්‍රී ලංකාවේ පැවති මැතිවරණ තුළදී අත්දකින ලද සුලභ සිදුවීම වූයේ අසීමිත ලෙස රාජ්‍ය දේපළ අවභාවිතය හා පවත්නා ආණ්ඩුවේ ආධාරකරුවන් ප්‍රතිපාක්ෂිකයන් වෙත මුදා හරිනු ලබන භිෂණයයි. නමුත් මෙවර නාමයෝජනා ලබා දීමෙන් අනතුරුව ගෙවී ගිය පළමු සති දෙක තුළ වාර්තා වූ සිද්ධි ප්‍රමාණය සංසන්ධනාත්මකව බලන කළ අවම මට්ටමක පවතින බව පෙනී යයි.**

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය (ICES), නවජීවන පුනරුත්ථාපන ආයතනය (තංගල්ල) හා Wheels in Motion (WIM) සංවිධානය)බමැතිවරණ කොමසාරිස්වරයාගේ පියවර අගය කරමින් ලිපියක් භාර දෙන ලදි. එකී චක්‍රලේඛය මඟින් ඔහු තම සියලු සහකාර කොමසාරිස්වරුන් හට ආබාධිත ඡන්දදායකයන්ගේ ඡන්ද අයිතිය අරිකෂා කිරීම සඳහා ගතයුතු පියවර පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ නිකුත් කර ඇත.

ආසියා - පැසිෆික් කලාපය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසමේ (UN-ESCAP) සංඛ්‍යා ලේඛනවලට අනුව රටේ ආසන්න වශයෙන් ආබාධ සහිත පුද්ගලයන් මිලියන 1.4 ක් සිටින අතර එම ප්‍රමාණය සැලකිය යුතු ඡන්ද පදනමකින් සමන්විත වෙයි. කෙසේ වුව ද ඔවුන්ට වෙන්කර තිබෙන ඡන්ද පොළවල් වෙත ප්‍රවේශයට, ඡන්ද ලියකියවිලි කියවා ගැනීමට හා ඔවුන්ගේ ඡන්දය පාවිච්චි කිරීමට ඔවුන්ට ඇති හිමිකමට අදාළව පවත්නා විධිවිධාන (නීතිරීති) පිළිබඳව ඔවුන් දැනුම්වත්ව සිටී ද යන්න සම්බන්ධයෙන් පවතින්නේ යම් ගැටළු සහගත තත්වයකි.

මෙහිදී ඡන්දය දීමට ලියාපදිංචි වී සිටින ආබාධ සහිත පුද්ගලයින් ගණන විමර්ශනය කිරීම හා ඔවුන්ගේ සාධාරණ පහසුකම් සලසා දීම සම්බන්ධව සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත නිකුත් කර ඇති මෙකී චක්‍රලේඛය එළඹෙන මහ මැතිවරණයේ දී ඉමහත් සේ ප්‍රයෝජනවත් වන බව සිහිකළ යුතුය. සියලුම පුද්ගලයින්ට සිය ආබාධිතතාවන් නොසලකා සහෝදර පුරවැසියන් සමග සිය ඡන්දය දීමේ අයිතිය සමානව භාවිතයට යෙදීමේ අවස්ථාව සලසන අන්තර්ග්‍රහනීය මැතිවරණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීමෙහිලා මැතිවරණ දෙපාර්තමේන්තුවේ තීරණාත්මක භූමිකාව පිළිබිඹු කරනසුළු මෙකී පියවර තවත් සාර්ථක වීමට නම් ගත යුතු තවත් ක්‍රියා මාර්ග රාශියක් ඉතිරිව ඇත. එහි පළමු පියවර ලෙස විවිධ භූගෝලීය වෙනස්කම් නිසා උස්මට්ටම් වල පිහිටුවා ඇති ඡන්ද මධ්‍යස්ථාන, ආබාධිත පිරිස් හට ප්‍රවේශ වීමට පහසු ලෙස වෙනස් කළ යුතුව ඇති අතර ඊට අදාළ තක්සේරුවක් මේ වන විටත් ආරම්භ වී තිබීම සැළකිය යුතු මට්ටමේ ප්‍රගතියක් බව සටහන් කිරීම වටී.

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා :**

මෑත කාලීනව ශ්‍රී ලංකාවේ පැවති මැතිවරණ තුළදී අත්දකින ලද සුලභ සිදුවීම වූයේ අසීමිත ලෙස රාජ්‍ය දේපළ අවභාවිතය හා පවත්නා ආණ්ඩුවේ ආධාරකරුවන් ප්‍රතිපාක්ෂිකයන් වෙත මුදා හරිනු ලබන භිෂණයයි. නමුත් මෙවර නාමයෝජනා ලබා දීමෙන් අනතුරුව ගෙවී ගිය පළමු සති දෙක තුළ වාර්තා වූ සිද්ධි ප්‍රමාණය සංසන්ධනාත්මකව බලන කළ අවම මට්ටමක පවතින බව පෙනී යයි. මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා නිවේදන එලෙසින්ම පිළිපදින නිලධාරී තන්ත්‍රයක් හා පොලිස් දෙපාර්තමේන්තුවක් බිහි වී තිබීම සැබවින්ම ආශ්චර්යජනකය. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන්, පූර්ව මැතිවරණ ප්‍රචාරක සමය තුළදී භාවිතා කිරීමට නියමිත නිළරථ වේ නම් ඒ සඳහා යම් මුදලක් ගෙවීමට තමන් සූදානම් යැයි මැතිවරණ කොමසාරිස්වරයා හට දැනුම් දීමක් කර ඇත. පසුගිය ජනාධිපතිවරණයේ රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමට අදාළ සංඛ්‍යාලේඛන හා රජයට ප්‍රධාන දේශපාලන පක්ෂ ගෙවිය යුතු මුදල පිළිබඳව සලකා බලන විට පෙනී යන්නේ මෙවැනි පියවර පක්ෂ භේදයකින් තොරව අගය කළ යුතු බවයි. එහි වඩාත් සරදම්සහගත සිදුවීම වන්නේ තම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය සඳහා රාජ්‍ය දේපළ රිසි සේ යොදාගත් අපේක්ෂකයන් පවා තමන් දැනට භාවිතා කරන රජයේ නිළරථ සඳහා එලෙස ගෙවිය යුතු මුදල ගෙවා දැමීමට පියවර ගෙන තිබීමයි. පසුගිය මැතිවරණ වලදී වාර්තා වූ සිද්ධීන් පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් පහතින් පළ වේ.

කෙසේ වුවද ඉහත දත්ත සලකා බැලීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ ශ්‍රී ලාංකීය ජන සමාජය මේ තාක් මැතිවරණ

www.omlanka.net



**එක් එක් දේශපාලඥයන් කවර දේශපාලන පක්ෂයේදැයි හඳුනාගත නොහැකි තරම් තම ආවේනික දේශපාලන ප්‍රතිපත්ති වෙනස් කරමින් පිල් මාරු කරන සමයක, ඔවුන්ගේ ජය උදෙසා අසරණ පාක්ෂික ජනතාව එකිනෙකා හා ඇණකොටා ගන්නා සංස්කෘතිය නිමා කිරීමේ ප්‍රයත්නය ද මෙවැනි මැතිවරණ හරහා මතු කර ගත යුතුව ඇත.**

එක්සත් ජාතික පෙරමුණේ ගිවිසුම් අත්සන් කරමින්

පාර්ලිමේන්තු මහ මැතිවරණයන්හී විශ්ලේෂණාත්මක සාරාංශයක්
පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන්

| මහ මැතිවරණය | බරපතළ සිද්ධීන් | සුළු සිද්ධීන් | මුළු සිද්ධීන් සංඛ්‍යාව | මිනිස් ඝාතන | ගිනිඅවි භාවිතයන් | ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| මහ මැතිවරණය 2000 | 1120 | 924 | 2044 | 66 | 444 | 75.63% |
| මහ මැතිවරණය 2001 | 1562 | 1173 | 2735 | 48 | 677 | 76.03% |
| මහ මැතිවරණය 2004 | 643 | 1104 | 1747 | 5 | 143 | 75.96% |
| මහ මැතිවරණය 2010 | 232 | 182 | 414 | 1 | 55 | 61.26% |

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මූලාශ්‍ර ඇසුරෙන්

ආශ්‍රිතව හට ගන්නා භීෂණයෙන් සපුරා ඈත්ව නැති බවයි. යම් ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු වූ කළ එය මනාප ක්‍රමය නිසා හට ගන්නා එකක් යැයි හඬ නගන පිරිස් නැවත සළකා බැලිය යුතු කරුණක් වන්නේ මැතිවරණ ආශ්‍රිතව හට ගන්නා යම්යම් ප්‍රචණ්ඩ ක්‍රියා ඊටම ආවේනික සිද්ධිදාමයක් නොව රටේ හාත්පස පවත්නා නීතියේ ආධිපත්‍යයේ බිඳ වැටීම, විසම්මුතියට ගරු කරන සුළු සමාජයක් නොතිබීම, වරදට සමාව දෙන සුළු සංස්කෘතියක් රාජ්‍ය මට්ටමින් බිහි වී තිබීම, සංඝ සමාජය ඇතුළුව ආගමික සංස්ථාව තම යුතුකම් හා වගකීම් නිසියාකාරව අවබෝධ කර නොගනිමින් බල දේශපාලනයේ පංගුකාරයන් වීමට උත්සහා කිරීම ආදී සමාජ යථාර්තයන් සමඟ එක පෙළට වැටී ඇති එකක් බවයි. යම් තරමකට අනාගතය පිළිබඳව අස්වැසිල්ලක් ලබන්නට නම් 19වන සංශෝධනය හරහා ප්‍රතිෂ්ඨාපිත ස්වාධීන කොමිෂන් සභා නිසියාකාරව ක්‍රියාත්මක කරවන මට්ටමකට ජනතා පෙළ ගැස්මක් නිර්මාණය කළ යුතුව ඇත. එමෙන්ම එක් එක් දේශපාලඥයන් කවර දේශපාලන පක්ෂයේදැයි හඳුනාගත නොහැකි තරම් තම ආවේනික දේශපාලන ප්‍රතිපත්ති වෙනස් කරමින් පිල් මාරු කරන සමයක, ඔවුන්ගේ ජය උදෙසා අසරණ පාක්ෂික ජනතාව එකිනෙකා හා ඇණකොටා ගන්නා සංස්කෘතිය නිමා කිරීමේ ප්‍රයත්නය ද මෙවැනි මැතිවරණ හරහා මතු කර ගත යුතුව ඇත. මනෝ විද්‍යාඥය සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් රචිත ‘Civilization and its discontents’ නම් ග්‍රන්ථයේ අඩංගු එක් ප්‍රකට සංකල්පයක් වන්නේ ‘Narcissism of minor differences’ යන්නයි. එහි දළ අදහස ලෙස දැක්විය හැක්කේ “සුළු සුළු වෙනස්කම් මහා වෙනස්කම් බවට පත් කිරීමට තරම් මනුෂ්‍යයා සතු විනාශකාරී ආශාව” යන්නයි. ඉහත සඳහන් කළ පරිදි පිල්මාරු දේශපාලනයේ ඉස්මත්තට පැමිණ ඇති ශ්‍රී ලාංකීය දේශපාලනය තුළ අරගල කර ගැනීමට තරම් දැඩි වෙනස්කම් සහිත දේශපාලන මතවාද මේ වන විට පවතින්නේ ඉතා සුළු වශයෙනි. එක් අපේක්ෂකයෙකුගේ ජය පතා තවත් අපේක්ෂකයෙක් හෝ ඔහුගේ ආධාරකරුවෙක් බිම හෙළා ප්‍රචණ්ඩත්වයක් නිර්මාණය කිරීමට උත්සාහ කරන පුද්ගලයන් තුළ ඇත්තේ ද සුළු සුළු වෙනස්කම් පමණක් වන අතර ඒවා අතිශය පෞද්ගලික ඒවා මිස බරපතල දේශපාලන මතිමතාන්තර නොවේ. ඒ අනුව මෙකී ප්‍රචණ්ඩක්‍රියා යනු  සුළු සුළු වෙනස්කම් එකිනෙකා අතර ද්වේෂය ජනිත කරවනසුළු මට්ටම කරා ලඟාවීමේ සාමාන්‍ය මනුෂ්‍ය චර්යාවක් මිස අන්කිසිවක් නොවන බව ඉහත ෆ්‍රොයිඩ්ගේ සංකල්පය හා මනාව විශද ද වේ. එහෙත් එවැන්නක් ජනීජනයාට අවබෝධ කර දීමට තරම් විවේකී බුද්ධියක් සමාජයට තිබේද යන්න ගැටළු සහගතය. ●



මහාචාර්ය
**ජයන්ත සෙනෙවිරත්න**



www.president.gov.lk

මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ලෙස දිවුරුම් දීම

# බෙදුණු අතීතයකින් හවුල්කාර අනාගතයක් කරා පියමං කරමු

2009 වසරේ දී පැවති ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටලුවට යුධමය විසඳුමක් ලබාදුන් අවස්ථාවේ දී බොහෝ දෙනෙකු කල්පනා කළේ ඇති වූ සංක්‍රාන්තික සමය තුළ රාජ්‍යය 'නව ආරම්භයක්' ලබා ගනිමින් දැවැන්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට අවතීර්ණ වනු ඇති බව ය. එම සංක්‍රාන්තික සමයේ ඉටුකළ යුතුව තිබූ යුක්තිය 'සංක්‍රාන්තික යුක්තිය' (Transitional Justice) ලෙසට හැඳින්වේ. එය කෙටිකාලීනවත් සහ දීර්ඝ කාලීනවත් ඉටුකළ යුතු ව තිබූ දැවැන්ත ක්‍රියාවලීන් සමූහයකින් යුතු වැඩ පිළිවෙළකි. පැවති යුධමය පීඩාකාරී සහ භීෂණකාරී තත්ත්වය යහපත් අතට මාරු වෙමින් පවතින අවස්ථාවේ දී ගතයුතු ලිබරල් මානව අයිතිවාසිකම් ප්‍රවේශයේ කෙටිකාලීන වැඩ පිළිවෙළ ලෙසට යුද්ධයේ දීත්, ඊට පෙරාතුවත් සිදු වූ මානව විරෝධී ක්‍රියාවන් විභාග කිරීම සඳහා අධිකරණ හෝ අධිකරණ නොවන ක්‍රියාමාර්ග මගින් වැරදි කළවුන්ට



හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා හට පිරිස් සමග

**රාජපක්ෂ බල ආධිපත්‍යයේ ඉලක්කය වූයේ අසමමිතික බලය ජන විඥානය තුළට ද කාන්දුකරලීම ය. සිංහල-බෞද්ධයන් තුළ ද සුළු ජාතීන්හට බලය පාවිච්චි කළ හැකි වග ජනනය කිරීමට ඔවුහු සමත් වූහ. බල ආධිපත්‍යයේ මූලාකෘතිය අභ්‍යාසය වනාහි යුද්ධය වන බවත් එය මොන තරම් අශික්ෂිත හා කුරිරු වුව ද යුද්ධය සාධාරණීය කිරීමට තරම් සිංහල බෞද්ධ ජනයා පෙළ ගැසුණාහු ය.**

දඬුවම් දීම මගින් විපතට පත් ජනයාට සහනය ලබාදීම, සත්‍ය සෙවීමේ කොමිසන් සභා ස්ථාපිත කොට සිද්ධීන්ගේ පූර්ණ සත්‍යය හෙළිදරව් කර ගැනීමට ජනතාවට අවස්ථාව සලසා දීම, ඒ මගින් ජනතාව සුවපත් වීමේ ක්‍රියාවලියකට අවතීර්ණ කරලීම, වරද නිවැරදි කර ගැනීම සඳහා වූදිතයන්ට ද අවස්ථාව සලසා දීම, සමාව ගැනීම, සමාව දීම ආදී සමගි සංධාන ක්‍රියාවලියකට අවශ්‍ය කරන සියලු අංගෝපාංග රාශියක් මෙම කෙටිකාලීන සංක්‍රාන්තිය යුක්ති සමයට අයත් වේ. මැක්ස් වෙබර් පැවසූ ආකාරයට එය අලුත් බන්ධුත්වයකට (elective afinigy) මඟපාදන අවස්ථාවක් වන්නේ ය.

සංක්‍රාන්තීය යුක්තියේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ වනාහි රාජ්‍යයත් එහි පුරවැසියනුත් ඒකාබද්ධව අතීත දේශපාලන ක්‍රමය නිසා සිදුවූ අසාධාරණකම්වලට සහනය ලබා දී අලුත් දේශපාලන සමාජයීය සහ ආර්ථික සංස්කෘතියක් අනාගතයට බලපාන පරිදි වර්තමානයේ ඇතිකරලීමයි. ඒ සඳහා පහත දැක්වෙන දස වැදෑරුම් වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුව තිබුණි.

1. ජනවාර්ගික ගැටළුවට සාධාරණ දේශපාලන විසඳුමක් ලබාදීම මූලික කොටගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් (නව ව්‍යවස්ථාවක්)
2. රාජ්‍ය ආයතන සියල්ල ප්‍රතිසංවිධානයට ලක් කිරීම
3. යුධ වියදම් දැවැන්ත ලෙස අඩුකොට එහි ප්‍රතිලාභ ජනතාව අතට පත් කිරීම
4. උතුරු-නැගෙනහිර සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීම ස්ථිර යළි පදිංචිය සහ ජීවනෝපාය ගොඩනැංවීම
5. නීතියේ ආධිපත්‍යය පිහිටුවීම
6. මානව අයිතිවාසිකම් සුරැකීම සහ නගාසිටුවීම
7. සිවිල් සමාජය ශක්තිමත් කිරීම
8. පරිපූර්ණ ලෙස ආරක්ෂක අංශ සහ පොලීසිය ප්‍රතිසංවිධාන ගත කිරීම
9. දූෂණය පිටුදැකීම
10. සහභාගීත්වය සහ ප්‍රජාතන්ත්‍රීයකරණයයි.

නමුදු රාජපක්ෂ පරිපාලන විසින් පශ්චාත් යුධ සමාජයේ 'සංක්‍රාන්තීය යුක්තිය' මුළුමණින් ම අකර්මණ්‍ය කරන ලදි. රාජ්‍ය 'නව ආරම්භයකින්' තොරව මිලිටරි ආර්ථික සහ සංස්කෘතික වශයෙන් වූ තම බල ආධිපත්‍යය සුළු ජාතීන්ටත්, අවසානයේ දකුණේ තමන්ට ප්‍රතිවිරෝධය දක්වන කණ්ඩායම්වලටත්, එරෙහිව පතුරුවා හැරියේ ය. රාජපක්ෂ බල ආධිපත්‍යයේ ඉලක්කය වූයේ අසමමිතික බලය ජන විඥානය තුළට ද කාන්දුකරලීම ය. සිංහල-බෞද්ධයන් තුළ ද සුළු ජාතීන්හට බලය පාවිච්චි කළ හැකි වග ජනනය කිරීමට ඔවුහු සමත් වූහ. බල ආධිපත්‍යයේ මූලාකෘතිය අභ්‍යාසය වනාහි යුද්ධය වන බවත් එය මොන තරම් අශික්ෂිත හා කුරිරු වුව ද යුද්ධය සාධාරණීය කිරීමට තරම් සිංහල බෞද්ධ ජනයා පෙළ ගැසුණාහු ය.

යුධමය වශයෙන් එල්.ටී.ටී.ඊ.ය පරාජය කිරීමත් සමග රාජ්‍යයේ ශක්තිමත් මිලිටරි හස්තය සුපුරුදු පරිදිම උතුරේ සිට දකුණ වෙත දිගහැරුම සිදුවූයේ ය. රතුපස්වල, හලාවත, මීගමුව ජනතා උද්ඝෝෂණ ඛේදාන්ත මගින් නිමා කෙරිණ. මාධ්‍ය ආයතනවලට සහ මාධ්‍යවේදීන්ට පහරදුනි. උද්ධච්ඡ පාලකයින්, අගවිනිසුරුවරිය පළවා හැරියේ ඇයට කළ හැකි සියලු අපහාස-උපහාස සිදු කිරීමෙන් අනතුරුව ය. අන්තවාදී බෞද්ධ සේනාවන් නිර්මාණය කොට ආගමික භීෂණයක් නිර්මාණය කෙරිණ. දැයට කිරුළ, නායකත්ව පුහුණුව සහ විදුහල් ප්‍රධානීන්ට 'මිලිටරි තනතුරු වරදාන' ආදී දේ මගින් ජන ජීවිතය හැමවිටම හමුදා මානසිකත්වයකින් යුතුව තබාගැනීම සිදු කෙරිණ. තමන්ව ගිලගැනීමට මාන බලා සිටින 'සතුරෙක්' පිළිබඳව බියක් සිංහල බෞද්ධයන් වෙත ජනනය කිරීම සෑම තත්වරයක් පාසා සිදු කෙරිණ. මේ සියලු දේ සමගින් 'ග්‍රීස්

www.ft.lka



**රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබූ LLRC කොමිසන් සභාවේ සිටියේ එක් ස්ත්‍රී සාමාජිකාවක් පමණි. අනෙක් සියල්ලන් පිරිමින් ය. නමුදු දකුණු අප්‍රිකානු TRC හි 18 දෙනෙකුගෙන් යුතු කොමසාරිස් මණ්ඩලයේ නව දෙනෙකුම ස්ත්‍රීහු වූහ. යුද්ධයේ විපතට පත් ස්ත්‍රීන්ගේ දුක්ගැනවිලි කෙරෙහි රාජපක්ෂලා කොතරම් සංවේදී වූයේ යන්න එයින් ම පැහැදිලි වන්නේ ය.**

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එල්.එල්.ආර්.සී. වාර්තාව කියවමින්

යකා' සූත්‍රගත කොට උතුරු සමාජය වෙත මුදවා හැරියේ මිලිටරි පීඩනයේ තවත් කූටෝපායයක් ලෙසිනි. මෙවැනි අශිෂ්ඨ සංස්කෘතියක් වැළඳ ගැනීමට සලස්වා පාලකයෝ ස්වකීය ආර්ථික සමෘද්ධිය වඩා ගත්හ. ඔවුහු අපගේ සමාජ උරතලය මත ලැගගත් පරපෝෂිතයෝ වූහ. ඔවුන්ගේ බල ආධිපත්‍යය මගින් සිදු කෙරුණු පීඩනය කොතෙක් වී ද යත් සමාජය තුළ විචාරය සහ සංවාදය නිහඬ කෙරිණ. ජනතාවට පීඩකයකු අවශ්‍ය වන තැනට සමාජය සූදානම් කිරීමක් ද සිදු කෙරිණ. වැඩවසම් සම්ප්‍රදායයේ රාජකීය කතා බුරුතු පිටින් සිනමාවට නැගුණු අතර වඳිමින්, ගරු බුහුමන් ලබන රජුන්ට මෙන් පාලකයන්ට ද වඳින පුදන සමාජයක් අපට දැකගත හැකි විය. මෙවැනි සමාජයක ව්‍යාජ බුද්ධිමතුන්ගේ ද හිඟයක් දැකිය නොහැකි බව සිසැක් (Zisek) පැවැසී ය. ඔහුට අනුව එවැනි ව්‍යාජ බුද්ධිමතුන් දෙවර්ගයකි. කෙනෙකු නම් වංචනිකයෙකි. අනෙකා මුග්ධයෙකි. වංචනිකයා තම ලාභ අපේක්ෂා උදෙසා පාලකයන් හා සමගාමී වෙමින් ස්වකීය නිර්මාණ හරහා අපව මෝහනයට පත් කරවයි. මුග්ධයා සමාජ විපර්වර්තනයේ දී විටෙක ඊට හරස් වෙමින් ද තවත් විටෙක නිහඬ වෙමින් ද මර්දනය අනුමත කරන්නෙක් වන්නේ ය. මේ දෙවර්ගයේ ම වංචනිකයන් අපට ආගන්තුක නොවන්නේ ය. නමුදු දෙවැන්නා වාමවාදී වෙස් මුහුණක් පැළඳ සිටින බැවින් බොහෝ විට ජනතාව රැවටීමට ගොදුරු වන්නේ ය.

රාජපක්ෂ පරිපාලනයේ අප දුටු තවත් අශිෂ්ඨ ක්‍රියාවක් වූයේ ස්ත්‍රීන් සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කළ හා අනුබලය දුන් ක්‍රියා පද්ධතිය ය. මා මුලින් සඳහන් කළ පරිදි බල ආධිපත්‍යයේ මූලික ඉලක්කය වන්නේ බල අසමමිතික භාවයයි. එම අසමමිතිකභාවය ස්ත්‍රී-පුරුෂ සමාජ භාවයේ ඉතාමත් කුරිරු සහ නග්න ලෙස පිළිබිඹු වන්නේ යුධ සමයේ දී බව අමුතුවෙන් කිව යුතු නො වේ. යුද්ධයේ දී පුරුෂයන්ට හිමිවන අසීමිත බලය හරහා ඔවුන් උන්මත්තක වන බව පැවසුයේ මාගරීටා සොලෙන්බර්ග් (Margareta Sollenberg) ය. යුද්ධයේ දී ස්ත්‍රීන් විඳි සහ දැනටත් අත්විඳින පීඩනය ලක්ෂයක් ඉක්මවූ උතුරු - නැගෙනහිර ජීවත් වන යුධ වැන්දඹුවන්ට සවන් දීමෙන් අපට දැනගත හැකි වේ. ඔවුන්ගෙන් බොහොමයක් දෙනෙකු එක්කෝ සමූහ දූෂණවලට, නැතහොත් ලිංගික අඩන්තේට්ටම්වලට ලක්වූවන් ය. රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබූ LLRC කොමිසන් සභාවේ සිටියේ එක් ස්ත්‍රී සාමාජිකාවක් පමණි. අනෙක් සියල්ලන් පිරිමින් ය. නමුදු දකුණු අප්‍රිකානු TRC හි 18 දෙනෙකුගෙන් යුතු කොමසාරිස් මණ්ඩලයේ නව දෙනෙකුම ස්ත්‍රීහු වූහ. යුද්ධයේ විපතට පත් ස්ත්‍රීන්ගේ දුක්ගැනවිලි කෙරෙහි රාජපක්ෂලා කොතරම් සංවේදී වූයේ යන්න එයින් ම පැහැදිලි වන්නේ ය. රාජපක්ෂ ආණ්ඩු සමයේ හිටපු අගවිනිසුරුවරියට හිරිහැර කළ ආකාරයත් සේ ම මැති ඇමතිවරුන්ගේ ක්‍රියාකලාප සහ ආකල්ප ස්ත්‍රීන්ට කෙතරම් නිගා ගෙන දෙන්නක් වීද යත් අමුතුවෙන් කිවයුතු නැතැයි සිතමි.

මේ මොහොත ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ ඉතාමත් වැදගත් මොහොත බව අපට කිව හැක්කේ රාජ්‍යයට නව මුහුණුවරක් දීමට ජනතාවගේ පරමාධිපත්‍යය උරගා බැලෙන බැවිනි. ගරාවැටුණු ප්‍රජාතන්ත්‍රවාදය යළි නගා සිටුවීම සඳහා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය බවට අවිවාදිත ය.

බොහෝ පශ්චාත් යුධ සමාජවල යුද්ධයට පෙර තිබූ ව්‍යවස්ථාවන් එක්කෝ ප්‍රතිසංස්කරණය කරනු ලදුව හෝ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගනු ලැබීම හෝ සිදු කෙරිණ.



**අද අපට අවශ්‍ය කරනුයේ ජාතික සමගිය ස්ථාපනය කරන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. ව්‍යවස්ථාව යනු නීතියේ පොදු ආධිපත්‍යයෙහි මුල්ගල විය යුතු ය. ජනතාවක් එකට එක්ව අන්තර් යැපීමෙන් යුතුව ජීවත්වන සමස්ථ චිත්‍රය ඒ මගින් පිළිබිඹුවිය යුතු ය.**

පශ්චාත් වර්ණභේදවාදී දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකසා ගනු ලැබුවේ කළු, සුදු සහ වෙනත් සියලු ජාතීන්ට අයත් ප්‍රජාවන් අතර අන්‍යොන්‍ය විශ්වාසය ගොඩනැංවෙන ආකාරයෙන් ගෙන ගිය දැවැන්ත ක්‍රියාවලියක් හරහා බව අපි දනිමු. නමුදු යුද්ධය නිමාකොට ශ්‍රී ලංකාව පසුගිය වසර හය ගෙවා ගත්තේ පවතින ව්‍යවස්ථාවට තව තවත් දැඩි මධ්‍යගත සහ අධිපතිවාදී අංගෝපාංග එකතු කරගනිමිනි. රාජ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදය පරිහානියට පත්වීමට ප්‍රධාන හේතුවක් වූයේ එයයි. ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළම ආඥාදායකත්වයට දොරටු විවෘත කිරීම සහ එමගින් ජනතා පරමාධිපත්‍යයට අභියෝග කිරීම මගින් රාජපක්ෂ පාලනය විසින් දේශපාලනයේ සදාචාරය අවලස්සන කරන ලද ආකාරය යළි යළිත් විස්තර කළයුතු නැත. අද අපට අවශ්‍ය කරනුයේ ජාතික සමගිය ස්ථාපනය කරන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. ව්‍යවස්ථාව යනු නීතියේ පොදු ආධිපත්‍යයෙහි මුල්ගල විය යුතු ය. ජනතාවක් එකට එක්ව අන්තර් යැපීමෙන් යුතුව ජීවත්වන සමස්ථ චිත්‍රය ඒ මගින් පිළිබිඹුවිය යුතු ය.

ඊළඟට ප්‍රධාන වන්නේ මා මෙම ලිපියෙහි මුලින් සඳහන් කළ පරිදි පශ්චාත් යුද සමාජයේ සංක්‍රාන්තික යුක්තියෙහි ඉටු කළ යුතුව තිබූ දීර්ඝකාලීන වැඩ සටහනේ දස වැදෑරුම් වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීම ය. එවැනි ක්‍රියාමාර්ගවලින් තොරව රාජ්‍යයට ඉදිරිගමනක් ඇත්තේ නැත. නමුදු අවාසනාවකට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ එක්සත් නිදහස් සංධානයට ඒ සම්බන්ධයෙන් දැක්මක් ඇත්තේ නැත. ඔවුන්ගේ සුපුරුදු වාග් විලාස වලිනුත්, මැතිවරණ ප්‍රකාශයෙනුත් කියැවෙන්නේ පරණ වැඩපිළිවෙලම ය. ජාතීන් අතර සහජීවනය (Coexistence), සංහිඳියාව (Harmony) සහ සමගි සංධානය (Reconciliation) ඔවුනට තිත්ත වචන පෙළකි. ජාතික ආණ්ඩුවක් කෙරෙහි කිසිදු පැහැදීමක් ඔවුන් කෙරෙහි නොමැති බවද පැහැදිළි ය. රාජ්‍යයේ සිංහල බෞද්ධ මතවාදය පමණක් උත්කර්ෂයට ගැනීමෙන් ආණ්ඩුවක් පිහිටුවිය හැකි බව ඔවුනගේ විශ්වාසය වී තිබේ. ඒ නිසා හැකි පමණින් ජාතිවාදය ඇවිස්සීම රාජපක්ෂ මතවාදීන්ගේ අරමුණ වී තිබේ. යුදකාමී ආධිපත්‍ය සංස්කෘතියෙන්, ඔවුනට බැහැර විය නොහැකි වී තිබේ. ලාංකීය සමාජය පුරා නගරයක්, නගරයක් පාසා අරක්ගෙන තිබෙන සහ ඒවා මගින් එකී නගර අවලස්සණ කොට තිබෙන 'රණවිරුවන්'ගේ ස්මාරක වන්දනා කිරීම රාජපක්ෂ මැතිවරණ ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය අංගයක් කොට තිබේ. ජාත්‍යන්තරය තුළ හුදකලාව සිටීම ඔවුනට ප්‍රශ්නයක් නොවේ. මක් නිසාදයත්, මියන්මාරයේ හමුදා පාලනයේ මෙන්, රාජ්‍යයේ සියලු සම්පත් සුළු පිරිසකට පමණක් භුක්තිවිඳිය හැකි බැවිනි.

ඒ නිසා ජනවාරි අටවෙනිදා මෙරට ප්‍රජාතන්ත්‍රවාදී බලවේග විසින් අත්පත් කරගනු ලැබූ ජයග්‍රහණය ඉදිරියට ගෙනයාම හැර වෙනත් විකල්පයක් අපට ඇත්තේ නැත. ඒ නිසාම මෙරට ප්‍රධාන සිවිල් සංවිධාන, වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂ එකමුතුව විසින් යහපාලනයක් සඳහා වූ එක්සත් ජාතික පෙරමුණ හා අත්වැල් බැඳගනු ලැබීම ලාංකීය දේශපාලන සමාජයේ සාධනීය අවස්ථාවක් ලෙස සඳහන් කරනු වටී. ඒ මගින් අගෝස්තු 17දායින් පසු කාලපරිච්ඡේදය මෙරට ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වර්ණමය යුගයක් සනිටුහන් කරනු ඇතැයි මම විශ්වාස කරමි. ●



ආචාර්ය
**ජයම්පති වික්‍රමරත්න**



www.rightsnow.net

නීතිවේදීන් පිරිසක් මාධ්‍ය සාකච්ඡාවක

# ප්‍රජාතන්ත්‍රීකරණයේ සංවර්ධන ගතිකය හා සමාජ සාධාරණත්වය.

කිසියම් ප්‍රමාණයකට ප්‍රජාතන්ත්‍රවාදී  අවකාශය  පුළුල් කරගැනීමට අපිට හැකි වී ඇත. මාස 6ක් භුක්තිවිඳි එහි වටිනාකම සමහර විට නොතේරෙන්නට ද පුළුවන.   අද ආණ්ඩුව විවේචනය කරන්නට තිබෙන අයිතිය පුළුල් වී තිබේ.  කාටූන් පමණක් නොව මහින්ද රාජපක්ෂට නාම යෝජනා දීම පිළිබඳව මිනිස්සු ජනාධිපතිවරයාට නොහොබිනා වචනයෙන් ද කථා කරති.  පෙර එවැනි නිදහසක් මේ රටේ තිබුණේ නැත.   ජනාධිපතිතුමා ද මේ ගැන පවසා තිබේ. ව්‍යවස්ථාව පැත්තෙන් ගත්කළ  ජනාධිපති ක්‍රමයේ බලතල 65%ක් පමණ අඩු කිරීමට හැකි විය. සමහර කඩාකප්පල්කාරී  වැඩ ආණ්ඩුව තුළින් සහ පිටින්  සිදු නොවූවා නම් අපිට තවත්  10%ක් පමණ ජනපතිගේ බලතල අඩු කරන්නට තිබුණි. අධිකරණයට ඇඟිලි ගැසීම සම්පූර්ණයෙන්ම නැවති ඇත. අපිට ඒවා දැන් දැනෙන්නේ ද නැත.  අද විනිශ්චයකාරවරු ආණ්ඩුවට

www.asiantribune.com



**ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තහවුරු වෙන ව්‍යවස්ථා රාමුවක් අපිට අවශ්‍ය ය. එම නිසා 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ කරගන්නට නොහැකි වූ දේවල් පරිසමාප්ත කළ යුතු ය. ඒ සඳහා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අත්‍යවශ්‍ය ය. අපි යෝජනා කරන්නේ පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් හැටියට රැස් වී බොහොම පාරදෘශ්‍යව මේ කටයුත්ත කළයුතු බව ය.**

19 ව්‍යවස්ථා සංශෝධනයේ විවාදය ජනාධිපති රූපවාහිනියෙන් නරඹමින්

විරුද්ධව පවා තීන්දු දෙන බව දක්නට පුළුවන. එකළ මෙන් විනිශ්චයකරුවන්ට දියයුතු තීන්දුවට අදාළ දුරකථන පණිවිඩ එන්නේ නැත.

මානව හිමිකම් තත්ත්වය ගතහොත් පෙර මෙන් මිනිසුන්ට තර්ජනයක් නැත. වැඩිමහල් සොහොයුරා හොරෙන් අසාගෙන සිටිනවා යන අදහසක් එදා තිබුණි. දැන් එසේ අසාගෙන සිටින වැඩිමහල් සොහොයුරෙක් නැත. මිනිසුන්ට ආණ්ඩුව විවේචනය කරන්නට අයිතියක් තිබේ. දූෂණ පැත්තෙන් ගතහොත් යම් යම් චෝදනා තිබේ. මහ බැංකුවේ බැඳුම්කර ප්‍රශ්නය එවැන්න කි. නමුත් සමස්ථයක් ලෙස ගත්කළ රටේ අති විශාල වෙනසක් ඇති වී තිබේ. යහපාලනය පැත්තෙන් ගත් කළ සත්‍ය වශයෙන්ම යහපත් ය. කල්යනවිට මිනිසුන්ට මෙය සාමාන්‍ය දෙයක් බවට පත් වී දැනෙන්නේ නැත.

ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා ගැනීමට පළවෙනි වරට රැස් වූ නමුත් ව්‍යවස්ථා සභාව පිහිටුවා ගන්නට නොහැකි විය. දැන් ඉතින් එය පත්කරගන්නට වන්නේ ඡන්දයෙන් පසුව ය. අලුතෙන් පිහිටවන කොමිසන් සභා පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු ය. අල්ලස් සහ දූෂණ කොමිසන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල තත්ත්වයක් ලබාදී තිබේ. අලුතෙන් විගණන කොමිසම පැමිණේ. සාමාන්‍ය ජනතාවට අවබෝධයක් නැතිවන්නට පුළුවන් නමුත් ජාතික ප්‍රසම්පාදන කොමිසම මා දකින්නේ ඉතා වැදගත් දෙයක් ලෙසට ය. එයින් කෙරෙන්නේ රජයට අවශ්‍ය භාණ්ඩ සහ සේවාවන් ලබාගැනීමේ දී අනුගමනය කළ යුතු රීති පිළිබඳව නිර්නායක තීරණය කිරීම ය. චන්ද්‍රිකා මැතිණිය ජනාධිපති වී සිටි කාලයේ ප්‍රසම්පාදන ඒජන්සිය යනුවෙන් හැඳින් වූ ආයතනයක් තිබුණි. රාජ්‍ය අංශයේ සියලුම ආයතන වලට භාණ්ඩ හා සේවා ලබාගැනීමේ දී නිර්ණායක තීරණය කළ ඒ ආයතනය අද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ම ස්ථාපිතකර ඇත. මීට පසු ටෙන්ඩර් නොකැඳවා කිසි දෙයක් කළ නොහැක. විශේෂයෙන්ම රාජපක්ෂ ආණ්ඩුවේ දෙවෙනි වසර 5 විශාල පරිමාණයේ ගැනීම් සිදුවූයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ය. එම ගැනුම් සියල්ල එම කොමිෂමේ නිර්දේශ වලට අනුව දැන් සිදුකෙරේ. මේවා අප ලබාගත් විශාල ජයග්‍රහණයන් ය. පොදුවේ ගත් කළ අප බලාපොරොත්තු වූ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය බොහෝ දුරට අපිට ලැබී තිබේ.

**නව ව්‍යවස්ථාවක්**

ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තහවුරු වෙන ව්‍යවස්ථා රාමුවක් අපිට අවශ්‍ය ය. එම නිසා 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ කරගන්නට නොහැකි වූ දේවල් පරිසමාප්ත කළ යුතු ය. ඒ සඳහා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අත්‍යවශ්‍ය ය. අපි යෝජනා කරන්නේ පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් හැටියට රැස් වී බොහොම පාරදෘශ්‍යව මේ කටයුත්ත කළයුතු බව ය. පාර්ලිමේන්තු තේරීම් කාර්ය සභාවක් තුළින් මේ කටයුත්ත කිරීමට මා සම්පූර්ණයෙන් විරුද්ධ ය. ඒකෙන් සිදුවෙන්නේ මොනවද යන්න රටට පෙන්නේ නැත. පාර්ලිමේන්තුව ම ව්‍යවස්ථා කෙටුම්පත් මණ්ඩලයක් හැටියට රැස් වී ඒ එකඟත්වය ලබාගෙන හදන ව්‍යවස්ථා කෙටුම්පත, නැවත පාර්ලිමේන්තුවේ 2/3 හා ජනමත විචාරණයකින් සම්මත කරගතයුතු ආකාරයේ ක්‍රමයක් මා යෝජනා කරන්නේ. ඊට සමාන්තරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කොමිසමක් පත්කර ඒ කොමිසම රටපුරා ගොස් ජනතාවගේ අදහස් ගෙන ඒ අදහස්වල වැදගත් දේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඉතාම වැදගත් ය. නව ව්‍යවස්ථාව සකස්කළ

eelamview.wordpress.com



**ජාතික ගැටළුවට දීර්ඝ කාලීන විසඳුමක් අවශ්‍ය ය. යුද්ධය අවසන් වූ පසු ඒ පිළිබඳ කිසිම තැකීමක් රාජපක්ෂ ආණ්ඩුව කළේ නැත. යුද්ධය අවසන් වූ නමුත් අපි සාමය දිනාගැනීමට අසමත් විය. උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම අනුව එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තිබේ.**

එල්.එල්.ආර්.සී. කොමිසන් සැසියක්

යුත්තේ ඒ ආකාරයට ජනතාවගේ සහභාගිත්වයක් ද ඇතිව ය. වමේ කණ්ඩායම් වලට මෙන්ම සිවිල් කණ්ඩායම්වලට විශේෂ කාර්යභාරයක් ඉටුකරන්නට තිබේ. අපිට පාර්ලිමේන්තුවට ලැබෙන නියෝජනය සම්පූර්ණයෙන්ම උක්ත අරමුණු ඉටුකර ගැනීමට යෙදිය යුතු ය. වාමාංශිකයින් වන අප තදින් ම කියන්නේ පාර්ලිමේන්තු ක්‍රමයට යායුතු බවයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ඒ කාලය තුළ වර්තමාන බලතල තිබීම ගැන මගේ විරුද්ධත්වයක් නැත. විශේෂයෙන්ම අපට අන්තර්කාලීන විධිවිධාන දාන්න පුළුවන. එක්සත් ජාතික පක්ෂය පවා එයට එකඟ ය. මක්නිසාද යත් එතුමා දුන්න පොරොන්දුව නොසළකා ගුණමකු ලෙස වැඩකරන්නට නොහැක. මා යෝජනා කරන්නේ පාර්ලිමේන්තු ක්‍රමයකි.

## ජාතික ගැටළුව හා මූලික අයිතිවාසිකම්

ජාතික ගැටළුවට දීර්ඝ කාලීන විසඳුමක් අවශ්‍ය ය. යුද්ධය අවසන් වූ පසු ඒ පිළිබඳ කිසිම තැකීමක් රාජපක්ෂ ආණ්ඩුව කළේ නැත. යුද්ධය අවසන් වූ නමුත් අපි සාමය දිනාගැනීමට අසමත් විය. උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම අනුව එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තිබේ. දෙමළ පක්ෂ අමතක කළ නොහැක. දෙමළ ජනතාව අති විශාල බහුතරය එනම් 90% වැඩි ප්‍රමාණයක් ඡන්දය දුන්නේ මෛත්‍රීපාල සිරිසේන මහතාට ය. ඒ අනුව බැලුවත් දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට ප්‍රමුඛත්වය දෙන්න යුතුකමක් තිබේ. ජාතිවාදී කොටස් ඒවාට නොයෙකුත් අවහිර කළහැක. එය සියලුම ජන කොටස්වලට පිළිගත හැකි විසඳුමක් විය යුතු ය. එය දෙමළ ජනතාව මත පටවන විසඳුමක් නොවිය යුතු ය. අනික් අතට එම විසඳුමට සිංහල ජනතාව ද කැමති කරවාගත යුතු ය. දැවැන්ත කාර්යක් වන එහි අමාරුකම මා කොහොමටවත් අඩුවෙන් තක්සේරු කරන්නේ නැත. පාර්ලිමේන්තු ක්‍රමයක් තුළ සුළු ජාතීන් පමණක් නොව සුළු දේශපාලන මතධාරීන්ටත් නියෝජනයක් ලැබිය යුතු ය. නැවතත් දෙවැනි මන්ත්‍රී මණ්ඩලයක් පිළිබඳව සිතන්නට කාලය පැමිණ තිබේ. ඉන්දියාවේ මෙන් පළාත් සභා වලින් පස් දෙනා බැගින් දෙවැනි මන්ත්‍රී මණ්ඩලයට පත්කළ හැක. ඊට අමතරව නියෝජනය නොවන කණ්ඩායම් වලට නියෝජනයක් ලබාදෙන ක්‍රමයක් හිතන්නට පුළුවන.

අති විශේෂ සුදුසුකම් තිබෙන, සිටියම යුතු අය කිහිප දෙනෙකු ද පත්කළ හැක. මේ සඳහා සියලු දෙනාගේ අනුමැතිය ගතහැකි නම් ඔය ඒකීය ද නැද් ද යන ප්‍රශ්නය එතරම් වැදගත් වන්නේ නැත. මේ ආකාරයේ සැළැස්මක් තිබෙන්නේ නම් සෑම පළාත් අවශ්‍යතාවයක් ම ආමන්ත්‍රණය කරන්නට පුළුවන. මේ සඳහා දීර්ඝ සාකච්ඡාවක් අවශ්‍යය ය.

## මූලික අයිතිවාසිකම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය ප්‍රමුඛ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ, පටහැනිව තියෙන සියළු පනත් සහ නීති රීති බල රහිත විය යුතුය. එයින් කියවෙන්නේ පාර්ලිමේන්තුව සෑදූ නීතියක් අවුරුදු ගානකට පසුව හෝ ව්‍යවස්ථාවට පටහැනි බව තීරණය වුවහොත් ඒ ප්‍රශ්ණය මතු වූ විට එම නීතිය බලරහිත කරන්නට නීතිමය බලය තිබිය යුතු ය. ඒ නීතිය ක්‍රියාත්මක වුණ කාලය තුල විශේෂයෙන් ම සමහරුනට යම් වරප්‍රසාද ලැබුණේ නම් ඒවට වෙන්නේ



www.huffingtonpost.com

**අපගේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුලත් වන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පමණි. එය ජාත්‍යන්තර ප්‍රමිතීන් කිට්ටුවටවත් යන්නෙ නැත. පසුගිය දශක දෙකක කාලයක පමණ සිට මූලික අයිතිවාසිකම් ලෙස සමාජ අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, ආර්ථික අයිතිවාසිකම් ළමා අයිතිවාසිකම්, ආබාධිතයන්ගේ අයිතිවාසිකම් වලට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීමක් ලබාදීම ලෝකයේ අලුත් ම ප්‍රවනතාවය වේ. මේවා ද අප සාකච්ඡාවට ගතයුතු ය.**

කුමක්ද යන ප්‍රශ්නය පැනනගී. ඒ අයවලුන්ට කරන්නේ කුමක් ද? යන්න තවත් ගැටළුවකි. ඒවාට ලෝකයේ බොහෝ රටවල් ක්‍රම සහ විධි සොයාගෙන තිබේ. එයින් එකක් වන්නේ අදාල කාල පරිච්ඡේදය තුළ ලැබූ වරප්‍රසාද සහ බැඳීම් යනාදියට හානියක් නොවී අනාගතයට පමණක් බලපාන ලෙස විධිවිධාන සැලසීම ය. පනතක් සම්මත වූ පසුව වුවත් එහි වගන්තියක් නීති විරෝධි, ව්‍යවස්ථා විරෝධි නම් එය වෙනස් කරන්නට ඉන්දියාවේ ද පනතක් තිබේ.

අපගේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුලත් වන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පමණි. එය ජාත්‍යන්තර ප්‍රමිතීන් කිට්ටුවටවත් යන්නෙ නැත. පසුගිය දශක දෙකක කාලයක පමණ සිට මූලික අයිතිවාසිකම් ලෙස සමාජ අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, ආර්ථික අයිතිවාසිකම් ළමා අයිතිවාසිකම්, ආබාධිතයන්ගේ අයිතිවාසිකම් වලට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීමක් ලබාදීම ලෝකයේ අලුත් ම ප්‍රවනතාවය වේ. මේවා ද අප සාකච්ඡාවට ගතයුතු ය.

දියුණු මද නමුත් ලෝකයේ අලුත් රාජ්‍යක් වන නැගෙනහිර ටිමෝරය ගතහොත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ආසියාවේ තියෙන හොඳම මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය වේ. එපමණක් නොව නැගෙනහිර ටිමෝරයේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් ස්වයංක්‍රීයවම රටේ නීතිය බවට පත්වේ. තුන්වන ලෝකයේ රටක් ලෙස ඒ අයට එපමණ දුරක් යෑමට හැකි වී තිබේ.

### ආර්ථික සංවර්ධනය

භෞතික යටිතල පහසුකම් වගේම සමාජ යටිතල පහසුකම්වල විශාල බාදනයක් පහුගිය කාලය තුළ සිදු විය. ඒවා පිළිබඳව සමාලෝචනයක් කළ යුතුව තිබේ. දුප්පත් ජනතාවට සෞඛ්‍යයට අදාලව නිසි ප්‍රවිශ්ඨයක් නැති බව ප්‍රකට ය. සමහර රෝහල් වල පැනඩෝල්වත් නැත. බොහෝ රෝහල් වල මූත්‍රා පරීක්ෂණයත් පිටින් කරගෙන ආ යුතු ය. ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් කරන්න අවශ්‍ය වේ. අධ්‍යාපනය, සෞඛ්‍ය හා මහජන ප්‍රවාහනය යන ක්ෂේත්‍ර තුන ආණ්ඩුව වගකීමක් හැටියට භාරගත යුතු ය.

අධ්‍යාපනය සඳහා පසුගිය කාලයේ පොරොන්දු වූ පරිදි 6% වෙන් කළයුතු ව තිබේ. සේවාවක් වූ මහජන ප්‍රවාහනය ජනතාවට අද මහත් හිරිහැරයක් වී ඇත. හුදෙක් ලාභය පමණක් අපේක්ෂා කරන පෞද්ගලික මගී ප්‍රවාහනය, සේවයට වඩා මගින් රස්තියාදු කරන ජාවාරමක් වී ඇත. මහාමාර්ග කොපමණ ඉදිකලත් වාහන තදබදය අඩුවනවා වෙනුවට වැඩි වී ඇත. තදබද වේලාවට හෝමාගම සිට කොළඹට එන්නට පැය දෙකක් පමණ ගතවෙන අවස්ථා තිබේ. නොදියුණු යැයි සැළකූ අපගේ පාසැල් සමයේ කොටුවේ සිට බොරැල්ලට එන්නට ගතවූයේ මිනිත්තු 15ක පමණ කාලය කි. නමුත් අද විනාඩි 30කට වඩා ගතවේ. මේ තත්ත්වයට වහාම පිළියම් නොකළොත් අලුත් වාහන පාරට එනවිට කොළඹ නගරයේ ඇවිදගෙන යෑම වාහනයකින් යෑමට වඩා පහසු විය හැක. මහජන ප්‍රවාහන සේවාව දියුණු කරන්නේ නැතිව මේ ගැටළුව විසඳිය නොහැක. නාගරික උමං දුම්රිය නැත්නම් අහස් දුම්රිය සේවාවකින් තොරව මේ ගැටළුව විසඳිය හැකි යැයි මා නම් සිතන්නේ නැත. මේ සඳහා අති දැවැන්ත ආයෝජනයක් අවශ්‍ය බව අමුතුවෙන් කිවයුතු නැත. එසේ වුව ද මෙය මගහැර යා හැකි ප්‍රශ්නයක් නම් නොවේ.




**ජනතාවට අහිතකර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙන්නේ නම් ඒවාට විරුද්ධව කටයුතු කරන්න අපි කොහොමත් පැකිලෙන්නෙ නැත. ඒ අවශ්‍ය පීඩනය අපි දෙනවා පමණක් නොව එහි ආදීනව ප්‍රසිද්ධියේ ජනතාවට හෙළිකරන්නට ද අප සූදානම්. රාජපක්ෂගේ පාර්ලිමේන්තුව තුළ වමේ පක්ෂවල අය කටයුතු කළ දීන ආකාරයට කටයුතු කරන්නේ නැති බවට සහතික වෙන්නට අපිට පුළුවන.**

**අනතුර හා ගමන් මග**

කෙසේ නමුත් මහින්ද රාජපක්ෂ නැවත පැමිණීමට දරන උත්සාහය තුළ ඉදිරි ගමනට අද විශාල තර්ජනයක් එල්ල වී තිබේ. ඔහු නැවත පැමිණීමට උත්සාහ දරන්නේ ඇයි ද යනුවෙන් මිනිස්සු ප්‍රශ්න කරති. දෙවාරයක් ජනාධිපති ධූරයට පත් වී පසුව ජනතාව විසින් ප්‍රතික්ෂේප වූ රාජපක්ෂ නැවත එන්නට උත්සාහ දරන්නේ ඇයි ද යන්න ඔවුන්ට ප්‍රශ්නයකි. රාජපක්ෂ සහ ඔහු වටේ සිටි අයට බලය අයුතු ලෙස යොදාගැනීම පිළිබඳව නීතිමය තර්ජන එල්ල වී තිබේ. බලයට නැවත පැමිණීමෙන් මේවායෙන් ගැලවිය හැකි බව මොවුහු සිතති.

නැවත එයාට ජනාධිපති නැත්නම් අගමැති වෙන්න පුළුවන් වේ යැයි මා නම් හිතන්නේ නැත. අවාසනාවකට හෝ එසේ වුවහොත් රට ආ පස්සට යන එක වැළැක්විය නොහැක. ජනාධිපතිවරයා පැවසූ පරිදි එතුමාගේ ජීවිතයට පවා එය මහත් තර්ජනයකි. ජනාධිපති ධූරය හිස්වුවහොත් වැඩ බලන ජනාධිපති පත්කරන්නේ ජනතා ඡන්දයෙන් නොව පාර්ලිමේන්තුවෙනි. එම නිසා බහුතරයක් තිබෙන පාර්ලිමේන්තුවක් තිබුණහොත් දෑත ශක්තිමත් කිරීමට යැයි පවසා මන්ත්‍රීවරු බිලි බා 2/3න් ව්‍යවස්ථාව සංශෝධනය කර ආපසු ඔහුට බලයට එන්නට පුළුවන. ඒ නිසා ජනවාරි 8 ලබාගත් ජයග්‍රහණයන් ආරක්ෂාකර තහවුරු කරගන්නට අවශ්‍ය වී තිබේ. වමේ පක්ෂවල අපට වුවත් අමාරු තත්ත්වයන් යටතේ අමාරු තීරණ ගන්නට සිදු වී ඇත. අපි කිසිදාක වමේ පක්ෂ ලෙසට එක්සත් ජාතික පක්ෂය සමඟ එක් වී මැතිවරණයකට තරඟකර නැත. එක පැත්තකින් එසේ නොකළා යැයි කීමට ද නොහැක. හංසයා ලකුණින් ගියවර අපි සියලුදෙනා එක වේදිකාවේ සිට තරඟ කළෙමු. නමුත් සමහරුන්ට මෙන් අපිටත් අර අලියා ලකුණු පිළිබඳ ප්‍රශ්ණයක් තිබේ. අපි අපේ පක්ෂ තුළ මෙය සාකච්ඡා කළෙමු. ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වියහැකි අනතුර සළකා අවසාන වශයෙන් අතිබහුතරය මේ තිත්ත බෙහෙත බොන්න තීන්දු කළ හ. වෙනත් ආකාරයට පවසන්නේ නම් අලියා ලකුණින් එන පුළුල් පෙරමුණක කොටස් කරුවෙක් වෙන්නට.

මේ තීන්දුව ගන්නට තව සාධකයක් වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කොටසක් කැඩී ඒම ය. මෛත්‍රී, චන්ද්‍රිකා වැනි අයට සම්බන්ධ අර්ජුන, රාජිත වැනි කොටසක් කැඩී ඒමත් එයට බලපෑවේ ය. එක්සත් ජාතික පක්ෂය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කළේ ඒ අනුව ය. ඒ අවබෝධතා ගිවිසුමේ තමන්ගේ අනන්‍යතාව තබාගෙන, අපිට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් බව සඳහන් වී තිබේ. රාජිත ප්‍රධාන කණ්ඩායමත් සමග තවත් අවබෝධතා ගිවිසුමක් අපි අත්සන් කළෙමු. ඒ තුළත් අපේ ස්වාධීනත්වය තහවුරු වී තිබේ. අගමැති රනිල් වික්‍රමසිංහ පැවසූ පරිදි මේ සෑම කණ්ඩායමකටම පාර්ලිමේන්තුවේදී තමන්ට ස්වාධීනව කටයුතු කරන්න නිදහස තිබේ. එමෙන්ම හෙළඋරුමය ද වෙනම අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේ ය. ජනවාරි 8 රටේ ජනතාව අපේක්ෂා කළ හා අප පොරොන්දු වූ දේ ඉෂ්ඨ කරගන්න හැකි වේ යැයි අපි සිතමු. ජනතාවට අහිතකර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙන්නේ නම් ඒවාට විරුද්ධව කටයුතු කරන්න අපි කොහොමත් පැකිලෙන්නෙ නැත. ඒ අවශ්‍ය පීඩනය අපි දෙනවා පමණක් නොව එහි ආදීනව ප්‍රසිද්ධියේ ජනතාවට හෙළිකරන්නට ද අප සූදානම්. රාජපක්ෂගේ පාර්ලිමේන්තුව තුළ වමේ පක්ෂවල අය කටයුතු කළ දීන ආකාරයට කටයුතු කරන්නේ නැති බවට සහතික වෙන්නට අපිට පුළුවන. ●



රාවය කර්තෘ, නීතිඥ
**කේ. ඩබ්ලිව්. ජනරංජන**




පුරවැසියා සක්‍රීය වීම

# පුරවැසියාගේ පුනරාගමනය හා ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණය

**පසුගිය ජනාධිපතිවරණයේ ප්‍රධාන වාද කරුණ වූ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ කථිකාව සමාජගත කිරීම පිළිබඳව පුරවැසි සංවිධානවලට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ශ්‍රී ලංකාවේ පුරවැසි සංවිධානවල විකාශනය හා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එකී සංවිධාන ඉටුකළා වූ හා ඉදිරියේ දී ඉටුකළ යුතු කාර්යයන් පිළිබඳ මේ සම්මුඛ සාකච්ඡාවෙන් පැහැදිළි කෙරේ. තව ද නව චින්තනය හා ප්‍රජාතන්ත්‍රවාදයේ නවීන මූලධර්ම මෙරටට හඳුන්වා දුන් සිවිල් සංවිධාන පිළිබඳව ද ඇගයීමක් කරන නීතිඥ කේ. ඩබ්ලිව් ජනරංජන මහතා රාවයේ කර්තෘවරයා ද වන්නේ ය. ජනරංජන මහතා මාධ්‍යවේදියකු හා නීතිඥයකු පමණක් නොව ක්‍රියාකාරී පුරවැසියෙකි. පහත පලවන්නේ ඔහු සමඟ කළ සාකච්ඡාවකි.**

**ජනවාරි 08 වෙනිදා ලැබූ ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණයට පදනම් වූ වාද කරුණු මෙවර මතුකළේ දේශපාලන පක්ෂ නොව පුරවැසි සංවිධාන කිහිපයක් විසිනි. මේ පිළිබඳව සාකච්ඡාව ඉදිරියට ගෙනයෑමට පෙර පුරවැසියා යන්නෙන් නාමකරණය වන්නේ කවුද?**

ලංකාවේ ජනගහනය අතුරින් ඡන්දදායකයෝ එක්කෝටි පනස් ලක්ෂයක් පමණ සිටිති. නමුත් පුරවැසියන්ගේ ගණන එයට වඩා බොහෝ අඩු ප්‍රමාණයකි. ඡන්දදායකයා සහ පුරවැසියා අතර වෙනස ගතහොත්, ඡන්දදායකයා කිසියම්




**පරමාධිපත්‍ය අයිතිවාසිකම් සම්බන්ධයෙන් කාරණා පහක බලය යටතට වැටේ. නීති සෑදීමේ බලය එයින් එකකි. දෙවැන්න නීති ක්‍රියාත්මක කිරීම ය. යුක්තිය පසිඳලීමේ බලය තුන්වැනි කාරණය වේ. හතරවැන්න මූලික අයිතිවාසිකම් සහ පහ ඡන්ද බලය මෙයට අයත් ය. දැන් මේ පංච බලය රඳපවතින්නේ ජනතාව මත නම් මෙකී බලයන් තමන්ට තිබෙන බවට ජනතාව සවිඥ්ඥාණික විය යුතු ය.**

ප්‍රමාණයකට තමන්ට ඇති තෝරාගැනීමේ අවස්ථාව පාවිච්චිකර තෝරාගැනීම කළ පසු කිසියම් ආකාරයකට නිෂ්ක්‍රීයව ඉන්නා පුද්ගලයෙකි. පුරවැසියා ලෙස සළකන්නේ ඒ අයිතිවාසිකමත්, පාවිච්චිකර ඊට පසු දිගින් දිගටම තම අභිලාෂයන් ඉටුවෙනවාද යන්න පිළිබඳව උනන්දුවෙන්, උවමනාවෙන්, මැදිහත්වෙමින් සහ උද්ඝෝෂණය කරමින් ක්‍රියාකාරීව සිටිනා පුද්ගලයෙකි.

එය තවදුරටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පැහැදිළි කළහොත්, ප්‍රජාතන්ත්‍රවාදි රටක පරමාධිපත්‍ය තිබෙන්නේ ජනතාව මත බව අපි දනිමු. එකී පරමාධිපත්‍ය අයිතිවාසිකම් සම්බන්ධයෙන් කාරණා පහක බලය යටතට වැටේ. නීති සෑදීමේ බලය එයින් එකකි. දෙවැන්න නීති ක්‍රියාත්මක කිරීම ය. යුක්තිය පසිඳලීමේ බලය තුන්වැනි කාරණය වේ. හතරවැන්න මූලික අයිතිවාසිකම් සහ පහ ඡන්ද බලය මෙයට අයත් ය. දැන් මේ පංච බලය රඳපවතින්නේ ජනතාව මත නම් මෙකී බලයන් තමන්ට තිබෙන බවට ජනතාව සවිඥ්ඥාණික විය යුතු ය. උදාහරණයක් ලෙස අපි නියෝජිතයින් මාර්ගයෙන් නීති සම්පාදනය කළත්, එය හදන්නේ ජනතාව ය. අපි නීති ක්‍රියාත්මක කිරීමට නියෝජිතයින් පත්කරන්නේ වී නමුත් අවසාන වශයෙන් එය ක්‍රියාත්මක කරන්නේ ජනතාව ය. නඩු අහන්නේ උසාවි මගින් වුවාට අවසාන විග්‍රහයේ දී නඩු අහන්නේ ජනතාව ය. මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ද එසේ ම ය. පුරවැසියා යනුවෙන් හඳුන්වන්නේ පාලකයින්ට අර පරමාධිපත්‍ය පැවරූ පුද්ගලයා ය. පුරවැසියා ජිවත් විය යුත්තේ සහ හැසිරිය යුත්තේ පරමාධිපත්‍ය තමන්ට තිබෙන බවට වූ අවබෝධය ඇතිව ය. එවැනි පුද්ලග යෙකු පුරවැසියෙක් ලෙස හැඳින්වේ.

**සිවිල් සංවිධාන යනුවෙන් සංවිධාන විශේෂයක් ද ඇත. නමුත් පසුගිය ජනාධිපතිවරණයට පෙර ඒවාට කිසියම් ප්‍රමාණයකින් වෙනස් ලක්ෂණ ඇති මේ පුරවැසි සංවිධාන ගොඩනැගුණි. උදාහරණ ලෙස "සාධාරණ සමාජයක් වූ ජාතික ව්‍යාපාරය, පුරවැසි බලය" සහ තවත් එවැනි සංවිධාන පෙන්වා දිය හැක. එවිට මේ පුරවැසි සංවිධාන සහ සිවිල් සංවිධාන අතර වෙනස සළකුණු කරන්නේ කෙසේ ද?**

සිවිල් සංවිධාන ලෙස මා හඳුනාගන්නේ බොහෝ වෙලාවට ඔය රාජ්‍ය නොවන සංවිධාන ලෙස හඳුන්වන සමූහය වේ. රාජ්‍ය නොවන සංවිධාන සමූහය ලංකාවේ ඉතාම විශේෂ කාර්යභාරයක් ඉටුකළ හා කරන සංවිධාන විශේෂයකි. ආ පසු හැරී බලන විට ඒ සංවිධාන හරහා තමයි ලංකාවට මේ නවීන දැනුම, නවීන චින්තනය මෙන්ම ලෝකයේ තිබෙන ඉතාම නවීන ප්‍රජාතන්ත්‍රවාදි සහ ජන ජීවිතයට අදාළ මූලධර්ම සමාජයට ගලා එන්නේ. ඊ ළඟට මිනිස් අයිතිවාසිකම් පිළිබඳ මූලධර්ම සියල්ලම ගලා එන්නේ ද ඒවා හරහා ය. ලංකාවේ බුද්ධිමය ක්ෂේත්‍රයේ සිටින බුද්ධි ජීවීන් විශාල ප්‍රමාණයක් මේ සිවිල් සංවිධාන ක්ෂේත්‍රයේ ක්‍රියා කළ හ. කරති. ඒ අයගේ බුද්ධිමය දායකත්වය හරහා තමයි නවීන චින්තනය ලංකාවට පැමිණියේ කියන එකයි මගේ අදහස. හැබැයි අවාසනාවට සමාජයෙන් ඒ ආයතනවලට එරෙහි ව පැන නැගුණු සහ ඕනෑකමෙන් ම ඇති කළ කිසියම් ආකාරයක විරෝධයක් සහ ඔවුන්ගේ ම සීමාවන් නිසා මහජනතාව අතර ක්‍රියාත්මක සංවිධාන ලෙස ඉදිරියට ඒමට ඔවුනට නොහැකි විය.

යම් ආකාරයකට ඒවාටත් සම්බන්ධ වී සිටි අයෙක් ලෙස මාගේ අත්දැකීම වන්නේ අපිට සෑම අවස්ථාවකම රටපුරා වැඩ කරන විට හමුවූයේ එකම පිරිසකි. ඔවුහු මානව අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළහ. විශාල නොවූ ඒ පිරිස මැතිවරණ නිරීක්ෂණයට ද සහභාගි වූ හ. කෙසේ නමුත් එකම පිරිසක් හැරෙන්නට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පුද්ගලයින් එක් නොවන ස්වරූපයක් ඒවායේ තිබුණි. මෑත කාලීනව පුරවැසි සංවිධාන හැටියට ගොඩනැගුණු ඒවා ආයතන ස්වරූපයේ සංවිධාන නොවී ය. උදාහරණයක් ලෙස "පුරවැසි බලය" ගතහොත් සංවිධිත සංවිධානයක් නොවේ. එය කිසියම් ආකාරයක පොදු අරමුණකින් යුතු අයගේ එකතු වීම කි. තාමත් අපිට සාමාජිකයින් නොමැත. සංවිධාන ව්‍යුහයක් නැත. මේ ප්‍රපංචය

tamilweek.com




**සිවිල් සංවිධානවලට වඩා පුළුල් සහ ඕනෑම කෙනෙකුට චකිතයක් නොමැතිව, සැකයක් නැතිව එකතු වෙන්නට පුළුවන් තැනක් හැටියටයි පවතින්නේ. සිවිල් සංවිධානවල සිට පුරවැසි සංවිධාන දක්වා ආ ගමන තුළ පුරවැසි සංවිධාන වලට ආකර්ශනීය බවක් ලැබී ඇත. නමුත් සිවිල් සංවිධානවලට රටේ කරන්න පුළුවන් මෙහෙය තවම අවසන් වී නැති බව ද මතක් කළ යුතු ය.**

තුළ නිදහසේ තමන් බලාපොරොත්තු වන අරමුණු ඉටුකර ගැනීම සඳහා එක්ව සටන් කිරීමේ පොදු උවමනාවක් නිර්මාණය වූ බවයි පෙනෙන්නේ. ඒක අර සිවිල් සංවිධානවලට වඩා පුළුල් සහ ඕනෑම කෙනෙකුට චකිතයක් නොමැතිව, සැකයක් නැතිව එකතු වෙන්නට පුළුවන් තැනක් හැටියටයි පවතින්නේ. සිවිල් සංවිධානවල සිට පුරවැසි සංවිධාන දක්වා ආ ගමන තුළ පුරවැසි සංවිධානවලට ආකර්ශණීය බවක් ලැබී ඇත. නමුත් සිවිල් සංවිධානවලට රටේ කරන්න පුළුවන් මෙහෙය තවම අවසන් වී නැති බව ද මතක් කළ යුතු ය.

**නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණත්වය සඳහා පුරවැසි සංවිධාන එක්තරා ආකාරයකට නිදහස ලබන්නට පෙර යුගයේ සිට ම ක්‍රියාත්මක වුණා නේ ද?**

ලංකාවේ පුරවැසි භූමිකාවේ පුරෝගාමියෝ තමයි මේ රටේ පැවති වාමාංශික නැත්නම් සමසමාජ-කොමියුනිස්ට් ව්‍යාපාරය. 1930 ගණන්වල සිට ඒ අය මේ පුරවැසි භූමිකාව ඔවුන්ගේ දේශපාලනය හරහා රටට උගන්වා තිබුණි. මගේ වැටහීම අනුව වාමාංශික සම්ප්‍රදාය තුළ හැදී වැඩුණු එම ව්‍යාපාරය 90 ගනන්වල මැද භාගයෙන් පසුව පරිහානියට ගියේ ය. ඒ ව්‍යාපාරය මගින් 94 දීත් කිසියම් ආකාරයක විශාල වැඩ කොටසක් සමාජය තුළ ඉටු කෙරුණි. අවසාන වතාවට ඒ අය තමන්ගේ දේශපාලන තෝරාගැනීම ලෙස චන්ද්‍රිකා බණ්ඩාරනායක බලයට පත් කළේ ය. එයින් පසුව කිසියම් ආකාරයකට ඔවුන් කාර්ය භාරය අවසන් කළා හෝ තව දුරටත් අරගලයේ ඉන්න බවක් පෙන්නුම් කළේ නැත. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග තමන් බලයට පත්කිරීමට වෙහෙස වූ එම ව්‍යාපාරයේ අභිලාෂයන්ට විරුද්ධව ක්‍රියාකරන විට එම ව්‍යාපාරය නිහඬ වූ බවක් පෙනේ. මා දකින හැටියට පැරණි පුරවැසි ක්‍රියාකාරිත්වයේ අවසාන අවස්ථාව ලෙස එය දකින්නට පුළුවන.

සිවිල් සංවිධාන කරලියට පැමිණෙන්නේ මෙයින් පසුව ය. පසුගිය ජනාධිපතිවරණය පැමිණෙන විට පැරණි පුරවැසි සංවිධාන සම්ප්‍රදාය ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම මානව අයිතීන් වැනි නවීන ලිබරල් අගයන් සමග එක්වන බවක් දක්නට ලැබේ. සම්ප්‍රදායන් දෙකකට උරුමකම් කියන නව පුරවැසි සංවිධාන වලට බැරෑරුම් වගකීමක් පැවරී ඇත. 1994 දී මෙන් නැවත වාරයක් චක්‍රය අනික් අතට කැරකීමේ අනතුරටම ලක්වේ ද නැති ද යන්න ගැන අප ඉතා සවිඥ්ඥාණිකව සිටිය යුතු ය. ජනතාව යමෙක් බලයට පත් කළායින් පසුව තවදුරටත් ග්‍රහණය ලිහිල් නොකර තම අභිලාශය ඉෂ්ටකරගැනීම සඳහා දිගින් දිගටම බලපෑම් කළ යුතු ය.

**මේ මැතිවරණයේදී කොයි ආකාරයටද පුරවැසි බලය ක්‍රියා කරන්නේ ?**

ජනවාරි 8 වැනිදා ජනාධිපතිවරණය පැවැත්වෙන විට රටේ දේශපාලන තත්ත්වය ඉතාම පැහැදිව තිබුණි. ඒ කියන්නේ මැතිවරණ සටනේ සිටියේ පාර්ශව දෙකකි. එකක් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි මහින්ද රාජපක්ෂ සහ ප්‍රජාතනන්ත්‍රවාදයට පක්ෂ විරුද්ධ පාර්ශ්වය ලෙස එය හැඳින්විය හැක. පැහැදිළිව ධ්‍රැවීකරණක් එහි තිබූ හෙයින් කිසිම සංකීර්ණත්වයක් නැතිව පුරවැසි සංවිධානවලට පහසුවෙන් ක්‍රියාකරන්නට පුළුවන්කම තිබුණි. පොදුවේ ගත්කල මහින්ද රාජපක්ෂව කුමන ආකාරයකින් හෝ පරාජය කිරීමට විරුද්ධ පාර්ශවය එකඟත්වයකට පැමිණ සිටිය හ. සියළු දෙනාටම වැදගත් වූයේ රාජපක්ෂ පරාජය කිරීමෙන් අනතුරුව ඇතිවන දේශපාලන අවකාශය පමණි. ඒ මොහොතේ කිසියම් ආකාරයක හැමෝටම වැඩ කරන්න පුළුවන් සාධාරණ ක්‍රීඩා පිටියක් සකස් ගැනීමයි සියලුම දෙනාට අවශ්‍ය වූයේ. දෙමළ සංවිධාන පවා තමන්ගේ ජාතියේ අභිලාෂයන් පවා මොහොතකට අමතක කර මේ ප්‍රජාතන්ත්‍රවාදී කාරණය සම්බන්ධයෙන් එකතු විය.

පෞද්ගලිකව ගත්තොත් අපි දිගින් දිගටම ජාතික ප්‍රශ්නය ගැන කථා කරපු අය වෙමු. ඒ කාරණාව යම් ආකාරයකින් තාවකාලිකව අමතක කර ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය යළි ඇති



**අපි පුරවැසි බලවේග විසින් ඔසවා තබන ලද දේශපාලන චරිත කිසියම් ආකාරයකට තමන්ගේ වලංගුභාවය තරමක් දුර්වල කරගෙන ඇත. අනික් පැත්තෙන් ජනවාරි 8 වැනිදා එකට ක්‍රියා කළ බලවේග දැන් පරස්පර නොවන නමුත් එකිනෙකට වෙනස් ආකාරයෙන් මේ මැතිවරණයට තරඟ කරන පාර්ශවයන්ට සහයෝගය දක්වන බව පෙනෙන්නට තිබේ. මේ නිසා ජනවාරි 8 තිබුණු ශක්තිය හා පිබිදීම ඒ ආකාරයෙන්ම අද ප්‍රායෝගිකව දකින්නට නොහැක.**

එක්සත් ජාතික පෙරමුණ ගිවිසුම් අත්සන් කරමින්....

කිරීමේ සටන් පාඨය තමයි අපටත් මූලික වුයේ. රාජපක්ෂ විසින් නිර්මාණය කෙරුණු තත්ත්වය සියළුම දෙනාට පැහැදිළි විය. නමුත් මේ වෙනකොට තත්ත්වය ඊට වඩා වෙනස් වී තිබේ. අපි පුරවැසි බලවේග විසින් ඔසවා තබන ලද දේශපාලන චරිත කිසියම් ආකාරයකට තමන්ගේ වලංගුභාවය තරමක් දුර්වල කරගෙන ඇත. අනික් පැත්තෙන් ජනවාරි 8 වැනිදා එකට ක්‍රියා කළ බලවේග දැන් පරස්පර නොවන නමුත් එකිනෙකට වෙනස් ආකාරයෙන් මේ මැතිවරණයට තරඟ කරන පාර්ශවයන්ට සහයෝගය දක්වන බව පෙනෙන්නට තිබේ. මේ නිසා ජනවාරි 8 තිබුණු ශක්තිය හා පිබිදීම ඒ ආකාරයෙන්ම අද ප්‍රායෝගිකව දකින්නට නොහැක. පොදු සතුරාගේ ශක්තිය දුර්වල වී ඇති නමුත් ඔහු තාම ක්‍රීඩා පිටියෙන් එළියට ගොස් නැත. පුරවැසියන් හැටියට මේ පොදු සතුරා මුළු වෙර යොදා පරාජය කළ යුතුව ඇත.

**මැතිවරණයෙන් අනතුරුව පුරවැසියාගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් තහවුරු කිරීම සඳහා බලයට පත්වන ආණ්ඩුවෙන් අපේක්ෂා කරන රාජ්‍යයේ ව්‍යුහාත්මක වෙනස්කම් සහ සමාජ ආර්ථික වෙනස්කම් මොනවාද?**

මෙරට පුරවැසි සංවිධාන පසුගිය ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂට විරුද්ධව කටයුතු කළ බව නොරහසක් වන අතර අනික් පැත්තෙන් අප බලාපොරොත්තු වූ දේවල් ද තිබුණි. එකක් තමයි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගැනීම හා මැතිවරණ ක්‍රමය වෙනස් කර ගැනීම. 17වෙනි සංශෝධනය නැවත බලගන්වා ගැනීම තවත් කාරණයකි. සෑහිමකට පත්විය නොහැකි නමුත් මේ මූලික කාරණාවලින් කිහිපයක් දින 100 ඇතුලත කරගැනීමට හැකිවිය. දෙන ලද සීමාවන් යටතේ අවස්ථාවට ගැලපෙන ලෙස මූලික කාරණා කිහිපයක් ඉදිරියට ගත්තේ වී නමුත් අපට පොදු අභිලාශයක් තිබුණි. සුළු සුළු ප්‍රතිසංස්කරණ පැලැස්තර අලවන එක නොව, මූලික අරමුණ වූයේ මේ රටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීම ය.

රටට ගැලපෙන ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීම කාලයක් තිස්සේ සමාජයේ තිබුණු කතිකාවකි. එහි දී අපේ මූලික කාරණා කිහිපයක් ලැයිස්තුගත කරන්නට පුළුවන. පළවෙනි එක විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තුවට බලය පවරණ ලද ආණ්ඩු ක්‍රමයක් ඇතිකර ගැනීම. අදට ගැලපෙන ලෙස මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් දියුණු මට්ටමට ගෙන ඒම දෙවැන්න ය. උදාහරණයක් ලෙස 19 වැනි ව්‍යවස්ථාවෙන් ජීවත්වීමේ අයිතිය දැනට ස්ථාපිත කර ඇත. නමුත් තොරතුරු දැන ගැනීමට තිබෙන අයිතිවාසිකම වැනි නව දැනුම් සම්භාරයට අදාලවන ලෙස අයිතිවාසිකම් පැත්තෙන් එය දියුණු කළ යුතුවේ. ජනවාර්ගික ප්‍රශ්නයට ස්ථිරසාර වශයෙන් විසඳුමක් ලබා ගැනීම සඳහා කේන්ද්‍රයේ තිබෙන බලය පරිධියට බෙදීමේ ක්‍රමයකට අපි හැකි ඉක්මනින් යා යුතුය ය. ජනවාරි 8 වැනිදා ප්‍රමුඛතාවයක් ලෙස එය ඉදිරියට ගෙනෙන්නට නොහැකි වූ නමුත් එය මේ මොහොතේ ඉදිරියට ගැනීම අවශ්‍ය ය. බලය බෙදීම මූලික වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය වියයුතු බවයි අපේ අදහස. රාජ්‍ය අනාගමික වියයුතු බවයි අපගේ පිළිගැනීම. රාජ්‍ය ආගම ලෙස බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දිය යුතුය කියන කාරණාව මත බුද්ධ ශාසනයට හා බුද්ධාගමට ඒ වගේම බෞද්ධ ආයතනවලට ආණ්ඩුවේ පැත්තෙන් විශාල ලෙස අනුග්‍රහය ලැබී තිබේ. අනෙක් ආගම් හෙලා දැකීමට හා අනෙක් ආගම් පහත් කොට සලකන බවට එයම එක් හේතුවකි. මේ තත්ත්වය නැති කර රාජ්‍ය කිසියම් ආගමික නොවන පෞද්ගලික දෙයක් ලෙස සැළකිය යුතු ය. ඒ වගේම රටේ රාජ්‍ය සේවය නිර්දේශපාලනීකරණය කිරීමේ පියවරකට යෑම යුගයේ අවශ්‍යතාවයක් වී තිබේ. ආර්ථිකය ගත්තොත් ඇති නැති පරතරය අඩුකරණ, ආර්ථිකයේ ප්‍රතිලාභ පහළට ගලා යන ආකාරයේ ක්‍රමයක් නිර්මාණය කරගතයුතු වේ.

ඔය ආකාරයට මූලික ප්‍රශ්නවලට විසඳුම් සොයන්නට පුළුවන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙතට තමයි අප

mffcoexist.wordpress.com



**පුරවැසි බලවේග මේ රාජ්‍ය පාලනයට සම්බන්ධ කරගන්නා කිසියම් යාන්ත්‍රනයක් අපි අලුතින් නිර්මාණය කරගත යුතු ය. ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ජනාධිපති වූ පසු ව්‍යවස්ථාමය බලයක් නොතිබුණු නමුත් තාවකාලික ජාතික විධායක සභාවක් තිබුණි. අවාසනාවට මුලින් පොරොන්දු වූ පරිදි සිවිල් නියෝජනයක් නැතිව දේශපාලන පක්ෂ වලින් එය සමන්විත විය. අනාගතයේ දී මෙය පූර්වාදර්ශයක් කරගැනීමට ඉඩ නොදිය යුතු ය.**

ජනාධිපති මෛත්‍රීපාල සිවිල් සංවිධාන සමග

පාලකයන්ව තල්ලු කරන්නේ. ඒකට විවිධාකාර කෙටුම්පත් ඉදිරිපත් වෙන්නට පුළුවන. ඒවා මැනවින් සමාජයේ සාකච්ඡා කරණ පරිසරයක් හා යාන්ත්‍රණයක් අප නිර්මාණය කරගත යුතුවේ.

**සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රවාහනය ඒ සම්බන්ධයෙන් පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශයේ මැදිහත්වීම පිළිබඳව කොයි ආකාරයට ද හිතන්නේ ?**

අපි දැන් මූලික වශයෙන් එකඟ වී තිබෙන්නේ සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ප්‍රවාහනය මූලික වශයෙන් මහජන සේවාවන් ලෙස සලකා ඒවාට රාජ්‍ය මැදිහත්වීම වැඩිකළ යුතු ය. පෞද්ගලික අංශය මෙයට කෙසේ සම්බන්ධකර ගන්නේ ද යන්න සාකච්ඡා කර තීරණයකට පැමිණිය යුතු ය. මේවා මුළුමණින් ම පෞද්ගලික අංශයට භාර දී ඔවුන් විසින් කළමනාකරණය කරන ඔවුන් විසින් පාලනය කරන ක්‍රමයක් නෙවෙයි අපේ බලාපොරොත්තුව. ඒ වෙනුවට වැඩි ප්‍රතිශතයක් වැඩි ප්‍රමාණයක් රජය විසින්ම මැදිහත්වෙලා පෞද්ගලික අංශයත් සහභාගිකරගෙන නියමාකාරයෙන් නියාමනය කරගෙන යන ක්‍රමයක් තමයි සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් අපට අවශ්‍යය.

**70ට පෙර නිලධාරිවාදය ජනතාව දැඩි ලෙස පීඩාවට පත් කළේ ය. ඒකට විරුද්ධව තමයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව දේශපාලන අධිකාරයට යටත් කළේ. ඉන් සිදුවූයේ රාජ්‍ය සේවය දේශපාලනීකණය වීමය මේ ද්විත්ව පීඩනයෙන් ජනතාව ගලවා ගැනීමට ඔබ කරන යෝජනාව කුමක් ද?**

මුල සිටම නිලධාරි තන්ත්‍රයෙන් සිදු වූ හානියට වඩා දේශපාලනයට නතුවීමෙන් වූ හානිය විශාලය. එයින් සිදුවූයේ මුළු රාජ්‍ය සේවයේම කොන්ද කඩා දැමීම පමණි. දේශපාලනීකරණයෙන් රාජ්‍ය සේවය ස්වාධීන කරන ස්ථාවරය තමයි අපිට ගන්නට තිබෙන්නේ. නැවත වාරයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවන්නට ආණ්ඩුව දැනටමත් කටයුතු කර තිබේ. දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්වාධීන මණ්ඩලයකින් පිහිටුවා මේ කටයුතු ස්වාධීනව පවත්වාගෙන යෑමට පුළුවන. මේ අවස්ථාවේ අපට තිබෙන විසඳුම හුදෙක් අර දේශපාලනීකරණයෙන් තොරව පවත්වා ගැනීම ය.

**ඒ කොමිෂන් සභාව තුළ පුරවැසි භූමිකාවක් නැද්ද?**

එය අපගේ සැළකිල්ලට භාජනය වියයුතු වැදගත් කරුණකි. මැතිවරණයක් හෝ මැතිවරණයක් ආසන්නයේ දී පුරවැසි භූමිකාව ඉදිරියට පැමිණේ. ඒ වගේම අපි කැමති අයව පත්කරන්නට ද කටයුතු කරමු නමුත් අවාසනාව තමයි එහෙම බලයට ආවායින් පසු ඒ පුද්ගලයින් මේ පුරවැසියන්ව සහභාගිකරවා ගැනීමට ඇති අකැමැත්ත. ව්‍යවස්ථාදායක සභාවේ සිවිල් පුරවැසි නියෝජනය අඩුකිරීමෙන්ම ඒ බව පැහැදිළි ය.

පුරවැසි බලවේග මේ රාජ්‍ය පාලනයට සම්බන්ධ කරගන්නා කිසියම් යාන්ත්‍රණයක් අපි අලුතින් නිර්මාණය කරගත යුතු ය. ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ජනාධිපති වූ පසු ව්‍යවස්ථාමය බලයක් නොතිබුණු නමුත් තාවකාලික ජාතික විධායක සභාවක් තිබුණි. අවාසනාවට මුලින් පොරොන්දු වූ පරිදි සිවිල් නියෝජනයක් නැතිව දේශපාලන පක්ෂ වලින් එය සමන්විත විය. අනාගතයේ දී මෙය පූර්වාදර්ශයක් කරගැනීමට ඉඩ නොදිය යුතු ය.

පුරවැසියන් සම්බන්ධ කරගන්නා මෙවැනි යාන්ත්‍රණයකට ව්‍යවස්ථානුකූල බලයක් තිබීම අවශ්‍ය ය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පමණක් නොව මුළු රාජ්‍ය ව්‍යුහයේම මේ පුරවැසි සහභාගිත්වය තිබිය යුතු ය. එවිට එළියේ සිට කරන බලපෑම් පමණක් නොව රාජ්‍ය පාලනයේ දී පුරවැසියාට චරිතයක් නිරූපණය කළ හැක. ●

සංවාද සටහන
**මහින්ද රත්නායක**



නීතිඥ
**එස්. ජී. පුංචිහේවා**

# රටට හෙටක් - අලුත් පුරවැසියෙක්

රටේ අනාගතය උදෙසා අත්‍යවශ්‍ය දෙයක් ඇත. එනම් අලුත් පුරවැසියෙකි. අලුත් ආණ්ඩු, නව වැඩපිළිවෙළවල් කොතෙකුත් තිබිය හැකි ය. ඒ සියල්ල විචිත්‍ර වාග් සංදර්ශන සහ නවීන තාක්ෂණික ආකර්ෂණයක් පමණක් නොවන්නට නම් මහ පොළොවේ පය ගසා සිටින පුරවැසියෙකු සිටිය යුතු ය. ඔහු ඇසෙන දේට එහා දෙයක් අසන, පෙනෙන දේට එහා දෙයක් දකින කෙනෙකු විය යුතු ය. මෙතෙක් ඔහු වෙනුවෙන් වෙනත් අයට සිතන්නට, අසන්නට, දකින්නට සලසා තිබිණ. එසේ බලය පැවරුණු අය තමන්ට වුවමනා ගමන ගියේ පුරවැසියා ද වැරදි දේ හරි යැයි දකින්නකු බවට පත් කරමිනි.

1948 අපට දේශපාලන නිදහස ලැබුණේ සුළුතර, බහුතර සියලු ජාතීන් කොටවා ඇන කොටා ගන්නට ය. පුරවැසියෝ ද දෙතුන් පිළට බෙදී කොටා ගන්නන් වටා රැස්වූහ. ඒ අතර හොරු ද තක්කඩියෝ ද ජනතාවගේ සම්පත් කොටා ගත්හ. පසුව ඒ හොරු, ජාතික වීරයන් ලෙස සම්භාවනාවට පත්වූහ. මේ 'ජාතික ක්‍රීඩාව' අවලංගු කිරීමට කාලය පැමිණ ඇත. යම් කලෙක උගත්කම හා මිනිස්කම ඇති මිනිසුන්

www.srilankaguardian.org

archives.dailynews.lk



**අපට අලුත් රටක් ගොඩනැගීමේ දැඩි අවශ්‍යතාව පැන නැගී ඇත. එය සිංහල දෙමළ මුස්ලිම් ආදී සියලු දෙනාගේ රටක් මිස ජාති, ආගම්වලින් කොටු කරගත් රටක් නොවේ. ඒ සඳහා අලුත් චින්තනයක් මෙන් ම අලුත් මිනිසෙක් ද අවශ්‍ය වේ.**

පාර්ලිමේන්තුවට පත්වූවා සැබෑ ය. එකල ඔවුන්ට යම් පිළිගැනීමක් තිබුණේ මන්ත්‍රීකම වාසිදායක රස්සාවක් කර නොගත් නිසා ය. එහෙත් පසු කලෙක නුසුදුස්සන්ට දේශපාලනය මහඟු ඉල්ලමක් බවට පත්විය. ඒ සමග රටේ ගැටුම් කලකෝලාහල බහුල විය. දරුණු ම අපරාධය වූ දිළිඳුකම සංවර්ධනය විය. සාමාන්‍ය මිනිසා කොන්ක්‍රීට් මන්දිරයන් උදෙසා බදු ගෙවන්නන් පමණක් විය. නීතිය යුක්තිය තුරන් වීම නිසා ඇති වු පීඩාව නො ඉවසූ දකුණේත්, උතුරේත් තරුණ පරපුර විසඳුම අවි ආයුධවලට පැවරූහ. එම අදූරදර්ශී විසඳුම නිසා හොර තක්කඩියන්ට වාසි සැලසිණ. මේ දේශපාලනය හා සමාජ සංස්කෘතිය දැන්වත් වෙනස් කළ යුතු ය. අපට අලුත් රටක් ගොඩනැගීමේ දැඩි අවශ්‍යතාව පැන නැගී ඇත. එය සිංහල දෙමළ මුස්ලිම් ආදී සියලු දෙනාගේ රටක් මිස ජාති, ආගම්වලින් කොටු කරගත් රටක් නොවේ. ඒ සඳහා අලුත් චින්තනයක් මෙන් ම අලුත් මිනිසෙක් ද අවශ්‍ය වේ.

#### නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්

අලුත් මිනිසෙකු පහළ වීමට පදනම වැටෙන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින්, ආර්ථිකය, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සංස්කෘතිය එම දිශාවට යොමු කිරීමෙනි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු තිබෙන ව්‍යවස්ථාව වෙනුවට තවත් එකක් පමණක් නොවේ. එය ඉහළින් පහළට පටවන උගතුන් ගේ සංග්‍රහයක් නොවිය යුතු ය. පහළින් ඉහළට විකාශනය විය යුතු ය. මේ සඳහා පුළුල් පුරවැසි සංවාදයක අවශ්‍යතාව දැනටමත් මතු වී ඇත. එය වාර්ගික, ආගමික සමගියට මග පෙන්වන අච්චු ගහපු පොතක් පමණක් නොවිය යුතු ය. පොළොවේ ක්‍රියාත්මක වැඩ පිළිවෙළ හැඳින්වෙන වගන්ති මාලාවක් විය යුතු ය. අගනා වගන්ති මාලාවක් තිබූ පමණින් ම රටක් හැදෙන්නේ නැත. එම වගන්ති ක්‍රියාත්මක කරන පුද්ගලයින් කවුරුන්ද යනු ඉතා වැදගත් සාධකයකි. පටු දේශපාලන හා පෞද්ගලික අරමුණු සහ සැඟවුණු න්‍යාය පත්‍ර සහිත පුද්ගලයන් නොවිය යුතු ය. එම පුද්ගලයන් හැසිරෙන ආකාරය නිරීක්ෂණය කිරීමේ බලය හා කැපවීම පුරවැසියාට තිබිය යුතු ය. එවිට පොදු ජනතාවගේ අභිලාෂයන් කෙරෙහි ලැදිකම දක්වන දේශපාලකයන් සහ නිලධරයන් අලුතෙන් හදාගත යුතු ය. ඒ සඳහා අලුත් දේශපාලන පක්ෂ, ප්‍රතිපත්ති සහ පුද්ගලයන් අලුත් විය යුතු ය. ඒ සියල්ලෙහි පොදු ජනතාවගේ යහපත පිළිබිඹු විය යුතු ය. පහළින් ඉහළට යා යුත්තේ ඒ නිසා ය.

අලුතෙන් බිහි වූ නමුත් පොදුජන යහපත පිළිබිඹු නොවූ ව්‍යවස්ථා අත්දැකීම් අපට ලැබිණ. 1947, 1972, 1978 ව්‍යවස්ථා සහ 19 වැනි සංශෝධනයේ අත්දැකීම් හෙවත් පිටුදැකිය යුතු ලක්ෂණ තවදුරටත් අපේ නීතිය නොවිය යුතු ය.

1947 ව්‍යවස්ථාව එංගලන්තයෙන් ආනයනය කොට උගතුන්ගේ ඔළුවල තැන්පත් කරගෙන සිට පහළට පැටවූවකි. රටේ ඉහළ පවුල්වලට පාලන බලය හිමිවන විදියේ ක්‍රියාකාරිත්වයක් සහිත නීති සමූහයකි. නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය ආදියට ඉඩ ලැබෙන සාධනීය ලක්ෂණ තිබිණ. 1972 ව්‍යවස්ථාව තිස් අවුරුදු යුද්ධයේ ආරම්භයයි. 6 සහ 7 ව්‍යවස්ථා මගින් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමත්, බුද්ධාගම රාජ්‍යාගමයයි ප්‍රකාශ කිරීමත් සිදුවිය. එමගින් ජාතිවාදය පෝෂණය කිරීමත්, අද පවතින බෞද්ධ මූලධර්මවාදය හඳුන්වා දීමත් සිදු වී එහි ප්‍රතිඵල ද බුක්ති විඳ හමාර ය. තවදුරටත් එම පාඩම ඉගෙන ගෙන ඇති බවක් පෙනෙන්නට නැත. 1978 ව්‍යවස්ථාවෙන් සියල්ල මුදලට යන ප්‍රතිපත්තිය නීතිගත වීමත්



**රටේ අනාගතය ආරක්ෂා කරන අලුත් මිනිසෙකු අවශ්‍ය බව අද ඉතා ම පැහැදිලි ය. එහෙත් ඒ අලුත් මිනිසා නියෝජනය විය යුත්තේ පුරවැසියාගෙනි. එවිට පුරවැසියාට ඉටු කිරීම සඳහා දැවැන්ත කාර්යයක් පැවරී ඇත. එහෙයින් එම පුරවැසි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු වන ක්‍රමවේදයක් පැවතිය යුතු ය.**

සමග මිනිස්කම ද ආගම ද ගුණ දහම් ද වෙළෙඳ පොළේ විකිණිය හැකි භාණ්ඩ බවට පත්විය. පාලකයා අන්ත දූෂිතයකු හොරකු බවට පත්වූයේ එම ව්‍යවස්ථාවෙන් ලැබුණු ඉඩ කඩත් සමග ය. ඉහත සඳහන් අවස්ථා සියල්ල ම පිළිබිඹු වන දෙයක් මෑත දී සම්මත වූ 19 වැනි සංශෝධනයේදී පිළිබිඹු විය. එනම් කලින් ඉදිරිපත් වූ යහපත් ලක්ෂණ සියල්ලට පාර්ලිමේන්තුවේ එතෙක් රැඳී සිටි හොර කල්ලිය විරුද්ධ වී ඇත. ව්‍යවස්ථා සභාවට සිවිල් සමාජයෙන් 5 දෙනෙකු තෝරා ගැනීමට විරුද්ධ වූ පල්හොරු එය බාල කළහ. තොරතුරු දැනගැනීමේ මූලික අයිතිවාසිකම අඩාල කළහ. එම පනත සම්මත කිරීම පවා කල් දැමිණ. ඔවුන් එය සම්මත කිරීමට එකඟ නොවූ කරුණු මොනවාද? පොදු ජනතාවට වැඩි බලයක්, පහසුවක් ලැබෙන කරුණු ය. ඒවාට විරුද්ධ වීමේ ආකල්ප ඔවුන්ට ලැබුණේ කෙසේ ද? මෙතෙක් පැවති දේශපාලන භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අණ පනත් සහ මෙතෙක් නොපැවති අණ පනත් ආදිය නිසා ය. අලුත් ව්‍යවස්ථාවක් සහ භාවිතයක් අවශ්‍ය වන්නේ එහෙයිනි.

**අලුත් මිනිසා නියෝජනය වන පුරවැසියා**

රටේ අනාගතය ආරක්ෂා කරන අලුත් මිනිසෙකු අවශ්‍ය බව අද ඉතා ම පැහැදිලි ය. එහෙත් ඒ අලුත් මිනිසා නියෝජනය විය යුත්තේ පුරවැසියාගෙනි. එවිට පුරවැසියාට ඉටු කිරීම සඳහා දැවැන්ත කාර්යයක් පැවරී ඇත. එහෙයින් එම පුරවැසි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු වන ක්‍රමවේදයක් පැවතිය යුතු ය. මෙතෙක් පැවතුණේ ඡන්දය දීමෙන් පසු නැවත ඡන්ද විමසීමක් එනතුරු අමතක කරනු ලැබ සිටි පුරවැසියෙකි. ඔහු ගණන් නොගැනුණු හාල්මැස්සෙකි. ඔහු මහ පාරේ ගමන් කරන විට, ඔහු විසින් පත් කළ නියෝජිතයා ආරක්ෂකයන් පිරිවරාගෙන වේගයෙන් යන්නේ ය. එවිට පුරවැසියා අයිනට වී ඉඩ දිය යුතු ය. වැටුප් ද, වාහන ද, ගිනිඅවි ද, ආරක්ෂකයන් ද පුරවැසියාගේම වියදමිනි. එසේ වේගයෙන් ගමන් කර ඇත්තේ හොරකම් කිරීමට ය. හොරකම් කර ඇත්තේ පුරවැසියාගේ ම සම්පත් ය. මෙවැනි තත්ත්වයකට පසුබිම් වන දේශපාලනය කුමක්ද? එහි දී අනෙක් ජාතීන්, ආගමිකයන් සැක කළ යුතු ය. සැකය නීතිගත කළ යුතු ය. ගැටුම් නිර්මාණය කොට යුද්ධ කළ යුතු ය. යුද්ධ වීරයන්ට බලය දිය යුතු ය. යුද්ධයේ දේශපාලනය සහ දේශපාලනයේ යුද්ධය යන දෙක ම නැතිකොට අලුත් මගක් ගත යුත්තේ පුරවැසියා විසින් ම ය.

ඒ සඳහා දේශපාලන ක්‍රියාකාරිත්වය තුළ පුරවැසියා බාහිර සාධකයක් නොව තීරණාත්මක සාධකය විය යුතු ය. පුරවැසියන්ට සෑම ගමකම සෑම වසමකම රැස්වන්නට තැනක් තිබිය යුතු ය. අදහස් දැක්වෙන වාද විවාද කරන සම්ප්‍රදායක් ගම්වලින් ම ගොඩනැගිය යුතු ය. එමගින් දේශපාලනයේ හෙවත් රට ගොඩනැගීමෙ හරි වැරදි හොඳ නරක කතාබහ කරන වටපිටාව ඇතිවිය යුතු ය. ඒ තැන්වල මන්ත්‍රීවරයා ඒකාධිපතියා නොවිය යුතු ය. මගේ ඉහට උඩින් මැස්සෙකුවත් නොයා යුතුයයි සිතන මන්ත්‍රීවරුන් මින් මතු පත් නොකළ යුතු ය.

**ගොවියා, කම්කරුවා, සේවකයා, ධීවරයා සූරාකෑමෙන් නිදහස් විය යුතු ය.**

ගොවියා අපේ රටේ ය. එහෙත් ඔහු ජපානයේ නැත්නම් ඇමරිකාවේ වහලෙකි. පොල්පෝර, කෘෂි උපකරණ මගින් ඔහු සූරාකෑමට ගොදුරු වේ. ඊට අමතරව මෙරට පාලකයන්ගෙන් ගොවියාගේ ඉඩම් නිදහස් කරගත යුතු ය. අහසින් වැටෙන වතුර සියලු ජනතාවගේ සම්පතකි. එය ගොවියාට ඉතිරි කර දීමේ



**දරුවන්ට දැනුම හා ක්‍රියාකාරිත්වය ලබාදිය යුත්තේ වහල් මෙහෙවර කිරීමට නො වේ. ජනතාවගේ වියදමෙන් ඉගෙන ගෙන පිටරටවල වහල් සැප විඳීමට නොවේ. රටට ප්‍රයෝජනවත් පුරවැසියෙකු වීමට ය. මේ සඳහා සකස් වූ අධ්‍යාපන ක්‍රමයක් තවමත් අපට නැත. එහෙයින් රටට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් උදෙසා පුරවැසියන් නිරන්තර උද්ඝෝෂණයේ යෙදිය යුතු ය.**

දේශපාලනයක් රටේ නැත. පිටරටුන්ගේ සූත්තරවලට වතුර සීමා වෙයි. මෙවැනි රටක ගොවි සංස්කෘතියක් ගැන පුරාජේරු කතා කිරීම රැවටිල්ලකි. ධීවරයා මාළු ගොඩට ගෙනේ. ගොඩ සිට ඒ මාළු කන්නෝ කොපමණ සිටිත් ද? ධීවරයාත්, අනිත් පැත්තෙන් පාරිභෝගිකයාත් සූරා කන මේ ක්‍රමයෙන් ධීවරයා නිදහස් වනතුරු ඔවුන්ගේ කුසගින්න හා දිළිඳුකම පවතිනු ඇත. එය පවත්වා ගැනීමේ දේශපාලනයෙන් නිදහස ලැබීම සැබෑ නිදහස ය. ඒ සමගම එය පවත්වාගෙන යන මිනිසුන් ද පිටුදැකිය යුතු ය.

ධනපති ක්‍රමයක් යටතේ වුව ද කම්කරුවාට යම් ප්‍රමාණයක නිදහසක් නීතියෙන් තහවුරු කර තිබිණ. දැන් ඒ ක්‍රම යටපත් කෙරෙමින් කම්කරුවන් සූරාකන යටි සූත්තර යෙදීම මේ දේශපාලනට ආවේණික වී ඇත. ආයෝජන මණ්ඩලය, මෑන් පවර් ක්‍රමය ආදියේ දී කම්කරුවාට නීතියෙන් ලැබී තිබුණ සහනයන් පවා තවත් නීති හා භාවිතයන් මගින් අහෝසි කැරේ. අපේ රටේ ආයෝජනය කිරීමට සමහර විදේශිකයන් පෙළඹවීම යනු කම්කරුවන්ට අඩුවෙන් ගෙවීමට පෙළඹවීම නොවන්නේ ද? එයින් රට දියුණු කරන්නේ කෙසේද? කම්කරුවා වහලෙකු බවට පත් කොට ටික දෙනෙකුට ප්‍රතිලාභ ලබාදීමෙන් රට දියුණු යැයි සංඛ්‍යාලේඛණ දැක්වීම ව්‍යාජයක් නොවන්නේ ද?

තවද සේවකයන්, උගතුන්, පුහුණු ශ්‍රමිකයන් සහ උසස් අධ්‍යාපනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද මෙම වහල් ක්‍රමයට ගොදුරු කර ගැනීමේ උපාමාරුවලින් එම ක්ෂේත්‍ර පිරී ගොසිනි. ණයවර පතක් ලබන සේවකයා අනාගතයේ වැඩකිරීමට හෙවත් ශරීර ශක්තිය හෙට යෙදවීම උදෙසා අද ණය ගනී. එය ගෙවන කාලය වන තෙක් ඔහු මේ ක්‍රමයේ වහලෙකි. උගතුන්, පුහුණු ශිල්පීන් වැඩට යාමට ලීසිං ක්‍රමයට වාහනයක් ගන්නේ තම සේවය අනාගතයට උගස් තබමිනි. ඔහු රටට වැඩක් කිරීමට වඩා සිදුවන්නේ පිට රටක් වෙනුවෙන් ජීවත් වීමට ය. උපාධියක්, විභාග යක් ගැනීමට බැංකු ණය ගැනීම ද අනාගත පරපුර ණය මුදලට වහල් කර ගැනීම ය. උපාධිය ලැබීමෙන් පසු ඔවුන් කළ යුත්තේ ණය ගෙවීමේ වහල් මෙහෙවර ය. සැබෑ සංස්කෘතියක් බිහිවිය හැක්කේ මොවුන් නිදහස් වූ රටක ය. අන්න එවන් වූ ස්වර්ණමය නිදහසක් කරා අපේ රට අවදි කරවීමේ වැදගත් කාර්යය පැවරී ඇත්තේ පුරවැසියාට ය.

**අධ්‍යාපනය, සාහිත්‍යය හා කලාව සහ සංස්කෘතිය**

දරුවන්ට දැනුම හා ක්‍රියාකාරිත්වය ලබාදිය යුත්තේ වහල් මෙහෙවර කිරීමට නො වේ. ජනතාවගේ වියදමෙන් ඉගෙන ගෙන පිටරටවල වහල් සැප විඳීමට නොවේ. රටට ප්‍රයෝජනවත් පුරවැසියෙකු වීමට ය. මේ සඳහා සකස් වූ අධ්‍යාපන ක්‍රමයක් තවමත් අපට නැත. එහෙයින් රටට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් උදෙසා පුරවැසියන් නිරන්තර උද්ඝෝෂණයේ යෙදිය යුතු ය. මේ සඳහා අවශ්‍ය දැනුම හා ආකල්ප වර්ධනය කිරීමට උගතා ද, ලේඛකයා ද, මාධ්‍යවේදියා ද කැපවිය යුතු නොවේද? ඊට අවශ්‍ය පොත පත ලිවීම ද, සාහිත්‍යකරණය වේ. එහෙත් අද අපේ රටේ සාහිත්‍යය වශයෙන් හැඳින්වෙන්නේ නවකතා, කෙටිකතා සහ කවි පමණි. එහෙත් ඒ තුළ පවා අපේ ජනතාවගේ නිදහස පිළිබිඹු වන්නේ කලාතුරකිනි. අද චිත්‍රපටි සහ නාට්‍ය ක්ෂේත්‍ර යම් දියුණුවක් ලබා තිබෙන බව සතුටට කරුණකි. එහෙත් ඒ සියල්ලේ ම සමාන්තර වර්ධනය අනුව අපේ සංස්කෘතිය ද සකස් වන්නේ ය. මේ සඳහා අවශ්‍ය පොදු සංවාදයක් ගොඩනැගීමට ජනමාධ්‍ය දක්වන උනන්දුව ප්‍රමාණවත් නැත.

පුරවැසියාගේ නිදහස රටේ නිදහස ය. එය උදාවිය හැක්කේ පුරවැසියාගේ ම උනන්දුව මත ය. ●






පූජ්‍ය
**මාදොළුවාවේ සෝභිත හිමි**

හිටපු ජනාධිපති ඇතුළු පිරිස මත්තල ගුවන් තොටුපොළ විවෘත කිරීම

# තරුණයට බොරු පොරොන්දු නොදී නිෂ්පාදන ආර්ථිකයකට රට යොමු කරමු

අපිට නිදහස ලැබුණු දා පටන් අපේ දේශපාලන ගමන් මග වැටී තිබෙන්නේ තට්ටුමාරු ක්‍රමයක් තුළ ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයේ සිටින විට ඒ අයගේ පිරිස් හිතූ මතයට තමනට අවශ්‍ය දේ කරති. ඔවුන්ගේ පාලනය තුළ පීඩාවට පත්වන ජනතාව විසින් ඊ ළඟ මැතිවරණයේ දී ඒ අයව ඉවත් කරති. ඊ ළඟ වාරය පාලනය හොබවන්නට ඒ ජනතාව එක්සත් ජාතික පක්ෂයට බලය දෙති. ඒ අය යන්නේ ද පෙර සිටි අය ගිය ආකාරයේ ම ගමනකි. එ වසර හතක් අටක් හෝ එයට වැඩි ගණනක් පාලනය කළාට පසු නැවත ඒ අය ඉවත් කර ඊට පෙර සිටි පිරිසටම බලය දෙති.

අලුතින් පත් වූ අය කරන වැරදි ගැන පැරදුණු අය කථාකරන විට අලුතින් පත්වූ අය පවසන්නේ පැරදුණු අයට ඒ ගැන කථා කිරීමට සදාචාරමය අයිතියක් නැති බවය. අල්ලස් හා දූෂණ ගැන කථා කරන



**නිෂ්පාදන ආර්ථිකයක් කරා ගමන් කරන්නට අපේ රටේ කිසිවෙක් උත්සාහ දරන බවක් පෙනෙන්නට නැත. අනික් අතට අපේ අය යෝජනා කරන සමහර දේ කළ නොහැක. උදාහරණයක් ලෙස තේ දළු සඳහා වැඩි මිලක් ගෙවීමට කළ යෝජනාව ගත හැක. වැඩි මිලට ගෙන අඩු මිලට විකිණිය නොහැක. එම නිසා තේ දළු වැඩි මිලට ගෙන කළ හැක්කේ කුමක් ද?**

විට ද එයට වඩා වෙන දෙයක් ඔවුහු නොකියති. එක් පැත්තකින් බැලූ කළ මෙය ද සත්‍යයකි. පුද්ගලයින් පමණක් මාරුවීමෙන් එසේ පවසා ප්‍රශ්නයෙන් ගැලවීමට ද ඉතා පහසු ය. අනික් අතට ඒ පුටුවට ම වෙනත් අය පත් කිරීමෙන් වෙනසක් ද සිදු නොවේ. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ පොරොන්දු පත්‍ර තිබුණාට දර්ශනයක් හා ඒ මත පදනම් වූ ප්‍රතිපත්තියක් නොතිබීම ය.

**ආර්ථික යථාර්ථය හා මිත්‍යාව**

තමන් බලයට පත් වූ පසු අවම වැටුප රුපියල් 25000ක් කරන බව මහින්ද රාජපක්ෂ මහත්තයා පවසයි. එපමණක් ද නොව තේ, රබර්, සහ වී සඳහා වැඩි මිලක් දෙන බව ද ප්‍රකාශ කර ඇත. මෙයට අමතරව සමෘද්ධිය වැනි සහනාධාර වැඩිකරන බව ද කියයි. අනික් අයත් තරඟයට පවසන්නේ ද මේ හා සමාන දෙයකි. මොවුන්ට කිසිදු දේශපාලන දැක්මක් නැතිවා පමණක් නොව මේ රට ගොඩගැනීමට සමාජ ආර්ථික ප්‍රතිපත්තියක් ද නැත. ආණ්ඩුවක් රටේ ආර්ථිකය ඉතාමත් බුද්ධිමත් ආකාරයට හැසිරවිය යුතු ය. දැන් ගෙවන්නට බැරි ණය කන්දරාවක් මේ රටේ වැසියන් මත පටවා තිබේ. හම්බන්තොට වරායෙන් ආදායමක් නැත. එම වරායේ ණය ගෙවන්නට සිදුවී තිබේ. මත්තල ගුවන් තොටුපළේ ආදායම රුපියල් 17000ක් බව කියැවේ. අපේ මාළු අපනයනයද නැති වී ගියේ ය. අපි ලබාගත් දේට වඩා අහිමි වූ දේ විශාල ය. සැළසුමක් නැති ගමනක් යන බව මෙයින් මොනවට පැහැදිලි ය.

නිෂ්පාදන ආර්ථිකයක් කරා ගමන් කරන්නට අපේ රටේ කිසිවෙක් උත්සාහ දරන බවක් පෙනෙන්නට නැත. අනික් අතට අපේ අය යෝජනා කරන සමහර දේ කළ නොහැක. උදාහරණයක් ලෙස තේ දළු සඳහා වැඩි මිලක් ගෙවීමට කළ යෝජනාව ගත හැක. වැඩි මිලට ගෙන අඩු මිලට විකිණිය නොහැක. එම නිසා තේ දළු වැඩි මිලට ගෙන කළ හැක්කේ කුමක් ද? ඒවාට නියමිත මිල මට්ටමක් වෙළඳ පොළ විසින් නියම කෙරී ඇත. නමුත් තවමත් ඒ සෙල්ලම එසේම සිදු වේ. සමෘද්ධිය වැඩිකරන බව මේ අය කියති. මිනිසුන්ගේ ශ්‍රමයෙන් වැඩක් ගතහැකි ලෙස ආර්ථිකයේ ව්‍යුහය වෙනසක් ඇති නොකර මේ සහනාධාර වැඩි කිරීමෙන් අගාධයට යනවා හැර වෙනත් යහපතක් සිදු නොවේ. මිනිසුන් දහස් ගණනක් ජලය ඉල්ලා උද්ඝෝෂණය කරන බව මම ඊයේ රෑ රූපවාහිනියෙන් දුටිමි. මෙය වෙන කොහේවත් නොව වැව් බැඳි රාජ්‍ය ලෙසින් සැළකූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය. තවමත් රටේ ජනගහනයෙන් සියයට 75ක ගොවි ජනතාවක් වෙසෙති. ඔවුන් ගේ ජීවන මග පදනම් වී ඇත්තේ වාරිකර්මාන්තය මත ය. අපේ විනාශ වූ වැව් ටික ප්‍රතිසංස්කරණය කිරීමට, ඇලවේලි ටික ප්‍රතිසංස්කරණය කිරීමට පාලකයින්ට උවමනාවක් නැත. මේ මිනිසුන්ට ගොවිතැන් කරගෙන ජීවත් වීමට අවශ්‍ය යටිතල පහසුකම් ටිකවත් වැඩිදියුණු කරදීමට මේ අයට උවමනාවක් නැත. අපේ රටේ නිෂ්පාදනය කරන්නට හැකි දේකටවත් මේ අය අත දෙන්නට සූදානම් බවක් නොපෙනේ. නමුත් ඇතැමුන් කථා කරන්නේ අජටාකාශයට යන්නට ය. මේ විකෘතියේ සම්පූර්ණ වගකීම ආණ්ඩු කළ දේශපාලන පක්ෂ විසින් දැරිය යුතු ය.

ලංකාවේ පවතින ගැටලු අතර රැකියා වියුක්තිය ප්‍රධාන ගැටළුවකි. මෙහි විපාකයක් ලෙස රටේ ශ්‍රමය විශේෂයෙන් කාන්තාවන්ට මැදපෙරදිග රටවලට බැල මෙහෙවරකම් කිරීමට සිදු වී තිබේ. ගුටි කෑම, අනාථවීම පමණක් නොව සමහරුනට පීතෘත්වයට හිමිකමක් නැති දරුවෝ ද ලැබෙති. ඔවුන් යන්නේ මහමෙරක් හරිහම්බ කිරීමට නොව රුපියල් විසි-තිස් පන්දාහක වැටුපකට ය. මේ ගැන කිසිවෙක් කථා නොකරති. මේ රටේ රැකියා උත්පාදනය කළා නම් ඒ අයට ඒ රටවලට බැළමෙහෙවරකම් කිරීමට සිදුවන්නේ නැත. දැන් මොවුහු කොරියාවට යෑම සඳහා මහ විශාල ඝෝෂාවක් කරති.

**නිෂ්පාදන ආර්ථිකයක්**

කොරියාවේ නැව් සහ වාහනේ කර්මාන්තය හැර සෑම තැනම තිබෙන්නේ කුඩා ප්‍රමාණයේ කර්මාන්ත ශාලා ය. ලෝකයට අවශ්‍ය සෑම දෙයක් ම ඒවායේ නිෂ්පාදනය කරති. කොරියාවට එය කළ හැකි නම් අපිට කළ නොහැක්කේ මන් ද? ඉන්දියාවේ

www.jvpsrilanka.com




**දේශපාලන පක්ෂවලට ගැති නොවන බුද්ධිමතුන්ගෙන් සමන්විත ක්‍රම සම්පාදක මණ්ඩලයක් පත්කර ඒ අයගේ උපදෙස් ලබාගෙන මේ ගමන යායුතු ය. ඒ ගමනට දේශපාලන පක්ෂ සූදානම් කළ යුතු ය. එතැන දී මම ජනතා විමුක්ති පෙරමුණට ප්‍රශංසා කරන්නට කැමැත්තෙමි. එක කුඩුකාරයෙක් බාර්කාරයෙක් ඔවුන්ගේ ලැයිස්තුවලට ඇතුලත්කර නැත. එමෙන් ම ජාතික ලැයිස්තුවට ද ඇතුලත්කර ඇති අයගේ නම් දුටුවිට පැහැදීමක් ඇති වේ.**

නිෂ්පාදකයෝ දැන් ජපානයේ නිපදවන කාර් ඒ රටේ ම නිෂ්පාදනය කරති. එවැනි නවීන කර්මාන්ත මගින් ඉන්දියාවේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳා ගැනීමට ඔවුහු මහන්සි ගනිති. ඒ නිසා ජනතාව විශාල වශයෙන් ආකර්ෂණය වෙන සංවර්ධනමය ආර්ථිකයට යන බවට සහතිකයක් අපිට තිබිය යුතු ය. මූලික වශයෙන් වී ගොවිතැන, හේන් ගොවිතැන දියුණු කර රට දියුණු තැනකට යන බවට සහතික විය යුතු ය. එය ප්‍රථමික මට්ටමේ නිෂ්පාදනයක් බව සත්‍යයකි.

### අපේ ඇඟළුම්

අඩුම තරමේ අල්පෙනිත්තක් නැතිනම් ඉඳිකට්ටක් හදා ගැනීමට හෝ මේ අයට සැළසුමක් නැත. අපේ ළමයින්ට දෙන රෙදි ටික ගෙනෙන්නේ ද චීනයෙනි. ප්‍රේමදාස මහතා ඇගලුම් කර්මාන්ත ශාලා ඉදි කළේ ය. මෙය ආරම්භ කරන විට සුද්දන්ට ජංගි මහන බව පවසා ඇතැම්හු පරිභව කළ හ. නමුත් අපේ ගැහැණු ළමෝ විශාල සංඛ්‍යාවකට ඒවායින් රක්ෂා ලැබුණි. ආත්ම ගෞරවය ද ආරක්ෂා කරගනිමින් ගෙදර සිට රැකියාවට ගොස් කීයක් හෝ උපයා ගැනීමේ හැකියාවක් ඒ ළමයින්ට එයින් ලැබුණි. අපිට අහිමි වූ ජී එස් පී ප්ලස් ලබාගෙන අඩු තරමේ අලුතින් තව පිරිසකට රක්ෂා උත්පාදනය කළහැකිව තිබුණි. වියට්නාමය, බංග්ලාදේශය වැනි රටවල් අපිට වඩා මේ අංශයෙන් වෙළඳපොල අල්ලාගෙන ඇත. විශේෂයෙන්ම රෙදි නිෂ්පාදනය අතින් අද අපිට වඩා ඉදිරියෙන් සිටිති. අපි මේවා ඒ ආකාරයට ඉදිරියට ගෙන ගියේ නම් රැකියා උත්පාදනය වේ. දැන් තිබෙන කර්මාන්ත ශාලා ටික ද වැසෙන්නට පටන්ගන තිබේ. සරු පසක් තිබෙන මේ රටේ අධිවේගී මාර්ග දෙපස ඇති ඉඩම්වල පදිංචි ජනතාවට එයින් කිසියම් වාසියක් අත්කරගත හැකි ආකාරයට එය සැළසුම් කර නැත. අධිවේගී මාර්ගය දෙපස ඇති වැටට තරමක් ඈතින් වටිනා දැව වගා කිරීමෙන් කොතරම් ආදායමක් ලබාගත හැකි ද? මෙවැනි නිර්මාණාත්මක ව්‍යාපෘති මගින් අතුරු ආදායම් ජනිත කළ හැක.

### පැහැදිලි වෙනසක්

දේශපාලන පක්ෂවලට ගැති නොවන බුද්ධිමතුන්ගෙන් සමන්විත ක්‍රම සම්පාදක මණ්ඩලයක් පත්කර ඒ අයගේ උපදෙස් ලබාගෙන මේ ගමන යායුතු ය. ඒ ගමනට දේශපාලන පක්ෂ සූදානම් කළ යුතු ය. එතැන දී මම ජනතා විමුක්ති පෙරමුණට ප්‍රශංසා කරන්නට කැමැත්තෙමි. එක කුඩුකාරයෙක් බාර්කාරයෙක් ඔවුන්ගේ ලැයිස්තුවලට ඇතුලත්කර නැත. එමෙන් ම ජාතික ලැයිස්තුවට ද ඇතුලත්කර ඇති අයගේ නම් දුටුවිට පැහැදීමක් ඇති වේ. අනික් පක්ෂත් ජනතා විමුක්ති පෙරමුණ ආදර්ශයට ගැනීම යහපත් ය. මහත්මා ගාන්ධි කිව්වේ ප්‍රතිපත්තියෙන් තොර දේශපාලනය පාප කර්මයෙන් එකක් ලෙස ය. ඒ අනුව බැලුවොත් දර්ශණයක් නැතිව අප යන අවගමන පාපයකි. ඒ නිසා ජනතාව මේ කර තිබෙන්නේ පාලකයෙකු ව ඉවත් කළා පමණක් නොව චින්තන විප්ලවයකි.

දේශපාලන පක්ෂ වැඩේ හරියට නොකරන්නේ නම් දැන් අපේ වාරය ලැබී ඇත. මේ වාරයේ හරියට ප්‍රයෝජනය ගතහොත් මේ පාර පාර්ලිමේන්තුව ශුද්ධ කරගන්නට අපට පුළුවන. පාර්ලිමේන්තුව උගතුන්ගේ තැනක් මෙන්ම බුද්ධිමතුන්ගේ තැනක් කරන්න අපට පුළුවන. අපිට පුද්ගලයින් අවශ්‍ය වන්නේ කරන්නේ දර්ශණයක් හා ප්‍රතිපත්තියක් මත ක්‍රියා කරන්නට ය. අපේ පොදු අරමුණ වන්නේ නිවැරදි දර්ශනයක් ඇතිව ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගිය හැකි පාර්ලිමේන්තුවක් නිර්මාණය කරගැනීම ය.

මොනවා කීවත් අපි මේ යන්නේ ජේ. ආර්. ජයවර්ධන මහතා ඇති කළ සැලැස්ම මත ය. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කළේ අපිට නොව ඒකාධිපති වීමේ උවමනාවට ය. මහින්ද රාජපක්ෂ මහතාට ඒ බලයත් ප්‍රමාණවත් නොවීන. ඒ නිසා 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනයක් ද අනුමත කරගත්තේ ය. ඒ ව්‍යවස්ථාවේ තිබෙන අසීමිත බලතල නිසා මේ රටේ හිතුවක්කාර ඒකාධිපතියෙක් ඇති විය. කුඩුකාරයින් සහ තැබෑරුම්කාරයින් එපා කියන අයම පවුල් පිටින් එක් වී එවැනි



**අප වෙනස් කිරීමට උත්සාහ දරන්නේ දේශපාලන බලය පමණක් ම නොව සමාජ සහ ආර්ථික යන අංශ 3ම මෙයට ඇතුලත් ය. ඒ ගමනේ දී වැදගත් ම දේ තමයි සැළසුමක් ඇති කර ගැනීම. මෙවර මැතිවරණයේ දී අමුතු වෙනසක් අපිට පෙනෙන්නට තිබේ. වෙනදා පැවති මැතිවරණ සමඟ සංසන්දනය කිරීමේ දී මේ මැතිවරණයේ දී විශාල වෙනසක් පෙනෙන්නට ඇත. මේ ටිකට මිනිසුන් සංයමයෙන් හැසිරෙන බව පෙනේ.**

පුද්ගලයින් මන්ත්‍රීවරයා කරගන්නා රටක් ඔහු විසින් නිර්මාණය කෙරින. ඉතිං මේ ජරාජීර්ණ ක්‍රමයට බොහෝ මිනිසුන් හැඩගැසි තිබේ. මේ ක්‍රමය වෙනස් කිරීමට  අපි ආරම්භයක් කළෙමු. අවුරුදු හැට හැත්තෑවක් පුරුදුවෙලා තියෙන මේ ක්‍රමයෙන් එකපාරට මුදවා ගන්න එක පහසු නැත. පාර්ලිමේන්තුව ද හෑල්ලුවට ලක්  වී තිබේ. අහන්නට බලන්නට පමණක් නොව අධිකරණයට ගියාට ප්‍රතිඵලයක් ද ලැබුණේ නැත. මේ තත්ත්වය වෙනස් කරගන්නට රාජ්‍ය බලය ලබාගතයුතු විය. ඒ මූලික වෙනස්කම කරගැනීම සඳහා පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කළේය. ඒ පොදු අපේක්ෂකයා වටා එක්වන ලෙස අපි සියළුම පක්ෂවලට ආරාධනා කළෙමු. පුද්ගලයෙකුට නොව පොදු අරමුණ වටා එක්වෙන ලෙසයි අප ආරාධනා කළේ. ඒ පොදු අරමුණ වූයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ය. අප විසින් සම්මත කෙරුන 19වෙනි ව්‍යවස්ථාව නැවත බලගැන්විය යුතුව තිබුණි. පසුගිය කාලය පුරාවටම එකම ඇමතිවරයෙකුගේ පමණයි අල්ලස් පිළිබඳව විමර්ෂණය කර තිබෙන බවට වාර්තා වන්නේ. ඒ කොමිසම තිබුණේ තම විරුද්ධවාදීන්ගෙන් පළිගැනීම සඳහා පමණක් බවයි එයින් පෙනෙන්නේ. ඒ ආයතනය ඇතුළු පොලිසිය දේශපාලනීකරණයෙන් නිදහස් කරන්නට අවශ්‍ය ය.

### ජනවාරි 8 ඉදිරි දිගුව

අපි ජනවාරි 8 වනදා ගත්ත උත්සාහයෙන් සම්පූර්ණයෙන්ම වෙනසක් කරන්නට පුළුවන් වුයේ නැත.  විධායක ජනාධිපති ක්‍රමයෙන් අපිට ඉවත්කර ගැනීමට හැකිවූයේ යම් බලතල ප්‍රමාණයක් පමණී. ජනවාරි 8 වැනිදායින් පසු ජනාධිපතිවරයාට හිතූමතේ පාර්ලිමේන්තුව විසුරුවන්නට නොහැක. එය වසර අවුරුදු 4 1/2ක් පැවතිය යුතු ය. ජනාධිපති නීතියට යටත් පුද්ගලයෙක් බවට පත් වී තිබේ. යම් යම් අයිතිවාසිකම් ප්‍රමාණයක් ලබාගැනීමට ද හැකි වී තිබේ. දීර්ඝ කාලයක් කථා කළ  රටේ මූලික අත්‍යවශ්‍යතාවයක් වූ ඖෂධ පනත සම්මත කරගැනීමට හැකි විය. ඖෂධ පනත හරියට ක්‍රියාත්මක වෙනවා නම් අපට බෙහෙත් ටික 50% ට නොවෙයි 25% අඩු කරන්නට පුළුවන. නිවාස ප්‍රශ්ණය ද අපිට තිබෙන බරපතල ප්‍රශ්නයකි. රජයෙන් නිවාස හදා ඉතාම අඩු කුලියට දෙන වැඩපිළිවෙලක් ලෝකයේ තිබේ. ලෝකයෙන් ණය අරන් මේවා කළත් එම කුලියෙන් ණය ගෙවීම අපහසු වන්නේ නැත. ප්‍රශ්න විශාල සංඛ්‍යාවක් තිබෙනවාක් මෙන්ම ඒ ප්‍රශ්ණ වලට විසඳුම් ද තිබේ.

අප වෙනස් කිරීමට උත්සාහ දරන්නේ දේශපාලන බලය පමණක් ම නොව සමාජ සහ ආර්ථික යන අංශ 3ම මෙයට ඇතුලත් ය. ඒ ගමනේ දී වැදගත් ම දේ තමයි සැළසුමක් ඇති කර ගැනීම. මෙවර මැතිවරණයේ දී අමුතු වෙනසක් අපිට පෙනෙන්නට තිබේ. වෙනදා පැවති මැතිවරණ සමඟ සංසන්දනය කිරීමේ දී මේ මැතිවරණයේ දී විශාල වෙනසක් පෙනෙන්නට ඇත. මේ ටිකට මිනිසුන් සංයමයෙන් හැසිරෙන බව පෙනේ. වෙනදා මෙන් විශාල කටවුට් අද දක්නට නැත. තාප්ප වැසීයන පරිදි පොස්ටර් ඇලවීම නතර වී තිබේ. පෙළපාලි ද පෙනෙන්නට නැත. පෙළපාලි ගියවුන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වී ඇත. මැතිවරණ කොමිසමකට හරියට බලතල දුනහොත් මොන තරම් යහපත් ලෙස මැතිවරණය පවත්වන්නට හැකි ද යන්න මෙයින් පෙනේ. මේ වෙනස අප තේරුම් ගතයුතුය. රාජ්‍යයේ එන්ජිම වන රාජ්‍ය පරිපාලනය දේශපාලනයෙන් නිදහස් වියයුතු ය. මේවාට හොද සුදුසුකම් තිබෙන අය පත්කළ යුතු ය. විශේෂයෙන්ම තානාපති සේවය ගැන බැලුවොත් පසුගිය කාලයේ යැව්වේ ඥාතින්, යහළුවන්, ගණන්කාරයන් සහ කිසි වැදගැම්මකට නැති පිරිස් ය. මේ අයට පුළුවන් ද අපේ රට මුහුණදෙන ජාත්‍යාන්තර ප්‍රශ්න පිළිබඳව බුද්ධිමත් ලෙස ගණුදෙනු කරන්නට. ඒක වෙනස් කිරීමට තමයි අපිට 19වැනි සංශෝධනය අත්‍යවශ්‍ය වූයේ.

සියයට සියයයක්ම අපිට සතුටුවිය නොහැකි බව සත්‍යයක් වන නමුත් ඒවා දෙස බැලීමෙන් අපිට පෙනෙනවා පැහැදිළිවම අපි ගමනක් ආරම්භ කර ඇති බව. ව්‍යවස්ථාදායක සභාව නැවත ගෙනෙන්නට හැකි වූවත් එය අපේක්ෂා කළ ආකාරයට කරගත නොහැකි වූ බව ද අප පිළිගත යුතු ය. ඒ අලුත් ගමන

www.colombopage.com




**මුළු මහත් ජනතාවට ම එනම් සිංහල, දෙමළ සහ මුස්ලිම් හැමට ආරක්ෂාවෙන් ජීවත්වෙන්නට, මානව අයිතිවාසිකම් බලගන්වා බලය රට පුරා බෙදී ගිය නව යුගයක් සඳහා යාමට තමයි අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉල්ලන්නේ. අප ඉල්ලන්නේ පාර්ලිමේන්තු ක්‍රමයකි.**

ආරම්භ කරන මොහොතේ මේ රටේ ජනතාව මැතිවරණ ක්‍රමය වෙනස් විය යුතු බව ද අපේක්ෂා කළ හ. මැතිවරණ ක්‍රමයේ අහිතු ඵලවිපාක ඉතාමත් කළකිරීමෙන් අපි ද බලා සිටියෙමු.

නමුත් මේ පැලැස්තර දැමීම හරියන්නේ නැත. ලබන වාරයේ පත්වන පාර්ලිමේන්තුවම ව්‍යවස්ථාදායක සභාවක් බවට පත්කර මුළු පාර්ලිමේන්තුවේ ම අනුමැතියෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කළ හැක. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර, 19 වැනි සංශෝධනය හරියට ක්‍රියාත්මක කර, නව මැතිවරණ ක්‍රමයක් රටට හඳුන්වලා දී රට සංවර්ධන ආර්ථිකයකට යොමු කිරීමයි ඊ ළඟට කළ යුත්තේ. මුළු මහත් ජනතාවට ම එනම් සිංහල, දෙමළ සහ මුස්ලිම් හැමට ආරක්ෂාවෙන් ජීවත්වෙන්නට, මානව අයිතිවාසිකම් බලගන්වා බලය රට පුරා බෙදී ගිය නව යුගයක් සඳහා යාමට තමයි අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉල්ලන්නේ. අප ඉල්ලන්නේ පාර්ලිමේන්තු ක්‍රමයකි.

මේ අය ද නීති හදන්නේ, මේ අය ද රටේ ප්‍රතිපත්ති තීරණය කරන්නේ, මේ අය මොනවාද දන්නේ යන ප්‍රශ්නය අප සියල්ලන්ටම තිබුණි. පාර්ලමේන්තු මන්ත්‍රීවරයෙකුට යම් තරමකට හෝ අධ්‍යාපන සුදුසුකමක් තිබිය යුතු ය. ඒ වගේම අපගේ නියෝජිතයින් සදාචාර සම්පන්න විය යුතුව තිබේ. ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ අය වීම අවශ්‍ය ය. එතනොල් කාරයෙක් හෝ කුඩු කාරයෙක් එතනට යන්නේ නම් ඒ අයගෙන් අප බලාපොරොත්තු වන්නේ කුමක් ද? ජනතාව දැණුවත් කිරීමට අපි මේ සඳහා යම් උත්සාහයක් දැරුවෙමු. දශලක්ෂයක පෙත්සමක් අත්සන් කිරීම එහි එක් පියවරකි. සියළු දේශපාලන පක්ෂ ද මේ පිළිබඳව දැණුවත් කළෙමු. ●



## රන් කොත බිඳුණා

වැව් දිය සිඳුනා
රන් කොත බිඳුණා
පිංකෙත ගිනි වැදුණා
වැව් තාවුල්ලේ
අපිට උරුම නැති
දිව මාලිග සැදුණා

රුක් දෙවියන් ළඟ
රෑ තුන් යාමෙට
උලමෙකුගේ හඬ ඇසුණා

**පූජ්‍ය පල්ලේගම**





මහාචාර්ය
**ජයදේව උයන්ගොඩ**

# රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය නැවත පාර්ලිමේන්තුවට ගතයුතුය.

පසුගිය ජනවාරි 8 දායින් එපිට සහ මෙපිට දිගහැරෙන ක්‍රියාවලිය 1994 සිදු වූ ක්‍රියාවලියට බොහෝ සෙයින් සමානකමක් දක්වයි. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව මෙන්ම ඉතාම අධිකාරිවාදී හා මර්ධනකාරි ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැබලි වී ගිය අතර වමේ ව්‍යාපාරයේ පරිහානිය සළකුණු කරමින් මෑත කාලයේ දී මෙන්ම මුළු විපක්ෂය ම දැඩි පසුබෑමකට ලක් විය. ශ්‍රී ලංකාවේ මෑත කාලයේ පවතින තත්ත්වය මෙන්ම එකළ ද විකල්ප දේශපාලන අදහස් සහ දේශපාලන පරිවර්තනීය ක්‍රියාමාර්ගයන් පිළිබඳ ඉදිරි දැක්මක් මතු කළේ බොහෝ විට

oneislandtwonationsblogspot.com



**ආණ්ඩු පක්ෂය හා විපක්ෂය අතර පමණක් නොව මෛත්‍රිපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට සම්බන්ධ පක්ෂ අතරේ පවා විශාල බල තරඟයක් තිබුණි. මා හිතන හැටියට 2015 ජනවාරි මාසයේ මුදුන්පත් වූ ඒ ක්‍රියාවලිය ද තිබෙන්නේ අනතුරක් ඉදිරිපිට ය. මෙම ක්‍රියාවලිය කොපමණ දුරකට ඉදිරියට ගෙනියන්නට දේශපාලන පක්ෂ සූදානම් ද යන ගැටලුව අප හමුවේ ඇත.**

දේශපාලන පක්ෂ වලින් ස්වාධීන වූ සිවිල් සමාජ ව්‍යාපාර විසිනි. මේ අවස්ථා දෙකේම පැවති පොදු ලක්ෂණ කිහිපයක් තිබුණි. සම්ප්‍රදායික දේශපාලන පක්ෂ වලින් පිටස්තර සමාජ ව්‍යාපාර තුළින් මතු වූ දේශපාලන විකල්ප ඉදිරිපත්වීම ඉන් එකකි. දෙවැන්න වූයේ විරුද්ධ දේශපාලන පක්ෂ මෙම සමාජ ව්‍යාපාර විසින් දෙනු ලැබූ සංකල්ප සහ ඉදිරි දර්ශනයන් සමඟ සම්බන්ධවීම ය. දේශපාලනයේ ව්‍යුහාත්මක පරිවර්තනයක් සඳහා අවශ්‍යය පසුබිම සකස්වීම අවස්ථා දෙකේදී ම දක්නට පුළුවන.

නමුත් ඒ කාලයේ තිබුණු එම ව්‍යාපාර මතින් බලයට පැමිණි පොදු පෙරමුණු ආණ්ඩුව එම දේශපාලන ව්‍යුහාත්මක පරිවර්තනය දිගටම ගෙන ගියේ නැත. 20015 ජනවාරි මාසයේ 8වන දින මුදුන්පත් වූ දේශපාලන පරිවර්තනයේ ද එම අනතුර තිබේ. පසුගිය මාස කිහිපය තුළ ලංකාවේ මතු වූ පරිවර්තනීය දේශපාලන ක්‍රියාවලිය සඳහා අවකාශයක් තිබුණේ වී නමුත් එය ක්‍රියාවට නගන්නට හැකි වන්නේ දේශපාලන පක්ෂ වලට පමණි. සත්‍ය වශයෙන් ම මේ සමාජ ව්‍යාපාරයට නව දේශපාලන අදහස්, ඉදිරි දර්ශන ඉදිරිපත් කළ හැකි නමුත් ඒ අය එය ව්‍යවස්ථාගත කරන අය නොවීම එක්තරා ප්‍රහේලිකාවකි. මොවුහු ප්‍රතිපත්ති සම්පාදකයෝ නොවෙති. ඒ කාර්ය පැවරී තිබෙන්නේ දේශපාලන පක්ෂවලට ය. ඒ නිසා 1994 මෙන්ම 2015 දී ද ඒ කාර්ය කිරීමේ දි පෙනෙන එකක් තමයි දේශපාලන පක්ෂ වලට සීමාවන් තිබීම. 19 වෙනි සහ 20 වෙනි සංශෝධනය පිළිබඳ කාරණයේ දී දේශපාලන පක්ෂ අතර පැවති අතිවිශාල බලතරඟයෙන් ඒ බව පැහැදිළි ය.

### දේශපාලන බල තරගය

ආණ්ඩු පක්ෂය හා විපක්ෂය අතර පමණක් නොව මෛත්‍රිපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට සම්බන්ධ පක්ෂ අතරේ පවා විශාල බල තරඟයක් තිබුණි. මා හිතන හැටියට 2015 ජනවාරි මාසයේ මුදුන්පත් වූ ඒ ක්‍රියාවලිය ද තිබෙන්නේ අනතුරක් ඉදිරිපිට ය. මෙම ක්‍රියාවලිය කොපමණ දුරකට ඉදිරියට ගෙනියන්නට දේශපාලන පක්ෂ සූදානම් ද යන ගැටලුව අප හමුවේ ඇත.

කෙසේ නමුත් මෙතන දී පුරවැසියන්ට කළ හැකි කාර්ය ඉතා සීමිත ය. මක්නිසාද යත් ලංකාවේ දේශපාලන පක්ෂ සහ පුරවැසියා අතර තිබෙන්නේ ඉතා දුර්වල සම්බන්ධය කි. උදාහරණයක් හැටියට ගතහොත්, දේශපාලන පක්ෂ පුරවැසියාට අභිමුඛ වන්නේ මැතිවරණයක දී පමණි. මැතිවරණයෙන් ලබන පරාජය හෝ ජයග්‍රහණයෙන් අනතුරුව දේශපාලන පක්ෂ නැවතත් පුරවැසියා කරා එන්නේ නැත.

පසුගිය කාලයේ දී ශ්‍රී ලංකාවේ තිබෙන දේශපාලන පක්ෂ කිසියම් පරිවර්තනයකට ලක් වී තිබේ. මේ පරිවර්තනය තුළ අපේ දේශපාලන පක්ෂවල සිටින්නේ සාමාජිකයින් නොව ඡන්දදායකයින් පමණි. මේ නිසාම මැතිවරණයකින් පසු පුරවැසියා කරා පැමිණීමට දේශපාලන පක්ෂ වලට හේතුවක් නැත. මැතිවරණ කාලයේ දී ජනතාව මතවාදී ලෙස තමන්ගේ ක්‍රියා මාර්ග තුළින් බලමුළු ගන්වනවා හැරෙන්නට සමාජය සමඟ ඓන්ද්‍රිය සම්බන්ධයක් දේශපාලන පක්ෂවලට නැත. අනික් අතට දේශපාලන පක්ෂ බලයේ සිටින විට සම්බන්ධකම් පවත්වන්නේ මහජනතාව සමඟ නොව ව්‍යාපාරිකයින් සහ නිලධාරිතන්ත්‍රය සමඟ ය.

### ලංකාවේ දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය

ලංකාවේ දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නොතිබීම තවත් කාරණයකි. කලකට ඉහත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අධ්‍යනයක් කළේ ය. මේ පක්ෂ වල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් ඇත්තේම නැති බව එමගින් මොනවට සනාථ

www.nation.lk



**ලංකාවේ දේශපාලන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නොතිබීම තවත් කාරණයකි. කලකට ඉහත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අධ්‍යනයක් කළේ ය. මේ පක්ෂ වල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් ඇත්තේම නැති බව එමගින් මොනවට සනාථ විය.**

විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති තීරණය කිරීම පක්ෂ වල අභ්‍යන්තර ක්‍රියාවලියක් ලෙස සිදු වන්නේ නැත. සාමාජිකයින්ගේ අදහස් පක්ෂයට ලැබීම මෙයින් වැළකේ. එය ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ වල තිබෙන බරපතල අඩුවකි. ඇත්ත වශයෙන්ම අප රටේ දේශපාලන පක්ෂ බොහෝ විට ව්‍යාපාරික ප්‍රජාවන් විසින් ග්‍රහණය කෙරී ඇත. මේ අනුව දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී වී තිබෙන්නේ මැතිවරණ කාලයේ දී පමණි. එසේ වන්නේ තම ඡන්දදායකයින් ලෙස සලකන පුරවැසියා ළඟට ගොස් ඡන්දය සහ අවසරය ලබාගත යුතු හෙයිනි. ඒ ඇරෙන්නට වෙනත් සම්බන්ධයක් පුරවැසියා සමඟ දේශපාලන පක්ෂකට නැත. මා හිතන්නේ ප්‍රජාතන්ත්‍රිකරණයේ දී ලංකාවේ දේශපාලන පක්ෂ වල ස්වභාවය පිලිබඳව අපි ඉතා ගැඹුරු සාකච්ඡාවකට යායුතු ය. එවැනි සාකච්ඡාවක් ආරම්භ වී ඇති බව මට තාමත් පෙනෙන්නේ නැත.

දේශපාලන පක්ෂ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයක් තුළ තිබෙන අත්‍යවශ්‍ය සහ කේන්ද්‍රීය ආයතන ව්‍යුහය කි. දේශපාලන පක්ෂ වල විශාල ප්‍රජාතන්ත්‍රවාදි කාර්ය භාරයක් තිබේ. නමුත් අප රටේ දේශපාලන පක්ෂ ක්‍රියා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදි නොවන ආකාරයට ය. තීරණ ගැනීමේ ක්‍රියාවලිය පමණක් නොව දේශපාලන පක්ෂ වල නායකත්වය ද තීරණය කෙරෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදි නොවන ආකාරයට ය. ලංකාවේ එජාපය දෙස බැලුවත්, ශ්‍රීලනිපය දෙස බැලුවත් අනිකුත් පක්ෂ බැලුවත් එය එසේම ය. ඒ අය වාර්ෂිකව පක්ෂ සම්මේලන පවත්වන බව සත්‍යයක් වන නමුත් ඒ ඇරෙන්නට අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලියක් නැත. දේශපාලන පක්ෂයන් හි ප්‍රජාතන්ත්‍රියකරණය පිළිබඳ සාකච්ඡාව චෙන්ද්‍රීය ක්‍රියාකාරින් තුළින් ම මතුවිය යුතු ය. නමුත් රාජ්‍ය ප්‍රජාතන්ත්‍රිකරණය පිළිබඳ සාකච්ඡාව මෙන්ම මේ සාකච්ඡාව ද දේශපාලන පක්ෂ තුළට ගෙන එන්නට වෙන්නේ පක්ෂ වලින් පිට සිටින අයට ය. දේශපාලන පක්ෂවල සිටින අයට මේ ගැටළුව වැටහුණත් ක්‍රියාමාර්ගයක් නොගැනීම එයට හේතුව වේ.

අනික් අතට අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නැති පක්ෂවලින් බිඳීගොස් නව දේශපාලන පක්ෂ බිහි වන්නේ ද නැත. ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය හැඩගැසී තිබෙන ආකාරය දෙස බැලීමේ දී සුවිශේෂ ලක්ෂණයක් තිබේ. කුඩා දේශපාලන පක්ෂ වලට ජාතික මට්ටමේ බලපෑමක් කිරීමට ඉතාම අපහසු ය. එයට හොඳම උදාහරණය වන්නේ ජනතා විමුක්ති පෙරමුණ ය. ලංකාවේ තුන්වන බලවේගය බවට පත්විය හැකි යැයි ඔවුහු දැණු දු කල්පනා කරති. නමුත් පසුගිය වසර 30-40ක දේශපාලන ක්‍රියාවලිය දෙස බැලීමේ දි එවැනි අවකාශයක් නැති බවයි පෙනෙන්නේ ලංකාවේ පාර්ලිමේන්තු දේශපාලනය හා පක්ෂ දේශපාලනය හැඩගැසී තිබෙන්නේ එක්තරා ධ්‍රැව ගතවීමකට අනුව ය. මෙසේ ධ්‍රැවගතවීමේ මධ්‍යස්ථාන දෙකක් තිබේ. එකක් එක්සත් ජාතක පක්ෂය වන අතර අනික ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වේ. අනිකුත් කුඩා පක්ෂ කැරකෙන්නේ මේ මධ්‍යස්ථාන දෙක වටා ය. මේ මැතිවරණය දෙස බැලුවත් තිබෙන්නේ ද්වි ධ්‍රැව ගතවීමකි. මේවා ව්‍යුහිය ලෙස කැඩිය නොහැකි බවයි මට පෙනෙන්නේ. ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය දැඩිලෙස මුල් බැස තිබෙන්නේ ඒ ආකාරයට ය. නමුත් දේශපාලන පක්ෂවල නොමැති මේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය පුරවැසියාට මතු කළ හැක.

කෙසේ නමුත් ප්‍රධාන දේශපාලන පක්ෂ වලට අභ්‍යන්තර



**රනිල් වික්‍රමසිංහ මහතා යටතේ මහජනයාගේ ඡන්දයෙන් අලුත් සභාග ආණ්ඩුවක් බලයට පත්වූවත්, ඔහු යටතේ ද ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙන්නේ කෙසේ ද යන්න නිරීක්ෂණය කළ හැක. පසුගිය 6 මාසය තුළ ද සිදු වූයේ ඒ දේම ය. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පදනයේ දි ප්‍රධාන වන මේ අය මහජනයාට සෘජුව වග කියන්නේ නැත. පාර්ලිමේන්තුවේ සිටින ජනතා නියෝජිතයින්ට මේවා පිළිබඳව අවබෝධයක් ද නැත.**

ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් බලපෑමක් කරන්නේ කෙසේ ද කියන එක මූලික අභියෝගයකි. එය එතරම් පහසු කාරණයක් නොවේ. නමුත් ලංකාවේ ප්‍රජාතනිත්‍රවාදය පිළිබඳ කාරණයේ දි මේ ප්‍රශ්නය ගතයුතුම ය. එය සාකච්ඡාවට ගැනීම තුළින් පමණයි යම්කිසි බලපෑමක් හරි කරන්නට හැකි වෙන්නේ.

### සංගමීකරණයේ පරිවර්තනයක් අවශ්‍යයි

ජනවාරි 8 වෙනිදායින් පසුව සිදුවෙමින් පවතින පරිවර්තනය තුළ දේශපාලන පක්ෂ වල ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කාරණය ද ඉදිරියට ගතහැක. ඒ සඳහා ප්‍රවේශයක් ලෙස මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වය යටතේ ලංකාවේ දේශපාලනය තුළ සිදු වූ එක්තරා වෙනසක් පිළිබඳ විග්‍රහයක් අපිට අවශ්‍ය ය. මට පෙනෙන ආකාරයට මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන තන්ත්‍රය යටතේ ලංකාවේ දේශපාලනයේ එක්තරා බැරෑරුම් පරිවර්තනයක් සිදු වී තිබේ. ඒ පරිවර්තනය නම් දේශපාලන බලය, රාජ්‍ය බලය සහ ආර්ථික බලය යන බල ත්‍රිත්වය ම අත්පත්කර ගන්නා කුඩා කණ්ඩායමක් බිහිවීමය. පාලනය සාංගමීකරණය ලෙස එය හැඳින්වීමට පුළුවන. පෙර තිබුණේ ව්‍යාපාරිකයින් දේශපාලකයින් වීමය. දැන් දේශපාලනය ප්‍රයෝජනයට ගෙන දේශපාලකයින් ව්‍යාපාරිකයෝ වෙති. දේශපාලනය මුල්‍යකරණයවීම ලෙසයි එය සැළකෙන්නේ. ඒ අනුව දැන් දේශපාලනය වෙළඳපොල අන්තර් විනිවිදයාමක් සිදුවී ඇත. රාජ්‍ය යාන්ත්‍රණයේ කොටස් පවා ඒකට ඔවුන් සම්බන්ධ කරගෙන තිබේ. මහින්ද රාජපක්ෂ මහතා යටතේ ඇතිවූ මේ ක්‍රියාවලිය නැවැත්වීමට ජනවාරි 8 සිදු වූ ආණ්ඩු වෙනසින් එක්තරා වැදගත් පදනමක් වැටුණි. නමුත් ඒ පරිවර්තන ක්‍රියාවලියට මූලික වූ අයට පවා මේ සාංගමීකරණය නැවැත්විම පිළිබඳ අවබෝධයක් නැති බවයි මට පෙනෙන්නේ.

ඒ පිළිබඳ දේශපාලන විග්‍රහයක් තව ම අපේ රටේ නැත. පසුගිය මාස 6 තුළ ආණ්ඩුවට මුහුණ දෙන්නට වූ අභියෝග වලින් ඒ බව හොඳට පැහැදිළි ය. ඉන් ප්‍රධාන කාරණයක් වන්නේ මේ දූෂණය පිළිබඳව සොයා බැලීම ය. ඒවා පෙර දී කළ ආකාරයට පහසුවෙන් සම්ප්‍රදායික ක්‍රමවලින් අල්ලා ගන්නට පුළුවන් ඒවා නොවේ. දූෂණය දැන් අතිශයින් ම තීක්ෂණව කරන දෙයක් බවට පත් වී ඇත. එයින් පෙනීයන්නේ දේශපාලනඥයින් මේවා තනිවම කරන දෙයක් නොවන බව ය. මෙය රාජ්‍ය යන්ත්‍රණයේ කොටස් සමග හවුල් වී කරණ දෙයකි. ඇත්ත වශයෙන්ම ඔය දූෂණය පිළිබඳව පරික්ෂණ ක්‍රියාවලිය අඩපන වීමට අර්ධ වශයෙන් එය බලපා තිබේ. මේ සාංගමීකරණයේ පාලනය ඉතා ශක්තිමත් ය. ඒක දියකර නොහැර ලංකාවේ යහපාලනය ඇති කළ හැකි යැයි සිතන්නට පුළුවන්කමක් නැත. මක්නිසාද යත් අලුතෙන් පත්වන ආණ්ඩුව තුළත් එවැනි කාටල හැදෙන්නට පුළුවන.

ඒ අනුව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් යටතේ ද මහින්ද රාජපක්ෂ මහතා යටතේ මෙන් සාංගමික පාලනයක් ගොඩනැගෙන්නේ නැති බවට සහතික දෙන්නට පුළුවන් කමක් නැත. ඒ අය සිතන්නේ ද මේ ආකාරයටම ය. ලංකාවේ පමණක් නොව නොයෙක් රටවල විශේෂයෙන් ම ගෝලීයකරණය යටතේ මේ ආණ්ඩුකරණ ක්‍රියාවලියේ බරපතල වෙනසක් සිදුවී තිබේ. ඒ වෙනසේ ප්‍රධාන ලක්ෂණයක් තමයි රාජ්‍ය ප්‍රතිපත්ති තීන්දු කිරීම ඉතා කුඩාම කණ්ඩායමක් අත ඒකරාශි විම. ඒක ලංකාවේ 1990 ගනන් වලත් දක්නට ලැබුණි. මහින්ද රාජපක්ෂ පාලනය යටතේ මෙය වඩාත් තදින් සිදුවිය. ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව තීන්දු ගන්නේ කවුද? එම තීන්දු ගන්නේ කැබිනට් ඇමතිවරුවත්, පාර්ලිමේන්තුවත් නොවේ. ජනාධිපති, මුදල් ඇමති, භාණ්ඩාගාර ලේකම්. භාණ්ඩාගාර උපදේශකයින්, ලෝක බැංකුවේ සහ



**අප රටේ පැවති විධායක ජනාධිපති ක්‍රමය කිසියම් ප්‍රමාණයකට බලපා තිබේ. ව්‍යවස්ථාදායකය සහ කැබිනට් මණ්ඩලය හුදෙක් රබර් සීල් එකක් බවට එමගින් පත්කෙරිණ. කැබිනට් ඇමතිවරු හැසිරුණේ ගෘහ සේවකයන් ලෙසටය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා එය වෙනස්කර තිබේ.**


හිටපු ජනාධිපතිවරු ප්‍රේමදාස, ජේ.ආර්., මහින්ද

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයින් යන කිහිප දෙනෙකි. වැඩිම වුවහොත් ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති තීරණය කරන මුළු සංඛ්‍යාව 10 දෙනෙකුට වැඩි නොවේ.

නමුත් නියමිත ආකාරයට මැතිවරණ පැවැත්වේ. දේශපාලන පක්ෂ තිබේ. පුවත්පත් වල අපි ප්‍රතිපත්ති පිළිබඳව විවාද ද කරන්නෙමු. පාර්ලිමේන්තුවක් ද ඇත. අමාත්‍ය මණ්ඩලය ද රැස්වේ. නමුත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම තිබෙන්නේ ප්‍රභූ කණ්ඩායමක් අත ය. මැතිවරණය තුළින් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මන්ත්‍රීවරු පත්කරන එම ක්‍රියාවලිය සිදු වී ඇති නමුත් රාජ්‍යයේ ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී වී නැති බව මෙයින් පැහැදිළි ය. පසුගිය කාලය පුරාවට ම එය සිදු වී තිබේ. රාජ්‍ය පරිපාලන ක්‍රියාවලිය ප්‍රජාතන්තවාදී කිරීමේ අලුත් ක්‍රියාමාර්ගයක් අවශ්‍ය වී තිබේ. ඒ ගැන ද පුරවැසියාට අවබෝධයක් තිබිය යුතු ය. මට පෙනෙන්නේ ජනවාරි 8 සිදු වූ පරිවර්තනය පිළිබඳ දේශපාලන විවාදය තුළ ඒවා සාකච්ඡාවට ගැනෙන්නේ නැත.

රනිල් වික්‍රමසිංහ මහතා යටතේ මහජනයාගේ ඡන්දයෙන් අලුත් සහාග ආණ්ඩුවක් බලයට පත්වුවත්, ඔහු යටතේ ද ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙන්නේ කෙසේ ද යන්න නිරීක්ෂණය කළ හැක. පසුගිය 6 මාසය තුළ ද සිදු වූයේ ඒ දේම ය. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පදනයේ දි ප්‍රධාන වන මේ අය මහජනයාට සෘජුව වග කියන්නේ නැත. පාර්ලිමේන්තුවේ සිටින ජනතා නියෝජිතයින්ට මේවා පිළිබඳව අවබෝධයක් ද නැත. පසුගිය වසර ගණනාව තුළ පාර්ලිමේන්තු හැන්සාඩ් ගෙන බැලිය හැක. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කියන්නට දෙයක් නැති බව ඒ වාර්තා කියවීමෙන් වටහාගත හැක. ඔවුන් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ වාද කරන්නේ නැත. අලුත් නීති කෙටුම්පතක් ඉදිරිපත් කළ විට මේ අය කථා කරන්නේ එයට කිසිම සම්බන්ධයක් නැති දේ ය. කැබිනට් සාකච්ඡාවට සහභාගි වන්නේ ඇමතිවරුන් දෙතුන් දෙනෙක් පමණි. 1980 ගනන් වල සිට කැබිනට් මණ්ඩලයේ ප්‍රමාණය ව්‍යාප්ත වීමත්, එහි කාර්ය ලඝුවීමත් එක සමානව සිදු වී තිබේ. ඇත්ත වශයෙන් කැබිනට් මණ්ඩලය සහ පාර්ලිමේන්තුව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, තමන් සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගකීම ලෙස සළකා නැවත අතට ගතයුතු ය. ඊකට ව්‍යවස්ථා සංශෝධන නැවත අවශ්‍ය නැත. ඒ කාරණය ගැන අපේ රටේ ප්‍රමාණවත් සාකච්ඡාවක් සිදුවන්නේ ද නැත.

මේ කණගාටු තත්ත්වය ඇතිවීම කෙරෙහි අප රටේ පැවති විධායක ජනාධිපති ක්‍රමය කිසියම් ප්‍රමාණයකට බලපා තිබේ. ව්‍යවස්ථාදායකය සහ කැබිනට් මණ්ඩලය හුදෙක් රබර් සීල් එකක් බවට එමගින් පත්කෙරින. කැබිනට් ඇමතිවරු හැසිරුනේ ගෘහ සේවකයන් ලෙසටය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා එය වෙනස්කර තිබේ. නමුත් මහින්ද රාජපක්ෂ හා ජේ ආර් ජයවර්ධන යන ජනාධිපතිවරුන් යටතේ කැබිනට් ඇමතිවරු හැසිරුණේ ජනාධිපතිගේ ගෘහ සේවකයින් හැසිරෙන ආකාරයට ය. කෙසේ නමුත් මේ වනවිට ජනතාවට මේ ගැන අවබෝධයක් ලැබී තිබේ. සිදු වී තිබෙන්නේ ලංකාවේ දේශපාලන කථිකාව ඉදිරියට ගෙනයන බලවේගය මේ ප්‍රශ්නය මතු නොකිරීම ය. ඒ අයට ද මේ නිර්ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලිය අවශ්‍ය තරම් අවබෝධකරගත් බවක් පෙනෙන්නට ද නැත. සමාජයේ දේශපාලන කථිකාව ගැඹුරු කිරීමට මේ කාරණය ද ඇතුළත් කළ හැක. පුරවැසියාගේ ප්‍රජාතන්ත්‍රිය කාර්යභාරය මැතිවරණයෙන් පසු අවසන් වන්නේ හෝ අදාල නොවන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සමූහාණ්ඩුවාදය පිළිබඳ න්‍යාය කියන මූල ධර්මය මෙතෙන්ට අදාලය. ●




අග්‍රාමාත්‍ය
**රනිල් වික්‍රමසිංහ**

# පංචවිධ ක්‍රියාවලිය

**2015.07.23 වන දින විහාර මහාදේවි උද්‍යානයේ එළිමහන් රංග පීඨය අසල පැවති එක්සත් ජාතික පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළිදැක්වීමේ අවස්ථාවේ දී එක්සත් ජාතික**

**පක්ෂ නායක හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා කළ කතාව**

ජනවාරි අටවෙනිදා බිහි වූ විප්ලවය තහවුරු කොට මාස හැටකින් අලුත් රටක් බිහි කිරීමේ පංච විධ ක්‍රියාවලිය අද අපි ජනගත කරනවා. අප ඉදිරිපත් කරන්නේ සාම්ප්‍රදායික මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් නොව රට ගොඩනගන සැලැස්මක් කිව්වොත් නිවැරදියි. එම සැලැස්ම ක්‍රියාත්මක කොට රට දියුණු කරන්න තමයි අපි ජනතාවගෙන් වරමක් ඉල්ලන්නේ.

අපි ඉදිරිපත්ව සිටින්නේ අලුත් දේශපාලන සංස්කෘතියක් රට තුළ ඇති කරන්නයි. ජනතාවට ප්‍රයෝජනවත් වන, ජනතාවට වාසියක් වන, දේශපාලනයක් උදෙසා තමයි යහපාලනය උදෙසා එක්සත් ජාතික පෙරමුණ බිහිවුණේ. ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන මෙම පංච විධ ක්‍රියාවලිය කුමක් දැයි සොයා බලන්න ජනතාවට අයිතියක් තිබෙනවා. එම පංචවිධ ක්‍රියාවලිය කුමක්ද කියා නිශ්චය කොට තමන්ගේ ඡන්දය භාවිතා කිරීමේ අවස්ථාව අපි ජනතාවට ලබා දී තිබෙනවා.



**පංචවිධ සැලැස්ම ක්‍රියාත්මක කරද්දි විකල්ප අදහස් තිබේ නම් ඒවාත් සොයා බලන්න අපි සූදානම්. විවේචන තිබේ නම් ඒවාටත් ඇහුම්කන් දෙන්න අපි සූදානම්. පංචවිධ සැලසුම ක්‍රියාත්මක කිරීමේ වගකීම අපි පාර්ලිමේන්තුවට භාරදෙනවා. එහි මූල්‍ය පාලනයත් පාර්ලිමේන්තුවට භාරදෙනවා. ඒ අනුව මුළු පාර්ලිමේන්තුවම එකතු කරගත් සම්මුතිවාදී පාලනයක් ක්‍රියාත්මක කරන්නයි අපි අපේක්ෂා කරන්නේ.**

ජනවාරි 08 දා අපි ආරම්භ කළ විප්ලවය වෙනසක් කරා ඉදිරියට ගෙන යන්නට ලැබෙන ජනතා වරම තුළ නව පාර්ලිමේන්තුවක් බිහිවුණාම ආණ්ඩුවේ ඇමතිවරු පමණක් නොව මුළු පාර්ලිමේන්තුවටම අපි දැනුම් දෙන්නේ පක්ෂ කෙසේ වෙතත් පංචවිධ සැලසුම ක්‍රියාත්මක කරන්න සහයෝගය දෙන ලෙසයි.

පංචවිධ සැලැස්ම ක්‍රියාත්මක කරද්දි විකල්ප අදහස් තිබේ නම් ඒවාත් සොයා බලන්න අපි සූදානම්. විවේචන තිබේ නම් ඒවාටත් ඇහුම්කන් දෙන්න අපි සූදානම්. පංචවිධ සැලසුම ක්‍රියාත්මක කිරීමේ වගකීම අපි පාර්ලිමේන්තුවට භාරදෙනවා. එහි මූල්‍ය පාලනයත් පාර්ලිමේන්තුවට භාරදෙනවා. ඒ අනුව මුළු පාර්ලිමේන්තුවම එකතු කරගත් සම්මුතිවාදී පාලනයක් ක්‍රියාත්මක කරන්නයි අපි අපේක්ෂා කරන්නේ.

එසේ නම් මේ පාලනය බ්‍රිතාන්‍ය වෙස්මිනිස්ටර් පාලනයටත් වඩා ඉදිරියට ගිය පාලනයක්. මෙය ශ්‍රී ලංකාව තුළ ලිච්චවි පාලනයක් ඇති කරන්න ගන්න උත්සාහයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ලිච්ඡවි පාලනය තුළ ලංකාව දියුණු කිරීමේ වැඩසටහනක් තමයි මේ පංචවිධ සැලැස්ම තුළ අපි ඇතුළත් කර තිබෙන්නේ.

පංචවිධ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම අපි දේශපාලන පක්ෂවලට හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පමණක් සීමා කරන්නේ නැහැ. ඒ සඳහා සිවිල් සමාජය, උගත් බුද්ධිමත් කණ්ඩායම්වලින් අදහස් ලබාගන්නවා. එවැනි පිරිසකගෙන් සමන්විත උපදේශක කාරක සභාවක් ආරම්භ කිරීමටත් අපි කටයුතු කරනවා. එයට සාපේක්ෂව ගම්මට්ටමින් ඇති කැන පොකුරු ගම්මාන සංකල්පය යටතේ තීන්දු තීරණ ගැනීමේ වගකීම දේශපාලනයඥයන්ගෙන් ඉවත් කොට ගමේ සිටින පිළිගත් සිවිල් සංවිධාන නියෝජිතයන්ට භාර දෙනවා. දේශපාලඥයින් නැති මේ කමිටුව ගමේ ප්‍රශ්න සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේ කණ්ඩායම බවට පත් කරනවා. පක්ෂ දේශපාලනයට පමණක් මෙම ක්‍රියාදාමය සීමා නොකොට ගමේ හෙංචයියා කියන වචනය ඉවත් කර ගමේ ජනතාව සහභාගී කරවාගන්නා වැඩපිළිවෙලක් අපි පංචවිධ සැලැස්ම ලෙස ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා අපි ජනතාවගේ සහයෝගය ඉල්ලා සිටින්නේ මේ වැඩසටහන ක්‍රියාත්මක කොට මාස 60 නව විප්ලවය ස්ථාපිත කරන්නටයි.

## දින 100න් 60 මාසෙට

අපි එදා දින සියයයේ වැඩසටහන ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කලහම දින සියයෙන් ඒවා කරන්නේ කෙසේද යන්න අපිව අවඥාවට ලක් කළා. නමුත් දින සියයයේ වැඩපිළිවෙල යථාර්ථයක් කරමින් රටතුළ නව වෙනසක් ඇති කළා. දැන් අපි ජනවරමක් ඉදිරිපත් කරන්නේ මාස 60 ක නව විප්ලවය ක්‍රියාත්මක කිරීමටයි.

ජනවාරි 08 දා විප්ලවයට සහාය දැක්වූ සෑම දෙනාගේම සහභාගිත්වය අපට නව පංචවිධ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ලබාගන්නවා. එදා අපි සියලු දෙනාම අකතු වුනේ මහින්ද රාජපක්ෂ පාලනයෙන් රටත් ජනතාවත් බේරාගෙන නව මාවතකට රට යොමු කිරීමටයි. එදා ජනාධිපතිවරණයේදී එක ධජයක් යට අපේ සටන ඉදිරියට ගෙනියන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරියට ආවා. ඒ සටන කරවමින් රටේ ජනතාව එතුමාව ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගත්තා.

එතුමා යටතේ අපි රට තුළ යහපාලනයක් ඇති කළා. ජනාධිපතිවරයා ලෙස එතුමා විධායක බලතල සීමා කරන්නට එකගවුණා. එතුමා ජනාධිපතිවරණයට ප්‍රථමයෙන් පොරොන්දු වුනු එම වැඩ කොටස ඉටු කළා. එතුමාගේ ඉතිරි වැඩකටයුතු කරගෙන යන්න නව පාර්ලිමේන්තුවක් ඇති කිරීමටයි දැන් අවස්ථාව උදාවී තිබෙන්නේ. එතුමාගේ වැඩපිළිවෙල ඉදිරියට ගෙන යන පංචවිධ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සටනට අප සියලු දෙනාටම සහභාගී වෙන්න සිදු වෙනවා.

## යහපාලනය එක පෙරමුණක් ලෙස

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මැතිවරණ ව්‍යාපාරයේදී ස්වාධීනව සිටීමත් යහපාලනයේ කොටසක්. ඒ නිසා පංචවිධ



**අපේ අරමුණ අලුත් සමාජයක් ඇති කිරීමයි. මමත් වසර ගණනාවක් තිස්සේ ධනවාදය, සමාජවාදය යනාදී සියලු පාලන ක්‍රමයන් පිළිබඳව අත්දැකලා තියෙනවා. නමුත් අද අපිට ඉදිරියට යන්න නම් තරගකාරී වෙළෙඳ ආර්ථිකයක් අවශ්‍යයි. අනෙක් පැත්තෙන් ජනතාවගේ සමාජ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුයි. මේ සියල්ල තුළ අපට හරිත සමාජයක් ඇති කිරීමේ වගකීමක් තියෙනවා.**

සැලැස්ම ඉදිරියට ගෙන යාමේදී ඊට එරෙහිව ඇති ප්‍රතිවිප්ලවය පරාජය කරන්න මුළු රටම නියෝජනය කරන පිරිසක් එකතු වී එක පෙරමුණක් ලෙස එකට එක්වී සිටිනවා. මේ පෙරමුණ අපි හඳුන්නේ ඡන්දය ප්‍රකාශයට පත්කළාට පසුවයි. ඡන්දයක් ප්‍රකාශයට පත් කළාට පසුව නව දේශපාලන පක්ෂ ලියාපදිංචි කරන්න නීතියෙන් ඉඩක් ඇත්තේ නැහැ.

ඒ නිසා අපට මෙවර මැතිවරණයට තරග කරන්න සිදුවන්නේ එක්සත් ජාතික පක්ෂයේ අලියා ලකුණ යටතේයි. මේ පෙරමුණේ වැඩපිළිවෙල ඉදිරියට ගෙන යන යාන්ත්‍රණය ලෙස එක්සත් ජාතික පක්ෂය භාවිතා කරනවා. ඒ යාන්ත්‍රණය තුළ මැතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසුව අපි මේ ගමනට එකතු වූ පක්ෂ සියල්ල එකතු කොට ගෙන සම්මුතිවාදය තුළ රට ඉදිරියට ගෙනයන එක පෙරමුණක් හදනවා. එම පෙරමුණට සම්බන්ධ කර ගැනීම වෙනුවෙන් සිවිල් සංවිධාන ඇතුළු අනෙකුත් සංවිධාන එකතු කරගන්නවා.

අපේ අරමුණ අලුත් සමාජයක් ඇති කිරීමයි. මමත් වසර ගණනාවක් තිස්සේ ධනවාදය, සමාජවාදය යනාදී සියලු පාලන ක්‍රමයන් පිළිබඳව අත්දැකලා තියෙනවා. නමුත් අද අපිට ඉදිරියට යන්න නම් තරගකාරී වෙළෙඳ ආර්ථිකයක් අවශ්‍යයි. අනෙක් පැත්තෙන් ජනතාවගේ සමාජ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුයි. මේ සියල්ල තුළ අපට හරිත සමාජයක් ඇති කිරීමේ වගකීමක් තියෙනවා.

මේ සියල්ල ඉටු කිරීමට තමයි අපි පංචවිධ සැලැස්ම ඉදිරිපත් කරලා සමාජ අයිතිවාසිකම් සුරැකෙන සමාජ සාධාරණ වෙළෙඳ පොල ආර්ථිකයක් ඉදිරිපත් කරන්නේ. ඊට අවශ්‍ය සියලු කරුණු කාරණා මේ පංචවිධ සැලැස්ම තුළ තිබෙනවා. ඒ සැලැස්ම ඇතුළේ තරුණයන්ට හොඳ රැකියා ඇති වෙනවා. ආදායම් වැඩි වෙනවා. දූෂණය නැතිවෙනවා. ඇති වෙන මේ නිදහස යථාර්ථයක් කිරීමට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ජනතාව එකතු කරලා ශ්‍රී ලාංකිකයන් ලෙස ඉදිරියට ගෙන යා යුතුයි.

නව සැලැස්ම තුළ රට ඉදිරියට ගෙන යද්දී යටිතල පහසුකම් දියුනු කෙරෙනවා. ඒ වගේම අධ්‍යාපනය දියුණු කොට දැනුමෙන් තරුණ පරම්පරාව සන්නද්ධ කළයුතුයි. මෙයින් ඇති කරන්නේ දුප්පත්කම නැති කරලා ජනතාවට ආදායමක් ලබාදීලා සංවර්ධිත රටක් බිහි වීමයි. මෙයයි අපි ආරම්භ කරන විප්ලවය. එයයි රටේ දියුණුව වෙනුවෙන් ඉදිරියට ගෙන යන්න ඕනේ.

මේ විප්ලවය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමග පාර්ලිමේන්තුවත් එකතු කරගනිමින්, පළාත් සභා, ප්‍රාදේශීය සභා එකතු කරගනිමින් තවත් සංවිධාන එකතු කරගනිමින් උපදේශක කාරක සභා එකතු කරගනිමින් මුළු රටම එකතු කරගත් විප්ලවයක් ඇති කරලා තියෙනවා. මේ වෙනස රාජපක්ෂ රෙජිමය ප්‍රමුඛ පවුල් පාලනයට වඩා ප්‍රමුඛ විප්ලවයක්.

අන්න ඒ විප්ලවය ඇති කිරීමට රටේ අනාගතය ගැන සිතා සියලු දෙනා එකතු වී අසාර්ථක වූ පැරණි මාවත අතහැර නව මාවතකට පිවිසෙමු. ඒ මාර්ගයේ යාමට ලබන 17 දාට ඡන්ද පොලට ගොස් එක්සත් ජාතික පක්ෂයට කතිරය ගසන්නැයි ජනතාවගෙන් මා ඉල්ලා සිටිනවා. මැතිවරණයෙන් අපට බහුතරයක් දෙන්න... බහුතරයක් මේ වැඩසටහන අනුමත කළ පසු වාද විවාදයෙන් තොරව රට දියුණු කිරීමේ වැඩසටහනට සියලු දෙනාම එකතු කරගෙන මේ ගමන යා හැකියි.

මේ නිසා ජනවාරි 08 දා ඇති කළ විප්ලවය හා එයින් ඇති වූ දින සියයේ වැඩසටහන ක්‍රියාත්මක කළා සේ පංචවිධ සැලැස්මත් යථාර්ථයක් කර ගැනීමට අප සියලු දෙනාම එක් වෙමු.

මට අවශ්‍ය වන්නේ රජ මාලිගාවක් හදන්න නොව, රටේ සෑම පුරවැසියෙකුගේම නිවස, සෑම පුරවැසියෙකුගෙ ම ගෙවත්ත, සෑම ගොවියෙකුගේම කුඹුර රජමාලිගාවක් රාජධානියක් කිරීමටයි. මගේ අනාගතය තහවුරු කිරීම වෙනුවට රටේ සෑම පුරවැසියෙකුගේම අනාගතය තහවුරු කිරීම මගේ අපේක්ෂාවයි. රජ පවුලක් ඇති වෙනවා වෙනුවට හැම පවුලක්ම රජ කරන්නටයි මට ඕනේ. මේ වැඩසටහන තහවුරු කරන්න එක්සත් ජාතික පක්ෂයේ අලියා ලකුණ ඉදිරියේ කතිරය ගසා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ සමගි ආණ්ඩුවක් ඇති කරන්නැයි මා ඔබෙන් ඉල්ලා සිටිනවා. ●






හිටපු ජනාධිපති
**මහින්ද රාජපක්ෂ**

# අනාගතයට සහතිකයක්

**2015.07.29 වන දින හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනයේ පැවති**

**එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළිදැක්වීමේ අවස්ථාවේ දී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කළ කතාව**

අපි අපේ මාතෘ භූමියේ අනාගතය සඳහා ඉතාම වැදගත් වෙන ලියවිල්ලක් ඉදිරිපත් කරන මොහොතයි මේ. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරන මොහොතේ මට මතක් වෙනවා මේ රටට නිදහස ගෙනෙන්න හේතු වුණ මහින්ද චින්තනය එදා 2005 දී ජනතාව අතට පත් කළ මොහොත. ලංකාව දෙකඩ වෙන්න ආසන්න යුගයක බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ තමයි අපි එදා මහින්ද චින්තනය ඉදිරිපත් කළේ.

අද වාගේ නොවෙයි එදා ඒ උත්සවයට හැමෝම ආවේ ලොකු මරණ බයක් තුරුල් කරගෙන. කොළඹ තිබුණ ආරක්ෂක බංකර්, මුර කපොලු, මැද්දෙන් තමයි හැමෝම බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට ආවේ. එදා වව්නියාවෙන් එහාට අපිට ඡන්දේ කරන්න යන්න බැරි වුණා.



**අපි අතීතයෙන් ඉගෙන ගන්නවා. ඉවසන්න ඕනෑ තැන ඉවසනවා. රට වෙනුවෙන් යුද්ධ කරන්න ඕනෑ තැන යුද්ධ කරනවා. ඒ වාගේම අළුත් වෙන්න ඕනෑ නම් අළුතින් හිතනවා. ඒ නිසා ගෙවුණ හය මාසය තුළ අපි අළුතින් හිතුවා. භික්ෂූන් වහන්සේ ඇතුලු පූජක උතුමන්, රටට ආදරය කරන බුද්ධිමතුන් උසස් රාජ්‍ය නිළධාරීන් සන්ධානයේ නායකයින් වාගේම වැඩ කරන ජනතාවගේ තරුණයින්ගේ පොදු ජනතාවගේ අදහස් විමසලා තමයි මේ ලියවිල්ල රට වෙනුවෙන් ගොඩ නගලා තියෙන්නේ.**

අද උතුරේ ගොවියෝ ළුණු වවන ගාණට ඒ පළාතේ බිම් බෝම්බ වළලලා තිබුණා.

## එදා සහ අද සැබෑ වෙනස

දැන් ජනතාව ඉතාම නිදහසේ හැන්දෑවට කොළඹ පාරවල් වල ඇවිදිනවා. නමුත් එදා කොළඹ ඇවිද්දේ කුණු ගොඩවල් මැද්දෙන් නහය වහගෙන. අනුරාධපුර, පෙළොන්නරුව, අම්පාර, මඩකලපුව, මොණරාගල, කුරුණෑගල, හම්බන්තොට හැම කන්නයක් අවසානයේ ම වී විකුණා ගන්න බැරිව ගොවියෝ වහ බිව්ව ප්‍රවෘත්ති පත්තරවල ගියා. අද ඡන්දේ කරන්න මේ රටේ කෙළවරටම පැය ගණනකදී යන්න පුළුවන්. අද එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයෙකුට උදේ හම්බන්තොට ගිහින් රැස්වීම් කරලා එදාම රෑ හතට දේශපාලන සාකච්ඡාවට කොළඹ එන්න පුළුවන්. ඒක ඉවර කරලා ආපහු රෑ 9.00 ට කුරුණෑගල රැස්වීමට යන්න පුළුවන්. නමුත් 2005 ඡන්දෙදි හම්බන්තොට ගියොත් ආපහු ආවේ පහුවෙනිදාට.

හාමුදුරුවනේ ! ඔබ වහන්සේලා නිතර කියනවා සිංහලයාට බොහොම දේවල් ඉක්මනින් අමතක වෙනවා. ඒනිසා එදා රට තිබුණ හැටි මතක් කරලා දෙන්න කියලා. නමුත් මම ඉතාම සතුටු වෙනවා වසර හතරක් තුළ හිතාගන්නත් බැරි තරමට මේ රට වෙනස් කරන්න පුළුවන් වීම ගැන.

දැන් යූ.එන්.පී. ය අහනවා මහින්ද රාජපක්ෂ ඇයි ආයෙත් එන්නේ කියලා. උතුරේ හමුදා කඳවුරු ඉවත් කරන කොට උතුරේ හොර මැරකම් ඉහළ ගිහින් මංකොල්ල කෑම් වැඩි වෙලා උතුරට යන්න ජනතාව තුළ බියක් ඇති වෙනකොට ජනතාව ආයෙත් මාව හොයාගෙන ආවා. අපි ජනවාරි අට වෙනකොට මේ රටේ සංවර්ධන ව්‍යාපෘති 58,000ක් කරගෙන ගියා. ඒ සංවර්ධන ව්‍යාපෘතිවලින් ප්‍රයෝජන ගත්තේ කොළඹ අයිස් කාමර වල ඉන්න අය නොවෙයි ගමේ ඉන්න වරප්‍රසාද අහිමි තරුණයින්ටයි ගමේ ජනතාවටයි ඒ අවස්ථාව ලැබුණේ.

ඒ අවස්ථාව ගමේ තරුණයාට නැති කළ නිසායි ජනතාව මාව හොයාගෙන ආවේ. අපි අවුරුදු අටක් තිස්සේ මේ රටේ ගොවියාට පොහොර සහනාධාර දීලා වී මිළට ගත්තා. ලෝක වෙළඳපොළේ රබර් මිළ රුපියල් 210 බැස්සත් අපි රුපියල් 300යට රබර් ගත්තා. නමුත් අද ගොවියාගෙ වී ටික මිලට ගත්තේ නෑ. රබර් ෂීට් ගඟට දානවා. සුළු තේ වගා කරුවෝ 400,000ක් අතරමං. ජාවාරම් කාරයින් ගෙන් පවරා ගෙන ගොඩ ගත්ත ආයතන ස.තො.ස. පවා ආයෙත් කඩා වට්ටල ඉවරයි.

රජයේ සේවකයෝ වැඩියි ඉදිරි මාසවල පඩි ගෙවා ගන්නත් බැරි වෙන බව දැනටමත් මේ ආණ්ඩුව හදපු අය කියනවා.

## දින 100න් රට ආපස්සට හැරවීම

යූ.එන්.පී.ය රට වසර විසිපහක් ආපස්සට හැරෙව්වේ නැතිනම් මහින්ද රාජපක්ෂට ආයෙත් එන්න ඕනේ වෙන්නේ නෑ.

මට ආයෙත් මේ රටේ ජනතාව එන්න කියන්නෙ මේ ගොඩ නැගීගෙන යන භයානක තත්ත්වයෙන් රට ගොඩ ගන්න.

අපි අතීතයෙන් ඉගෙන ගන්නවා. ඉවසන්න ඕනෑ තැන ඉවසනවා. රට වෙනුවෙන් යුද්ධ කරන්න ඕනෑ තැන යුද්ධ කරනවා. ඒ වාගේම අළුත් වෙන්න ඕනෑ නම් අළුතින් හිතනවා. ඒ නිසා ගෙවුණ හය මාසය තුළ අපි අළුතින් හිතුවා. භික්ෂූන් වහන්සේ ඇතුලු පූජක උතුමන්, රටට ආදරය කරන බුද්ධිමතුන් උසස් රාජ්‍ය නිළධාරීන් සන්ධානයේ නායකයින් වාගේම වැඩ කරන ජනතාවගේ තරුණයින්ගේ පොදු ජනතාවගේ අදහස් විමසලා තමයි මේ ලියවිල්ල රට වෙනුවෙන් ගොඩ නගලා තියෙන්නේ.



**අපි නවීන දේශයක් අභීත රටක් සහද සමාජයක් ගොඩනගනවා. අපිත් එක්ක තියෙන වෛරය නිසාම නතර කළ සංවර්ධන ව්‍යාපෘති 58,000 ආයෙත් පටන් ගන්නවා. කොළඹ නගරය ආයෙත් පිරිසිදු කරනවා. රටේ අනෙක් නගරත් ඒ වාගේම ගොඩනගලා සුන්දර කරලා ලස්සන කරන කාර්ය පටන් ගන්නවා.**

නෙළුම් පොකුණ රඟහල

අපි නවීන දේශයක් අභීත රටක් සහද සමාජයක් ගොඩනගනවා. අපිත් එක්ක තියෙන වෛරය නිසාම නතර කළ සංවර්ධන ව්‍යාපෘති 58,000 ආයෙත් පටන් ගන්නවා. කොළඹ නගරය ආයෙත් පිරිසිදු කරනවා. රටේ අනෙක් නගරත් ඒ වාගේම ගොඩනගලා සුන්දර කරලා ලස්සන කරන කාර්ය පටන් ගන්නවා.

අපි එදා උපාධිධාරීන්ට රජයේ රැකියා දුන්නා. මගනැගුම ගම නැගුමේ දහස් ගණන් රැකියා දුන්නා. අද ලක්ෂ ගණනකට රස්සා නෑ. ඒ සියලු දෙනාට අපි යළිත් අපි රැකියා දෙනවා.

මටත් මතක් කරන්න වෙනවා, එදා රනිල් වික්‍රමසිංහ තරුණ කටයුතු ඇමති කාලේ මේ රටේ තරුණයන්ට වුණාදේ. නන්දා මාලිනිය ගේ ගීතයක මෙහෙම තියනවා.

යදමින් බැද විංලගු ලා - මගේ පුතා රැගෙන යන්න.

ඉදිකටු ඇණ ඇඟිලි තලා දෙතිස් වධය පමුණුවන්න

අලුත් ලොවක් ගැන සිතීම

දඬුවම් දෙන වරද නම්

කුමට එරට අධිකරණය

නීතිය සහ විනිසුරන්

එදා අළුත් ලොවක් ගැන හිතපු තරුණයින්ට සැලකුවෙ එහෙමයි. ඔය සිංදුව ලියපු මහාචාර්ය සුනිල්ටත් රටින් පැනලා යන්න වුණා. යූ.එන්.පී.යෙන් එදා මරපු හැටදාහ හිටියා නම් ඒ බොහොම දෙනෙක් අනුර කුමාරගෙ වයසෙ බව ඒ මැරුම් කෑව තරුණයින්ගේ අම්මලට මම මතක් කරන්න ඕනෑ. අද රනිල් එක්ක එකතුවෙලා ඉන්න ජනතා විමුක්ති පෙරමුණ ඒ අම්මලාව බලාගන්න බවට සහතිකයක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දීලා නෑ. නමුත් අපි ඒ අම්මලාත් පවුල්වල අයත් ජීවත් කරවන්න පොරොන්දු වෙනවා.

ගමේ රටේ තරුණයො ආයුධ අතට ගන්න පෙළඹෙන සමාජ කාරණා අපි අහෝසි කළා. නමුත් මේ ආණ්ඩුව ශිෂ්‍යයින්ගේ මහපොළ ප්‍රමාද කලා. පෙළපාලි ගිය තරුණයින්ට දින සියයක් යන්නත් කලින් රනිල්ගෙ ආණ්ඩුවෙන් ගැහුවා. අද එහෙම නම් හෙට මොනවා කරයි ද ? මහා බැංකුවට අත තියපු රනිල් මේ රටේ නිදහස් අධ්‍යාපනයට අත නොතබයි කියලා දෙන සහතිකේ මොකක්ද ? මේ රටේ අධ්‍යාපනයට දාපු අධ්‍යාපන ඇමති ගෙන් පෙනෙනවා යූ.එන්.පීයෙ අධ්‍යාපන හා තරුණ ප්‍රතිපත්තිය.

### රටට පණ දෙමු - අලුතෙන් පටන් ගමු

අපි නිදහස් අධ්‍යාපනය දිවි හිමියෙන් රකිනවා. ඒ විතරක් නොවෙයි. වයස අවුරුදු 18ට වැඩි හැම තරුණයෙක්ම තරුණියකටම ඉහළට ඉගෙන ගන්න රුපියල් 50,000ක් ලබා දෙනවා. විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන හැම තරුණයෙකුටම පොත්පත් ගන්න රුපියල් 10,000ක් දීලා මහපොළ රුපියල් 6,000 දක්වා වැඩි කරනවා. උසස් පෙළ සමත් වුණත් විශ්වවිද්‍යාලයට යන්න බැරි වෙන අයගෙ වගකීම රජයක් ගන්න ඕනෑ. ඒ අයට විශ්වවිද්‍යාලයෙන් පිටත ඉගෙන ගන්න අවශ්‍ය ආධාර වැඩ පිළිවෙළක් ඇති කරනවා. අපි මේවා කරන්නේ මේ රටේ මානව සම්පත් දියුණු කරන්න.

අපි පරිගණක සාක්ෂරතාවය සියයට 3 ඉදන් 45 දක්වා ඉහළ නංවුවා. ඒ පරිගණක ශිල්පයෙන්ම තමයි අපිවත් පරාද කරන්න වැඩ කළේ. බොරු ප්‍රචාර ගෙන ගියේ. එහෙම වුණොත් අපි මේ රටේ හැම නිවසකම බ්‍රෝඩ් බෑන්ඩ් පහසුකම් දීලා තරුණ පරපුරට ඔන් ලයින් වෙළෙඳපල හඳුන්වා දෙනවා. අපි ආරම්භ කරන්නේ රට නවීකරණයට තරුණයො එක්ක යන ගමනක්.



**අපි රජයේ සේවකයාගේ අවම වැටුප රුපියල් 25,000ක් කරනවා. ඒකට ජීවන වියදම් දීමනාව ඇතුළු දීමනා එකතු වුණාම ඒ වැටුප විශාල වෙනවා. ඒ වැටුප තනතුර ඉහල යන කොට 1 : 4.25 අනුපාතයට වැඩි වෙනවා. අපේ මේ වැඩ පිළිවෙල නිසා ඉතිහාසයේ පළමු වතාවට රජයේ සේවකයා ලක්ෂපතියෙක් වෙනවා.**

අපි අවුරුදු හතර තුළ රටටම පාර විදුලිය දීලා රටේ යටිතල පහසුකම් හැදුවා. දැන් ඒවායින් ප්‍රයෝජන අරගෙන පොදු ජනතා ජීවිතය සුවපත් කරන යුගය උදා කරනවා. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය කියලා කහයි කොත්තමල්ලිය අඩු කරන අයවැය නොවෙයි ඕනෑ. අපි හදන්නේ සහල් වල ඉඳන් කුකුළු මස් දක්වා ළඳරු කිරිපිටි වල මිළත් සාධාරණ මට්ටමකට පවත්වාගෙන යන රටක්. සෑම පවුලකටම නිවසක් ලබා දෙන්න ඕනෑ. මධ්‍යම පන්තියේ අයට ගෙයක් තනාගන්න එක තව දුරටත් සිහිනයක් වූ යුගය අවසන් කරනවා. ලෝක ආහාර අර්බුදය ආවත් එක වේලක් බඩගින්නේ තියපු නැති අපට මේවා කරන්න පුළුවන්.

රාජ්‍ය සේවකයාගේ වාගේම රණවිරුවාට පොලිසියට අපි යුතුකම් ඉටු කරනවා. එදා බයිසිකලයට ගෙවපු 50,000 ගාස්තුව ආපසු දෙනවා කියලා පොරොන්දු වුණා. ඒ පොරොන්දුවට මොකද වුණේ. අපි කවදාවත් රජයේ සේවකයාට ඒ රැවටීම කරන්නේ නෑ.

අපි රජයේ සේවකයාගේ අවම වැටුප රුපියල් 25,000ක් කරනවා. ඒකට ජීවන වියදම් දීමනාව ඇතුළු දීමනා එකතු වුණාම ඒ වැටුප විශාල වෙනවා. ඒ වැටුප තනතුර ඉහල යන කොට 1 : 4.25 අනුපාතයට වැඩි වෙනවා. අපේ මේ වැඩ පිළිවෙල නිසා ඉතිහාසයේ පළමු වතාවට රජයේ සේවකයා ලක්ෂපතියෙක් වෙනවා.

ඒ වගේම පෞද්ගලික අංශයේ සේවකයින්ට රු.3,000 ක වැටුප් වැඩිවීමක් කරන්න අපි වගබලා ගන්නවා. අද මේ රටේ ව්‍යාපාරික ප්‍රජාව අසරණයි. කොටස් වෙළඳපොළ කඩා වැටිලා. අපි ව්‍යාපාරිකයින්ට, ආයෝජකයින්ට අවශ්‍ය දිරි දීම් දීලා ඒ අයව නංවනවා.

පොලීසියට, සන්නද්ධ සේවා වලටත් වැටුප් සංශෝධන කමිටු පිහිටවලා මාස තුනක දී වැටුප් වැඩි කරනවා. මේ රටේ සමෘද්ධිලාභීන්ගේ ජීවන තත්වය උසස් කරන්න ඕනෑ. ඒ පවුල් වලට ගෑස් ලිපක්, සිලින්ඩරයක් පමණක් නොවෙයි රුපියල් 350 ක් ගෑස් වියදම හැටියට අපි ලබා දෙනවා. අපි කවුරුත් එක සමාන ජීවිතයක් ගතකරන්න ඕනෑ.

ත්‍රී රෝද රථ හිමිකාරයාගේ ඉඳන් පෙර පාසලේ ඉඳන් සුළු කර්මාන්තකරුවා දකවා ප්‍රතිලාභ ලැබෙන ලියවිල්ලක් මේ. පිරිවෙන් වලට වගේම දහම් අධ්‍යාපනයට පසුගිය අයවැයේ දුන් සහන ඉක්මනින් ක්‍රියාවට නගන්න ඕනෑ. තේ රුපියල් 90ට අරන් වී 50ට අරන් රබර් මිළ ඉහළ දාලා ආයෙත් මේ රටට පණ දෙන්න ඕනෑ.

අපේ සන්ධානයේ පිල් දෙකක් නෑ. එක පිලයි. ඒ පිළ එක්සත් ජාතික පක්ෂ විරෝධී පිලට. එක පිලයි එක රටයි. නමුත් යූ.එන්.පී.ය පිල් ගොඩක්. ඒ අය කියනවා ජ.වි.පෙ ත්, ටී.එන්.ඒ එකත් එකතු කරගෙන ආණ්ඩුව හදනවාලු. අපි අහනවා එතකොට ටී.එන්.ඒ. ප්‍රතිපත්ති ප්‍රකාශයට මොකද වෙන්නේ. ඒ ස්වයං පාලනයත් දීලා උතුරු නැගෙනහිර ඒකාබද්ධ කරලා ජිනීවා යුධ අධිකරණයට අපිව ගෙනියන්න පොරොන්දු වෙලාද ඔය ජාතික ආණ්ඩුව හදන්නේ. එදා මේ ගොල්ලො හැදුවේ කැඳ හැලියක්. දැන් හදන්නේ මජර පෙරමුණක්. මුස්ලිම් ජනතාවට සපුරා විරුද්ධ වුණ හෙළ උරුමයත් එතන. 89 ප්‍රා කහ බලල්ලුත්, කළු බලල්ලුත් එතන. ජනතා විමුක්ති පෙරමුණෙත් එතනට එනවාලු. මහින්ද රාජපක්ෂ ඡන්දෙට එන එක වළක්වන්න ප්‍රජා අයිතිය අහෝසි කරවන්න ඉදිරියට දාන්න හදන්නේ ජ.වි.පෙ. මගේ ආරක්ෂාව අඩු කරන්න ඉදිරියට දාන්නෙ ජ.වි.පෙ. 89 දීත් ජ.වි.පෙ. අයව පාවා දෙන්න යූ.එන්.පී.ය යොදා ගත්තේ ජ.වි.පෙ. ගෝනිබිල්ලො. අද රනිල්ට පුළුවන් වෙලා තියෙනවා ජ.වි.පෙ. නායකයාව ගෝනිබිල්ලා කරගෙන රට පාවා දෙන්න.



**අපි අපේ සාර්ථකත්වය පෙන්වපු රජයක්. සාර්ථකත්වය පෙන්වන්න පුළුවන් සන්ධානයක්. ඒක ඉතිහාසයෙන් ඔප්පු කරලා තියෙනව. මතක තියා ගන්න 1948 ඉදන් ආණ්ඩු ගණනාවක් රට කරළත් ජාතික ආදායම තිබුණේ ඩොලර් බිලියන 25යි. අපි වසර අට තුළ ඩොලර් බිලියන 75කින් තුන් ගුණයකින් ජාතික ආදායම ඉහළ දැම්මා.**

මේ රටේ සිංහල වාගේම දෙමළ ජනතාවත් මුස්ලිම් ජනතාවත් මරණ බයෙන් මුදා ගත්තේ අපි. 80 ඉදන් කඩා වැටුණු මුස්ලිම් පල්ලි කතෝලික පල්ලි දේවස්ථාන ඉදිකළේ අපි. නමුත් වසර හතරක් ඇතුළත දෙමළ ජනතාව තුළත් මුස්ලිම් ජනතාව තුළත් භීතියක් වැපිරෙව්වා. අද ඒ ජාතිකයන්ට වැටහෙන්න ඕනෑ මේ රටේ කුමන්ත්‍රණයක් තිබුණ බව. මේ ජාතිවාදීන් මර්ධනය කරන්න හදනකොට එදා කැබිනට්ටුවේ මුස්ලිම් ජාතියට එරෙහිව කතා කළ අය අද යූ.එන්.පීයේ. මතක තියා ගන්න යූ.එන්.පී. ය මුස්ලිම් ජනතාවට කළ සේවයක් නෑ. පලස්තීනයට සහාය දෙන්න පාර්ලිමේන්තුවේ මම යෝජනා කරනකොට ඒකත් වැළැක්කුවේ රනිල්. එහෙම පක්ෂයකින් මුස්ලිම් ජාතියට වෙන සේවය මොකක්ද ? එදා මුස්ලිම් ජනතාවට බිය ඇති කරන කුමන්ත්‍රණය කළ අය ඉන්නෙ යූ. එන්. පී. යේ. ඒ නිසා මතක තිය ගන්න මේ රටේ කිසිම ජන කොටසකට ජාතියකට වෙනස්කමක් වෙන්න බියක් ඇති කරන්න මම ඉඩ තියන්නේ නෑ. අපිට ඕනෑ සුහදශීලි සමාජයක්.

මතුගම නගරයේ මහජන නියෝජිතයෙක් දණ ගස්සලා පටන් ගත්ත නීතියේ ආධිපත්‍ය අතට ගැනීමේ ගමන යූ.එන්.පී.ය දිගටම යනවා. විදේශ මුදල් වංචා කළ හොරු නිදහස් කරන කොට නීති ක්ෂේත්‍රයම කැළඹුණා. මේ විදියට නීතිය අතට ගැනීමේ යුගය හමාර කරන්න ඕනෑ. නීතියේ ආධිපත්‍ය අධිකරණයේ ස්වාධිපත්‍ය රකින්න අවශ්‍ය ප්‍රතිසංස්කරණ අපි හදුන්වා දෙනවා.

අපි යහපත් විදේශ සම්බන්ධතා නැවතත් ගොඩ නගනවා. ඒ වගේම පාර්ලිමේන්තුව, ව්‍යවස්ථා දායක සභාවක් බවට පත් කරලා මාස හයක් ඇතුලත මේ සියවසට ගැලපෙන නව ව්‍යවස්ථාවක් හදනවා. මේ රජය පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැතුව මග ඇරපු නව මැතිවරණ ක්‍රමය අපි මේ රටට ගෙනෙනවා. ඒ වගේම ගමේ ජනතාව මේ රටේ පරිපාලනයට සම්බන්ධ කරගන්න ගම්සභා නැවත ඇති කරනවා. මේ වෙන කොට යූ.එන්.පී.ය ඔප්පු කරලා තියෙනවා මේ එකක්වත් තමන්ට කරන්න බැරි බව.

අපි අපේ සාර්ථකත්වය පෙන්වපු රජයක්. සාර්ථකත්වය පෙන්වන්න පුළුවන් සන්ධානයක්. ඒක ඉතිහාසයෙන් ඔප්පු කරලා තියෙනව. මතක තියා ගන්න 1948 ඉදන් ආණ්ඩු ගණනාවක් රට කරළත් ජාතික ආදායම තිබුණේ ඩොලර් බිලියන 25යි. අපි වසර අට තුළ ඩොලර් බිලියන 75කින් තුන් ගුණයකින් ජාතික ආදායම ඉහළ දැම්මා.

ලංකාව සතුව විදේශ සංචිත තිබුණේ බිලියන 2.3 යි. මාගේ කාලය තුළ මේ රටට විදේශ බිලියන 8.3 ක් රටට ලබා දුන්නා. රැකියා වියුක්තිය සියයට හතයි. ඒක සියයට 4.3 ට බැස්සුවා. වසර 57ක් රට කරවලත් විදුලිය ලබා දීලා තිබුණේ ජනතාවගෙන් සියයට 77යි. මගේ කාලය තුළ ඒක සියයට 98 නැංවූවා. දුරකතන තිබුණේ සියයට 36% කට. අද ඒක සියයට 120ට නැංවූවා. මම ජනවාරි අට වෙනිදා භාර දුන්නේ එහෙම දියුණු කළ රටක්.

කොටින්ම අසමත් රාජ්‍යයේ ඉදන් මේ රට සමත් රාජ්‍යයක් අතරට ගෙන ගියා. අද අපිට එරෙහිව සටන් කරන රනිල් මේ වාගේ එක ජයග්‍රහණයක් රටට ගෙනත් තියෙනවාද? මේ රටේ ජනතාව යා යුත්තේ වෛරය එක්ක නොවෙයි. මේ රටේ ජනතාව යා යුත්තේ සුහදශීලී සමාජයක් කරායි. අපේ ජනතාව යා යුත්තේ අප්‍රාණික නිදා වැටෙන දේශයක් කරා නොවෙයි. මේ රටේ ජනතාව යා යුත්තේ සාර්ථකත්වය එක්ක. පණ ඇති සාර්ථකත්වය සොයා යන රටක් හදන්න. අපි අළුතින් පටන්ගමු. පණ ඇති අභීත දේශයක්, අභීත රටක්, සුහද සමාජයක් ගොඩ නගමු. ●





ජ.වි.පෙ. නායක
**අනුර දිසානායක**

# හෘද සාක්ෂියේ සම්මුතිය

**2015.07.22 වන දින මහරගම යොවුන් රඟහලේ දී පැවති**

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළිදැක්වීමේ අවස්ථාවේ දී එහි නායක අනුර කුමාර දිසානායක මහතා කළ කතාව**

විශේෂ සමුළුව පවත්වන මේ අවස්ථාව වන විට මේ රට සංකීර්ණතා රැසක ගිලී පවතිනවා. රටත් ජනතාවත් අර්බුද රැසක වෙළී තිබෙනවා. මේ මොහොතේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය අගෝස්තු 17වැනිදාට ඉදිරි අවුරුදු 05 වෙනුවෙන් පැවරිය යුත්තේ කාටදැයි සාකච්ඡාවක් පවතිනවා. මෙය මේ රටේ පළමු මහ මැතිවරණය නෙමෙයි. මේ රටේ ජනතාව මැතිවරණවලින් ආණ්ඩු හදා තිබෙනවා. නායකයින් මාරු කර තිබෙනවා. අවුරුදු 67ක් ආණ්ඩු පෙරළුවට, ආණ්ඩු මාරු කළාට, නායකයො මාරු කළාට අපේ සමාජයේ ගැඹුරුම අර්බුදවලට විසඳුම් ලබාගන්න අසමත් වී තිබෙනවා.



**දවසකට 14දෙනෙක් දිවි නසා ගන්නවා. ඒ ලෝකයේ 04වැනි තැන. වකුගඩු රෝගය නිසා දවසකට 06දෙනෙක් මිය යනවා. හෘදයාබාධ නිසා දිනකට 102 දෙනෙක්. පිළිකා රෝගය නිසා 12දෙනෙක් මිය යනවා. වාහන අනතුරු නිසා 08දෙනෙක් මිය යනවා. මේ රට කවරාකාරද. මේ පාලකයන් 67 අවුරුද්දක් මේ රට පාලනය කරලා රටට ඉතිරි කොට තිබෙන ශේෂ පත්‍රය අර්බුදයන්ගෙන් පිරුණු, ඉදිරියට නොයන සමාජයක්.**

**අතීත ගැටළු**

ආර්ථිකය ණය කන්දකට යටවෙලා. එය රුපියල් කෝටි හත් ලක්ෂ හතළිස් දහස ඉක්මවනවා. එක පුරවැසියෙක් රුපියල් තුන්ලක්ෂ පනස් පන් දහසක් ණයකරුවෙක්. වර්ෂයක උපයා ගන්නා ආදායම, 2013 වසරේ රු. බිලියන 1183යි. ඒ රටට ණය පොලී ගෙවන්න රු. බිලියන 1191ක් ගෙවීමට සිදුව තිබෙනවා. උපයා ගන්නා මුදලෙන් ඒ වසරේ ණය පොලී වාරිකය ගෙවා දමන්නටවත් නොහැකියි. ආර්ථිකයේ ප්‍රතිලාභ දුප්පතුන් වෙත ගලා නොයෑමේ බරපතළ ගැටලුවක් තිබෙනවා. අපේ රටේ ජාතික ආදායමෙන් ඉහළම 20%ට රටේ ජාතික ධනයෙන් 55.1%ක් යනවා. ජනගහනයෙන් දුප්පත්ම 20%ට ජාතික ධනයෙන් ලැබෙන්නේ 3.6%යි. මෙහි සාධාරණත්වයක් තිබෙනවාද. ඔවුන්ගේ ජීවිතේ කවරාකාරද. ආණ්ඩුවෙම වාර්තා කියනවා ජනහනයෙන් 42%කට දිනක ආදායම ලැබෙන්නේ ඩොලර් 2කට අඩු බව. රු. 280ට අඩුයි. මේ ආර්ථික අර්බුදය වැළැක්විය නොහැකි ලෙසම සමාජ අර්බුදයක් බවට පත්වෙලා. දවසකට 14දෙනෙක් දිවි නසා ගන්නවා. ඒ ලෝකයේ 04වැනි තැන. වකුගඩු රෝගය නිසා දවසකට 06දෙනෙක් මිය යනවා. හෘදයාබාධ නිසා දිනකට 102 දෙනෙක්. පිළිකා රෝගය නිසා 12දෙනෙක් මිය යනවා. වාහන අනතුරු නිසා 08දෙනෙක් මිය යනවා. මේ රට කවරාකාරද. මේ පාලකයන් 67 අවුරුද්දක් මේ රට පාලනය කරලා රටට ඉතිරි කොට තිබෙන ශේෂ පත්‍රය අර්බුදයන්ගෙන් පිරුණු, ඉදිරියට නොයන සමාජයක්. මෙය මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකර ගත නොහැකි සමාජ ආර්ථික දේහයක්. මේ මොහොතේ ජීවත්වන පුරවැසියන් ලෙස, හෘදසාක්ෂියක් ඇති මිනිසුන් ලෙස මේ සමාජ ආර්ථික දේහය වෙනස් කිරීමේ වගකීමක් අපට තිබෙනවා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ මේ සමාජ ආර්ථික දේහය වෙනස් කිරීම අරමුණු කොට ගෙන මේ රට ගොඩනැගීම සඳහා වූ හෘදසාක්ෂියේ සම්මුතිය නම් වූ රට ගොඩනැගීමේ ජාතික වැඩපිළිවෙළ රට හමුවේ තබනවා.

**මූලික මානව අවශ්‍යතා**

අපේ රටේ ජනතාවගේ ප්‍රශ්න වුණු දුවා දරුවන්ට අධ්‍යාපනය දෙන්න බැරිනම්, පවුලකට ආදායම් මාර්ගයක් දෙන්න බැරිනම්, ඉන්න නිවාසයක් දෙන්න බැරිනම්, නිරෝගී සම්පන්න වන්නට සෞඛ්‍ය සේවයක් දෙන්න බැරිනම්, කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් දෙන්න බැරිනම්, ඒ රටට පාලනයක් මොකටද. රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න බැරිනම්, ජාතික සමගිය ස්ථාපිත කරන්න බැරිනම්, රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්න බැරිනම්, ශක්තිමත් විදෙස් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න බැරිනම් රටක ස්ථාවරත්වයක් ඇතිවෙයිද. ජනතාවගේ මූලික ප්‍රශ්න විසඳීම වෙනුවෙනුත් රටේ මූලික ස්ථාවරයන් වෙනුවෙනුත් අප විසින් මෙම වැඩපිළිවෙළ ඉදිරිපත් කර තිබෙනවා.

අපේ රට ඉදිරියට යෑමටනම් ආර්ථිකයේ මහත් වර්ධනයක් අත්පත් කරගත යුතුයි. ආර්ථික සාධාරණත්වයත් අත්පත් කරගත යුතුයි. ආර්ථිකයේ වර්ධනයකිනුත් සාධාරණවයකිනුත් මිස අධ්‍යාපනයේ සාධාරණත්වයක් හදන්න බැහැ; රටේ ජනතාවට තමන්ගේ මූලික ආදායම උපයාගැනීමට නොහැකියි; නිරෝගී ජීවිතයක් දෙන්න බැහැ; ඉන්න නිවහනක් දෙන්න බැහැ; කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් දෙන්න බැහැ. රට වෙළී තිබෙන ගැඹුරුතම අර්බුදයන්ගේ පතුලේ තිබෙන ගැටලුව මෙයයි. එය විසඳිය යුතුයි. අපේ ආර්ථිකය කවරාකාර දිශාවකට යායුතුදැයි අපි අපේ වැඩපිළිවෙළ තුළ සාකච්ඡා කරනවා.

**ලෝක ආර්ථිකය**

ලෝකයේ කිසිදු රටකට තවදුරටත් හුදකලාව ජීවත් වෙන්න බැහැ. ලෝකය තාක්ෂණයෙන් එකට එක්කොට තිබෙනවා; සන්නිවේදනයෙන් එකට එක්කොට තිබෙනවා; ගමනාගමනයෙන් එකට එකතු කොට තිබෙනවා. දැනුමෙන් එකට එකතු කොට තිබෙනවා. ඒ නිසා කවුරුන් හෝ කල්පනා කල්පනා කරනවානම්



**අපි ව්‍යාපාරිකයො නෙමෙයි. අනෙක් බොහෝ අය ව්‍යාපාරිකයො. මුදල් ඇමති, ව්‍යාපාරිකයෙක් වුණාම බදු ගහන්නෙ තමන්ගෙ ව්‍යාපාරය ගැන හිතලා. කර්මාන්ත ඇමති සැලසුම් හදන්නෙ තමන්ගෙ ව්‍යාපාරය ගැන හිතලා. අපි ව්‍යාපාරිකයො නොවන නිසා අපි රට හදන ආර්ථික වැඩපිළිවෙළ හදන්නෙ අපිට ලැබෙන කොමිස් කුට්ටිය ගැන බලාගෙන නෙමෙයි;**

හුදකලා වෙන්න, ඔවුනට යා හැකි වන්නේ ගල් යුගයකට පමණයි. ලෝකය වේගයෙන් සමීපවෙමින් පවතිනවා. ඒ සමීපවෙමින් පවතින ලෝකය තුළ අපේ පාලකයින් 67 වසරක් පුරා ලෝකය සමග අප ඉදිරියට ගෙනගියා වෙනුවට පසුපසට ඇද දැම්මා. ජනතා විමුක්ති පෙරමුණේ ආර්ථික හා දේශපාලන වැඩපිළිවෙළ මුළුමනින්ම සමන්විත වන්නේ, ලෝකය සමග සමාන්තරව, ලෝකය අත්පත් කරගන්නා ජයග්‍රහණ ලංකාවේ ජනතාවටත් අත්පත් කරදීම වෙනුවෙනුයි. ඒ වැඩපිළිවෙළ අප සාර්ථක කර ගත යුතුයි.

අපි ලෝක වෙළඳපොළේ භාණ්ඩ හා සේවාවේ පංගුවක් අත්පත් කරගත යුතුයි. එසේ නොකොට අපේ රටේ ආර්තික ගොඩනගන්න බැහැ. 1978දී ලෝක වෙළඳපොළේ අපේ රටේ පංගුව 0.05%යි. ඩොලර් 200ක වෙළඳාමක් සිදුවුණානම් ශ්‍රී ලංකාවට ඩොලරයක් ආවා. අද වෙනකොට ලෝක වෙළඳාමෙන් ශ්‍රී ලංකාවේ පංගුව 0.0045%යි. ඒ කියන්නේ අද ඩොලර් 200ක වෙළඳාමක් වුණොත් ලංකාවට එන්නේ සත 10යි. අපේ රට මේ තත්වයට පත්කිරීම ගැන මේ පාලකයින් ලැජ්ජා විය යුතුයි.

අපි අපේ රටේ ආර්ථික උපායමාර්ගය සකස් කරන්නේ, අපේ රටේ නිෂ්පාදනය හා සේවාවන් ලංකාවේ ජනතාවගේ අවශ්‍යතාවය වගේම ලෝක වෙළඳපොළේ අවශ්‍යතාවත් සලකා බලමිනුයි. ලෝක වෙළඳපොළෙන් සැලකිය යුතු පංගුවක් අප විසින් අත්පත් කරගත යුතුව තිබෙනවා. අප ආර්ථික වැඩපිළිවෙළ සකස් කළ යුත්තේ එය ඉලක්ක කරගනිමිනුයි. ලෝකයේ විවිධ රටවලට තමන්ගේම වූ නිෂ්පාදනවලට ලෝක වෙළඳාමේ කොටසක් තිබෙනවා. ජපානයට මෝටර් රථ, කොරියාවට දුරකථන, ඉතාලියට සපත්තු, ස්විට්සර්ලන්තයට ඔරලෝසු, ප්‍රංශයට සුවඳවිලවුන් විය හැකියි. අපි අපේ කොටස අත්පත් කර ගත යුතුයි. එය ලෝකයට මෙහෙකරුවන් සැපයීම වැනි දෙයක් විය යුතු නැහැ.

අපි මෙතෙක් පැවති මෙම ආර්ථික උපායමාර්ගය මුළුමනින්ම වෙනස් කර දේශීය නිෂ්පාදනයත් ලෝක වෙළඳපොළත්, භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ පංගුවත් සැලකිල්ලට ගනිමින් ආර්ථිකය මෙහෙයවනවා. අපේ රටට අත්පත් කරගත හැකි ජයග්‍රහණය එයයි.

අපි මහත් අඩම්බරයෙන් කතා කළ අපේ රට අද ලෝකය හමුවේ දණින් වට්ටවා තිබෙනවා. හිඟමනට පාත්‍ර කර තිබෙනවා. අපි නැවත අපේ රටට උරුම සශ්‍රීකත්වය, ආර්ථික ජයග්‍රහණ ලබා ගැනීම සඳහා ආර්ථිකය මෙහෙයවන්න සූදානම්. අපේ කෘෂිකර්මාන්තය අපි ගොඩනැගිය යුතු වන්නේ, අපේ ආහාර සඳහා පමණක් නෙමෙයි, ලෝක වෙළඳපොළත් සැලකිල්ලට ගනිමිනුයි. ආහාර සුරක්ෂිතභාවය වැදගත්. ඒ වගේම අපේ කෘෂිකර්මාන්තය ලෝක වෙළඳපොළේ පංගුවක් අත්පත් කරගැනීම වෙනුවෙනුත් මෙහෙය විය යුතුයි. එසේ නොකොට අපේ රටේ කෘෂිකර්මාන්තය ස්ථාවර කළ නොහැකියි. ඉන්දියාවේ අල හා ළූණු අඩු නිෂ්පාදන වියදමකින් අපේ රටට එනවා. ඒවා දඹුල්ලට වැලිමඩට එනකොට මෙහෙ ඒවාට වඩා මිල අඩු වෙන්නෙ කොහොමද. අපේ රටේ කෘෂිකර්මාන්තයට අලුත් පර්යේෂණ, තාක්ෂණය ගේන්න ඕනෑ. නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට ඉලක්කයක් තිබිය යුතුයි. ලංකාවේ අල හොණ්ඩරයකින් අල හොණ්ඩර 08ක් ලැබෙනවා. ඉන්දියාවෙ 21ක් ලැබෙනවා. අලුත් බීජ, අලුත් පර්යේෂණ, තාක්ෂණය වගාවට යොදනවා. වගාවේ ඵලදායිතාව වැඩිකරලා නිෂ්පාදන පිරිවැය අඩුකරලා. පිරිවැය අඩුකිරීමකින් තොරව අපේ රටේ කෘෂිකර්මාන්තය ස්ථාවර කරන්න බැහැ. වී කිලෝවකට රු. 33.50ක් යනවා. අපේ උපරිමය අක්කරයකට වී බුසල් 100යි. ජපානයේ අක්කරයකින් වී බුසල් 300යි. මේ පාලකයෝ ලෝකයේ තාක්ෂණයේ, විද්‍යාවේ දියුණුව රටට ගෙනාවෙ නැහැ. අපේ කෘෂිකර්මාන්තය ඉබාගාතේ ගියා. අපි අපේ කෘෂිකර්මාන්තය නවීකරණය කරනවා.

ලෝක වෙළපොළේ පංගුවක් අත්පත්කරගැනීම සඳහා අපි අපේ රටේ පෞද්ගලික අංශයට ආරාධනා කරනවා. මේ ආර්ථික



**ප්‍රමිතියෙන් යුතු වැසිකිළියක් හදන්නත් 58,000ක් යන බවට ගණන් බලා තිබෙනවා. ලක්ෂයක් දීලා ගෙවල් හදන බව කීම මේ අනුව ව්‍යාජයක් බව පැහැදිලියි. එසේ නිවාස ගැටලු විසඳන්න බැහැ; ඊට ජාතික සැලැස්මක් අවශ්‍යයි. මේ රටේ අලුතින් විවාහවන හැම පවුලකටම නිවාසයක් ලබාදීමේ වගකීම ජ.වි.පෙ. රජය භාරගන්නවා.**

සැලැස්මේ ප්‍රධාන පංගුවක් ඔවුනට පැවරෙනවා. අද අපේ රටේ ව්‍යාපාරිකයාට, නිෂ්පාදකයාට සිදුවී තිබෙන්නේ, තමන්ගේ ව්‍යාපාරික පැවැත්ම වෙනුවෙන් වැළැක්විය නොහැකි ලෙසම කළු ව්‍යාපාරයේ යෙදෙන්න ඔවුනට බලකෙරී තිබෙනවා. අපේ රටේ ව්‍යාපාර පිරිසිදු කර දෙන බවටත් පිරිසිදු ව්‍යාපාරිකයින්ට ඉඩ ලබා දෙන බවටත් අපි සහතික වෙනවා. අපි ව්‍යාපාරිකයො නෙමෙයි. අනෙක් බොහෝ අය ව්‍යාපාරිකයො. මුදල් ඇමති, ව්‍යාපාරිකයෙක් වුණාම බදු ගහන්නෙ තමන්ගෙ ව්‍යාපාරය ගැන හිතලා. කර්මාන්ත ඇමති සැලසුම් හදන්නෙ තමන්ගෙ ව්‍යාපාරය ගැන හිතලා. අපි ව්‍යාපාරිකයො නොවන නිසා අපි රට හදන ආර්ථික වැඩපිළිවෙළ හදන්නෙ අපිට ලැබෙන කොමිස් කුට්ටිය ගැන බලාගෙන නෙමෙයි; අපි රටත් ජනතාවත් වෙනුවෙන් වූ උත්තුංග ප්‍රේමයෙන් දේශපාලනය කරන මිනිස්සු. එවැනි මිනිස්සුන්ට විතරයි මේ රට හදන්න පුළුවන්. සමහරු අහනවා අපි බලයට ආවොත් ආයෝජනවලට මොකද වෙන්නෙ කියලා. අපි ආයෝජන කැඳවනවා. ඒ, රටේ ආණ්ඩුව හදන ආර්ථික උපායමාර්ගයට අනුවයි. මේ අය අයෝජන කැඳවන්නෙ තමන්ට ලැබෙන කොමිස් කුට්ටිය දිහා බලාගෙන. කැඳවනු ලබන ආයෝජනය ආර්ථික උපායමාර්ගයක කොටසක් විය යුතුයි. ඒ සඳහා ආයෝජන කැඳවිය හැකියි. ණය ලබාගත හැකියි. දේශීය ව්‍යාපාරිකයාට අවස්ථාව විවෘත වන්නේත් ආර්ථික උපායමාර්ග යට අනුවයි. ඒ අනුව අපි සියලු දෙනා එක් වුවහොත් අපේ රටේ නිෂ්පාදනයත් සේවාවත් ඉදිරියට ගෙනිනවා සේම අවුරුදු 05ක් තුළ ලෝක වෙළඳපොළේ අපේ පංගුවක් අත්පත් කරගැනීමේ ඉලක්කයකට අපි ළඟා වෙනවා.

**ආර්ථිකය හා සමාජ ජීවිතය**

ආර්ථිකයේ ප්‍රතිලාභ ලැබුණොත් විතරයි දරුවාට අධ්‍යාපනය දෙන්න පුළුවන්. පළමු වසරට දරුවො 360,000ක් ඇතුල් වෙනවා. සාමාන්‍යපෙළට කලින් 60,000ක් හැළෙනවා. සාමානයපෙළ විභාගෙන් 140,000ක් හැළෙනවා. සාමාන්‍යපෙළ සමත් නොවන ලක්ෂ 2කක දරුවන්ගේ ජීවිතවලට මොකද වෙන්නෙ; මොකක්ද ඔවුන්ගෙ අනාගතය. අපරාධ වැඩිවෙන එක, කුඩු ව්‍යාප්ත වෙන එක, බාර්වල සෙනඟ පිරෙන එක අහන්න දෙයක් නෙමෙයි. සමාජයක් ලෙස කඩා වැටෙන එක අහන්න දෙයක් නෙමෙයි. අපි සහතිකයක් දෙනවා මේ රටේ ජනතාවට, පළමු පංතියට ඇතුල් වෙන 360,000ම හැකියාවක්, දක්ෂතාවයක්, නිපුනතාවයක් සහිතව අධ්‍යාපනයෙන් එළියට ගන්න බවට. එය අපේ වගකීමක්. අපි එය ඉටු කරනවා.

අද අධ්‍යාපනය දෙමව්පියන්ට බරක්. දරුවො ඉස්කෝලෙ යන නිසා දෙමව්පියන්ට අමාරුයි කියලා අපි ඕනෙ තරම් අහලා තියෙනවා. දරුවෙක් පාසල් යන එක, උසස් අධ්‍යාපනය ලබන එක ගෙදරකට බරක් වී තිබෙනවා. දෙමව්පියන් මත පටවා තිබෙන බර මුළුමනින්ම අපේ ආණ්ඩුවක් විසින් භාරගන්නවා. ඒ බර දැරිය යුත්තේ අපයි. දැනුමක් සහිත, අධ්‍යාපනයක් සහිත පරම්පරාවක් අවශ්‍ය අපිටයි. මේ රට හදන්න ඕනෑ.

ඉන් පස්සේ ඒ දරුවට රස්සාවක් හැදිය යුතුයි. රැකියා නිර්මාණය වෙන්නෙ, නිෂ්පාදනය ඇරඹෙන කොට කර්මාන්ත ශාලාව ඇතුළෙ, සේවා මධ්‍යස්ථාන ඇතුළෙ. මේ රටේ හැම පුරවැසියාටම අපි සාධාරණ ආදායම් මාර්ගයක් සහතික කරනවා. ඒ වගකීම අපි භාරගන්නවා. හැම කෙනාටම නිවසක් ඕනෑ. පුරවැසියන්ට නිවසක් ලබාදීම නොහැකිනම් ඔවුන් පාලකයොද. ඔවුන් ලැජ්ජා විය යුතුයි. නිවසක් ගන්න දේශපාලකයා පසුපස යාමට සිදුවී තිබේනම් රුපියල් ලක්ෂයක් හිඟාකන්න සිදුවී තිබේනම් මොකක්ද ඇතිවී තිබෙන තත්වය. ප්‍රමිතියෙන් යුතු වැසිකිළියක් හදන්නත් 58,000ක් යන බවට ගණන් බලා තිබෙනවා. ලක්ෂයක් දීලා ගෙවල් හදන බව කීම මේ අනුව ව්‍යාජයක් බව පැහැදිලියි. එසේ නිවාස ගැටලු විසඳන්න



බැහැ; ඊට ජාතික සැලැස්මක් අවශ්‍යයි. මේ රටේ අලුතින් විවාහවන හැම පවුලකටම නිවාසයක් ලබාදීමේ වගකීම ජ.වි.පෙ. රජය භාරගන්නවා.

හොඳ සෞඛ්‍ය සේවයක් අපිට ඕනෑ. අද අපේ රටේ ජනතාව රෝගී ජනතාවක් බවට පත් කර තිබෙනවා. රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලට අවුරුද්දකට ලක්ෂ 500ක් එනවා. රටේ ජනගහනයත් ලක්ෂ 200යි. රෝහලේ නේවාසිකව බෙහෙත් ගන්නවා ලක්ෂ 60ක්. ලෙඩ ජාතියක් නිර්මාණය කරලා. සෞඛ්‍ය පුරුදු, ආහාර පුරුදු නැතිව ගිහින්. කන දේකට කිසිවක් මිශ්‍ර කරන්නෙ නැති සංස්කෘතියක් තිබුණු රටේ දැන් ආහාරවලට විෂ මිශ්‍ර කරන තැනට ඇවිත්. මේ රටේ පුරවැසියන් මිලදී ගන්නා සෑම ආහාරයකම ප්‍රමිතියෙන් ආරක්ෂා කොට ලබා දීම ආණ්ඩුවේ වගකීමක් ලෙස භාරගන්න බවට අපි සහතික කරනවා. මහජන සෞඛ්‍ය සේවය, ප්‍රජා සෞඛ්‍ය සේවය පුළුල් කළ යුතුයි ඒවා ඒකාබද්ධ වැඩපිළිවෙළක් දියත් කළ යුතුයි. ඒ අනුව බොහෙත් ගන්න එන ලක්ෂ 500ක ජනතාව වසරක් තුළ ලක්ෂ 250ට අඩුකරන්න පුළුවන්.

**කාර්යක්ෂම අධිකරණයක්**

ජනතාවට කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් ඕනෑ. අපේ රටේ උසාවිවලට අවුරුද්දකට නඩු ලක්ෂ 10ක් පමණ එනවා. පවුල් ලක්ෂ 50යි. ඒ කියන්නේ, සෑම වසරකම පවුල් 05කින් 01 පවුලකට නඩුවක් වැටෙන බවයි. එකෙන් ට්‍රැෆික් නඩු විතරක් ලක්ෂ 350,000ක්. මොන වගේ රටක්ද. එක නඩුවට අවුරුද්දකට දවස් 3ක් යන්න වුණොත් ලක්ෂ 30ක් අධිකරණයේ ගත වෙනවා. මේ පිරිස ගෙනියන්න බස් කොච්චර ඕනෑද. වාහන කීයක පෙට්‍රල් පුච්චන්න ඕනෑද. මේක අකාර්යක්ෂමතාවයෙන් පිරිච්ච රටක්. අද ජනතාව නඩුවක් දාන්න බයයි. අපේ පාලනයක් යටතේ හැම කෙනාටම යුක්තිය ඉටු කෙරෙන බවටත් කාර්යක්ෂමව නඩුව විභාග කෙරෙන බවටත් සහතික වෙනවා. බදාදා දිනට රජයේ කාර්යාලයකට ගියොත් ඒ එන 100දෙනාගෙන් 80ක්ම එන්නේ තුන්වන වතාවටයි. පළවෙනි වතාවට ඒවායින් වැඩක් කරගන්න ලැබුණොත් ලොතරැයියක් ඇදීම හා සමානයි. අපි අපේ රටේ ජනතාවට කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබාදීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කරනවා.

**ජාතික සමගිය**

රට ස්ථාවර වන්නට නම් ජාතික සමගිය ගොඩනැගිය යුතුයි. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යනුවෙන් මේ රටේ ජන කොට්ඨාසයන් ගණනාවක් ඉන්නවා. ඔවුන්ගේ මූලයන් ඉතිහාසයට අයිති දෙයක්. මේ ජන කොටස් අතර ජාතික සමගිය ස්ථාවර වීමෙන් තොරව රටට ඉදිරි ගමනක් නැහැ. ජන කොටස් අතර අවිශ්වාසය, සැකය වැඩිකරලා, ගැටුම වැඩිකරලා රටක



**සන්නද්ධ අරගලය තවදුරටත් බලය මාරු කිරීමේ මෙවලමක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ පිළිගන්නේ නැති බව මා සහතික කරනවා. ඉදිරි ගැටුම නිර්මාණය වන්නේ බයිනෙත්තු, කෙටේරි, කාලතුවක්කු අතර නොව අදහස් අතර යැයි අපි විශ්වාස කරනවා. ඒ අදහස් අතර ගැටුමට මැදිහත් වෙන්න ජනතා විමුක්ති පෙරමුණ මුවහත් වෙමින් සිටිනවා. අදහස් සමඟ ගැටුමට එන ලෙස අපි අනෙක් පාර්ශ්වයන්ට ආරාධනා කරනවා.**

ස්ථාවරභාවය සෑදිය නොහැකියි. ජාතික සමගිය ගොඩනගිය හැක්කේ, සියලු ජන කොට්ඨාසයන්ගේ ආගමික අයිතිය, සංස්කෘතියේ අයිතිය, ඇදැහිලිවල අයිතිය, භාෂාවේ අයිතිය ආදී සියල්ල සම අයිතියක් ලෙස පිළිගැනීමෙන් පමණයි. අපි ඒ අයිතිය පිළිගන්නවා. මේ රටේ පාලකයො අවුරුදු 67ක් කළේ මොනවාද. ඔවුන් බලය රැකගන්න, බලය ආරක්ෂා කරගන්න ජාතිවාදය වැපිරුවා. සියලු ජනතාවන් අතර ජාතික සමගිය ගොඩනැගීම ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක ප්‍රමුඛතම කාර්යයක් ලෙස භාරගන්නවා.

### නව විදේශ ප්‍රතිපත්තියක්

නව ගෝලීය තත්වයන්ට ගැලපෙන ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක් නිර්මාණය කරගත යුතුයි. ලෝකයේ ප්‍රතිවිරෝධීතාවයන් රැසක් තියෙනවා. මේ ප්‍රතිවිරෝධීභාවයන් තුළ අපේ රටට වාසි සහගත වන විදෙස් පිළිවෙතකට අපි මාරු විය යුතුයි. අපිට තිබුණෙ එක් එක් බලවතාට කප්පම් පිදීමේ විදෙස් පිළිවෙතක්. ජ.වි.පෙ. අනුගමනය කරන්නේ, ලෝකය තුළ ශ්‍රී ලංකාව ඉතාම අභිමානවත් රාජ්‍යයක් ලෙස, අනෙකාගේ ආදරයට, අනෙකාගේ ගෞරවයට පාත්‍රවන රටක් බවට පෙරළීමේ විදෙස් ප්‍රතිපත්තියක්.

### ප්‍රජාතන්ත්‍රවාදී නිදහස

ප්‍රජාතන්ත්‍රවාදී නිදහස නොමැතිව රටකට ස්ථාවර විය නොහැකියි. ජනමාධ්‍යවේදියාගේ, කලාකරුවාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා වීමෙන් තොරව රටකට පැවතිය නොහැකියි. මාධ්‍යවේදියට නිදහසේ ලියන්නටත් කලාකරුවාට නිදහසේ නිර්මාණකරණයේ යෙදෙන්නටත් නොහැකිනම් රටේ ස්ථාවරභාවයක් නැහැ. රටේ ස්ථාවරභාවය රඳා පවතින්නේ පාර්ලිමේන්තුවේ හදා ගන්නා ඔළු ගෙඩි ගණනින් නෙමෙයි. රටේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ආරක්ෂා වීම තුළයි. අපි ඒ වෙනුවෙන් කැපවෙනවා. ජාතික ආරක්ෂාව තහවුරු විය යුත්තේ රටේ ජනතාවගේ ආරක්ෂාව තහවුරුවීමේ අර්ථයෙනුයි. ජ.වි.පෙ. ජාතික ආරක්ෂාව පිළිබඳ න්‍යායපත්‍රයට ප්‍රවේශ වන්නේ ලාංකේය භූමියේත් ඒ තුළ ජීවත්වන ජනතාවගේත් ආරක්ෂාව වෙනුවෙනුයි.

අපේ වැඩපිළිවෙළ සකස් කිරීමේදී විවිධ පුද්ගලයින් සංවිධාන, වෘත්තීය සමිති සමග සාකච්ඡා කළා. අදහස් ලබාගත්තා. මෙය සැබැවින්ම ක්ෂේත්‍රයේදී ජනතාව මුහුණදී තිබූ ගැටලු හා ඒවාට ඔවුන් දුටු විසඳුම් පිළිබඳ හෘදසාක්ෂිය පිටතට ඒමක්. ඒ නිසා තමයි මේ වැඩපිළිවෙළ ජනතාවගේ හෘදසාක්ෂියේ සම්මුතිය වන්නේ. ඒ සඳහා දායක වූ සියලු දෙනාට අපි බෙහෙවින් ස්තුතිවන්න වෙනවා. මේ වැඩපිළිවෙළ යථාර්ථයක් කිරීමටනම් අපට බලය ලැබිය යුතුයි. සන්නද්ධ අරගලය තවදුරටත් බලය මාරු කිරීමේ මෙවලමක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ පිළිගන්නේ නැති බව මා සහතික කරනවා. ඉදිරි ගැටුම නිර්මාණය වන්නේ බයිනෙත්තු, කෙටේරි, කාලතුවක්කු අතර නොව අදහස් අතර යැයි අපි විශ්වාස කරනවා. ඒ අදහස් අතර ගැටුමට මැදිහත් වෙන්න ජනතා විමුක්ති පෙරමුණ මුවහත් වෙමින් සිටිනවා. අදහස් සමඟ ගැටුමට එන ලෙස අපි අනෙක් පාර්ශ්වයන්ට ආරාධනා කරනවා.

රෝහණ විජේවීර සහෝදරයා කී ලෙස අද අපට සවන් නොදෙන කන් හෙට අපට සවන් දෙන බව අපට විශ්වාසයි. අප නියෝජනය කරන්නේ සත්‍යය, යුක්තිය, සාධාරණත්වය. හෘදසාක්ෂිය ඉල්ලා සිටින ඒ වේදිකාවට ගොඩවන්නට සියලු දෙනාට ආරාධනා කරනවා. ●

oneislandtwonations.blogspot.com



# එක්සත් සහ නොබෙදුණු ශ්‍රී ලංකාවක් තුළ උපරිම බලය බෙදීමේ ආකෘතියක් අවශ්‍යයි

**2015.07.27 වැනි දින දෙමළ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදැක්වීම යාපනය උඩුවිල් මරදනාර් තෝට්ටම් ක්‍රීඩාංගනයේ පැවති උත්සවයේ දී එහි නායක ආර්. සම්බන්ධන් හා එම්. එස්. සුමන්දිරන් මහතා කළ ප්‍රකාශයන්**

දෙමළ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් දෙමළ ප්‍රජාවගේ ප්‍රබලතම නියෝජිතයා තමන් වන බව අපගේ දැක්ම වන්නේ සියලු ජනතාවට අව්‍යාජ සමගි සංධානයක්, කල්පවතින සාමයක් හා සංවර්ධනයක් සඳහා වූ මූලික අවශ්‍යතාවයක් හැටියටයි. ඒ සඳහා අප යෝජනා කරන්නේ උතුරු නැගෙනහිර පළාත් දෙක ඒකාබද්ධ කිරීමයි. එසේම ශ්‍රී ලංකාව පිළිගෙන ඇති එක්සත් ජාතීන්ගේ සිවිල් දේශපාලන හා ආර්ථික සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අනුව ස්වයංනිර්ණය අයිතියට දෙමළ ජනතාවට හිමිකමක් තිබෙන බව. ෆෙඩරල් ආකෘතියක් මත පිහිටා

www.slelections.gov.lk




**නිවැරදි බලය බෙදාහැරීමක් තුළ කිසිදු ජාතියකට හෝ කිසිදු පුද්ගලයෙකුට අගතියක් සිදු නොවන බවත් ඉඩම් නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමටත් උතුරු නැගෙනහිර ජනතාව සඳහා විදේශ ආයෝජන සෘජුව ලබාගැනීමටත් අපට අවස්ථාවක් තිබේ. එක්සත් ශ්‍රී ලංකාවක් තුළ නොපැඳුණු ප්‍රතිපත්තියක් මත පිහිටා අප කටයුතු කරන්නට දකුණේ සමාජයට විවෘත මනසකින් අපි අපේ සුපිරිසිදු දෑත් දිගු කරමු.**

දෙමළ කතා කරන අයිතිහාසික පදිංචිකරුවන් වන දෙමළ මුස්ලිම් ජනතාවට උතුරු නැගෙනහිර බලය බෙදා හැරීමේ සියලු විධිවිධානයන්හි ප්‍රතිලාභීන් වීමට අයිතිවාසිකම් ලබන බව ප්‍රකාශ කළේ ය.

මෙහිදී අදහස් දැක් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එෆ්. සුමන්දිරන් මහතා ප්‍රකාශ කළේ නිවැරදි බලය බෙදාහැරීමක් තුළ කිසිදු ජාතියකට හෝ කිසිදු පුද්ගලයෙකුට අගතියක් සිදු නොවන බවත්, ඉඩම්, නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමටත් උතුරු නැගෙනහිර ජනතාව සඳහා විදේශ ආයෝජන සෘජුව ලබාගැනීමටත් අපට අවස්ථාවක් තිබේ. එක්සත් ශ්‍රී ලංකාවක් තුළ නොබැඳුණු ප්‍රතිපත්තියක් මත පිහිටා අප කටයුතු කරන්නට දකුණේ සමාජයට විවෘත මනසකින් අපි අපේ සුපිරිසිදු දෑත් දිගු කරමු.

අවසාන යුද්ධයෙන් අනතුරුව දමිළ ජනතාව භෞතික වශයෙන් හීනකොට තිබූ අවධියක දමිළ ජනතාවට අවශ්‍ය කර තිබූ නායකත්වය සහ මගපෙන්වීම ලබා දීමට අපොහොසත් වී පෞද්ගලික ලාභ ප්‍රයෝජනය කෙරෙහි පමණක් සිය අවධානය යොමු කළ අය මැතිවරණයේදී දමිළ ජනතාව තමන්ට ඡන්දය දිය යුතු යැයි බලාපොරොත්තු වන්නේ කෙසේද?

ඔහු තවදුරටත් පැවසුවේ දෙමළ අයිතීන් දිනා ගැනීමේ අරගලයේ සෑම කාලවකවානුවලදීම නිසි ක්‍රියාමාර්ගයන් සහ අරගලවලට නිසි ස්වරූපයන් අවශ්‍ය වූ බවත්, මෙම වසර මුලදී පැවති ජනාධිපතිවරණයේදී රාජපක්ෂගෙන් රට බේරා ගැනීමේ වගකීම දමිළ ජනතාවගේ කර මත පටවන ලද බවත්, සෘජුව සහ වක්‍රව රාජපක්ෂ ආරක්ෂා කිරීමට උත්සාහ කර අවසානයේදී අන්ත පරාජයක් ලද ඒජන්තවරුන් දමිළ ජනතාවගේ ඡන්දය ඉල්ලා සිටීම පුදුමසහගත වන බවත්ය.

මහින්දට කඩේ ගිය ඩග්ලස් දේවානන්දා රාජපක්ෂ සෘජුව ආරක්ෂා කිරීමට උත්සාහ දැරුවේය. ඡන්දය දීම ප්‍රතික්ෂේප කරන මෙන් ඉල්ලා සිටි ගජේන්ද්‍රකුමාර් වක්‍රාකාරයෙන් රාජපක්ෂගේ පැවැත්ම ආරක්ෂා කිරීමට වෙර දැරුවේය. මොවුන්ගේ ඉල්ලීම් සහ ප්‍රචාරයන් සියල්ල සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ දමිළ ජනතාව දෙමළ ජාතික සන්ධානයේ මගපෙන්වීම සහ නායකත්වය අනුමත කළ අතර විශාල වශයෙන් තම ඡන්දය ප්‍රකාශ කර එයින් ජයග්‍රහණයද ලැබූහ. දමිළ ජනතාවගේ එකමුතුකමේ බලයෙන් ලබා ගන්නා ලද මෙම ජයග්‍රහණයේ ඊලඟ පියවර කරා පියමන් කළ යුතුවා සේම ඊලඟ ඉලක්කය කරා ස්ථිරවම ගමන් කළ යුතුව ඇත.

දමිළ ජනතාව තම එකමුතුකමේ බලයෙන් රාජපක්ෂගෙන් රට බේරා ගැනීමෙන් අනතුරුව දමිළ ජනතාවගේ එකමුතුකමේ බලය සිංහල ජනතාව සහ ජාත්‍යන්තරය විසින් දැක ගන්නා ලදී. එම එකමුතුකම මෙම මැතිවරණයේදීද පැවතිය යුතු අතර එය මෙම මැතිවරණයේදී ස්ථිරවම දැක ගැනීමට හැකි විය යුතුය. එවිට දමිළ ජනතාවගේ එකමුතුකමේ බලයෙන් ජාත්‍යන්තරයේ සහාය ඇතිව දමිළ ජනතාවගේ ස්වයං පාලනය පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ගයන් දෙමළ ජාතික සන්ධානය විසින් නිවැරදිව ඉදිරියට ගෙන යනු ලබනු ඇති බව ස්ථිරවම ප්‍රකාශ කර සිටිමු. ●



www.tbcuk.net / tamildiplomat.com



ඉලෙයිජා හූල්

# දෙමළ ජාතික සන්ධානයට දෙමළ ජාතික ජනතා පෙරමුණ අභියෝගයක්ද?

දෙමළ ජාතික දේශපාලනයේ වෙනසක් ඇතිවිය යුතු යැයි ඇතැම්හු හඬ නගති. දෙමළ දේශපාලනයේ හැරවුම් ලක්ෂයක් සහ යම් නිවැරදිභාවයක් ඇති විය යුතු බව සත්‍යයකි. දෙමළ ජාතික සන්ධානය ඔවුන් ව ශක්තිමත් කරන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටිය ද බහුතර දෙමළ ජනයාගේ අදහස වන්නේ දෙමළ ජාතික සන්ධානය නිවැරදි ගමන්මඟට ප්‍රවිෂ්ට වීම සඳහා කාලය යෙදවිය යුතු බවයි.

www.omlanka.net



**දෙමළ ජාතික ජනතා පෙරමුණේ සභාපති වන්නේ ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් ය. ඔහු පවසන්නේ දෙමළ ජාතික සන්ධානය දෙමළ ප්‍රජාවගේ ද්‍රෝහීන් බවයි. ගජේන්ද්‍ර කුමාර් ගේ මැතිවරණ ප්‍රචාරණය සිදු වන්නේ ද එය පදනම්කොට ගෙන ය. මේ ඔස්සේ ඔවුන් උත්සාහ කරන්නේ දෙමළ ජාතික සන්ධානය දෙමළ ප්‍රජාවගේ ද්‍රෝහීන් බව සහතික කිරීමට ය.**

දෙමළ ජාතික ජනතා පෙරමුණෙහි ඩයස්පෝරාව සහ ක්‍රියාධරයන් ඉල්ලා සිටින වෙනස කුමක් ද? මේ පිරිස සැබැවින් ම නව වෙනසක් ඉල්ලා සිටී ද? එසේ නොවේ නම් වෙනසක් සඳහා සැළැසුමක් තිබේ ද? මේ සියල්ලට වඩා විශේෂ වන්නේ මේ පිරිස ඉල්ලන වෙනස අපව කොතැනට ගෙනයාවි ද යන්නයි. මෙවැනි ප්‍රශ්න මතු වී නැතිවා නොවේ.

**දෙමළ ජාතික ජනතා පෙරමුණෙහි පසුබිම**

දෙමළ ජාතික සන්ධානයේ ගමන්මග වැරදි දිශාවකට යොමු වන බව පවසමින් ඉන් ඉවත්ව 2010 මහ මැතිවරණයට ඉදිරිපත් වූ කණ්ඩායම දෙමළ ජාතික ජනතා පෙරමුණයි. 2004 මහ මැතිවරණයේ දී දෙමළ ජාතික සන්ධානය තුළ වැඩි මනාප ප්‍රමාණයක් හිමිකරගත්තේ මෙම ඉවත් ව ගිය කණ්ඩායම යි. 2010 මහ මැතිවරණයේදී මොවුන්ට හිමිවූයේ ඉතා අඩු ඡන්ද ප්‍රමාණයකි. ඉන් මෙම පිරිසට ජනතාවගේ තිබූ පිළිගැනීම කොතෙක් දැයි පැහැදිලි වේ.

2010 පසුව පැවති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණයන්ට ප්‍රතිපත්තියක් වශයෙන් දෙමළ ජාතික ජනතා පෙරමුණ ඉදිරිපත් නොවූ අතර එය දෙමළ ජාතික සන්ධානයේ ජයග්‍රහණය සඳහා වාසි විය. මේ හේතුවෙන් දෙමළ ජනයා වෙනුවෙන් කැපවෙන පක්ෂය තමන් බව පෙන්වීමට අවස්ථාව හිමි විය. දෙමළ ප්‍රජාව දෙමළ ජනතා ජාතික පෙරමුණ ප්‍රතික්ෂේප කර දෙමළ ජාතික සන්ධානයට සහාය පළකරන්නේ එම පක්ෂයේ බුද්ධිමත් දැක්ම හා යහපත් ආකල්ප හේතුවෙනි.

**දෙමළ ජාතික ජනතා පෙරමුණේ ස්වයං විවේචන දේශපාලනය**

දෙමළ ජාතික ජනතා පෙරමුණේ සභාපති වන්නේ ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් ය. ඔහු පවසන්නේ දෙමළ ජාතික සන්ධානය දෙමළ ප්‍රජාවගේ ද්‍රෝහීන් බවයි. ගජේන්ද්‍ර කුමාර් ගේ මැතිවරණ ප්‍රචාරණය සිදු වන්නේ ද එය පදනම්කොට ගෙන ය. මේ ඔස්සේ ඔවුන් උත්සාහ කරන්නේ දෙමළ ජාතික සන්ධානය දෙමළ ප්‍රජාවගේ ද්‍රෝහීන් බව සහතික කිරීමට ය. නමුත් අන්තර්ජාලයේ ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් ලෙස නම් කොට ඔහු පිළිබඳව සොයන්නෙකුට පළමුවෙන් ඔහු පිළිබඳව සඳහන් වන්නේ ද්‍රෝහියෙකු හැටියට ය. මොවුන්ගේ මැතිවරණ ප්‍රචාරණය සඳහා නිර්මාණය කර ඇති වාර්තා චිත්‍ර පටියක ද දෙමළ ජාතික සන්ධානය ද්‍රෝහියන් බව වඩ වඩාත් පවසයි.

ගජේන්ද්‍ර කුමාර්ගේ පිරිසට දෙමළ ජාතික සන්ධානය ද්‍රෝහියන් වීමට හේතුවන කාරණා කිහිපයක් දක්වයි.

- ජාතික ධජය එසවීම
- නිදහස් දින උත්සවයට සහභාගී වීම
- 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජාතික ගැටලුව ට විසඳුමක් ලෙස පිළිගැනීම
- සන්නද්ධ අරගලය හෑල්ලුවට ලක් කිරීම

සම්බන්දන් ට ජාතික කොඩිය එසැවීමෙන් වැළකීමට අවස්ථාව තිබූ බව අපගේ අදහසයි. සිංහ කොඩිය ඔසවන සියලු දෙනා දෙමළ ජනයාගේ ද්‍රෝහියන් හැටියටත්, කොටි කොඩිය ඔසවන සියලු දෙනා දෙමළ ජනයාගේ ගැලවුම්කාරයන් හැටියටත් පිළිග ැනීමේ සිද්ධාන්තයක් ගොඩ නැඟීම භයානක තත්ත්වයකි. කෙසේ නමුත් ජාතික උත්සවයක දී දෙමළ භාෂාවෙන් ජාතික ගීය ගායනා නොකර ජාතික කොඩිය එසවීමේ අර්ථයක් ඇති බව අපට පැහැදිලි නොවේ. තම දේශපාලන ඉතිහාසය පිළිබඳව පුන පුනා කතා කරන ගජේන්ද්‍රන් සිය සීයාගේ (ජී.ජී. පොන්නම්බලම්) දේශපාලනය පිළිබඳ කතා කිරීමට මැලිකමක් දක්වයි. හේතුව වන්නේ ජී.ජී. පොන්නම්බලම් යනු සෙල්වනායගම්ගේ දේශපාලනය දැඩි විවේචනයට ලක් කළ පුද්ගලයා බැවිනි.

පසු ගිය ජාතික නිදහස් දින උත්සවය ට සම්බන්දන් හා සුමන්දිරන් යන අය සහභාගී වීම දැඩි කතාබහට ලක් වූ කාරණාවක් විය. එම සිදුවීම අද දින දේශපාලන කරළියේ උණුසුම් මාතෘකාවක් වී තිබේ. කිසි දිනක ජාතික උත්සවයන් සඳහා සහභාගී වීමෙන් වැළකී සිටිනවායි දැඩි මතයක සිටි සම්බන්දන්

lankasrinews.com



**දෙමළ ජනතා ජාතික පෙරමුණ 13 වන ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාව තුළ එන ඒකීය රාජ්‍යයක් යන්න පිළි නොග නියි. පසුගිය පළාත් සභා මැතිවරණයට ඔවුන් තරඟ නොකළේද ඒ නිසා ය. එසේ නම් ඒකීය රාජ්‍යයක් යටතේ පවැත්වෙන මෙවර මහ මැතිවරණයට ඔවුන් ඉදිරිපත් වන්නේ කුමන් පදනමකින් ද? ඉන් ගම්‍ය වන්නේ පවතින ව්‍යවස්ථාව පිළිගන්නා බවයි.**

වැනි කෙනෙක් නිදහස් දින උසත්සවයට සහභාගී වීම සිතන්නට බොහෝ දෑ ඉතිරි කරයි. එයට සහභාගී වීමෙන් ඇතිවන ප්‍රති විපාක මොනවාද යන්න ඔහු සැබැවින් ම දැනගෙන සිටියේ ය. මෙවර නිදහස් දින උත්සවයේ තේමාව පිළිබඳ තිබූ විශ්වාසය ඔහු එයට සහභාගී වීමට හේතුව වන්නට ඇත. නමුත් ඒවා ක්‍රියාත්මක කිරීම විවාදාපන්න ය.

නිදහස් දින උත්සවයේ දී සියලු දෙනා කියැවූ ප්‍රතිඥාවේ සඳහන් කාරණා පහත පරිදි වේ.

- සාමය, ආරක්‍ෂාව ඇතුළුව ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකුට හිමි විය යුතු හිමිකම් සෑම දෙනාට ම හිමි විය යුතු ය.
- නිදහසින් පසු විශේෂයෙන් ම අවුරුදු 30 යුද්ධයේ ප්‍රතිඵලයක් සේ ජීවිත අහිමි වූ සියලු දෙනා ම ජාතී,භාෂා, ආගම් භේදයකින් තොරව සිහිපත් කළ යුතු ය. ගෞරව කළ යුතු ය.
- නීතිය, සාමය හා සංහිඳියාව සියලු ම පුරවැසියන්ට භුක්තිවිඳීමට හැකි අයුරින් ස්ථාපිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- විඳදරා ගැනීම, ඉවසීම, එකඟතාව යන කාරණා බහුවාර්ගික සමාජයක් සේ ප්‍රවර්ධනය කිරීම.
- නැවතත් ලේ වැගිරීමට රටට අවශ්‍ය නොවේ.

ඉහත සඳහන් කාරණා ප්‍රතිඥා දීම ද්‍රෝහී කමක් වේද? එසේ නම් 'ද්‍රෝහීත්වය' යන්නට වෙනත් අර්ථ ඇත්දැයි සොයා බැලිය යුතු ය.

දෙමළ ජනතා ජාතික පෙරමුණ 13 වන ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාව තුළ එන ඒකීය රාජ්‍යයක් යන්න පිළි නොගනියි. පසුගිය පළාත් සභා මැතිවරණයට ඔවුන් තරඟ නොකළේද ඒ නිසා ය. එසේ නම් ඒකීය රාජ්‍යයක් යටතේ පවැත්වෙන මෙවර මහ මැතිවරණයට ඔවුන් ඉදිරිපත් වන්නේ කුමන් පදනමකින් ද? ඉන් ගම්‍ය වන්නේ පවතින ව්‍යවස්ථාව පිළිගන්නා බවයි.

මේ උත්සහය ජාත්‍යන්තරය තුළ හඬක් නැගීම සඳහාය. මේ උත්සහය නව වේදිකාවක් ඇති කිරීමටය. ඔවුන්ගේ තීරණය රජයත් සමග කිසිදු ගනුදෙනුවකට නොයෙදී සිටීමය. එනම් ඡන්දය ලබාදුන් ජනතාව හෑල්ලුවට ලක් කිරීමය. දෙමළ ජනයාගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය රැක ගැනීමට මෙවර මැතිවරණයේදී තරග කරන්නේ නම් 2010 කුමක් සිදු වූයේද යන්න විමසා බැලිය යුතුය.

මොවුන් ජනතාවට ලබා දෙන ගෞරවය කුමක්ද? ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරාගත් පක්ෂ නායකයන් හට ජනතාවගේ විවෘතභාවයට ඉඩ නොදී ඔවුන්ට ද්‍රෝහියන් ලෙස හංවඩු ගැසීමේ ක්‍රමයට කිව හැකි දෙයක් නොමැත.

අවසාන වශයෙන් දෙමළ ජාතික සන්ධානය සන්නද්ධ අරගලයට අපහාස කරයි යන අසත්‍ය ප්‍රචාරයන් බොහෝ අවස්ථාවලදී ගජේන්ද්‍ර කුමාර් හා ඔවුන්ගේ සගයන් විසින් පවසා ඇත. එල්.ටී.ටී.ඊ යේ ප්‍රතිපත්තිමය කාරණාවන් සමඟ එකඟ නොවීම සන්නද්ධ අරගලය හෑල්ලුවට ලක් කිරීමක් වන්නේද? එය එසේ වුවහොත් ගජේන්ද්‍ර කුමාර්ද එම වැරැද්දම සිදුකර ඇත. මන්දයත් ඔහු ප්‍රකාශ කරන්නේ එක් රටක් හා එක් දේශයක් අවශ්‍ය බවයි. නමුත් එල්.ටී.ටී.ඊ ය ඉල්ලා සිටියේ වෙනම රාජ්‍යකි. එබැවින් ගජේන්ද්‍ර කුමාර්ගේ ප්‍රකාශයෙහි සදාචාරාත්මක බව විවාදාත්මකය. සැබවින්ම දෙමළ ජාතික සන්ධානය සන්නධ අරගලය හෑල්ලුවට ලක් කළේද? නැත. එය ඉංග්‍රීසි මාධ්‍ය පළ වූ ප්‍රවෘත්ති විකෘති කිරීමෙන් ජනතාව මුළා කිරීමකි.

තෙවනුව, එල්.ටී.ටී.ඊ ය කරන ලද වැරදි පෙන්වා දී ඉන් ගොඩ ඒමේ මග කාලීන අවශ්‍යතාවක් ලෙස සැලකිය නොහැකිද?

නවීන තත්වය කුමක්ද? දෙමළ ජාතික ජනතා පෙරමුණ දෙමළ ජාතික සන්ධානයට විරුද්ධව ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අප ඉහතින් සළකා බැලුවෙමු. විචාරයෙන් ඔබ්බට මොවුන් ඉදිරිපත් කරන තීන්දු පිළිබඳව හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැවැන්ත අර්බුදයක් ඇත. කුමක් කළ යුතුද? යන පැණයට නිසි පිළිතුරක් ලබා නොදීම සත්‍යකි. අත්හළ යුතු නොවැදගත් කාරණා දුසිම් ගණන් ඔවුන් සතුව ඇත.




www.tamilnet.com

**සරලව ප්‍රකාශ කළහොත් දේශපාලන විසදුමක් පිළිබඳ මොවුන්ගේ යෝජනාවන් දෙයාකාර වේ. පළමුවැන්න නම් දළ සැකිල්ලක්වත් නොමැති ඊළාම් රාජ්‍යය, ලෝකයේ ජීවත්වන දමිළ ජනතාව හා තමිල්නාඩුව සමග එක්ව ජාත්‍යන්තර දේශපාලනයෙහි තම දේශපාලන ඉල්ලීම් සඳහා විසඳුම් ලබා ගැනීමයි. දෙවනුව යුධ අපරාධ, වර්ග ඝාතනය පිළිබඳ ජාත්‍යන්තර පරීක්ෂණයක් තුළින් දේශපාලන විසදුම් සඳහා වන ප්‍රවේශයයි.**

සරලව ප්‍රකාශ කළහොත් දේශපාලන විසදුමක් පිළිබඳ මොවුන්ගේ යෝජනාවන් දෙයාකාර වේ. පළමුවැන්න නම් දළ සැකිල්ලක්වත් නොමැති ඊළාම් රාජ්‍යය, ලෝකයේ ජීවත්වන දමිළ ජනතාව හා තමිල්නාඩුව සමග එක්ව ජාත්‍යන්තර දේශපාලනයෙහි තම දේශපාලන ඉල්ලීම් සඳහා විසඳුම් ලබා ගැනීමයි. දෙවනුව යුධ අපරාධ, වර්ග ඝාතනය පිළිබඳ ජාත්‍යන්තර පරීක්ෂණයක් තුළින් දේශපාලන විසදුම් සඳහා වන ප්‍රවේශයයි.

පළමු වැනි යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව විවාදයක් පැවැත්වුවහොත් එහි ප්‍රායෝගිකභාවය සම්බන්ධව පරාජය නියතය. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කාල රාමුවට පටහැනිව කටයුතු කරන විට ජාත්‍යන්තර දමිළ ප්‍රජාවද හඬ නගමින් තමන්ට අවැසි දේ ඉටුකර ගනී. මෙය පසුගිය සය වසර තුළදී ම අප උගත් පාඩමකි. ගජේන්ද්‍ර කුමාර් පවසන්නේ තම පක්ෂය පාර්ලිමේන්තුවට තේරී පත් වුවහොත් ජාත්‍යන්තර ප්‍රජාව තමන්ට නතුකර ගත හැකි බවයි. එසේ නම් 2004-2010 යන කාලය තුළ කොපමණ සංඛ්‍යාවක් ඔහු තමන්වෙත නතු කර ගත්තේද? නමුත් තමිල්නාඩු රජය හා එහි ජනයා ශ්‍රී ලංකාවේ ධීවර ජනයාගේ සම්පත්, ජීවනාධාර සූරා කෑහ. 2013 දී තමිල්නාඩුව පුරා ශිෂ්‍ය විරෝධතාවන් පැවැත්වුණේ ශ්‍රී ලංකාවේ සිදු වූ යුද අපරාධ සඳහා ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍ය බවටය. නමුත් ඉන්දියානු රජය මැදිහත් වීමෙන් ශ්‍රී ලංකාවට එරෙහි ජිනීවා යෝජනාවේ ප්‍රබලත්වය අවම කර ඇත. නීතියේ ආධිපත්‍යයේ ගැටළු ඇත්නම් ජාත්‍යන්තරය ඊට මැදිහත් වීම වරදක් නොවේ. එනම් එම ක්‍රියාකලාපයේ ශක්තිය, බෙලහීනතාවය හා ජාත්‍යන්තර බලපෑම් සඳහා යම් කාලයක් අවශ්‍ය වන්නේය. මීට ඉවසීමක් අවශ්‍යය.

ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම්ගේ දෙවන යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී පැවැත්වූ ජනාධිපතිවරණය ඔවුන් දැඩිව හෙළා දකී. ඒ අනුව ඉහත ප්‍රකාශයන් ද්විත්වයම සැලකීමේදී මොවුන්ගේ සැගවුණු අරමුණු පෙනී යයි. එනම්, ජාතිවාදී සිංහල රජය දමිළ ජනයා දහස් ගණන් මරා දැමූ අතර අදත් එම වෛරයෙන් කටයුතු කිරීම වැනි කාරණා පුන පුනා හුවා දැක්වීම කවදා හෝ කවුරුන් හෝ මැදිහත්ව දේශපාලන විසඳුමක් ලබා දෙන්නේය යන අන්ධ විශ්වාසයක ඔවුන් එල්බ සිටී යන්නයි. මෙම කාරණාව ඉටුකර ගැනීම සඳහා කුමන හෝ මවා පෙන්වීමක් කිරීමට ඔවුන් සූදානම්ය.

මෙම සැලසුම ක්‍රියාත්මක වීමට ගතවන කාලය අවිනිශ්චිතය. මේ හේතුව නිසා පසුගිය ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජයග්‍රහණය වෙනුවෙන් දෙමළ ජනතාව ඡන්දය ලබාදිය යුතුය යන කරුණ පැහැදිලිව අවබෝධ කරගත්තද මොවුන් ඉන් ඍජුව හා වක්‍රව වැළකී සිටිමින් සහාය දක්වන ලදි. මීට හේතුව වන්නේ මහින්ද රාජපක්ෂගේ පාලනය තුළ මෙවැනි අදහසක් කිසිසේත්ම ඉදිරිපත් කළ නොහැකි වීමයි. ඒ අනුව කුමන පරිමාණයකින් බැලුවද මොවුන් ජනතාවාදී දේශපාලකයන් නොවන බව පැහැදිලිය.  මොවුන් බලාපොරොත්තුවන ආකාරයේ ජාත්‍යන්තර පරීක්ෂණයක් සිදුවේද? එසේ සිදු වූවත් මොවුන් බලාපොරොත්තුවන විසදුම ඉටුවේද? දේශපාලන විසදුමක් හිමිවුවත් එතැන් පටන් කුමන ආකාරයෙන් කටයුතු කරන්නේද? යන්න පිළිබඳව සැලසුමක් මොවුන්ට තිබේද? සැබවින්ම මොවුන් බලාපොරොත්තු වන ආකාරයේ ජාත්‍යන්තර විසඳුමක් ලැබේද? නොලැබේද? යන පැණයන් සඳහාවත් මොවුන්ට පිළිතුරු නොමැත. මෙවැනි අදහසක්වත් නොමැති පක්ෂයක් කෙසේනම් හඳුනාගන්නද? මොවුන් දෙමළ ජනයාගේ විමුක්තිය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාවන් තව තවත් දෙමළ ජනතාව පීඩාවට පත් කිරීමට හේතු වන්නේය. මෙය එක්තරා සියදිවි නසාගැනීමේ දේශපාලනයකි.

## දෙමළ දේශපාලනය යා යුතු ගමන් මාර්ගය

ඡන්දය දුන් ජනතාව ලෙස දෙමළ ජාතික සන්ධානය හා එහි නායකත්වය ප්‍රශ්න කිරීම, විවේචනය කිරීම අතිශයින්ම සාධාරණ වේ. එය අනිවාර්ය අවශ්‍යතාවයකි. ●

(උපුටා ගැනීම මාට්‍රම් වෙබ් අඩවිය ඇසුරිණි.)





නීතිඥ
**නිසාම් කාරියප්පර්**

මුස්ලිම් ජනයාට ලැබුණු වාසි මත ජනාධිපති රාජපක්ෂට කැමති වුවත්,

# ඔහුගේ මුස්ලිම් විරෝධය ඔහුට ම පාරාවළල්ලක් විය.

මුස්ලිම් ජනතාවගේ උපන් අයිතියක් වන ආගම ඇදහීමට එරෙහිව පහර දෙන බලවේගයන්ට, සෘජුව හෝ වක්‍රව මහින්ද රාජපක්ෂ මහතාගේ සහයෝගය ලැබුණු බව මුස්ලිම් ජනයා ප්‍රබල ලෙස විශ්වාස කළ හ. එයට දැක්වූ විරෝධයේ ප්‍රතිඵලයක් ලෙසයි රාජපක්ෂ මහතාගේ පරාජය මුස්ලිම් ප්‍රජාව දකින්නේ.

වෙනත් ජනවර්ගයක ආගමික අයිතියට විරුද්ධව ගිය නායකයෙක් ලෙස සාමාන්‍ය මුස්ලිම් ජනයා රාජපක්ෂ මහතාව දකින්නේ වී නමුත් මා නම් ලාංකීය පුරවැසියෙක් ලෙස දකින්නේ ඊට වඩා බරපතල

www.news.lk



**ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස දේශපාලන පක්ෂ කැඩීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන සියලුම වගන්තීන් තමන්ට පක්ෂව අර්ථකථනය කර, තව දුරටත් විධායක බලතල තර කර ගැනීම ඔහු ප්‍රිය කළේ ය. ව්‍යවස්ථාදායක සභාවත්. අධිකරණයත් එක්කර රට පාලනය කරගෙන යාමට මහින්ද රාජපක්ෂ ගෙන ගිය වැඩ පිළිවෙල දැන් අහෝසිවී තිබේ. ඒ හරහා නිදහසේ ඕනෑම සුළු පක්ෂයකට නැතිනම් සුළු ජාතික පක්ෂයකට ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීමට අයිතිය ලබාගැනීමට හැකිවීම ප්‍රධාන ම ජයග්‍රහණයකි.**

කාරණයක් එහි ඇති බව ය. මුස්ලිම් ප්‍රජාව වේවා, දෙමළ කථා කරන ප්‍රජාව වේවා, සිංහල ප්‍රජාව වේවා පොදුවේ සාමාන්‍ය ජනයාගේ මූලික අයිතිවාසිකම් අහිමි කිරීම රාජපක්ෂ මහතාගේ පරාජයට බලපෑවේ ය.

ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස දේශපාලන පක්ෂ කැඩීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන සියලුම වගන්තීන් තමන්ට පක්ෂව අර්ථකථනය කර, තව දුරටත් විධායක බලතල තර කර ගැනීම ඔහු ප්‍රිය කළේ ය. ව්‍යවස්ථාදායක සභාවත්. අධිකරණයත් එක්කර රට පාලනය කරගෙන යාමට මහින්ද රාජපක්ෂ ගෙන ගිය වැඩ පිළිවෙල දැන් අහෝසිවී තිබේ. ඒ හරහා නිදහසේ ඕනෑම සුළු පක්ෂයකට නැතිනම් සුළු ජාතික පක්ෂයකට ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීමට අයිතිය ලබාගැනීමට හැකිවීම ප්‍රධාන ම ජයග්‍රහණයකි.

මුස්ලිම් ප්‍රජාව තුළ ඒ පිළිබඳව යම්කිසි පළල් දැණුමක් නැත. සාමාන්‍ය ජනතාව හැටියට ඔවුන් දුටුවේ, ගමට පාරක් හදා දෙන්නට හැකි, එහෙම නැත්නම් වැසිකිළියක් සාදවාගත හැකි, එහෙමත් නැත්නම් එදිනෙදා ඔවුන්ට අවශ්‍ය දේවල්, මෙන්ම මුදල් ප්‍රශ්ණය මතු නොකොට, ටෙන්ඩර් පටිපාටිය ගැන කිසිම තැකීමක් නැතිව, කිසිම ප්‍රමාදයකින් තොරව, ඉල්ලූගමන් දෙන්ට පුළුවන් මනුෂ්‍යයෙක් එතන සිටීම යහපත් දෙයක් ලෙසට ය. එහි විශාල ආකර්ශණයක් තිබුණි. අවුරුදු 50ක් තිස්සේ කරගන්නට නොහැකි වූ වැඩ කරගන්නට හැකි මනුෂ්‍යයෙක් ලෙස අපේ මුස්ලිම් ජනතාව රාජපක්ෂ දුට හ.

මුස්ලිම් කොංග්‍රසය ආණ්ඩුව සමඟ නැති අවස්ථාවේ, මහින්ද රාජපක්ෂ මහතා මුස්ලිම් කොංග්‍රස් විරෝධී අනික් මුස්ලිම් දේශපාලන පක්ෂවලට කැමති දෙයක් කරන්න අයිතිය ලබා දුන්නේ ය. ඒක ඕනෑම විෂයක් වෙන්නට පුළුවන. විශාල මුදලක් ගෙවා, මුස්ලිම් කොංග්‍රසයට විරුද්ධව ක්‍රියාකළ වෙනත් මුස්ලිම් නායකයකුගේ ගම අනෙකුත් ගම්මානවලට වැඩියෙන් සංවර්ධනය කර රාජපක්ෂ මහතාගේ පැත්තට ආවොත්, ඔබේ ගමත් හදලා දෙන්නම් යන පණිවිඩය මුස්ලිම් ජනතාවට රාජපක්ෂ යැව්වේ ය. අක්කරපත්තුව හොඳම උදාහරණය කි. රවුෆ් ඇමතිතුමා සිටි කාලයේ දී අක්කරපත්තු ප්‍රාදේශීය සභාව දෙකට කඩා සභිකයින් 7 දෙනෙකු වෙනුවෙන් මහ නගර සභාවක් සහ අනික් 9 දෙනාට ප්‍රාදේශීය සභාවක් සාදා දුන්නේ ය. එහි දී කිසිම පළාත් පාලන ආයතන සම්ප්‍රදායක් රාජපක්ෂ පිලිපැද්දේ නැත. අවුරුදු 100ට වැඩි සීමා නිර්ණය කොමිෂම පිළිබඳ සැළකිල්ලක් නැතිව කැමති ආකාරයට එසේ කර අතාවුල්ලා ඇමතිතුමාගේ පුතාව එතැන නගරාධිපති බවට පත්කෙරිණි. එයින් පසු මිලියන ගණන් වටිනා, ඒ ප්‍රදේශයේ කිසිම ගමකට නොමැති විශාල මහ නගර සභා ගොඩනැගිල්ලක්, රෝහළක්, බස් නැවතුම් පොළක් සහ සාප්පු සංකීර්ණයක් පමණක් නොව ගමට ඇතුළු වන තැන විශාල පිළිගැනීමේ පුවරුවක් ද ඉදි කළේ ය.

මිනිසුන් දැක්කේ ඇයි අපේ දේශපාලන නායකයන්ට මේවා කරගන්නට බැරි යන ප්‍රශ්නය ඇතිව ය. මහින්දට කිට්ටු වුණොත් මේ වැඩ කරගන්න පුළුවන් යන හැඟීම මුස්ලිම් ජනයා තුළ ඇතිවීමට මෙය බලපෑවේ ය. රටේ තිබෙන බලතල හා සම්පත් සියල්ලක්ම හිමි, එම පුද්ගලයා සමඟ යහලුකම්, හිතවත්කම්, පැවැත්වීම මත ඕනෑම දෙයක් කරගන්න පුළුවන් යන අදහස මුස්ලිම් ප්‍රජාව අතර ගොඩනැගී තිබුණි. මා සිතන්නේ අර යටත් විජිත කාලේ ජනතාවට වැඩ කරපු ආකාරයට. ජනතාව වෙනුවෙන් ගොඩනැගිලි හැදුනා, කොමිස් ලැබුණා, අනිකුත් නගරවලට වැඩියෙන් විදුලි බුබුළු යනාදිය ලැබුණි. පලාත් සභා බලතල සහ



/www.youtube.com

**මහින්ද රාජපක්ෂ මහතා වෙත මුස්ලිම් ප්‍රජාව තුළ පුදුම ඇල්මක් තිබුණි. තමාගේම වාසිය ගැන පමණක් සිතන නමුත් වැරදි ලෙස සම්පත් පාලනය කරන, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය ගැන සිතන්නට තරම් අපේ සාමාන්‍ය ජනතාවට දැනුමක් නැත. නමුත් මේ රට තුළ ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කළ, මේක බෞද්ධ රටක්; මුස්ලිම් ජනතාවට අයිතියක් නැහැ යන දෘශ්ටිවාදය මතුවීමත් සමඟ මුස්ලිම් ප්‍රජාවට රාජපක්ෂ මහතාව එපා විය.**

ප්‍රාදේශීය සභා බලතල සියල්ලක්ම එක් අයෙකු විසින් පැහැරගෙන කරන මේ ක්‍රියාවේ තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී බව ජනතාව දුටුවේ නැත. මහින්ද රාජපක්ෂ මහතා වෙත මුස්ලිම් ප්‍රජාව තුළ පුදුම ඇල්මක් තිබුණි. තමාගේම වාසිය ගැන පමණක් සිතන නමුත් වැරදි ලෙස සම්පත් පාලනය කරන, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය ගැන සිතන්නට තරම් අපේ සාමාන්‍ය ජනතාවට දැනුමක් නැත. නමුත් මේ රට තුළ ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කළ, මේක බෞද්ධ රටක්; මුස්ලිම් ජනතාවට අයිතියක් නැහැ යන දෘශ්ටිවාදය මතුවීමත් සමඟ මුස්ලිම් ප්‍රජාවට රාජපක්ෂ මහතාව එපා විය.

මේක හොඳ දෙයක් ලෙසටයි මා දකින්නේ. මේකෙන් ලැබුණ විශාලම වාසිය වන්නේ ප්‍රජාතන්ත්‍ර විරෝධීව අත්තනෝමතිකව බලතල පාවිච්චි කරන මනුෂ්‍යයෙක්ව ගෙදර යවන්න අවස්ථාවක් උදාවීම. සුළු හා සුළු ජාතික එහෙම නැත්නම් සංඛ්‍යාත්මකව අඩු පක්ෂවලට නිදහසේ ප්‍රජාතන්ත්‍රීකව තම දේශපාලනය කරන්නට මේ තුළින් අවස්ථාව දැන් උදාවී ඇත. රාජපක්ෂට කැමැත්ත නොකැමැත්ත ප්‍රකාශකිරීම මිනිසුන්ගේ අයිතියකි. නමුත් ඒ වාතාවරණය ඇතිකරන්න හැකිවීම මුස්ලිම් කොංග්‍රසය දකින්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අයිතීන් මත ඉදිරියට යාමට තිබුණු විශාල බාධාවක් ඉවත් වූ ලෙසට ය.

දකුණේ මේ විධායක ජනාධිපති ක්‍රමයට එරෙහිව කළක සිට විරෝධයක් මතු වු නමුත් මුස්ලිම් ප්‍රජාව පාර්ලිමේන්තු ක්‍රමයකට වඩා ජනාධිපතිවරයෙක් සිටීම යහපත් යැයි කල්පනා කරන බව සත්‍යකි. විධායක බලතල පිළිබඳව යහපත් ආකල්පයක් අපේ හිටපු නායක අෂ්රොෆ් මැතිතුමා ගේ කාලෙයේ තිබුණි. ඒක දැඩි ලෙස අපේ ජනතාව තුළ මුල් බැස තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවේ තිබිය යුතු අංගය සපුරා නැති අවස්ථාවක පුද්ගලයෙක් රටේ නායකයා සමග තිබෙන හා ඒ පුද්ගලයා සමග ජනතාව තිබෙන සම්බන්ධතාවය හරහා නොයෙකුත් දේවල් අපට කරන්නට හැකිවීම එයට එක් හේතුවකි. කොටි ත්‍රස්තයන් හා අනෙකුත් කලබල ඇතිවුණ කාලය එහි උච්චතම අවස්ථාව ලෙස සළකන්නට පුළුවන. මුස්ලිම් ගම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වෙනත් පුද්ගලයෙකුගෙන් එහෙම නැත්නම් ව්‍යවස්ථාදායක මණ්ඩලයකින් නැත්නම් වෙනත් යම්කිසි ආයතනයකට යටත් නොවී කෙළින්ම අණ ලබාදීමේ අයිතිය හරහා අපට නොයෙකුත් ආරක්ෂාවන් විධායක ජනාධිපති තුමා හරහා ලැබුණි. විද්වතුන් හැටියට අප කුමක් කීවත් ප්‍රායෝගිකව බැලූ කළ සත්‍යය වන්නේ මෙයයි.

අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ 89.8%ක් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය පාවිච්චි කරන විට මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලැබුණේ 10%ට අඩුවෙනි. කිසිම මැතිවරණ කොට්ඨාශයකින් එපමණ කුඩා ප්‍රතිශතයක් රාජපක්ෂ මහතාට ලබුණේ නැත. නමුත් දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශයේ හා අම්පාර මැතිවරණ කොට්ඨාශයේ හැම පළාතකම විශාල වශයෙන් ඡන්ද අඩු වන අවස්ථාවක නැගෙනහිර පළාතේ තිබුණ සියළුම සිංහල ප්‍රදේශවල 65% වැඩි ප්‍රතිශතයක් මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලැබුණි.

ජාතික මට්ටමේ ආරක්ෂාව විධායක මට්ටමේ රැඳී තිබෙන විට සංඛ්‍යාත්මකව බහුතර ජනතාව සුළු සංඛ්‍යාවක් වශයෙන් සිටින දිස්ත්‍රික්කවල ඔවුන්ගේ ආරක්ෂාව ඔවුන් විධායකය හරහා බලාපොරොත්තු වේ. ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්ණයකදී ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් තමන්ගෙන් රාජකාරිය සාධාරණව ඉටු නොකිරීම හේතුවෙන් ඕනෑම ප්‍රජාවක් තුළ එම ආකල්පය ඇති වේ.

newscentral.exsees.com



**අධි ආරක්ෂිත කලාපයක් හදාගෙන දෙමළ ජනතාව අවතැන් වී එය ඉවත්කර ගැනීමට නොකළ දෙයක් නැත. අවසානයේ අධිකරණයට ගිය ද එය ද හරිගියේ නැත. නමුත් ජනාවාරි 8 වැනිදා දෙමළ සන්ධානයෙන් දැක්වූ සහයෝගයට ප්‍රතිචාරයක් වශයෙන් නිකුත් කළ ගැසට් නිවේදනයෙන් පැය 24ක් ඇතුලත ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට එය කරන්නට හැකි විය. විධායක ජනාධිපති ක්‍රමය තිබීම යහපත් බවට මෙයින් ජනතාවට පණිවුඩයක් ලැබේ.**

උදාහරණයක් හැටියට දෙමළ කථා කරන මනුෂ්‍යයෙකුට හමුදාව ළඟට ගොස් අවශ්‍ය දෙයක් කරගන්න නොහැකි තත්ත්වයක් තිබේ. සමහර විට ඇත්තටම ඔහු නීති විරෝධී යමක් කර තිබෙන්නට පුළුවන. තමාගේ ව්‍යාපාර කටයුතු 100% ක් රෙගුලාසිවලට අනුකූල නොවන ලෙස කටයුතු කළා විය හැක. සාමාන්‍යයෙන් යුධ හමුදාව විසින් කෙරෙන ක්ෂණික පරීක්ෂණයකට භාජනය වූ අවස්ථාවක එහි නීති විරෝධී සුළු දෙයක් තිබෙන්නට පුළුවන. අවශ්‍ය නම් එය පොලීසියට භාරදෙන්නත්, නැත්නම් නිදහස් කිරීමට ද හැකි ය. එවැනි වෙලාවට මිනිසුන් බලන්නේ විධායකයත් සමග යම්කිසි විශේෂ සම්බන්ධතාවයක් තිබෙනවා නම් අපට ඒක ලොකු රැකවරණයක් තිබෙනවා යන ආකල්පයෙනි.

යම්කිසි දිස්ත්‍රික්කයක සංවර්ධනය හා සම්පත් විෂම ආකාරයෙන් බෙදී යන්නේ නම්, මූල්‍ය කොමිෂමක් නැත්නම් හා සංවර්ධනය හරි හැටි ඉටු කිරීම සම්බන්ධ ආයතන නොමැති අවස්ථාවක දේශපාලන බලතල තිබෙන පුද්ගලයා එයා කැමති ආකාරයට එය හසුරුවන බව අමුතුවෙන් කිවයුතු නැත. මෙසේ සිදුවීම ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් විශාල හානියක් වන නමුත් යහපත් ආකාරයට එය සිදුවිය යුතු යැයි සළකන්නේ .1% අඩු සංඛ්‍යාවක් පමණි.

9%ක් සිටින මුස්ලිම් ජනතාවට විධායක ජනාධිපති මැතිවරණයක දී ඒ 9%ක ප්‍රතිශතියෙන් බහුතරයක් ඡන්ද ජනාධිපති අපේක්ෂකයෙකුට ලබාදීම හරහා තම ජනතාව වෙනුවෙන් අයිතියක් හෝ වරප්‍රසාදයක් ලබා ගැනීමට සැමදාම කේවල්කර තිබේ. එයාට කවුරු පක්ෂපාතීව ඡන්දය දුන්නත් ජනාධිපති වුණාට පස්සේ ව්‍යවස්ථානුකූලව හැර ඔහුට හිතු මනාපයට කටයුතු කරන්න නොහැකි, 75%-80% ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන රාමුවක් පවතින අවස්ථාවක් හැරෙන්නට මිනිස්සු කල්පනා කරන්නේ විධායක ජනාධිපති ක්‍රමය අවශ්‍ය දෙයක් ලෙසට ය. ඒ නිසා විධායක ජනපති ධූරය ඉවත්කරනවා කියන එක සම්බන්ධයෙන් තවමත් මුස්ලිම් නායකයන් හා මුස්ලිම් කොංග්‍රස් නායකයන් අතරත් කිසියම් ප්‍රහේලිකාවක් තිබේ. දේශපාලනික වශයෙන් එහි සාධාරණත්වයක් ද තිබේ.

මක්නිසා ද යත් මේ මැතිවරණයේ දී කෙසේ කටයුතු කළත්, අනාගත මැතිවරණයකදී මුස්ලිම් ප්‍රජාවේ ඡන්දය අවශ්‍ය යැයි සිතන අවස්ථාවක මුස්ලිම් නායකයෙකුට කේවල් කිරීමේ අයිතිය තබාගෙන තමන්ගේ ජනතාවට ආරක්ෂාව හෝ ඔවුන් වෙනුවෙන් කටයුතු කිරීමේ පහසු ක්‍රමය වන්නේ එක පුද්ගලයකුට කථා කිරීම ය. පාර්ලිමේන්තුවට නැතිනම් කැබිනෙට්ටුවට එහෙමත් නැත්නම් අධිකරණයට ගිහිල්ලා තම අයිතිවාසිකම් ලබා ගන්නවාට වඩා එය පහසු ය. අධි ආරක්ෂිත කලාපයක් හදාගෙන දෙමළ ජනතාව අවතැන් වී එය ඉවත්කර ගැනීමට නොකළ දෙයක් නැත. අවසානයේ අධිකරණයට ගිය ද එය ද හරිගියේ නැත. නමුත් ජනාවාරි 8 වැනිදා දෙමළ සන්ධානයෙන් දැක්වූ සහයෝගයට ප්‍රතිචාරයක් වශයෙන් නිකුත් කළ ගැසට් නිවේදනයෙන් පැය 24ක් ඇතුලත ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට එය කරන්නට හැකි විය. විධායක ජනාධිපති ක්‍රමය තිබීම යහපත් බවට මෙයින් ජනතාවට පණිවුඩයක් ලැබේ.

විධායක ජනාධිපති ක්‍රමය නිසා දෙමළ ජනතාව සෑහෙන්න බැට කෑ හ. සංසන්දනය කර බැලීමේ දී කරගත හැකි දේ අඩු බවත් දුර්විපාකය වැඩි බවත් ඔවුහු අවසානයේ දී තේරුම් ගත් හ. අනික් පැත්තෙන් මුස්ලිම් ජනතාවට ආරක්ෂාව හා භෞතික

lankasinhala.com



**කෙසේ නමුත් පාර්ලිමේන්තු ක්‍රමයට යා යුතු බව අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් යෝජනා කර තිබේ. තම පෞද්ගලික දේශපාලනමය අවශ්‍යතාවය මත ගන්න තීරණයක් ද නැත්නම් පොදුවේ රටේ යහපත ගැන සලකා ගන්න තීරණයක් ද යන්න ප්‍රශ්නය මෙතන දී මතුවේ.**

පහසුකම් ලැබුණි. තමන් කැමති වෙලාවට පාරවල් හැදු නමුත් දැන් එම පාරවල් හැදෙන්නේ නැති බවයි ඔවුන් කියන්නේ. මුස්ලිම් ජනයාට එය පෙනුනේ ජනාධිපතිවරයාගේ පෞද්ගලික බුදලයකින් සෑදූ දෙයක් ලෙසට ය. ඒවා සිදුවූයේ එසේ නොවන බව මිනිසුන්ට තේරෙන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවකින් සම අයිතිවාසිකම් හා සම්පත් බෙදා දීම සමව සිදු නොවන්නේ නම් දේශපාලන පක්ෂවල විග්‍රහයෙන් එහාට ගොස් ක්‍රියා කිරීමේ තත්ත්වයක් ගැන අප වැනි රටකට සිතන්නට අමාරු ය. විධායක බලතල අඩු කිරීමෙන් අනතුරුව ද විධායක ජනාධිපති ධුරය පිළිබඳව යම්කිසි ඇල්මක් තිබේ.


කෙසේ නමුත් පාර්ලිමේන්තු ක්‍රමයට යා යුතු බව අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් යෝජනා කර තිබේ. තම පෞද්ගලික දේශපාලනමය අවශ්‍යතාවය මත ගන්න තීරණයක් ද නැත්නම් පොදුවේ රටේ යහපත ගැන සලකා ගන්න තීරණයක් ද යන්න ප්‍රශ්නය මෙතන දී මතුවේ. මක්නිසා ද යත් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට ජනාධිපතිවරණයකට තරඟ කර ජයගන්නට නොහැකි යන විවේචනයක් තිබේ. වසර ගණනාවක් පුරා එය ඔප්පු කර ඇත. ජනවාරි 8 වෙනිදා ජයග්‍රහණය කළේ ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කෙනෙකුව ඉදිරිපත් කර ය. ඒ වගේ වාතාවරණයක මෙය පටු දේශපාලන අවශ්‍යතාවය මත ගන්නා තීරණයක් ද එහෙමත් නැත්නම් රට දෙස බලාගන්නා තීරණයක් ද යන්න ප්‍රශ්ණයකි.

එයින් ඔබ්බට ගොස් සුළු ජාතීන් හැටියට මා නම් දකින්නේ බලය බෙදා හැරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මීට වැඩිය යමක් කර තිබුණා නම්, අඩුම ගණනේ 60%කට සෑහීමකට පත්විය හැකි ස්ථානයකට පැමිණියා නම් ඔය පාර්ලිමේන්තු ක්‍රමය ද විධායක ජනාධිපති ක්‍රමය ද යන ප්‍රශ්ණය මතුවෙන්නේ නැත. මක්නිසාද යත් ඒ දෙකෙන් කුමක් වුවත් තිබෙන ඒ බලය බෙදාහැරීම හරහා ඒ ඒ පළාත්වලට බලතල හිමිවේ. විශේෂයෙන් එවිට උතුරු නැගෙනහිර දෙමළ කථාකරන බහුතරයක් සිටින ස්ථානයේ තමන්ගේ ම මහ ඇමතිවරයෙක් හරහා තමන්ගේ ම ඇමතිවරයෙක් හරහා ඒවා ක්‍රියාත්මක කිරීම, නැත්නම් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හැකියාව ලැබුණොත් එය විශාල දෙයකි.

අවුරුදු දෙකක් නගරාධිපති හැටියට ක්‍රියාකළ මගේ අත්දැකීමෙන් මා දැක්කේ ඇමතිවරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු එසේත් නැත්නම් විශේෂ සම්බන්ධතාවයක් නැතිවුණාම වැඩක් කරගන්නට නොහැක. එම නිසා විධායක ධුරය නැතිකිරීම කියන කාරණය මා දකින්නේ බලය බෙදා හැරීමේ ක්‍රියාදාමය සමග සම්බන්ධයක් ඇතිව ය. විශේෂයෙන් දෙමළ කථා කරන ජනතාවටත්, කඳුකර දෙමළ ජනතාවටත්, හැම පළාතෙම ඇති නොයෙකුත් සිංහල දෙමළ ගම්වලටත්, බලතල සහ සම්පත් බෙදී යන ආකාරය සැළකිල්ලට ගන්නේ නම් ඒක රටට ප්‍රශ්ණයක් වෙන එකක් නැහැ. එවිට අපට ජනාධිපතිවරණය සඳහා තිබෙන මුදල් ටික ඉතුරු කරගන්නට පුළුවන.

වැරදි මනුෂ්‍යයෙකුට විධායක බලතල ලැබුණු විට එයා ඒවා පාවිච්චි කළේ කෙසේ ද යන්න අපි දුටුවෙමු. ව්‍යවස්ථාදායකයට වගකියන්න අවශ්‍ය නැත. අධිකරණයට වගකියන්න අවශ්‍ය නැත. ඒ වගේ එක්කෙනෙක් ඇති කිරීමේ ප්‍රතිඵලය ගැන අමුතුවෙන් කිවයුතු නැත. විශාල ආයතනයක් වූ විට, සමූහිකව වගකීමක් භාරගන්න අවස්ථාවක, ජනතා නියෝජිතයන්ගේ විවේචනාමක මත වැඩක් කරන්න බලකෙරෙන විට එතැන සාකච්ඡාවක්, යම්කිසි අදහස් හුවමාරුවක් ඇතිවන විට, විනිවිද පෙනීමක් ඇත. නමුත් ඒ තැනට යන්ට පෙර මා කියන්නේ පළාත් පාලන ආයතන හා පළාත් සභා මට්ටම් වල බලතල ශක්තිමත් කරන රාමුවක් තුළ

omlanka.com



**ෆෙඩරල් මාදිළියේ බලතල බෙදීමක් තුළින් අපරටේ පවතින ජාතික ප්‍රශ්නයට විසඳුමක් වන බව විශ්වාස කරන පිරිසක් ද සිටිති. මුස්ලිම් කොංග්‍රසය හැමදාම ඔය යෝජනාවට පක්ෂපාත ය. නමුත් දැනට පවතින බලය බෙදීමේ අත්දැකීම සැළකිල්ලට නොගෙන අනවශ්‍ය සුදු අලියෙක් නිර්මාණය කර නොගෙන ඉන් ඔබ්බට යායුතු ය.**

විධායක බලතල නැතිවෙන එක සුළු ජනතාවට පිළිගන්නට හැකි තත්ත්වයක් වීමට පුළුවන.

ෆෙඩරල් මාදිළියේ බලතල බෙදීමක් තුළින් අපරටේ පවතින ජාතික ප්‍රශ්නයට විසඳුමක් වන බව විශ්වාස කරන පිරිසක් ද සිටිති. මුස්ලිම් කොංග්‍රසය හැමදාම ඔය යෝජනාවට පක්ෂපාත ය. නමුත් දැනට පවතින බලය බෙදීමේ අත්දැකීම සැළකිල්ලට නොගෙන අනවශ්‍ය සුදු අලියෙක් නිර්මාණය කර නොගෙන ඉන් ඔබ්බට යායුතු ය.

දැනට පාර්ලිමේන්තු මන්ත්‍රිවරු 225ක් සිටිති. පළාත් සභා වල සිටින ගනන එයට වැඩිය. පළාත් පාලන ආයතන වල 10000ක් පමණ සිටිති. ද්වීමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කළහොත් තව ගනනක් එයට එක් වේ. ඔවුන්ට ද සවාරි යන්නට තව පැජරෝ, ප්‍රාඩෝ සහ මොන්ටේරෝ ඇතුළු පහසුකම් ලබාදෙන්නට සිදුවේ. ප්‍රයෝජනයක් නැතිව මොවුනට මේ පහසුකම් දීම පිළිබඳ මහජනතාව තුළ ප්‍රසාදයක් නැත. සාමාන්‍ය ජනතාව තුළ මෙවැනි මතයක් තිබෙන වාතාවරණයක් තුළ එම යෝජනාවට ලැබෙන ප්‍රතිචාරය යහපත් නැත. දැන් අපට තිබෙන රාමුව තුළ ද බලය නිසි ලෙස බෙදී නැතිවා පමණක් නොව තිබෙන බලතල නිසිලෙස ක්‍රියාත්මක කර ද නැත. මේ නිසාම මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරුනගෙන් මිස පලාත් සභාවකින් සැළකියයුතු යමක් කෙරුන බව ද මා අසා නැත.

නමුත් එයට වඩා පළාත් පාලන ආයතනය පාලම්-බෝක්කු වැසිකිලි සහ කුඩා පිට්ටනි සාදා දුන් බව මිනිස්සු කියති. පළාත් සභාවල ඇමතිවරුන් තම ආයතනවලට සුළු සේවකයන් ටිකක් දමාගත්තා හැරෙන්නට ජනතාවට පෙනෙන තරමට වැඩක් කර නැත. තාමත් ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික්ක ලේකම් මධ්‍යම රජයේ නියෝජිතයෝ වෙති. ඒවා අවුරුදු 100ට වඩා පැරණි ඉතාමත් ශක්තිමත් ආයතනයන් ය. ජනතාව ඒ ආයතන තමයි දකින්නෙ තමන්ගේ වැඩ කටයුතු කරන ආයතන ලෙස.

පළාත් සභාවට දෙන බලතලවත් ඒ අය පාවිච්චිකර නැත. ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හැකියාව තියෙනවා ද යන ප්‍රශ්නයක් ද තිබේ. මෙවැනි තත්ත්වයක් තුළ වඩා පුළුල් රාමුවකට යෑමට ඉක්මන් වියයුතු නැත. කාලයත් සමග බලය බෙදා දීම පුළුල් කළ යුතු බවයි මා නම් සිතන්නේ. පළමුවෙන්ම, තිබෙන පලාත් රාමුවේ බලය ක්‍රියාත්මක කර ශක්තිමත් පළාත් සභා ඇති කිරීම වැදගත් ය. පාර්ලිමේන්තුව ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනයට පමණක් ඔවුන් විසින්ම සීමා පනවාගත යුතු ය. මක් නිසා ද යත් පාර්ලිමේන්තුවට යන්නවුන් පළාත් සභාවට බලය ජීවිතයට දෙන්නේ නැත. එසේනම් තව මෛත්‍රීපාල සිරිසේනලා පැමිණිය යුතු ය. මා සෞඛ්‍ය ඇමති වී කොළඹ තිබෙන ජාතික රෝහළ පමණක් භාරගන්නම් කියා කිසි දු මන්ත්‍රීවරයෙක් කියන්නේ නැත. සෞඛ්‍ය පමණක් නොව අනික් විෂයන්ට ද මෙය ඒ ආකාරයට ම අදාල ය. අවසාන වශයෙන් මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මහින්ද රාජපක්ෂ මැතිතුමාව හමුවන්නට අපේ නායකතුමා ද, හසන් අලී මන්ත්‍රීතුමා ද, මම ද ගියෙමු. මේ ගැන ධෛර්යක් නොතිබුණු බැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කවුරුත් පැමිණියේ නැත. ඒ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මන්ත්‍රී කෙනෙකු ජනාධිපතිතුමාට අභියෝග කිරීමෙන් තමන්ට ශත 5ක්වත් නොලැබේ යැයි ඔවුන් බියවිය. අපගේ පක්ෂය වෙනුවෙන් ඔය බලතල සම්බන්ධයෙන් අප කථා කළෙමු. මහින්ද රාජපක්ෂ මහතා ප්‍රතිචාරය දැක්වූයේ ජනාධිපති ධූරයේ බලතල ලෙස නොව තමන්ගේ පෞද්ගලික බලයක් යමෙක් ඉල්ලනවිට ප්‍රතිචාර දක්වන හැඟීමෙනි. දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක් නැති රටක මිනිසුන් සිතන ආකාරය එසේ ය. ●









මහාචාර්ය
**එම්. ඕ. ඒ. ද සොයිසා**

# ජාතික සංහිඳියාවකට සමාන අවස්ථාවන් හා සමාන පුරවැසියන්

කිසියම් ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට නම් ස්ථාවර ආණ්ඩුවක් තිබිය යුතු ය. ඒ අනුව ඉදිරි මැතිවරණයේ දී අවම වශයෙන් එක්සත් ජාතික පක්ෂය ආසන 113ක්වත් ලබාගත යුතුව ඇත. අපගේ අත්දැකීමට අනුව සහාග ආණ්ඩුවලට තනි මතයක සිට කිසිදු ප්‍රතිපත්තියක් ආත්ම විශ්වාසයක් ඇතිව ක්‍රියාවට නැගීමට නොහැකි වී තිබේ. ඒ නිසා අනාගත සමාජ ආර්ථික ප්‍රතිපත්තියක් ගැන සිතීමට පෙර දේශපාලන ස්ථාවරත්වයක් ඇතිකර ගැනීම ඉතාම වැදගත් ය. ඉදිරි මැතිවරණයට ඉදිරිපත්වී ඇති දේශපාලන පක්ෂ කිහිපයක්ම තමන් බලයට පත් වූ පසුව මේ රටේ ක්‍රියාත්මක කිරීමට අදහස් කරණ සමාජ ආර්ථික වැඩ පිළිවෙලේ



**ආර්ථික සංවර්ධනය සඳහා වෙළඳ පොළ ක්‍රමයේ කාර්යක්ෂමතාවය මේ ආර්ථික ප්‍රතිපත්තිය මගින් මූලික වශයෙන් පිළිගැනේ. එහෙත් සමාජ සාධාරණත්වය ඉටුකිරීමෙ හි ලා එහි ඇති දුර්වලතාවය සළකා අවශ්‍ය අංග වලට රාජ්‍ය මැදිහත් වේ. මේ වැඩ පිළිවෙල ආණ්ඩුවේ පංචවිධ ප්‍රතිපත්තිය ලෙස දැනටමත් නම්කර තිබේ.**

දළ සටහනක් තමන්ගේ මැතිවරණ ප්‍රකාශනය මගින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

මේ අතර එක්සත් ජාතික පක්ෂය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රාමුව තුළ සමාජ වෙළඳපොල ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්කම කිරීමට අදහස් කරන බව ප්‍රකාශකර තිබේ. එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනය කියවන ඕනෑම අයෙකුට මෙය පැහැදිළි වේ. නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියට වෙනස් වූ සමාජ සාධාරණත්වය කෙරෙහි ද මේ මගින් අවධානය යොමුකරනු ලැබඇත. ආර්ථික සංවර්ධනය සඳහා වෙළඳ පොළ ක්‍රමයේ කාර්යක්ෂමතාවය මේ ආර්ථික ප්‍රතිපත්තිය මගින් මූලික වශයෙන් පිළිගැනේ. එහෙත් සමාජ සාධාරණත්වය ඉටුකිරීමෙ හි ලා එහි ඇති දුර්වලතාවය සළකා අවශ්‍ය අංග වලට රාජ්‍ය මැදිහත් වේ. මේ වැඩ පිළිවෙල ආණ්ඩුවේ පංචවිධ ප්‍රතිපත්තිය ලෙස දැනටමත් නම්කර තිබේ.

පළමු වැන්න පාර්ලිමේන්තුවේ බහුතර බලයක් ලබා ගැනීම ය. ඉන් අනතුරුව අනිකුත් දේශපාලන පක්ෂ ද සම්බන්ධ කරගැනීමට අදහස් කරන අතර විරුද්ධ පක්ෂයට ද ආණ්ඩුවට එක්වන ලෙස ආරාධනා කෙරේ. මෙය දේශපාලන තේරුමෙන් ගත් කළ සහාග ආණ්ඩුවක් නොවන අතර ජාතික ආණ්ඩුවක් ලෙස නම් කළ හැක. මේ පිළිබඳව ජනාධිපතිවරණයට පෙර සිටම අගමැති රනිල් වික්‍රමසිංහ මහතා රට හමුවේ ප්‍රකාශකර ඇත.

මෙය එක්තරා ආකාරයකට 1932 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ පැවති විධායක කාරක සභා ක්‍රමය අපගේ සිහියට නැගේ. මෙහි දී ව්‍යස්ථාදායක සහ විධායක කටයුතු සඳහා පත්වෙන සියලුම දේශපාලන පක්ෂ සම්බන්ධ කරගැනීමට අදහස් කෙරේ. මෙයින් ඇතිවන විශාලතම වාසිය වන්නේ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ එය ක්‍රියාත්මක කිරීමේ දී තමන් එයට සම්බන්ධයක් නැතිබව පවසමින් වගකීමෙන් පලා යෑමට ඔවුන්ට නොහැකි වීම ය.

දේශපාලන සහ ජාතික සංහිඳියාව ඇති කරගැනීමට ද මේ විධායක කාරක සභාක්‍රමය ඉවහල් වනු ඇත. ස්ථාවර ආණ්ඩුකරණයක් තිබෙන බැවින් 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ද සාර්ථක ලෙස ක්‍රියාත්මක කරගැනීමට ද හැකිවනු ඇත.

ජාතික සංහිඳියාව ඇතිකර ගැනීමට නම් සමාන පුර වැසියන් සහ සමාන ඉඩ ප්‍රස්ථා ඒ රාජ්‍ය තුළ ජීවත්වන සියලුම පුරවැසියන්ට තිබිය යුතු ය. මෙය එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිඅපත්තිය නොවන්නට පුළුවන් වන නමුත් මගේ පෞද්ගලික මතයට අනුව නම් එවැනි රාජ්‍ය අනාගමික විය යුතු අතර එක් භාෂාවකට පමණක් විශේෂත්වයක් හිමි නොවිය යුතු ය. එසේ වර්ග කිරීමෙන් පුරවැසි කොට්ඨාශ අතර උස් පහත් භේදයක් නිර්මාණය වේ. එක් රාජ්‍යයක් තුළ ජීවත් වන පුරවැසියන් අතර මේ ආකාරයට උස්පහත් භේදයන් නිර්මානය වීම ගැටුම් ඇති කිරීමට තෝතැන්නක් වීම වැළැක්විය නොහැක. පුරවැසියන් අතර ඇතිවන මේ උස්පහත් භේදය වලක්වා ගන්නට නම් අනිවාර්යයෙන්ම රාජ්‍ය ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය ය. ඒ සඳහා මූලික පියවරක් ලෙස නව ව්‍යවස්ථාවක් නිර්මාණය කළ යුතු ය. එවැන්නක් නිර්මාණය කරගත හැක්කේ රටේ බහුතරයකගේ අනුමැතිය එයට ලබාගතහැකි වන්නේ නම් පමණි. අනික් අතට දේශපාලනඥයින් පමණක් නොව ඒ මුලධර්ම මත ගොඩ නගන ආණ්ඩු ක්‍රමයක් ජනතාවගේ නොමඳ ගෞරවයට ද පාත්‍ර වියයුතුව තිබේ.

සැබවින්ම මෙය දේශපාලන සංස්කෘතිය හා සම්බන්ධ කාරණයක් වේ. දේශපාලන සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ හුදෙක් මහජන නියෝජිතයින්ගේ හැසිරීම වැනි සදාචාරාත්මක කාරණයක් නොවේ. එය රටක මිනිසුන්ගේ දේශපාලන චර්යාවට සම්බන්ධ කාරණයකි. මිනිසුන් තවදුරටත් අපේක්ෂා කරන්නේ සියලු බලයන් සහිත රජ කෙනෙකු නම් ඒ රටේ උසස් දේශපාලන සංස්කෘතියක් තිබෙන්නේ යැයි කියව නොහැක. ප්‍රජාතන්ත්‍රවාදී රටක පාලකයා යනු භාරකරුවෙක් පමණක් යන හැඟීම ඒ රටේ පුරවැසියන්ට තිබිය යුතු ය. පාලකයින් නීතියට ගරු නොකරන්නේ නම් අනික් අතට ප්‍රජාතන්ත්‍රවාදී ආයතන කෙරෙහි ජනතාවගේ විශ්වාසයක් නොමැතිනම් ඒ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වන්නට හේතුවක් නැත. පුරවැසියන්ගේ දේශපාලන අනුයෝජනය යහපත් වන්නේ කාලාන්තරයක් තිස්සේ එවැනි හැඩගැසීමක් ඇත්නම් පමණි. එවැනි හැඩ ගැසීමක් මේ සමාජයේ පවතින් බව පසුගිය ජනාධිපති වරණයේ දි අපිට දක්කට ලැබුණි. අවශ්‍ය වන්නේ ඉදිරි මැතිවරණයෙන් පසුව එය ඉදිරියට ගෙන යෑම ය.





# ප්‍රතිපත්තියක් නැති වතුකරයේ දේශපාලනය

සුරේෂ් කුමාර්

ලෝකයේ වඩාත් පීඩිත ජන කොට්ඨාසයක් ශ්‍රී ලංකාවේ ද සිටිති. ඔවුන් මධ්‍යම කඳුකරයේ ජීවත්වන වතු දෙමළ ජනයාය. 1948 නිදහසින් පසුව පවා ඔවුන්වෙත නිසි අවධානයක් යොමු වී නොමැතිබව වත්මන් සන්දර්භයෙන් තහවුරු වේ. 19 වන සියවසේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී තේ,රබර්, කෝපි යන වගාවන් සාර්ථක වන්නේ ඉන්දියානු වතු දෙමළ ජනයාගේ ආගමනයත් සමගිනි. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව ලෝක වෙළඳපොළේ යම් ස්ථාවර භාවයක් අත්පත් කරගත්තද ඒ සඳහා වතු දෙමළ ජනතාවට යම් වටිනාකමක් හෝ හිමිකර නොදීමේ සදාචාරාත්මක බව විවාදාත්මක ය. මෙවර මැතිවරණයේ දී ඔවුන්ට ඇති අයිතීන් ලබා දීමට පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනවල කෙතරම් ඉඩක් වෙන් වී තිබේ ද යන්න විමසා බැලිය යුතු ය.

1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වතු දෙමළ ජනයාටද ඡන්ද අයිතිය හිමිවිය. නමුත් බහුතරය වූ සිංහල ජාතියේ දේශපාලන ව්‍යූහය නිසා ජවහල් ලාල් නේරුගේ සෘජු මැදිහත්වීමක් මේ සඳහා යොමුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඉන්දියානු කොංග්‍රසය වතුකර ජනයාගේ නායකත්වය වෙනුවෙන් පිහිටුවන ලද අතර එය පසුකාලීනව බලගතු දේශපාලන පක්ෂයක් හා වෘත්තීය සමිතියක් ලෙස මතුවිය.

1947 මැතිවරණයේදී 101ක් වූ සමස්ත ආසන ප්‍රමාණයෙන් ආසන 08 ක් ජයග්‍රහණය කිරීමට මොවුන් සමත් වූ නමුත් 1948 පුරවැසිභාවය පිළිබඳ පනතින් වතු දමිළ ජනයාගේ ජන්ද අයිතිය අහෝසි කිරීමත් සමග 1952 මැතිවරණයේදී වතු ජනයාට කිසිඳු නියෝජනයක් හිමි නොවීය. ලංකා ඉන්දියානු කොංග්‍රසය ලංකා කම්කරු කොංග්‍රසය ලෙස පරිවර්තනය විය. පසුව 1967 සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමේ සඳහන් වූ පුරවැසිභාවය ලබාදීමේ ක්‍රියාවලියද සිදුවූයේ ඉතාමත් මන්දගාමීවය. මෙම ගිවිසුමේ යම් ප්‍රතිඵලයක් ලෙස වතු දමිළ ජනයාට සුළු නියෝජනයක් හිමිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස පසුකාලීනව 1986 අංක 05 දරණ පනතින් පුරවැසිභාවයට ඉල්ලුම්කරන වතු දමිළ ජනයාට ජන්ද අයිතිය හිමිවිය. නමුත් 1993 අංක 43 දරණ පනතින් හා 2003 අංක 16 දරන පනතින් ශ්‍රී ලංකා ආර්ථිකයට දායක වූ අයට ඡන්ද අයිතිය ලබාදෙන ලදි. මේ සෑම අවස්ථාවකදීම විවිධ අදහස් ඔස්සේ වෘත්තීය සමිති බිහිවිය.

අප රටෙහි ඇති දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති මත ගොඩ නැඟුණු ඒවා වේ. නමුත් වතුකරයේ ඇති දේශපාලන පක්ෂයන්හි ප්‍රතිපත්තිමය කාරණා කෙසේ වේදැයි දෙවරක් සිතිය යුතු ය. මේ බොහෝ පක්ෂ වෘත්තිය සමිති පදනම් කරගෙන දේශපාලන පක්ෂ



**ඇමරිකාව, දකුණු අප්‍රිකාව වැනි රටවල සුළු ජාතීන් තමන්ගේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගමින් ප්‍රතිපත්තියක් තුළ පවතින ආණ්ඩු සමඟ සම්මුති දේශපාලනයක යෙදී ඇත. නමුත් වතුකරයේ දේශපාලන පක්ෂ එවැනි උත්සහයන්වල නියුතුව සිටියද ස්ථිර ප්‍රතිපත්තියක් නොමැතිව ක්‍රියා කිරීම නිසා එම උත්සාහයන් අසාර්ථක වී ඇත.**

බවට පත් ව තිබේ. දැනට පවතින වෘත්තීය සමිති පදනම් වූ පක්ෂ පෙනී සිටින්නේ මූලික කරුණු දෙකක් මත පදනම්වය. පළමු වැන්න වන්නේ ඔවුන් සිය වතුකර ජනයාගේ සමාජික මුදල් මත යැපීමයි. අනෙක වන්නේ කම්කරු ජනයාගේ සේවා ගිවිසුම් පිළිබඳ වාර්ෂිකව වතු සමාගම් සමඟ අත්සන් තැබීමයි. නිදහසින් පසු වතු ජනතාව නියෝජනය කරන දේශපාලන අධිකාරියේ දුරදර්ශී ප්‍රතිපත්තීන්ගෙන් යුතු දේශපාලන පක්ෂයක්වත් බිහි නොවීම අවාසනාවකි. මෙවැනි තත්ත්වයක් යටතේ වුව ද වතුකරයේ හඳුනාගත හැකි දේශපාලන පක්ෂ ගණනාවකි. ඒවා නම් ලංකා කම්කරු කොංග්‍රසය (CWC), කඳුරට ජනතා පෙරමුණ (UPF), ජාතික කම්කරු වෘත්තීය සමිතිය (NWU), ලංකා ජාතික වතු වෘත්තීය සමිතිය (CJEWU), ලංකා වතු කම්කරුවන්ගේ සංගමය (CPWU), ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොංග්‍රසය (DWC), සහ එක්සත් වතු කම්කරු සංගමය (UPWU) ආදිය වේ.

වතුකර දේශපාලනයේ වෙනසක් අවශ්‍ය කරන බව පොදුවේ හඬක් නැගී ඇත. නමුත් එකී වෙනස ආරම්භ කළ යුත්තේ කෙසේ ද? කොතනින් ද? කවුරුන්ද? කියා කිසිවෙකුටවත් අදහසක් නොමැත. එසේ වෙනසක් කිරීම සඳහා සිටින සුළු පිරිසට පවා ඒ සඳහා නිශ්චිත අවකාශයක් ගොඩ නැගී නොමැත. වතු සමාජයේ උගත් බුද්ධිමත් පිරිස වතු සමාජය අතැර වෙනත් ප්‍රදේශවලට හෝ නගරයන්ට සංක්‍රමණය වීම තවත් ගැටලුවකි. ඇතැම් තරුණ පිරිස් තම මතවාදයන් අදහස්වලට පමණක් සීමා කරගනිමින් කළ යුත්තේ කුමක්ද'යි සිතා ගත නොහැකිව සිටිති. අතැමුන් ඒ සඳහා උත්සාහ කළ ද ඒවා ව්‍යර්ථ වී තිබේ. සිවිල් ක්‍රියාධරයන් මේ වෙනුවෙන් කැප වී යම් සාර්ථකත්වයක් ලබාගෙන තිබේ.

අප දන්නා පරිදි ලෝක ඉතිහාසයේ සමාජ විප්ලව, සමාජ ව්‍යාපාර බිහිව ඇත්තේ ජනතාවට එල්ල වූ ආර්ථික, සමාජ, දේශපාලන පීඩනයන් හේතුවෙනි. ඇමරිකාව, දකුණු අප්‍රිකාව වැනි රටවල සුළු ජාතීන් තමන්ගේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගමින් ප්‍රතිපත්තියක් තුළ පවතින ආණ්ඩු සමඟ සම්මුති දේශපාලනයක යෙදී ඇත. නමුත් වතුකරයේ දේශපාලන පක්ෂ එවැනි උත්සහයන්වල නියුතුව සිටියද ස්ථිර ප්‍රතිපත්තියක් නොමැතිව ක්‍රියා කිරීම නිසා එම උත්සාහයන් අසාර්ථක වී ඇත. මීට පෙර වතු ජනයා නියෝජනය කළ මන්ත්‍රීවරු එම සමාජයේ මූලික අයිතිවාසිකම් හා ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව පාර්ලිමේන්තුව තුළ හඬක් නගා ඇත්ද? යන කාරණය කණගාටුදායක ය. මන්ද වතු ජනයා වෙනුවෙන් ප්‍රමාණවත් හඬක් නැගී නොමැත.

**මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන හා වතු ගැටලු**

පවතින ආණ්ඩුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේත්, ජනතා විමුක්ති පෙරමුණ සහ දෙමළ ජාතික සන්ධානයේත් මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් පිරික්සීමේ දී වතු ජනයා වෙනුවෙන් ඔවුන්ගේ දැක්ම කෙබඳු දැයි හඳුනාගත හැකි ය. එහි දී වතු ජනයාගේ මූලික ගැටළු ආමන්ත්‍රණය කිරීම වගන්ති එකකට හෝ දෙකකට පමණක් සීමා කිරීම දැකිය හැකිය.

එජාප ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වතු ජනයා ගැන මෙසේ සඳහන් වෙයි.

- **වතුකරයේ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල ජීවත්වන ඉන්දියානු ප්‍රභවයකින් යුත් ජනතාව සමාජය තුළට ඒකාබද්ධ කිරීමට කටයුතු කරන්නෙමු. පවුලකට ඉඩම් කොටසක් සමඟ නිවසක් ලබා දී ඔවුන් දැනට ජීවත්වන දුෂ්කර 'ලයින් කාමර' ජීවිතයෙන් මුදවා ගැනීමට පියවර ගන්නෙමු.**
- **මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල දමිළ මාධ්‍ය උසස් පෙළ විද්‍යා විෂය ධාරාව හැදෑරීමේ පහසුකම් සහිත තෝරාගත් පාසල් වැඩිදියුණු කරන්නෙමු. මෙම පළාත්වල දරුවන් සඳහා සමාන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන පහසුකම් ලබා දෙන්නෙමු. (එජාප මැ.ප්‍ර.ප්‍ර පි: 9)**

එක්සත් ජනතා නිදහස් සන්ධාන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 29 සහ 33 වැනි පිටුවල වතු ජනයා පිළිබඳ ඔවුන්ගේ දැක්ම පහත අයුරින් දක්වා ඇත.

- **වතු ලයින් කාමරවල ජීවත්වන්නා වූ සියලුම පවුල් තමන්ටම හිමි නිවසක පදිංචිය සඳහා යොමු කිරීම හා ඔවුන්ට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා අපගේ රජය විසින් ආරම්භ කළ වැඩපිළිවෙළ ඉදිරියටත් ගෙන ගොස් කඩිනමින් අවසන් කරන්නෙමු.**
- **වතු කම්කරුවන් සඳහා වැටුප දිනකට රුපියල් 1,000 දක්වා වැඩි කිරීම සහ එම ගෙවීම සඳහා යම්කිසි රාජ්‍ය අනුග්‍රහයක් අවශ්‍ය**

eelamview.wordpress.com



**විය යුත්තේ හුදෙක් ඉඩම් ඔප්පුවක් ලබාදීම, ලැයිම් කාමරවලින් ඉවත් කර නිවාස ලබා දෙනවායි පැවසීම නොව විධිමත් විගණනයකට හා සැලසුමකට අනුව විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ සියලු ම ගැටලුවලට විසඳුම් සහිත ප්‍රතිපත්ති සහ නීති ගොඩ නැගීමයි. එවිට කවුරුන් බලයට පත්වුවද අවධානමක් නොමැත්තේය.**

**වේ නම් එම මූල්‍ය අවශ්‍යතාවය ලබා දී ඉහත වැටුප් වැඩි කිරීම නොපමාව සිදුකරන්නෙමු.**

ප්‍රධාන පක්ෂ දෙකට වඩා වතු ගැටලුව පුළුල්ව හඳුනාගෙන ඇති ජවිපය වතු ජනයා පිළිබඳ ඔවුන්ගේ ස්ථාවරය සඳහන් කරයි

- **වතු ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු ජනතාවගේ රැකියා සුරක්ෂිත කිරීම, එම ජනතාවට උසස් ජීවන තත්වයක් හා ඉහළ සංස්කෘතික ජීවිතයක් උරුම කර දීම හා විශ්‍රාමික ශ්‍රමිකයන් සුරැකීම රජයේ ප්‍රබල කාර්යක් බවට පත් කෙරේ.**
- **දෛනික වැටුප රුපියල් දහස දක්වා වැඩිකළ හැකි ආකාරයට රජය හා පුද්ගලිකව ද මූල්‍ය කලමණාකරණය කඩිනමින් විධිමත් කෙරේ.**
- **වතුකරයේ ජීවත්වන ජනතාවගේ ඉඩම් ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඔවුන් සේවය කරන ප්‍රදේශ ආශ්‍රිතව සුදුසු භූමි තෝරාගෙන ඔවුන්ට නිවසක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් බැගින් ලබා දීමට කටයුතු කෙරේ. (ජවිප ප්‍ර.ප්‍ර පිඃ 45, 46)**

ප්‍රධාන පක්ෂ තුනෙහි ප්‍රතිපත්තිවල ඉඩම්, නිවාස සහ වැටුප් ආදී ගැටලු පිළිබඳ හැමදාම සිදු වූ පරිදි ප්‍රතිපත්ති ප්‍රකාශන සරසන්නට පමණක් යොදා ගෙන ඇත. එම ගැටලුවලට විසඳුම් සපයන ආකාරය සහ ඒ වෙනුවෙන් නිශ්චිත ජාතික වැඩපිළිවෙළක් ගොඩ නගන්නේ කසේද කියා කිසිවෙක් කරුණු දක්වා නොමැත. විය යුත්තේ හුදෙක් ඉඩම් ඔප්පුවක් ලබාදීම, ලැයිම් කාමරවලින් ඉවත් කර නිවාස ලබා දෙනවායි පැවසීම නොව විධිමත් විගණනයකට හා සැලසුමකට අනුව විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ සියලු ම ගැටලුවලට විසඳුම් සහිත ප්‍රතිපත්ති සහ නීති ගොඩ නැගීමයි. එවිට කවුරුන් බලයට පත්වුවද අවධානමක් නොමැත්තේය. මෙහිලා විශේෂයෙන් පැවසිය යුතු කරුණක් වන්නේ යම් ජාතිවාදී මතවාදයකින් බිහිවූ ජනතා විමුක්ති පෙරමුණ වත්මන්ව වතු ජනයාගේ ගැටළු පුළුල්ව ආමන්ත්‍රණය කළ ද සුළුතරයේ ජාතිවාදී පදනමක් සහිත දමිළ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ වතු ජනයාට දේශපාලන විසඳුමක් සහිත කිසිඳු අදහසක් පළ නොකිරීම විමතියට කරුණක් බව ය.

ප්‍රධාන පක්ෂ සමඟ සන්ධානගතව ඇති වතුකරයේ දේශපාලන පක්ෂ සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයන් ලෙස සන්ධානගතවන ප්‍රධාන දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිගෙන ඇත. මෙය එක් අතකින් සාධාරණ වුවත් තමන් නියෝජනය කරන ජනතාවගේ දැවෙන ප්‍රශ්න ප්‍රතිපත්තිමය කාරණා වශයෙන් ඒවායෙහි අන්තර්ගත නොවීම පිළිබඳව ඇත්තේ දැඩි අසාධාරණ ස්වභාවයකි. එසේම වතුකර දේශපාලඥයින් ද තමන් සහය දක්වන පක්ෂයන්ට බලපෑම් කොට තම ජනයාගේ ගැටලුවලට විසඳුම් සපයා ගත යුතු ය. එසේ නොවේනම් පෙනෙන කරුණ වන්නේ  වතු දේශපාලඥයින් හුදු බඩගෝස්තර වාදය වෙනුවෙන් සම්මුති දේශපාලනයේ නියැලී සිටින බව නොවේ ද?

## වතුජනයා මුහුණපාන ගැටලු සහ යෝජනා

- මෙවර මහ මැතිවරණයෙන් පසු වතු ජනයා වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්ති සම්පාදනයක් සිදුවිය යුතුය.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී වතුකරය තුළ තවමත් සිංහල භාෂාව ප්‍රමුඛ වීම නිසා මුහුණ දෙන ගැටළු සඳහා නිසි විසඳුම් පිළිබඳව අවධානය යොමුවිය යුතුය. වතුකරයේ රාජ්‍ය ආයතනවලට ලැබෙන සියලුම චක්‍රලේඛ තවමත් සිංහල භාෂාවෙන් පමණක් සඳහන්ව තිබීම හා රාජ්‍ය ආයතනවල සිටින නිලධාරීන්ගේ දමිළ භාෂා ප්‍රවීණතාවය ඉතාමත් දුර්වල මට්ටමක පැවතීම සඳහා කඩිනම් විසඳුම් අවශ්‍යය.
- දින සියයේ වැඩසටහන යටතේ එක් ග්‍රාම සේවා වසමකට රුපියල් දස ලක්ෂයක මූල්‍යමය ප්‍රතිපාදන ලබාදුන්නද ඒවායේ ප්‍රතිලාභ විඳීමට වතුජනයාට නොහැකි විය.
- ඉඩම් හා නිවාස යනු මානවයාගේ ජීවිතයේ ප්‍රධාන අංගයකි. රජය ඉඩම් හා නිවාස ලබාදීමේදී ජාතික හා ජාත්‍යන්තර සම්මුතීන් අනුව ක්‍රියා කරන්නේ ද? යන ගැටළුව පැන නැගී තිබේ. පසුගිය ජනාධිපතිවරණයෙන් පසුව වතුකරයට ලබාදුන් ඉඩම් ඔප්පු පිළිබඳවද ඇත්තේ අර්බුදකාරී තත්වයකි.
- එසේ ම හිත් පිත් නොමැති ගොඩනැගිලිවලට පවා ලිපින ඇති රටෙහි වතු ජනයාට ස්ථිර ලිපින නොමැති වීම හා ඒවා ලබා දීමට මැදිහත් නොවීම අභාග්‍ය සම්පන්න කාරණයකි.

www.opendemocracy.net



**වතු ජනයා බලාපොරොත්තු වන්නේ ඉන්දියානු ජන සම්භවය යන පදනම අත්හරිමින් ඔවුන් ශ්‍රී ලාංකේය වතු දමිළ ජනයා යන අනන්‍යතාවය අත්කර ගැනීමට ය. එම නිසා මින් ඉදිරියට පරිපාලන ව්‍යූහය තුළ ඉන්දියානු සම්භවය සහිත වතුජනයා යනුවෙන් ව්‍යවහාර නොකළ යුතුය.**

- දැනට හඳුනාගත් ජනාකීර්ණ වතු ප්‍රදේශවල නාය යෑමේ අවධානම පිළිබඳව හා ඊට ගතයුතු පූර්වාරක්ෂණයන් හා විකල්පයන් පිළිබඳව විශේෂ අවධානයක් හිමිවිය යුතුය.
- රාජ්‍ය සෞඛ්‍ය සේවයෙන් පාලනය වන වතු රෝහල්වල සේවය කාර්යක්ෂමව විධිමත් කිරීමක් සිදුවිය යුතුය.
- ඌව, මධ්‍යම හා සබරගමුව යන පළාත් පමණක් ප්‍රධාන කොට ගනිමින් මෙම දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශනයන් සැකසී තිබේ. නමුත් ඉන් පරිබාහිරව වයඹ, බස්නාහිර හා දකුණු පළාත්වල ජීවත්වන වතුජනයා කෙරෙහිද අවධානයක් යොමුකළ යුතුය.
- පළාත් පාලන ආයතනවලට වතුකරයද ඇතුළත් කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් සකස් කළ යුතුය.
- දැනට කෘෂිකාර්මික හා සත්ව පාලනයේ යෙදෙන කෘෂිකාර්මික ඉඩම්වල අවම වශයෙන් භුක්තික අයිතියවත් ඔවුන් වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

### වතු ජනයාගේ සමාජ අනන්‍යතාවය

වතු ජනයා බලාපොරොත්තු වන්නේ ඉන්දියානු ජන සම්භවය යන පදනම අත්හරිමින් ඔවුන් ශ්‍රී ලාංකේය වතු දමිළ ජනයා යන අනන්‍යතාවය අත්කර ගැනීමට ය. එම නිසා මින් ඉදිරියට පරිපාලන ව්‍යූහය තුළ ඉන්දියානු සම්භවය සහිත වතුජනයා යනුවෙන් ව්‍යවහාර නොකළ යුතුය. වතු දෙමළ ජනයාගේ ආදී මුතුන්මිත්තන් ඉන්දියාවෙන් පැමිණි බව සැබෑ ය. නමුත් දැන් ගෙවෙන්නේ ඔවුන්ගේ සිව් වන පරපුරයි. මෙරටේ ම ජීවත් වෙමින්, මෙරටේම පොළව හා උරෙනුර ගැටෙමින් ජාතික ආර්ථිකය නගා සිටුවීමට කැපවෙන ඔවුන් ඉන්දියානු දෙමළ යැයි පැවසීම කෙතරම් සාධාරණදැයි සිතිය යුතු ය.

කාලීන ගැටලු වලට පමණක් හඬ නගමින් ඒ ඒ දේශපාලන වාතාවරණයන්ට අනුව හැඩ ගැහෙමින් සිටිනවාට වඩා තම ගැටලුවලට ප්‍රතිපත්තිමය දේශපාලන විසඳුම් ලබා ගැනීමට දැන් කාලය උදාවී ඇත. ඒ සඳහා වතු දේශපාලනඥයින් සැබෑ වුවමනාවකින් මැදිහත්විය යුතුවා සේම වතු ජනයා ද තම අයිතීන් පිළිබඳව දැනුවත් වෙමින් ඒවා දිනා ගැනීම සඳහා සක්‍රීයව ඒකරාශී විය යුතු ය.

## තේ කඳුයායේ දේවතාවියන් ගේ කඳුළු

හිමිදිරි පින්න වැටී තේ දළු සිඹින විටයි
තේ මල් පුදින්නේ කඳුරට හිනැහෙන්නේ
දුක්බර හැඬුම් ඇසෙයි දේශය පුරා ඇසෙයි
දළු නෙලමින් හඬනා සුර දෙව් ලියන්ගේ

දුකින් දුකම විඳි දුක්බර දෙමළ ලඳුන්
හඬනා හඬ ඇසෙයි ලෝකය පුරා ඇසෙයි
මහවැලි ගඟ පුරා ගැලුවේ ඒ කඳුළුයි
ඒ කඳුළින් නිවෙයි බඩගිනි ලොවම දනියි

පැනයක් අසමි මිනිසුනි බඩගිනි නිවනු
පිළිතුරු නො ලැබුණොතින් නිසැකය ඇස් අරිනු
ඇස් ඇර බැලුවොතින් පීඩිත මේ ගැහැණු
සේනාවක් ලෙසින් නිසැකය පෙළ ගැසෙනු

රතු පස් ඇති යාපනයේ නෙලනා මේනකා
හේනේ වැඩ කරනා වන්නියේ අරුන්දතී
මාළු සිංදු කියන රටේ කුඹුරේ ඌර්වසී
එන්න එකතුව වෙන්න එන්න පෙළපාලියට එන්න
තේ වතුවල දළු නෙලනා දේවතාවියන්ගේ

**ව.ජ.ස. ජයපාලන්**

(සීතා රංජනී/දෝංකාරය)



# පුරවැසි සහභාගීත්වයෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්

**ලයනල් ගුරුගේ**

අපගේ දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක පාර්ලිමේන්තු මැතිවරණයක් සඳහා දැන් දින නියම ව තිබේ. සියලු පක්ෂ තම බලය වැඩි කර ගැනීම සඳහා නොයෙක් අයුරින් ජනතා ආකර්ෂණය දිනා ගැනීමට කටයුතු කරමින් සිටියි. නොයක් දෑ පවසමින් එසේ ජනතා ආකර්ෂණය වෙනුවෙන් මැතිවරණ වේදිකා උණුසුම් කළ ද මෙවර මැතිරණයේ දී පක්ෂ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශ වඩාත් වැදගත් බව කිව යුතු මනා ය. එහි දී ප්‍රධාන දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන ප්‍රතිපත්ති ප්‍රකාශන කෙරහි වැඩි සැළකිල්ලක් යොමු වේ. ඒ ඒ පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනවල කුමන දෑ සඳහන් වුව ද මෙහිලා අප අවධාරණය කරන්නේ ජාතික වශයෙන්, දේශපාලනික වශයෙන් රටට බලපානු ලබන කාරණා කීපයක් කෙරහි ය. එනම් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩ නගා ගැනීම වෙනුවෙන්  පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනවල කෙතරම් ඉඩප්‍රමාණයක් හිමි වී තිබේ ද කියා ය.



ආචාර්ය බී.ආර්. අම්බෙක්කාර්

**ලංකාවේ ජීවත්වන සියලු ජන කොටස්වල සහභාගිත්වයෙන් මෙය නිර්මාණය කළ යුතුයි. ආචාර්ය අම්බෙට්කාර් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණයෙන් එරට ජාතික එක්සත්කම ඇති කළේ ය. එය අද දක්වා සාධනීය අංගයන් එක්කරමින් ලෝකයේ ප්‍රබල ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ලෙස පිළිගැනෙයි.**

ශ්‍රී ලංකාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාවය වසර ගණනාවක් තිස්සේ සාකච්ඡාවන කරුණකි. මේ සංවාදය බොහෝ ඈතට දිව යයි. නමුත් මහජන සහභාගිත්වයකින් සිදුකෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ සියලු ජනයාට එම ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ අයිතිය හිමිවිය යුතු ය. ඒ සඳහා මුළු මහත් සමාජය ම කැපවිය යුතු ය.

ලංකාවේ ජීවත්වන සියලු ජන කොටස්වල සහභාගිත්වයෙන් මෙය නිර්මාණය කළ යුතුයි. ආචාර්ය අම්බෙට්කාර් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණයෙන් එරට ජාතික එක්සත්කම ඇති කළේ ය. එය අද දක්වා සාධනීය අංගයන් එක්කරමින් ලෝකයේ ප්‍රබල ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ලෙස පිළිගැනෙයි.

දකුණු අප්‍රිකාවේ නෙල්සල් මැන්ඩෙලා සහ ක්ලාක්ගේ සහභාගිත්වයෙන් ගොඩනැගුණු දේශපාලන ව්‍යාපාරයෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට මග පෑදුණි. සත්‍ය සෙවීමේ කොමිසම ඔස්සේ සියලු ජන කොටස්වල සහභාගිත්වයෙන් පුරවැසි ව්‍යවස්ථාවක් ලෙස ගොඩනැගුණි.

ඒ අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි ඉදිරිපත් කර ඇති කාරණා විමසා බැලීම වටී. එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ  සිය ප්‍රතිපත්ති ප්‍රකාශනවල නව ආණ්ඩුකම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම පිළිබඳ පැහැදිලිව කරුණු දක්වා ඇති මුත් එක්සත් ජනතා නිදහස් සන්ධානය ඒ පිළිබඳ පැහැදිලි කරුණු දැක්වීමක් සිදු නොකරයි.


වර්තමාන රජය නියෝජනය කරන එක්සත් ජාතික පෙරමුණු ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනැගීම සම්බන්ධයෙන් ' **නිදහස තහවුරු කිරීමේ ක්‍රියාවලිය' නම් හිසින් යුතු ව 3 වන කොටසේ 'නිවහල් රටක්' නිදහස් මිනිසෙක්'** යටතේ කරුණු දක්වා ඇත්තේ මෙසේ ය.

**"රටේ ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් වන අයුරින් යහපාලන මූලධර්ම රාජ්‍ය ක්ෂේත්‍රයට තව දුරටත් කාවදින ලෙස ද ප්‍රාදේශීය නියෝජනයන් ශක්තිමත් කර ප්‍රාදේශීය වශයෙන් පවතින අසමානතා දුරුවන අයුරින් ද, මානව හිමිකම් තව දුරටත් ශක්තිමත් කරමින් ජන කණ්ඩායම් හා පුද්ගලයන් අතර අසමානතා දුරුකර සමානතාව ශක්තිමත් කරන අයුරින් ද වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තැනීම පිණිස මීළඟ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ සමඟ කටයුතු කරනු ඇත." (පි: 12)**

ජනතා විමුක්ති පෙරමුණ සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි **'ජනතාවාදී පාලනයක්' කොටසේ 'ක්‍රියාමාර්ග'** යටතේ මෙසේ දක්වයි.

**"සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලු ම ජනතාවන්ට ආර්ථික, දේශපාලන, සමාජමය හා සංස්කෘතික ක්ෂේත්‍රවල සමාන අයිතිය සහ ප්‍රජාතන්ත්‍රවාදී හිමිකම තහවුරු කරන රාජ්‍ය බලයක් සහ රාජ්‍ය ක්‍රියාකාරීත්වයක් ස්ථාපිත කෙරේ. ඒ සඳහා පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට ජනතාව ඉදිරිපත් කරන යෝජනා සහ අදහස් සැළකිල්ලට ගෙන කෙටුම්පත් කෙරෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වසරක් තුළ ජනමත විචාරණයක් මඟින් සම්මත කෙරේ." (පි: 3)**

කෙසේ වතුදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කළ යුත්තේ පුළුල් මහජන සහභාගීත්වයකින් යුතුව ය. පුරවැසි සහභාගීත්වයකින් යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තවමත් ගොඩ නැගී නොමැති අතර නිදහසින් පසු නිර්මාණය වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හුදු පුද්ගල වුවමනාවන් මත ගොඩනැගුණු ඒවා ය. මේ නිසා සියලු විද්වත් පාර්ශ්වයන්ගේ සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අදහස් එකට ගොනු කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩ නැගීම අද වන විට ප්‍රමුඛ කාරණයක් බවට පත් ව තිබේ. එකී කාරණයේ දී තම තමන්ගේ අභිමතයන් නොව සමාජ අවශ්‍යතාව පදනම්කරගත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩ නැගීමට වග බලාගත යුතු ය. බඩගෝස්තරවාදී පටු අරමුණුවලින් මිදී රටේ අනාගතය ගැන පමණක් සිතා සියලු සමාජ කණ්ඩායම්, එකතු කර ගත් මහජන ව්‍යවස්ථාවක් ගොඩනැගීමේ වගකීම පිළිබඳ සියලු දේශපාලන පක්ෂ දැඩිව අවධානය යොමු කළ යුතු ය.




**ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා නිර්මාණයේ දී ප්‍රබලම මිත්‍යාව වන්නේ එය නිර්මාණය කළ හැක්කේ නීතිඥයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමකට පමණකැයි විශ්වාස කිරීමයි. නිදහසින් පසු ශ්‍රී ලාංකික ජාතිය එක්සත් කරවීමට අපේ පාලකයෝ අසමත් වූහ. දකුණින් කැරලි දෙකකින් ද උතුරේ තිස් අවුරුදු යුද්ධයකින් ද කියා පෑවේ එකී සත්‍යය යි. දස දහස් ජනයාගේ රුධිරයෙන් මෙම බිම තෙත් වී ඇත. එබැවින් ජාතිය එක්සත් කිරීමේ නව ව්‍යවස්ථාවක අවශ්‍යතාවය අප හට තදින් ම දැනේ.**

1989 තරුණ කොමිෂන් වාර්තාව

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා නිර්මාණයේ දී ප්‍රබලම මිත්‍යාව වන්නේ එය නිර්මාණය කළ හැක්කේ නීතිඥයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමකට පමණකැයි විශ්වාස කිරීමයි. නිදහසින් පසු ශ්‍රී ලාංකික ජාතිය එක්සත් කරවීමට අපේ පාලකයෝ අසමත් වූහ. දකුණින් කැරලි දෙකකින් ද උතුරේ තිස් අවුරුදු යුද්ධයකින් ද කියා පෑවේ එකී සත්‍යය යි. දස දහස් ජනයාගේ රුධිරයෙන් මෙම බිම තෙත් වී ඇත. එබැවින් ජාතිය එක්සත් කිරීමේ නව ව්‍යවස්ථාවක අවශ්‍යතාවය අප හට තදින් ම දැනේ. මෙකී ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා අප පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමු.

1. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පත්කිරීම. මෙම මණ්ඩලය සඳහා දේශපාලන නියෝජිතයින්, කලාකරුවන්, නීතිවේදීන්, විවිධ වෘත්තිකයන්, මාධ්‍යවේදීන්ගෙන් හා සිවිල්සමාජිකයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විය යුතුයි. මෙකී කාරණයේ දී ජවිපෙය 'ජනතාව ඉදිරිපත් කරන යෝජනා සහ අදහස් සැළකිල්ලට ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩනගනවා යි පැවසීම සාධනීය ලක්ෂණයක් මුත් එය සිදු වන ක්‍රමවේදය කුමක්දැයි නිශ්චිතව දක්වා නැත. එජාපය පාර්ලිමේන්තුවේ සියලු ම පක්ෂ එකතුකර ගනිමින් ව්‍යවස්ථාව ගොඩ නගනවායි පැවසුව ද ඒ සඳහා පුරවැසි දායකත්වය ලබා ගන්නා ක්‍රමවේදයක් ගැන සඳහන් නොකරයි.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක්ද, එහි අන්තර්ගත වන මූලික කරුණු කවරේද, ලෝකයේ හොඳම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල ඇති, එහෙත් අපේ නැති කරුණු මොනවාද? මෙවැනි ශීර්ෂයන් එකිනෙක ඔස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සාකච්ඡාවට බඳුන් කළ යුතුයි.
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාව, බලය බෙදාහැරී ම පිළිබඳ ක්‍රමවේදය, කොමිෂන් සභාවල සංයුතිය හා ක්‍රියාකාරීත්වය, මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන, ගොඩ නැගෙන ආකාරය පිළිබඳ කටයුතු කළ යුතු ය.

**බලතල බෙදීම හා ජාතික ගැටලුවට විසඳුම්**

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ අදහස් දක්වන එජාපය සහ ජවිපෙය සියලු ජනතාවගේ මූලික අයිතිවාසිකම් රැකෙන අයුරින් සිදුකරන බව සඳහන් කරයි. බලය බෙදා හැරීමේ ක්‍රමවේදය සහ ජාතික ගැටලුවට ලබා දෙන දේශපාලන විසඳුම කුමක්දැයි ප්‍රධාන පක්ෂ තුන මෙන් ම දෙමළ ජාතික සන්ධානය ද වෙන වෙන ම කරුණු දක්වා ඇත.

ඒ අනුව එජාපය **'ඒකීය රාජ්‍යයක් යටතේ සියලු දෙනාගේ සම්මුතියෙන් කළ හැකි උපරිම ආකාරයෙන් බලය බෙදීමකට පියවර ගන්නෙමු" (පි: 13)** යි සඳහන් කරයි. වගකිව යුතු දේශපාල පක්ෂයක් ලෙස බලය බෙදීම පිළිබඳ ඔවුන්ගේ දැක්ම වඩාත් පැහැදිලිව ඉදිරිපත් කළ යුතු ව තිබුණි. රට ම කෙරෙහි බලපාන කාරණයක් සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හිමි වන්නේ එක් කරුණකට පමණක් සීමාවන ඉඩක් නම් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක දී ඒ පිළිබඳව කෙසේ කටයුතු කරයි ද යන්න පිළිබඳ කුකුසක් පැන නගී.

එක්සත් ජනතා නිදහස් සන්ධානය දක්වන්නේ මෙවන් අදහසකි.

**"ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ඒකීය රටක් තුළ සියලු ජාතීන්ගේ අයිතීන් තහවුරු කෙරෙන සාධාරණ දේශපාලන විසඳුමක් ලබාදීමේ අරමුණින් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට නොයන; පළාත් සභා සහ පළාත් පාලන ආයතන වඩා ශක්තිමත් කෙරෙන දේශපාලන විසඳුමක් සඳහා අවතීර්ණ වීම අපගේ අරමුණයි. ඒ සඳහා පළාත් සභා සහ පාර්ලිමේන්තු නියොජිතයන්, ජාතික තලයේ දේශපාලන පක්ෂ ඇතුළු සියලු පාර්ශ්වයන් සමඟ, රජය පත් වී මාසයක් ඇතුළත සාකච්ඡා ආරම්භ කරන අතර මාස 6ක් ඇතුළත විසඳුම් යෝජනා කිරීමට අපි සහතික වෙමු"(පි: 7)**

වරෙක 13 න් ඔබ්බට යන දේශපාලන විසඳුමක් ලබා දෙනවායි පැවසූ එජනිස දැන් පවසන්නේ 13 වන ව්‍යවස්ථාවට අයත් බලතල බෙදීමේ ව්‍යුහයට යටත්ව බලය ලබා දෙන බවයි. එහිදී



**යුද්ධය අවසන් වීමත් සමඟ අපට රටක් වශයෙන් බොහෝ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු විය. මෙයට විසඳුමක් වශයෙන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ නිර්දේශ (LLRC) ඉදිරිපත් කළ නමුදු ඉන් ඔබ්බට කිසිදු වැඩ පිළිවෙළක් සඳහන් නොවී ය.**

LLRC වාර්තාව

ඉඩම් හා පොලිස් බලතල සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්ථාවරය පැහැදිලි නොකරයි.


ජනතා විමුක්ති පෙරමුණ සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි පළාත් සභා හෝ පළාත් පාලන ආයතන ගැන කිසිවක් සඳහන් නොකරයි. නමුත් ඔවුන් "**ජාතික ගැටලුව විසඳීම සඳහා ප්‍රවේශය**' ඔස්සේ මෙවැන්නක් ඉදිරිපත් කරයි.

**"ජනමත විචාරණයකින් සම්මත කරගනු ලබන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් විවිධ ජාතිකත්වයන්ට වෙනස් ලෙස සැළකීමත් සියලුම ජාතිවාදයනුත් විවිධ ජන කණ්ඩායම් සහ ආගම් අතර අසමගිය සහ ගැටුම් නිර්මාණය වීමට හේතු වන සියලු ක්‍රියාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම තහනම් කෙරේ. එමෙන් ම සියලු ජන කණ්ඩායම්වල සමාන අයිතීන් ව්‍යවස්ථාවෙන් තහවුරු කෙරේ." (පි: 7)**

එසේ ම ඔවුන් සංවර්ධනය අවම ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් ආර්ථික සංවර්ධනය, පරිපාලනමය ගැටලු විසඳීම, සංස්කෘතිකමය අනන්‍යතාව ආරක්ෂා කිරීම හා පවත්වා ගෙන යෑම සඳහා විශේෂ පරිපාලන ව්‍යුහයක් ලෙස '**ජනතා සභා**' ස්ථාපිත කරන බව සඳහන් කරයි. පවතින ක්‍රමය හා බලන කල්හි එය කෙතරම් ප්‍රායෝගික ද, යන්න දෙවරක් සිතා බැලිය යුතු ය.

වසර කීපයකට පසු නැවතත් මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් එළි දක්වන දෙමළ ජාතික සන්ධානය ජාතික ගැටලුවට විසඳුම් ලෙස ඔවුන්ගේ දැක්ම ඉදිරිපත් කරයි. "**ශ්‍රී ලංකාවේ සියලු ජනාවට අව්‍යාජ සමඟි සන්ධානයක්, කල්පවතින සාමයක් හා සංවර්ධනයක් සඳහා වූ මූලික අවශ්‍යතාවක් හැටියටයි. ඒ සඳහා ඔවුන් යෝජනා කරන්නේ දෙමළ කතා කරන උතුරු නැගෙනහිර පළාත් දෙක ඒකාබද්ධ කිරීමටයි. එසේ ම ශ්‍රී ලංකාව පිළිගෙන ඇති එක්සත් ජාතීන්ගේ සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන්ට අනුව ස්වයං නිර්ණය අයිතියට දෙමළ ජනතාවට හිමි කමක් ඇති බවට ඔවුන් සඳහන් කරයි. ෆෙඩරල් ආකෘතියක් මත පිහිටා දෙමළ කතා කරන ඓතිහාසික මුස්ලිම් පදිංචිකරුවන් උතුරු නැගෙනහිර බලය බෙදා හැරීමේ සියලු විධි විධානයන්හි ප්‍රතිලාභීන් වීමට අයිතිවාසිකම් ලබන අතර මෙමගින් මොනම ජාතියකට හෝ කිසිදු අහිමිවීමක් සිදු නොවන බව ද ඔවුන්ගේ අදහසයි. උතුරු නැගෙනහිර වෙත සෘජු විදේශ ආයෝජනයන් පහසුකරණය විය යුතු අතර එමගින් කර්මාන්තයන් සහ තරුණ තරුණියන් සඳහා නව රැකියා අවස්ථා ජනනය වියයුතු ය. ඉහත කී සියල්ල එක්සත් සහ නොබෙදුණු ශ්‍රී ලංකාවක ආකෘතිය තුළ නීතිගත වීම හා ක්‍රියාත්මක වීම සිදුවනු ඇත."** නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක දී මෙවැනි කාරණා පිළබඳව ද අවධානය යොමු කළ යුතු අතර උතුරු නැගෙනහිර නැවත ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් දෙවරක් සිතිය යුතු ය.

යුද්ධය අවසන් වීමත් සමඟ අපට රටක් වශයෙන් බොහෝ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු විය. මෙයට විසඳුමක් වශයෙන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ නිර්දේශ (LLRC) ඉදිරිපත් කළ නමුදු ඉන් ඔබ්බට කිසිදු වැඩ පිළිවෙළක් සඳහන් නොවී ය. එක්සත් ජනතා නිදහස් සන්ධානය **උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවේ නිර්දේශ වසරක් ඇතුළත ක්‍රියාත්මක කරන බව** ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 1.8.6 වගන්තියේ (**එජනිස, ප්‍ර.ප්‍ර පි: 8)** දක්වා ඇත. අවුරුදු කිහිපයකට පසු හෝ එය ක්‍රියාත්මක කරන බව පැවසීම සාධනීය පියවරක් මුත් එය සිදු කරන අකාරය පිළිබඳව වඩාත් පැහැදිලිව සඳහන් නොවීම ගැටලුවකි. ජනතා විමුක්ති පෙරමුණ ද '**ජාතික සමගිය**' **යන කොටසේ තිස් අවුරුදු යුද්ධය නිසා විවිධාකාරයෙන් පීඩාවට පත් වූවන්ට සහන ලබා දීමටත් ජාතික සමගිය ප්‍රර්ධනය කිරීමේ හා ප්‍රතිසන්ධානගත කිරීමේ පනතක් මගින් සත්‍ය විමර්ශන කොමිසමක් පත් කරන බව (ජවිපෙ, ප්‍ර.ප්‍ර පි: 8)** සඳහන් කිරීම සාධනීය පියවරකි. නමුත් ඒවා ස්වාධීන කොමිෂන් විය යුතු ය.




**පාර්ලිමේන්තුව ඔස්සේ සිදුවිය යුත්තේ ජාතික මට්ටමේ නීති, තීන්දු තීරණ ගැනීම් සහ සංවර්ධන ව්‍යාපෘති පිළබඳව සැළකිලිමත් වීමයි. පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් සිදුවන තීන්දු තිරණ ගැනීම් සහ සංවර්ධන ව්‍යාපෘති පිළබඳ තීරණ ගැනීම පළාත් සභා හෝ පළාත් පාලන ආයතනවලට පැවරිය යුතු ය.**

ප්‍රජාතන්ත්‍රවාදී අයුරින් කටයුතු කරනවා නම් සංහිඳියාව අමුතුවෙන් ගොඩනැගිය යුතු නොවේ. ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය හා නීතියේ ආධිපත්‍ය නොමැති තැන සංහිඳියාවක් ගොඩ නොනැගේ.

### පරස්පරතා

එසේ ම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනවල හමුවන පරස්පරතාවයන් ද බොහෝ ය. එජාපය බලය බෙදීම පිළිබඳ කතා කරනු ලැබුව ද දිස්ත්‍රික් සංවර්ධන ක්‍රම මන්ත්‍රීවරු හෝ ආණ්ඩුවේ නියෝජිතයින් හරහා මධ්‍යම රජයට පවරා ගැනීමක් පිළිබඳ සඳහන් කරයි.

**"සෑම මැතිවරණ දිස්ත්‍රික්කයකට ම සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවනු ලැබේ. එහි සභාපතිවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන අතර ඔහු හෝ ඇය ද පක්ෂ භේදයකින් තොරව තෝරා ගනු ලැබේ" (පි.13)**

පාර්ලිමේන්තුව ඔස්සේ සිදුවිය යුත්තේ ජාතික මට්ටමේ නීති, තීන්දු තීරණ ගැනීම් සහ සංවර්ධන ව්‍යාපෘති පිළබඳව සැළකිලිමත් වීමයි. පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් සිදුවන තීන්දු තිරණ ගැනීම් සහ සංවර්ධන ව්‍යාපෘති පිළබඳ තීරණ ගැනීම පළාත් සභා හෝ පළාත් පාලන ආයතනවලට පැවරිය යුතු ය. සෑම මැතිවරණ දිස්ත්‍රික්කයක ම සංවර්ධන කමිටුවක් පිහිටුවා එහි සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකු පත් කිරීම අනවශ්‍ය ගැටලුවක් නිර්මාණය කිරීම බව අපගේ විශ්වාසය වේ. ජවිප ය ප්‍රාදේශීය සංවර්ධනය සඳහා නිශ්චිත ප්‍රතිශතයක් නීතිගතකර වෙන් කරන බවක් **(ජවිපෙ ප්‍ර.ප්‍ර පිː 4)** සඳහන් කළ නමුදු එම සංවර්ධන ව්‍යාපෘති ප්‍රාදේශීය මට්ටමින් සිදු කිරීමට බලය ලබා දියයුතු ය. ජවිපය බලය බෙදා හැරීම සම්බන්ධයෙන් කරුණු නොදැක්වීම නිසා මෙය ගැටලුවක් බවට ම පත් ව තිබේ.


විශේෂයෙන් ම බල තල බෙදීමේ දී මධ්‍යම රජයේ විෂයයන් මධ්‍යම රජයටත් පළාත් සභාවේ විෂයයන් පළාත් සභාවටත් පැවරීම ඉතාම වැදගත් ය. ඒවා සමතික්‍රමණය කිරීම වැළැක්වීම සියලු පාර්ශ්වයන්ගේ කටයුත්තක් විය යුතු ය. එජාපය ඒ සඳහා විශේෂ අධිකරණයක් පත් කරන බව සඳහන් කිරීම සාධනිය පියවරකි. ඒකීය රාජ්‍යක් තුළ උපරිම බලය බෙදීම ගැන සඳහන් විය යුතු ය.

### කොමිෂන් සභා

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් වන්නේ කොමිෂන් සභා පවතින තත්ත්වයට වඩා ශක්තිමත් වන ක්‍රමවේදයක් ඔස්සේ ස්ථාපිත කිරීමයි. මානව හිමිකම් කොමිසම, පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම, අධිකරණ කොමිසම, පරිපාලන කොමිසම, ඉඩම් කොමිසම, අල්ලස් කොමිසම ආදී ජනතාව වෙනුවෙන් පෙනී සිටින කොමිෂන් සභා පිළිබඳ කතිකාවක් 19 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා සාකච්ඡා කෙරිණි. එහෙත් ජාතික සංහිඳියාව ගොඩනැඟිය හැකි, සමාජයේ ගැටලුවක් පැන නැගුණ අවස්ථාවක ඒ වෙනුවෙන් මැදිහත් වන පාර්ලිමේන්තුවට වග කියන ස්ථිරසාර බලයක් සහිත කොමිසමක් පිහිටුවිය යුතු ය. එය කාලීන අවශ්‍යතාවයකි. කොමිසම තුළ ආගමික සංහිඳියාව, සමාජ ඒකාබද්ධතාව යන අංශ ඔස්සේ තීන්දු තීරණ ගත හැකි ඒකකයක් පිහිටුවීමේ අවශ්‍යතාව ද පවතී. එක්සත් ජනතා නිදහස් සන්ධාන ප්‍රතපත්ති ප්‍රකාශනයෙහි **'ජාතික ඒකාග්‍රතාවය සහ තිරසාර සංහිඳියාව පිළිබඳ ප්‍රතිපත්තිය' නම් ශීර්ෂය යටතේ 1.8. 1 වගන්තිය යටතේ 'ජාතික සුහදතා කොමිසම'** පිළිබඳව සඳහන් කර තිබීම සාධනීය ලක්ෂණයකි.

### මූල්‍ය කොමිසම

එසේම මෙහි දී තවත් වැදගත් කාරණාවක් වන්නේ මූල්‍ය කොමිසම යි. එය වඩාත් ස්වාධීන ආයතනයක් විය යුතු ය. ජාතික ධනය බෙදා හැරිය යුත්තේ කෙසේද කියා තීරණ ගැනීමට මූල්‍ය කොමිසමට අයිතිය තිබිය යුතු ය. මුදල් අමාත්‍යාංශය හෝ මහ බැංකුව යටතේ පාලනය වන්නක් වීම තුළ බොහෝ කටයුතු කිරීම සඳහා ඇති හැකියාව ඇහිරේ. ඌව, උතුර, උතුරු මැද




**වත්මන් දේශපාලනයේ බොහෝ ගැටලු ඇතිවීමට පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිකම බල පා තිබේ. එය නිරීක්ෂණයට ක්‍රමවේදයක් ගොඩනැගීම අත්‍යාවශ්‍ය වේ. එසේ ම පක්ෂවල අරමුදල් කොපමණ ද, මැතිවරණයකට වියදම් කරන ප්‍රමාණය කොපමණ ද, එක් අපේක්ෂකයකුට වැය කළ හැකි මුදල කොපමණ ද ආදී කරුණු විමසා බැලීමට මැතිවරණ කොමිසමට බලය හිමි විය යුතු ය. මෙවැනි කාරණා කෙන්යානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ම දක්වා ඇත. එවැනි ව්‍යවස්ථාවන්ගෙන් පූර්වාදර්ශ සපයා ගනිමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙවැනි දෑ ඇතුළත් කිරීමට වග බලාගැනීම වැදගත් ය.**

වැනි රටේ පවතින දුප්පත් පළාත්වලට සංවර්ධනය සඳහා මුදල් කොමිසම ඔස්සේ ප්‍රතිපාදන වෙන් කළ හැකි ය. ඒ සඳහා අවස්ථාව හිමි වන්නේ එය ස්වාධීන ආයතනයක් වුව හොත් පමණි. මේ හේතුවෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ දී ඒ පිළිබඳව වඩාත් සැළකිලිමත් වීමට ඒ ඒ පක්ෂ වග බලා ගත යුතු ය.

**මැතිවරණ කොමිසම**

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක දී මැතිවරණ කොමිසම බල ගැන්විය යුතු ය. එසේ කිරීමට ප්‍රධාන හේතුව වන්නේ ලංකාවේ පවතින බහුවාර්ගිකත්වයට ප්‍රමාණවත් නියෝජනයක් ලබාදීමටත්, ප්‍රජාතන්ත්‍රවාදයේ හිමිකරුවන් වන එහෙත් නියෝජනයක් නොලැබෙන ඇතැම් ජන කොට්ඨාසවලට නියෝජනයක් ලබාදීමටත් හා බහුවිධ අභිලාෂයන් සහිත සමාජ කණ්ඩායම් වෙත නියෝජනයක් ලබාදීම සඳහා නිශ්චිත හා පැහැදිලි ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ය. මැතිවරණ කොමිසම යනු විශාල බලයක් හිමි විය යුතු ආයතනයකි. එය මැතිවරණ කාලයේ දී පමණක් නොව හැම කලක දිම ක්‍රියාත්මක විය යුතු ය. ඒ ඔස්සේ මැතිවරණ නීති රීති පිළිබඳ ඡන්දදායකයා දැනුවත් කිරීම හා පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය අධීක්ෂණය කිරීම ආදී කටයුතු පිළිබඳ කොමිසමට විශාල වගකීමක් ඇත. වත්මන් දේශපාලනයේ බොහෝ ගැටලු ඇතිවීමට පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිකම බල පා තිබේ. එය නිරීක්ෂණයට ක්‍රමවේදයක් ගොඩනැගීම අත්‍යාවශ්‍ය වේ. එසේ ම පක්ෂවල අරමුදල් කොපමණ ද, මැතිවරණයකට වියදම් කරන ප්‍රමාණය කොපමණ ද, එක් අපේක්ෂකයකුට වැය කළ හැකි මුදල කොපමණ ද ආදී කරුණු විමසා බැලීමට මැතිවරණ කොමිසමට බලය හිමි විය යුතු ය. මෙවැනි කාරණා කෙන්යානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ම දක්වා ඇත. එවැනි ව්‍යවස්ථාවන්ගෙන් පූර්වාදර්ශ සපයා ගනිමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙවැනි දෑ ඇතුළත් කිරීමට වග බලාගැනීම වැදගත් ය.

**තොරතුරු දැනගැනීමේ පණත හ විගණන පනත**

මීට අමතරව තොරතුරු දැනගැනීමේ පනත සහ විගණන පනත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කිරීම වැදගත් ය. තොරතුරු දැන ගැනීම 19 වැනි සංශෝධනය  යටතේ මූලික අයිතියක් බවට පත් ව ඇත. එම නිසා තොරතුරු දැන ගැනීමේ පනත ද ශක්තිමත් එකක් විය යුතු ය. මේ පිළිබඳ ව මහජන සංවාදයක් ගොඩනැගිය යුතු අතර ඒ සඳහා කාලයක් ලබා දිය යුතු ය. ජනතා අදහස් යෝජනා, චෝදනා එකතුකර ගන්නා ක්‍රමවේදයක් සකස් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සිවිල් ක්‍රියාකාරීන් සහ විද්වතුන්ගේ ද මතයන් එකට ගොනු කර සාමූහික ව මෙය ගොඩනැගිය යුතු ය. එය යම් පුද්ගල අවශ්‍යතාවයක් මත සිදු නොවිය යුතු ය.

එහි දී තොරතුරු දැනගැනීමේ පනතක ඇති සීමාවන් මොනවාදැයි නිශ්චිත ව දැක්විය යුතු ය. එහිදී මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා හා පළාත් පාලන ආයතනයන් ජනතාවගේ පැවැත්ම තහවුරු කිරීම සම්බන්ධයෙන් සිදුවන ක්‍රියාවලීන් පිළිබඳ ව ජනතාවට නිශ්චිත හා පැහැදිලි තොරතුරු ලබාදීම අත්‍යාවශ්‍ය වේ. ඊට ප්‍රධාන හේතුව වන්නේ එමගින් ප්‍රජාතන්ත්‍රවාදයේ කතිකාවත ශක්තිමත් කිරීම මෙන් ම  ජනතාවට තම අභිලාෂ හා අවශ්‍යතා ඉටුකිරීම සම්බන්ධ විශ්වසනීයත්වයක් ඇති කරවීමයි. එසේ ම ඉන්දියාව වැනි රටවල තොරතුරු දැනීමේ පනතෙහි සඳහන් සාධනීය පූර්වාදර්ශයන් එකතු කිරීම ද වැදගත් ය.

විගණන පනතේ දී සැළකිය යුතු ප්‍රධාන කරුණු කීපයකි. එනම් ඒ ඒ ආයතන විගණනය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදය කුමක්දැයි නිර්ණය කළ යුතු ය. නොඑසේ නම් එකම විගණන ක්‍රමවේදයක් ඔස්සේ රටේ සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේ පවතින අක්‍රමිකතා පිරික්සීමට යෑම ගැටලු සහගත ය. මෙවැනි කාරණා පිළිබඳ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක දී සැළකිලිමත් විය යුතු ය.

දැන් පවතින්නේ ජනාධිපති ප්‍රමුඛ ආණ්ඩුක්‍රමයකි. බොහෝ කාලයක් තිස්සේ මෙරට වැසියා විධායක ජනාධිපති ක්‍රමයක්



**ග්‍රාම සේවා මට්ටමෙන් එන යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වාත්, දිස්ත්‍රික් මට්ටම දක්වාත්, පසුව ජාතික මට්ටම දක්වාත් ගෙන යායුතු ය. සියලු ජනකොටස්වල යෝජනාවලින් සැදුණු ව්‍යවස්ථාවක් බව ඔවුනට ඒත්තු ගැන්විය යුතු ය. එය ජනතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වන්නේ එවැනි ප්‍රබල සමාජ සංවාදයකින් ගොඩ නැගුණහොත් පමණි.**

යටතේ වෙසෙමින් එහි බලපෑම් වලට ලක් ව තිබේ. ඒ නිසා තව දුරටත් එවැන්නක් අවශ්‍ය නොවන අතර සාමූහික තීන්දු ගන්නා කැබිනට් මණ්ඩලයක් නිර්මාණය කළ යුතු ය. එහි අගමැති ප්‍රමුඛ වුව ද ඔහු විධායක අගමැති කෙනෙකු නොවිය යුතු ය.

අගමැතිගේ සහ කැබිනට් මණ්ඩලයේ බලතල අනුව ජනාධිපතිගේ බලතල ක්‍රියාත්මක වනු ඇතැයි **(එජාප ප්‍ර.ප්‍ර පිː 13)** සඳහන් වුව ද අගමැතිගේ බලතල නිශ්චිතව දක්වා නොමැත. ඔහු විධායක අගමැතිකෙනෙක් යැයි ඇතැමෙකුට උපකල්පනය කළහැකි ය.  එම නිසා නව ව්‍යවස්ථාවක් ගොඩනැගීමේදී මේ පිළිබඳව නිශ්චිතව සඳහන් වීම වැදගත් ය. **පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ස්ථාපනය කරමින් ඇමති මණ්ඩලය 25 දෙනෙකුට සීමා කරන බව ආණ්ඩුවේ සියලු තීරණ, ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ සාමුහික ව වගකියන බව (ජවිපෙ, ප්‍ර.ප්‍ර පිː 3) ජවිපෙ සඳහන් කරයි.** නමුත් එහිද නිශ්චිත ව අගමැති ගැන සඳහන් නොවේ. මේ කිසිවක් පිළිබඳ එජනිස අදහස් නොදැක්වීම තුළ ඔවුන්ගේ ක්‍රියාදාමය කුමක් දැයි යන්න ගැන සැකයක් පහළ වේ.

උක්ත කාරණාවලට අමතරව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණයේ දී පහත කරුණු කෙරෙහි ද අවධානය යොමු කළයුතුය.

සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් විශේෂයෙන් ම ග්‍රාම සේවා මට්ටමෙන් සිවිල් සංවිධාන සංවිධාන ගත කොට පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන සඳහා අය වැය යෝජනා ඉදිරිපත් කිරීමත්, සංවර්ධන කටයුතු ගම් මට්මෙන් අධීක්ෂණය කිරීම, සංවර්ධන කටයුතු යෝජනා කිරීම වැනි ආදී සියලු කටයුතුවල දී නීත්‍යනුකූලව සම්බන්ධවීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවමගින් තහවුරු කිරීම වැදගත් වේ. එජනිස යෝජනා කරන '**ජන සභා**' සහ ජවිපය යෝජනා කරන '**ග්‍රාමීය සභා**' මේ සඳහා හොඳ ප්‍රවේශයක් වන අතර දැනටමත් උතුර, නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත්වල '**පුරවැසි සභා**' නමින් ක්‍රියාත්මක වන ඒකකය අධීක්ෂණයකොට එජනිස සහ ජවිපයේ අදහස වඩාත් ප්‍රායෝගිකව සිදු කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වේ. එවැනි ඒකකයන් ව්‍යවස්ථාවට ඇතුළත් වීම වඩාත් වැදගත් ය.

ග්‍රාම සේවා මට්ටමෙන් එන යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වාත්, දිස්ත්‍රික් මට්ටම දක්වාත්, පසුව ජාතික මට්ටම දක්වාත් ගෙන යායුතු ය. සියලු ජනකොටස්වල යෝජනාවලින් සැදුණු ව්‍යවස්ථාවක් බව ඔවුනට ඒත්තු ගැන්විය යුතු ය. එය ජනතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වන්නේ එවැනි ප්‍රබල සමාජ සංවාදයකින් ගොඩ නැගුණහොත් පමණි. සියලු විද්‍යුත් හා මුද්‍රිත ජන මාධ්‍ය, පුද්ගලික ජනමාධ්‍ය, ආණ්ඩුවේ ජනමාධ්‍ය හා නව මාධ්‍ය ඔස්සේ ප්‍රබල ව සාකච්ඡා කළ යුතු ය.

ඕනෑම ප්‍රතිපත්ති ප්‍රකාශනයක සාධනීය හා නිශේධනීය ලක්ෂණ අන්තර්ගතවීම දැකිය හැකි නමුත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක බලාපොරොත්තුවෙන් සිටින පුරවැසියා වෙනුවෙන් තම ප්‍රතිපත්ති ප්‍රකාශනයන් තව තවත් ශක්තිමත් කර ගැනීම හා ඒවා කෙතරම් ප්‍රායෝගික දැයි ඒ ඒ පක්ෂ කල්පනා කළ යුතු ය.

ඉහත යෝජනා පදනම් කරගනිමින් විශේෂයෙන් ම ජාතික එක්සත්කම සුරැකෙන පරිදි සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන කවර ජාතිකත්වයකට අයත් වුව ද ශ්‍රී ලාංකිකයන් හැටියට එකම එක පුරවැසි කණ්ඩායමක් වශයෙන් සියලු අයගේ අයිතීන් ආරක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය විය යුතු ය. විවිධත්වය පිළිගැනීම, විවිධත්වයට ගරු කිරීම, විවිධත්වය ඉවසීම ශ්‍රී ලාංකීය සමාජයේ හැරවුම් ලක්ෂ්‍යය මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බවට පත්කිරීම රටට ආදරය කරන සියලු පුරවැසියන් ගේ පරම යුතුකම යි. ඒ සඳහා පටු ආකල්ප, පටු දේශපාලන බෙදීම් නොසලකා මේ කාර්යය කිරීමට වගකීමක් හා භාරදූර කාර්යයක් වත්මන් ජනාධිපතිවරයාට හිමිවෙයි. එසේ ම හිටපු ජනාධිපතිවරු, අගමැතිවරු, සියලු දේශපාලන පක්ෂ, සියලු ජනමාධ්‍ය, සියලු පුරවැසියන්ගේ ම මේ සියවසේ ජාතිය නැවත නිර්මාණය කිරීමේ කොටස්කරුවන් වීමේ පුරෝගාමී මෙහෙවර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනැගීම වේ. ●

C P A
Centre for Policy Alternatives

# 2015 මහා මැතිවරණය
# පූර්ව මැතිවරණ මත විමසුම - සංක්ෂිප්ත වාර්තාව

2015 අගෝස්තු 4, කොළඹ, ශ්‍රී ලංකාව: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator) විසින් මැතිවරණයට සූදානම් වීමේ කාලය තුළදී සාකච්ඡා කරනු ලබන ප්‍රධාන මාතෘකා පිළිබඳව ශ්‍රී ලාංකීය ඡන්දදායකයාගේ අවබෝධයන් හා ආකල්ප හඳුනා ගැනීමේ හා එමගින් වත්මන් දේශපාලන කතිකාවතට දායකත්වයක් සැපයීමේ අරමුණෙන් යුතුව දීප ව්‍යාප්ත පූර්ව මැතිවරණ මත විසුමක් පැවැත්වීය.

ශ්‍රී ලාංකිකයින් ගෙන් 4% ක් පමණක් 2015 මහ මැතිවරණය නිදහස් හා සාධාරණ එකක් නොවනු ඇතැයි විශ්වාස කරන අතර 66. 9%ක් එය නිදහස් හා සාධාරණ එකක් වනු ඇතැයි විශ්වාස කරති.

ඔවුන් සිතන අන්දමට ශ්‍රී ලංකාවේ අගමැතිවරයා වීමට වඩාත්ම යෝග්‍ය වන්නේ කවරෙක් ද යන්න පිළිබඳව ඔවුන් ගෙන් විමසූ විට දමිළ ජනයාගෙන් (62.3%), කඳුරට දමිළ ජනයාගෙන් (71.1%) හා මුස්ලිම් ජනයාගෙන් (62.3%) බහුතරය පැවසුවේ රනිල් වික්‍රමසිංහ කියා ය. මහින්ද රාජපක්ෂ සුදුසු යයි කීවේ මෙම සෑම ප්‍රජාවකින්ම 2% කට අඩු ප්‍රමාණයකි. සිංහල ප්‍රජාව අතර මෙම මතය බෙදී යන්නේ 36% ක් මහින්ද රාජපක්ෂ විය යුතු යයි ද 31.9% ක් රනිල් වික්‍රමසිංහ විය යුතු යයි ද යනුවෙනි.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ එළඹෙන මහ මැතිවරණයේ දී තරඟ කළ යුතු ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයෝ බෙදී සිටිති. 40% ක් හිටපු ජනාධිපතිවරයා තරඟ කළ යුතු යයි කියන අතර 42% ක් කියන්නේ ඔහු තරඟ නොකළ යුතු බව ය.

ඊළඟ පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කළ යුතු යයි ශ්‍රී ලාංකිකයින් විශ්වාස කරන ප්‍රධාන ප්‍රශ්න වන්නේ විරැකියාව හා තරුණ ජනයා සඳහා රැකියා අවස්ථා, ජීවන වියදම අඩු කිරීම, රටේ සංවර්ධනය වේගවත් කිරීම හා අධ්‍යාපන ක්‍රමය දියුණු කිරීම ය.

අපේක්ෂකයෙකු තුළ තිබිය යුතු යයි ශ්‍රී ලාංකිකයින් අපේක්ෂා කරන ඉතාම වැදගත් ලක්ෂණ තුන වන්නේ එම අපේක්ෂකයා රට වෙනුවෙන් කර ඇත්තේ කුමක් ද? (19.4%), ඔවුන්ගේ හෝ ඇයගේ අධ්‍යාපනය (17.5%) හා ඔවුන් දූෂිත නොවිය යුතු ය (15%) යන ඒවා ය. ශ්‍රී ලාංකිකයින්ගෙන් 50% ක් පමණක්ම ඔවුන්ගේ ඡන්දය දීමට සැලසුම් කරන අපේක්ෂකයින් ඔවුන්ගේ වත්කම් ප්‍රකාශ කර තිබීම අතිශයින්ම වැදගත් යයි පවසන අතර 18.5% ක් පවසා තිබෙන්නේ ඔවුන්ට එය එක්තරා දුරකට පමණක් වැදගත්වන බව ය.

තමන් ඡන්දය දෙන්නේ කෙසේ ද යන්න කෙරෙහි මාධ්‍ය මගින් ඔවුන් ලබා ගන්නා තොරතුරු බලපාන බව ශ්‍රී ලාංකිකයින්ගෙන් 59% ක් පවසන අතර 29.6% ක් කියන්නේ එය බල නොපාන බව ය.

රටේ දිස්ත්‍රික්ක 25 ක පවත්වන ලද මෙම මත විමසුම ප්‍රධාන ජනවර්ග කණ්ඩායම් අතරෙන් පුද්ගලයින් 1986 කගේ මතය ග්‍රහණය කළේ ය. ක්ෂේත්‍ර වැඩකටයුතු 2015 ජූලි 22-29 අතර කාලය තුළ සිදුකරනු ලැබිනි.



# මහා මැතිවරණය 2015
## ශ්‍රී ලාංකේය ඡන්දදායකයා

ශ්‍රී ලාංකිකයන් අතුරින් 66.9% දෙනකු මෙම මැතිවරණය නිදහස් සහ සාධාරණ එකක් වනු ඇතැයි විශ්වාස කරති.

ශ්‍රී ලාංකිකයන්ගෙන් 58.1% දෙනකු තමන් ඡන්දය දෙන්නේ කාටද යන්න දැනටමත් තීරණය කර ඇත.

58.1% "මා ඡන්දය පාවිච්චි කරන්නේ කාහටද යන්න මා දැනටමත් තීරණයකර ඇත්තෙමි"




### ශ්‍රී ලංකාවේ මීළඟ අගමැතිවරයා විය යුත්තේ





| | 39.8% | 27.5% |
|---|---|---|
| සිංහල | 31.9 | 36 |
| දෙමළ | 62.3 | 1.8 |
| උඩරට දෙමළ | 71.1 | 1.2 |
| මුස්ලිම් | 62.3 | 1.6 |

47.9% "මා ඡන්දය පාවිච්චි කිරීමට බලාපොරොත්තුවන අපේක්ෂකයන් තම වත්කම් ප්‍රකාශකොට තිබේය යන්න මාහට අතිශයින්ම වැදගත්වේ"

59% "මාධ්‍යයන් ඔස්සේ මට ලැබෙන තොරතුරු මා ඡන්දය පාවිච්චි කරන්නේ කෙසේ ද යන්න කෙරෙහි බලපෑමක් ඇති කරයි"

ශ්‍රී ලාංකිකයන්ගෙන් 40% දෙනෙකු සිතන්නේ හිටපු ජනාධිපතිවරයා නැවත තරඟ නොකළයුතු බවයි.

මීළඟ පාර්ලිමේන්තුවට මුහුණ දීමට සිදුවන ප්‍රධාන ගැටලු වන්නේ -

- සේවා නියුක්තිය
- ජීවන වියදම
- සංවර්ධනය

81.5% මේ මැතිවරණ කාලය තුළ මාහට ප්‍රධාන වශයෙන්ම තොරතුරු ලැබෙන මූලාශ්‍රය වන්නේ රූපවාහිනියයි.

මෙම සොයාගැනීම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2015 ජූලි මස 22 - 29 දක්වා රටේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය කරමින් පවත්වනු ලැබූ පූර්ව මැතිවරණ ජනමත සමීක්ෂණය ඇසුරිනි. මෙම ජනමත සමීක්ෂණය තුලින් ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් හතරම ආවරණය වන පරිදි 1986ක් වූ ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවකගේ මතය ලබාගනු ලැබිණි.

**මෙම සම්පූර්ණ වාර්තාව cpalanka.org වෙබ් අඩවිය වෙතින් ලබාගත හැකිය.**

CPA
Centre for Policy Alternatives

## සම්පූර්ණ පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් ලබාගත හැකි ස්ථාන

| පක්ෂය | තොරතුරු |
|---|---|
| එක්සත් ජනතා නිදහස් සන්ධානය | සභාපති - මෛත්‍රීපාල සිරිසේන<br>ප්‍රධාන කාර්යාලය - 301, ටී.බී. ජයා මාවත, කොළඹ.<br>මුහුණු පොත ලිපිනය - SLUPFA@Facebook.com<br>විද්‍යුත් තැපැල් - upfasl@gmail.com<br>අන්තර් ජාලය - www.upfasrilanka.com, http://www.sandanaya.lk/<br>දුරකථනය -<br>ප්‍රතිපත්ති ප්‍රකාශනය<br>ලබාගැනීමේ ප්‍රවේශය - http://upfa2015manifesto.com/?gclid=CPGtgv3mjscCFRAojgodpUYPqg |
| ජනතා විමුක්ති පෙරමුණ | සභාපති - අනුරකුමාර දිසානායක<br>ප්‍රධාන කාර්යාලය - 464/20, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල<br>මුහුණු පොත ලිපිනය - www.facebook.com/jvpsrilanka<br>විද්‍යුත් තැපැල් - media@jvpsrilanka.com<br>අන්තර් ජාලය - www.jvpsrilanka.com,(www.jvp.lk)<br>දුරකථනය - +94112785612, +94112785545<br>ප්‍රතිපත්ති ප්‍රකාශනය<br>ලබාගැනීමේ ප්‍රවේශය - http://www.jvpsrilanka.com/en/images/e_books/hardasaksiye_sammuthiya.pdf |
| එක්සත් ජාතික පක්ෂය | නායකයා - රනිල් වික්‍රමසිංහ<br>ප්‍රධාන කාර්යාලය - සිරිකොත මන්දිරය, අංක 400, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.<br>මුහුණු පොත ලිපිනය - https://www.facebook.com/the.united.national.party.<br>විද්‍යුත් තැපැල් - info@unp.lk<br>අන්තර් ජාලය - http://unitednationalparty.tripod.com/<br>දුරකථනය - +94112865374, +94112886754, +94112866547,+94112865347<br>ප්‍රතිපත්ති ප්‍රකාශනය<br>ලබාගැනීමේ ප්‍රවේශය - http://www.unp.lk/images/60%20months.pdf |
| දෙමළ ජාතික සන්ධානය | නායකයා - ආර්. සම්බන්ධන්<br>ප්‍රධාන කාර්යාලය - 6, 1වන පටුමග, පේදුරු තුඩුව පාර, යාපනය<br>(TNA ප්‍රධාන කාර්යාලය 32 A, රෙට්ට්රීට් පාර, කොළඹ 4)<br>මුහුණු පොත ලිපිනය - www.facebook.com/TamilNationalAllianceTNA/info?tab=page_info<br>විද්‍යුත් තැපැල් - media.office@tnapolitics.org<br>අන්තර් ජාලය - www.tnainfo.com<br>දුරකථනය - Colombo - 011 255 9352<br>ප්‍රතිපත්ති ප්‍රකාශනය<br>ලබාගැනීමේ ප්‍රවේශය - http://www.sundaytimes.lk/150726/TNA%20Manifesto.pdf |

# ප්‍රචණ්ඩත්වය

# එපා

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (සී.ඇම්.ඊ.වී)

**ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ප්‍රචණ්ඩත්වයට එරෙහිව ඡන්දය දාන්න.**

ISSN 955-1800-0061

ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් - නො. 5A, ස්ටෝර්ක් පෙදෙස, කොළඹ 10 - දුරකථන : 0777-315971